**<u>ප්‍රශ්නය</u>**

***01. ගෞරවනීය ස්වාමීන් වහන්ස, රෝගියෙකුට උපස්ථානය කිරීම බුදුරජාණන් වහන්සේට කරන උපස්ථානයක් සේ සලකනවද?***

**<u>පිළිතුර</u>**

නෑ මහත්තයො. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කොතැනකවත් රෝගීන්ට උපස්ථානය කිරීම බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීමක් කියලා දේශනා කරලා නැහැ. සමාජයේ දැන් මතයක් තියෙනවා, නමුත් ඒක සම්පූර්ණ දුර් මතයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ, යමෙක් රෝගියෙකුට උපස්ථාන කරනව නම් ඔහු මම කියපු දේ / කරපු දේ කරපු කෙනෙක් වෙනවා. මම යමක් දේශනා කරල තියෙනවද ඒ දේශනා කරපු දේ මම කරපු දේ කරපු කෙනෙක් වෙනවා. ඒ නිසා කොයිම වෙලාවකවත් රෝගියෙකුට උපස්ථාන කිරීම බුදුරජාණන් වහන්සේට කරන උපස්ථානයක් නෙමේ. ඔබ එහෙම හිතනවානම් කවදාකවත් ඔබට ශ්‍රද්ධාව කියන කාරණය නම් සකස් කර ගන්න බැහැ. මොකද බුදුරජාණන් වහන්සේ කියන්නේ අයෝමීය ගුණයන්, අයෝමීය ඥාණයන්ගෙන් පරිපූර්ණ වූ කෙනෙක්. රෝගියෙක් කියන්නේ කව්ද? සමහර විට එයා පංච සීලය විතරයි සමාදන් වෙලා තියෙන්නෙ. සමහර විට එයා පංච සීලයත් සමාදන් නොවී ඉන්න පුළුවන්. එහෙමනම් කවදාකවත් බුදුරජාණන් වහන්සේට කරන උපස්ථානයයි, රෝගියෙකුට කරන උපස්ථානයයි එක වෙයිද? නැහැ ඒක වෙනස්.

ඒ නිසා හැම වෙලාවෙම රෝගියෙකුට කරන උපස්ථානය කියලා කියන්නෙ ඒ රෝගී තැනැත්තාට කරන උපස්ථානයක්. නමුත් බුදුරජාණන් වහන්සේ කියපු දේ කරපු කෙනෙක්. ඒක තේරුම් ගන්න ඕනෙ. අපි රෝගියෙකුට උපස්ථාන කරන්නෙ නැත්නම් අපි බුදුරජාණන් වහන්සේ කියපු දේ කරන්නේ නැති කෙනෙක් බවටයි පත්වෙන්නේ. ඒ නිසා හැම වෙලාවෙම බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීමක් කියන කාරණය රෝගියකුට උපස්ථාන කිරීමෙන් ඉෂ්ඨ වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ කියපු දේ කරන්නේ නැති කෙනෙක් බවටයි එයා පත්වෙන්නේ. ඒක තේරුම්ගන්න ඕනෑ.

රෝගීන්ට උපස්ථාන කරන රෝහල් තියෙන නිසයි මේ මතක් කරන්නේ. මොකද මම අඳුනන එක නර්ස් නෝනා කෙනෙක් හිටියා. එයා දැන් නම් මිය පරලොව ගිහිල්ලයි ඉන්නේ. මම හිතන්නේ අවුරුදු 40 ක් විතර එයාගෙ සේවා කාලයක් තිබුණා. ඒ සේවා කාලය

පුරාවටම එයා පන්සල් ගියේ නැහැ. පන්සලෙන් දානයක් ආවොත් සල්ලි යවනවා. එයා හැම වෙලේම උදම් ඇණුවේ මම රෝගීන්ට කරන දේ මට ප්‍රමාණවත් කියලා. නෑ නෑ මම මෙච්චර කරනවා. ඕටී ගන්නෙ නැතුව 6 ට ඕෆ් වෙලා 9 වෙනකම් රෝගීන් බලනවා. මම මෙච්චර දේවල් කරනවා. මම මෙච්චර උපකාර කරනවයි කියලයි හිටියෙ. නමුත් ඒ නිසාම එයා තෙරුවන් සරණෙ පිහිටියෙ නැහැ. සිල් සමාදන් වෙන්න ගියෙත් නැහැ. එයා බුදුරජාණන් වහන්සේගේ සරණින් බැහැර වෙලා රෝගීන්ගේ සරණ සොයා ගෙන තමයි ගියෙ. නමුත් මේ අම්මා විශ්‍රාම ගිහිල්ලා අවසානයේ අසනීප වුණා. මම දන්න තරමින් මාස 9 කට වඩා අධික කාලයක් දැඩි ආකාරයෙන් රෝගී වෙලා ඇඳේ සිටියා. ඉතාමත් දුඃඛිත ආකාරයෙන් රෝගී වෙලා ඇඳේ හිටියා. නමුත් ඒ අවස්ථාවල දී එයාට මතු කරල ගන්න කුසලයක් තිබුණේ නැහැ. මොකද තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව කියන්නේ සීලය කියන්නෙ, අයෝමිය ශක්තීන්, බලයන්.

ඒ නිසා රෝගියෙකුට උපස්ථානය කරනවා කියන කාරණය ශක්තිමත් කුසලයක් ලෙස අපට මතුකර ගන්න බැහැ. මේක තේරුම් ගන්න ඕනෙ. එහෙමනම් රෝගී උපස්ථානය හැම වෙලාවෙම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ශක්තිමත් කර ගන්න ඕනෙ. ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ශක්තිමත් වෙලා ශීලයෙන් ශක්තිමත් නම් අන්න රෝගී උපස්ථානය ශක්තියක් වෙලා එනවා.

ඒ නිසා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින් බැහැර වෙලා, ශීලයෙනුත් බැහැර වෙලා, අපි හිතනවනම් රෝගී උපස්ථානය තුළින් පමණක් මට සුගතිය සකස් වෙයි කියලා ඒක නම් කවදාකවත් සිද්ධ වෙන්නෙ නැහැ. මොකද මං හොඳටම දන්නවා අර මැණියන්ට ඒක සිද්ධ වුණේ නැහැ. අවසානෙ මැරෙන වෙලාවෙ එයාට මතු කරගන්න ශක්තිමත් කුසලයක් තිබ්බේ නැහැ. එයා ප්‍රමාද භාවයට පත්වුණා.

ඒ නිසා නිරතුරුවම බුදුරජාණන් වහන්සේගේ සරණ තුළටම එන්න. ශීලයේ සරණ තුලටම එන්න. එහෙම ඇවිල්ලා රෝගීන්ගේ උපස්ථානය සිද්ධ කරන්න. ඒ තුළින් එය ශක්තියක් බවට පත් කර ගන්න පුළුවන්.

**<u>ප්‍රශ්නය</u>**

***02. අප සිත තුළ මතුවෙන්නා වූ ආවේගශීලී භාවය සමග ධර්මය මුසු කරන්නේ කෙසේදැයි පහදා දෙනු මැනවි ස්වාමීන් වහන්ස !***

**<u>පිළිතුර</u>**

ආවේගශීලී භාවය කියන්නේ ද්වේශය ව්‍යාපාදය කියන කාරණයම නේද? චංචල ස්වභාවය. ඉතිං අපි දකින්න ඕනෙ නිරතුරුවම මේ ද්වේශය, ව්‍යාපාදය කියන්නෙ ඵස්සය කියන කාරණය. ඵස්සය කියන්නෙ කාරණා තුනක් එකතු වෙනවා. මොකක්ද කාරණා තුන. අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඥානයත්. අන්න ද්වේශය සකස් වෙනවා. කනත්, බාහිර රූපයත්, විඥානයත් එකතු වෙනවා. අන්න ද්වේශය සකස් වෙනවා. එහෙමනම් ද්වේශය කියන්නෙ මේ කාරණා තුනයි. දැන් මම මෙතන හොඳට වාඩි වෙලා ඉන්නවා. වාඩි වෙලා ඉන්නකොට ඔන්න අකමැති රූපයක් එනවා. අකමැති රූපයක් දැක්කා කියන්නේ මොකක්ද ඇහැ ආධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඥානයත් එකතු වුණා. ඵස්සය ළඟදීම ඵස්සය නිත්‍ය වශයෙන් ගන්නවා. අන්න ද්වේශය සකස් වෙනවා. එහෙමනම් ද්වේශය කියන්නේ, ව්‍යාපාදය කියන්නේ, මේ චංචල ස්වභාවය කියන්නෙ මොකක්ද, අපි නිරතුරුවම ඵස්සය ළඟදී ඒ රූපය නිත්‍ය වශයෙන් ගන්නවා. මම මෙතන වාඩි වෙලා ඉන්නවා. මට කවුරු හරි පිටි පස්සෙ ඉඳන් බනිනවා. බනින වචනත් ඇහෙනවා. බනින කෙනත් මට දැනෙනවා. මම ඇසුනා කියන තැන නවතිනවා. ප්‍රශ්නයක් වෙනවද? නැහැ මට බනිනවා ඇහෙනවා. නමුත් මම ඇසුනා කියන තැන නැවතුණා. ප්‍රශ්නයක් මතු වෙන්නෙ නැහැ. ඵස්සය ළඟ නැවතුණා. මම රූපයක් දකිනවා ඒක අකමැති රූපයක්. මම දැක්කා කියන තැන නවතිනවා. ඉන් එහාට යන්නෙ නැහැ. මට සිතුවිල්ලක් සකස් වෙනවා දැනෙනවා. මම දැනුනා කියන තැන නවතිනවා. ඉන් එහාට යන්නෙ නැහැ. ඒක තෘෂ්ණාවෙන් තෙත් කරන්නෙ නැහැ.

එහෙමනම් ද්වේශය, ව්‍යාපාදය, චංචල ස්වභාවය කියන්නෙ මොකක්ද? ඵස්සය. මේ කාරණා තුනක් එකතු වෙනවා. මේ කාරණා තුන එකතු වෙන මොහොතෙම අපි දක්ෂ වෙන්න ඕන මේ ඵස්සය අනිත්‍යයි කියලා දකින්න. ඊයෙ දවසේ කේන්තියක් ආවා කියලා හිතන්නකො. ඒ කේන්තිය අද තියෙනවද? නෑ. අද ඉඳන් මේ මොහොතෙ ඉඳන් ඊයෙ දවසේ ආව කේන්තිය දැක්කොත් එහෙම මොකද හිතන්නේ? අනේ අපරාදෙ මම ඊයේ කේන්ති ගත්තෙ කියලා. නමුත් බලන්න දැන් ඒ කේන්තිය ඔබට අයිති නැති වුණත්, ඊයේ කේන්තිය

නිසා සකස් කර ගත්තා වූ අකුසලය විපාකය පිණිස ඔබ පිටිපස්සේ තියෙනවා. එහෙමනම් බලන්න මේ ජීවිත කාලය තුළදී ඔබ කොච්චර නම් කේන්ති ගන්න ඇත්ද? නමුත් ඒ එකම කේන්තියක්වත් දැන් ඒ අතීතයට හිත යොමු කරද්දී ඔබට අයිති ද? නැහැ. කේන්තිය ඔබට අයිති නැති වුණත් ඒ කේන්තිය නිසා සකස් වුණා වූ අප්‍රමාණ අකුසල්, විපාකය පිණිස ඔබ පිටිපස්සෙ තියෙනවා, පින්වතුනි. ඒ නිසා හෙට කේන්තියක් සකස් වුණත්, ඔබ දකින්න මේ කේන්තිය මට අයිති නැහැ කියන කාරණය. මේක මට අයිති දෙයක් නෙවෙයි. මේක එස්සය නිසා සිද්ධ වෙන්නා වූ දෙයක්.

ඒ නිසා එස්සය ඔබ නිත්‍ය වශයෙන් ගන්න එපා. ඔබ හැම වෙලාවෙම දැක්කා කියන තැන නවතින්න. ඇසුණා කියන තැන නවතින්න. දැනුනා කියන තැන නවතින්න. ඒ කියන්නෙ එස්සය ළඟ ඔබ නවතිනවා, එස්සය ඔබ තෘෂ්ණාවෙන් තෙත් කරන්නෙ නැහැ. තෘෂ්ණාවෙන් තෙත් කළොත් තමයි ඒක සංස්කාරයක් බවට පත් කර ගන්නෙ. ඒ වගේම නිරතුරුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රූපය මාරයා හැටියට දකින්න කියලා. මොකද රූපය මාරයා හැටියට දකින්න අපි දක්ෂ නැහැ. දැන් එක මහත්තයෙක් ඇවිත් කිවුවා ''හාමුදුරුවනේ අපේ ගෙදෙට්ට ස්වාමීන් වහන්සේ නමක් ටිකට් පොතක් විකුණන්න ආවා. මේ ළමා නිවාසයකට ආධාරයක් පිණිස'' මේ මහත්තයා ටිකක් දෘෂ්ටිගත මහත්මයෙක්. මේ මහත්මයා මොකද කරලා තියෙන්නේ? මේ ස්වාමීන් වහන්සේට බැණලා එළවලා. ''ඔයගොල්ලන්ට සල්ලි පරිහරණය කරන්න බැහැ. මෙහෙම කරන්න බැහැ'' කියලා බැණල එළවගෙන තියෙනවා. බැනල එළෙව්වා විතරක් නෙමෙයි එයා මේක නැවත නැවත හැමෝටම කිය කියා තව තවත් සතුටු වෙනවා. ගැටෙනවා.

දැන් බලන්න කොයි සා අකුසලයක් ද මේ මහත්තයා සිද්ධ කර ගත්තෙ කියලා. ස්වාමීන් වහන්සේගේ වැරැද්දක් තියෙන්න පුළුවන්. නමුත් ස්වාමීන් වහන්සේලාගේ වැරදි හැදීම ගිහි පින්වතුන්ලාට බාර කරලා නැහැ, බුදුරජාණන් වහන්සේ කොතැනකදීවත්. ඒ නිසා ඒ මහත්තයා මොකද මේ කර ගත්තේ? රූපය මාරයා හැටියට දැක්කා නම් ඒ මහත්තයා මොකද කරන්නේ ''හාමුදුරුවනේ මං ළඟ ටිකට් ගන්න සල්ලි නැහැ. ඒ නිසා මට ගන්න විදිහක් නැහැ'' කියලා හාමුදුරුවන්ව පිටත් කරලා අරිනවා. නැත්නම් ටිකට් එකක් ගන්න පුළුවන් නම් ටිකට් එකක් අරගෙන හොඳයි හාමුදුරුවනේ කියලා පිටත් කරලා අරිනවා. එහෙමනම් ප්‍රශ්නයක් මතු වෙනවද? නැහැ ඇයි එහෙම ප්‍රශ්නයක් මතු කර ගත්තෙ රූපය මාරයා හැටියට දැක්කේ නෑ. බුදුරජාණන් වහන්සේ කියනවා මගේ රූපයත් මාරයා හැටියට

දකින්න කියලා. මොකද එහෙම නැත්නම් ඒ රූපය නිසා ඔබ අප්‍රමාණ අකුසල් සිද්ධ කර ගන්නවා පිංවතුනි. ඒ නිසා අපි ඉදිරියට මොන රූපයක් ආවත්, එයා තරහකාරයෙක් වෙන්න පුළුවන්, මිත්‍රයෙක් වෙන්න පුළුවන්, යාළුවෙක් වෙන්න පුළුවන්, හැම වෙලාවෙම අපි දක්ෂ වෙන්න ඕනෙ, රූපය මාරයා හැටියට දකින්න. දැන් ඔබ අකමැති කෙනෙක් ඔබ ඉස්සරහට එනකොට ඔය එන්නේ මාරයා කියලා, මේ එන්නේ මාරයා කියලා දැක්කා නම් ඔබ සූදානම් වෙනවා මං මෙයා නිසා කේන්තිය සකස් කර ගන්නෙ නැහැ කියලා.

ඒ නිසා එක පැත්තකින් රූපය මාරයා විදිහට දකිමින් ඔබ හික්මෙනවා. අනික් පැත්තෙන් කේන්තිය කියන්නෙ ඵස්සය, ඵස්සය නිත්‍ය වශයෙන් ගන්නෙ නැතුව ඵස්සයෙ අනිත්‍ය භාවය දකිමින් කේන්තිය මඟ හැරලා යන්න. එහෙම නැත්නම් ඇසුණා කියන තැන ඔබ නවතින්න. දැනුණා කියන තැන නවතින්න. දැක්කා කියන තැන නවතින්න. ඉන් ඉස්සරහට යන්න එපා පින්වතුනි. ඒ නිසා කොයි ආකාරයෙන් හෝ ඔබ ද්වේශය කියන කාරණයෙන් මඟහැර යන්න. ලෝභ, ද්වේශ, මෝහ කියලා කියන්නේ බලවත් අකුසල මූලයන් පින්වතුනි. මොකද බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ කාය කර්ම, වචී කර්ම වලට වඩා මනෝ කර්ම බලවත් කියලා. මේ මනෝ කර්ම කියන්නෙ මොකක්ද? අකුසල මූලයන්. අකුසල මූලයන් කියන්නෙ මොනවද? ලෝභ, ද්වේශ, මෝහ. ඔබ කොච්චර දවස ගානේ සිල් පද පහ සමාදන් වුණත්, සීලයට වටිනාකමක් දෙමින්, සිල් සමාදන් වුණත් ඔබ ලෝභ, ද්වේශ, මෝහ සිතුවිලි ඇති කර ගන්නවා නම් ඔබ සමාදන් වන්නා වූ සීලය හැම මොහොතෙම ඔබ දුර්වල කර ගන්නවා පින්වතුනි. සීලයේ අර්ථය ඔබට මතු කරලා දෙන්නේ නැහැ. මොකද සීලය තුළින් රැකෙන කාය කර්ම, වචී කර්ම වලට වඩා මනෝ කර්මයි බලවත් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙමනම් ඔබ සිල් සමාදන් වෙලා සිල්පද කොච්චර ආරක්ෂා කළත්, ඔබ ලෝභ, ද්වේශ, මෝහයන් ජීවිතය තුළින් සිද්ධ කර ගන්නවා නම් ඒ කරන මොහොතක් පාසා ශීලයේ ශක්තිය ඔබ දුර්වල කර ගන්නවා පින්වතුනි.

ඒ නිසා ද්වේශය ජීවිතයට එන්න දෙන්න එපා. ද්වේශය කියන්නෙ හරි භයානක තැනක් පින්වතුනි. අපි ද්වේශය ජීවිතය තුළින් පුරුදු කළොත්, සමහර විට දොස්තර මහත්මයා ඉන්ජෙක්ෂන් එකක් ගහනකොට ඒ මොහොතේම ද්වේශය සකස් කරගෙන මැරෙන්න පුළුවන්. ඒ නිසා ද්වේශය ජීවිතයට පුහුණු කරන්න එපා. මොකද ද්වේශය අයිති යක්ෂයාටයි. ඒ වගේම තිරිසන් ලෝකයටයි, සර්ප කුල වලටයි ද්වේශය අයිති. භයානක

අකුසලයක් ද්වේශය. ඒ නිසා හැකිතාක් මේ ද්වේශය සංස්කාරයන්ගේ ඒ තියෙන්නා වූ විෂම බව දැකලා අයින් කර ගැනීම අපිට යහපතක්ම වෙනවා.

**<u>ප්‍රශ්නය</u>**

***03. බොහෝ අය මරණින් පසු ප්‍රේත ආත්මභව වල උපදිනවා කියනවා. ඒ අයගෙන් සිදුවන කරදර වලින් මිදෙන්නේ කොහොමද ස්වාමීන් වහන්ස?***

**<u>පිළිතුර</u>**

ප්‍රේතයන්ගේ කරදරවලට, බලවේග වලට භය වෙන්න ඕනෙ ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක නැත්නම් පමණයි. ඒක හොඳට තේරුම් ගන්න ඕනෙ. යමෙක් තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තියෙනව නම්, තමන් සීලයෙන් පරිපූර්ණ නම්, ඒ ගොල්ලන්ට භය වෙන්න දෙයක් නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනවා මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨ ආරක්ෂාව ගැන. දැන් අපි ආරක්ෂාව කියලා කියන්නේ මොකක්ද? ඒ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෝ ඉන්නවා තුවක්කු පිස්තෝල තියාගෙන. මේවනෙ ආරක්ෂාව. නමුත් බුදුරජාණන් වහන්සේ කියන ආරක්ෂාව මේක නෙමෙයි. බුදුරජාණන් වහන්සේ මේ ලෝකේ තියෙන ශ්‍රේෂ්ඨ ආරක්ෂාව කියලා කියන්නෙ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, සීලයත්, දානයත්. ඒ තුන තමයි මේ ලෝකේ තියෙන ශ්‍රේෂ්ඨ ආරක්ෂාව. දැන් ඔබේ නිවස තියෙනවා. ඔබේ නිවස තුළ ඔබ නිරතුරුවම දන් දෙනව නම්, නිවසේ අය සිල් ආරක්ෂා කරනව නම්, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තියෙනව නම් මොකද වෙන්නේ? ඔබ හරි පිරිසිදුයි. ඔබ පිරිසිදු වෙනකොට ඔබේ නිවසත් පිරිසිදුයි. අතුපතු ගානවා කුණු එකතු වෙන්නට දෙන්නෙ නැහැ. කිළුටු රෙදි ටික එකතු වෙන්න දෙන්නෙ නැහැ. මකුළු දැල් ටික බැඳෙන්න දෙන්නෙ නැහැ. ඒවා එකතු වෙන්න වෙන්න තමයි අමනුෂ්‍යයෝ ළං වෙන්නෙ. තමන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් සීලයෙන් පරිපූර්ණ වෙද්දී දන් දෙනකොට තමන්ගේ සිත ප්‍රභාෂ්වරයි පිරිසිදුයි.

ඒ නිසාම තමන්ගේ ගේ පරිසරයත් පිරිසිදුයි. අන්න ඒ පිරිසිදු භාවයට පත් වෙනකොට සම්‍යක්දෘෂ්ඨික බලවේග තමන් ළඟට එනවා. මේ මනුෂ්‍ය ලෝකයේ ඉන්නවා මහ විශාල සම්‍යක්දෘෂ්ඨික බලවේග. ඒ ගොල්ලො සම්‍යක්දෘෂ්ඨික යක්ෂයෝ. ඒ යක්ෂයෝ කියන්නේ පෙර ජීවිතවල ද්වේශය සහිත සමහර ස්වාමීන් වහන්සේලා අපවත් වුණාට පස්සෙ සම්‍යක්දෘෂ්ඨික යක්ෂයෝ වෙලා උපදිනවා. මේ යක්ෂයෝ කිව්වහම භය වෙන්න එපා. ඒ දිව්‍ය

ස්වභාවයේ යක්ෂයෝ. මහා තේජස්, මහා බලැති ආභරණ පැළඳ ගත්ත දිව්‍ය ස්වභාවයේ ඒ යක්ෂ අයට සේනාව සිය දහස් ගණනක් ඉන්නවා. එතකොට ඔබලා දන් දෙනකොට අර සතරවරම් දෙවියන්ගෙන් වරම්ගත්ත සම්‍යක්දෘෂ්ඨික යක්ෂයෝ තව තවත් තමන් ළඟට එනවා. තමන් ළඟට එනකොට මොකද කරන්නේ අමනුෂ්‍යයෝ පැනලා යනවා, මිථ්‍යාදෘෂ්ඨික බලවේග නැතුව යනවා. දැන් පොලිසියේ ඉන්න ඕ.අයි.සී මහත්තයා කසිප්පු විකුණන තැනට ආවොත් කසිප්පු විකුණන මහත්තයා ඉන්නවද නැහැ. එයා පැනලා යනවා. ඒ වගෙයි අර සම්‍යක්දෘෂ්ඨික බලවේග. දැන් ඔබ තෙරුවන් සරණින් සීලයෙන් පරිපූර්ණ නම් ඒ ගොල්ලො එනකොටත් අර ගොල්ලො යනවා.

දැන් සමහරු අපෙන් අහනවා හාමුදුරුවනේ ගෙදර පින් දෙන්න හොඳ නැහැ නේද? ගෙදර බුදුන් වඳින්න හොඳ නැහැ නේද? ගෙදර දන් දෙන්න හොඳ නැහැ නේද? කියලා ඒක සම්පූර්ණ මිථ්‍යාදෘෂ්ඨියක්. ඔබ ගෙදර පින් කරන්නේ නැත්නම් දන් දෙන්නේ නැත්නම්, සීලයක් ආරක්ෂා කරන්නේ නැත්නම් ගෙදරත් අපිරිසිදුයි, පරිසරයත් අපිරිසිදුයි. ඔබත් අපිරිසිදුයි. එහෙම තැනක දී මිථ්‍යාදෘෂ්ඨික බලවේගයි ඇවිල්ලා පිරෙන්නේ. මිථ්‍යාදෘෂ්ඨික බලවේගයයි. ඒ නිසා ඔබ පින් කරන කොට, දන් දෙනකොට, සිල් රකිනකොට අර සම්‍යක්දෘෂ්ඨික බලවේග තමන් ළඟට එනවා. ඒ ගොල්ලො ඔබව ආරක්ෂා කරනවා. ඔබලා වාහනේ නැඟලා යනකොට ඒ ගොල්ලො වාහනේ නැඟලා යනවා. ඔබලාට පේන්නේ නැහැ. ඔබලා කාර්යාලයට යනකොට ඒ ගොල්ලො කාර්යාලය තුළ ඉන්නවා. ඔබට පේන්නේ නැහැ. ඔබට අනතුරක් වෙන්න යනව නම් ඒක වළක්වනවා. ඔබට ඒ හිත වළක්වනවා දැන් යන්න එපා කියලා. ඒගොල්ලන්ට ඒ දේ කරන්න පුළුවන්. ලිස්සලා කකුල වද්දලා කකුල තුවාල කරලා හරි ගමන ප්‍රමාද කරනවා. එතකොට එහෙමනම් එම බලවේග තමන් ළඟට ආවේ කුමක් නිසාද? තෙරුවන් කෙරෙහි දානයත්, සීලයත්, ශ්‍රද්ධාවත් නිසා.

ඒ නිසා ඔබ දක්ෂ වෙන්න ඕනෙ තෙරුවන් කෙරෙහි සීලයත්, දානයත්, ශ්‍රද්ධාවත් ජීවිතයෙ ආරක්ෂකයා කර ගන්න. ඔබ තෙරුවන් කෙරෙහි සීලයත්, දානයත්, ශ්‍රද්ධාවත් ඔබේ ජීවිතයේ ආරක්ෂාව කර ගත්තොත් ඔබේ මේ ජීවිතය විතරක් නෙමෙයි ආරක්ෂා වෙන්නේ. ඔබේ පරලොව ජීවිතයත් ආරක්ෂා වෙනවා. නමුත් ඔය ආරක්ෂාව යොදා ගෙන ආරක්ෂක භටයෝ සිය දහස් ගණනක් යොදා ගෙන මේක තමයි සැබෑ ආරක්ෂාව කියලා හිතාගෙන යමෙක් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැරව යනව නම්, ඒ කොච්චර ආරක්ෂා තිබ්බත්

මැරෙන මොහොතේ සතර අපායටයි යන්නේ. සැබෑ ආරක්‍ෂාව නම් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවයි, සීලයයි, දානයයි.

<u>ප්‍රශ්නය</u>

***04. අටමහ කුසල් ගණයට අයත් වන කඨින පූජාව සිදුකරන ලද පින්වතුන්ට ලැබිය හැකි කුසලානිසංසයන් / මාර්ගඵල ආදිය පිළිබඳව අප දැනගන්නට කැමතියි ස්වාමීන් වහන්ස. ඒවගේම අපගේ අතිරික්ත ධනය මහත්ඵල මහානිසංස හිමිවන ලෙස ආයෝජනය කළ හැක්කේ කෙසේද යන කාරණය පැහැදිළි කර දෙන්න ස්වාමීන් වහන්ස,***

<u>පිළිතුර</u>

කඨින චීවර පූජා කිරීම අටමහ කුසලයකට අයිතියි. අපි කවදාහරි දීර්ඝායුෂ ලබල අපි මැරෙන වෙලාවේ මේ උතුම් කුසලය සිහිපත් වුනොත් සශ්‍රීක දිව්‍යතලයක උපත සකස් වේවි. ඒ කියන්නෙ ඒ වෙලාවෙ මේ කඨින වස්ත්‍ර පූජාව සිහිපත් වෙන්න ඕනෑ. එහෙම නැතුව හරියන්නේ නැහැ. අපි කඨින වස්ත්‍රයක් පූජා කරල මැරෙන වෙලාවෙ දි ඉඩකඩම් කෙරෙහි තෘෂ්ණාවෙන් මැරුණොත් අපි ප්‍රේතයෙක් වෙලා උපදිනව. ඒක ඉතින් අහන්න දෙයක් නෑ. කඨින වස්ත්‍ර පූජා කරල තියෙද්දිත් අපට මතක් වුණේ අපි දුන්නා වූ වෙනත් දානයක් නම් ඊට අදාළව දිව්‍ය තලයක උත්පත්තිය සකස් වෙනව. ඒ සකස් වුනාට පස්සෙ කඨින චීවර පූජාවේ විපාක එයාට ලැබෙන්න පුළුවන්. ඒ නිසා මැරෙන වෙලාවෙ දි අපි දක්‍ෂ වෙන්න ඕන කඨින වස්ත්‍රය පූජා කළා වූ කුසලය මතු කරල ගන්න. කඨින වස්ත්‍ර පූජාවේ කුසලය අපි මතු කරල ගත්තොත් ලැබෙන්නා වූ දිව්‍ය ජීවිතය අවුරුදු ලක්‍ෂ ගණන් දීර්ඝ වූ දිව්‍ය සැපයක් කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. නමුත් අර කුසලය මතු කරල ගන්න අපි දක්‍ෂ වෙන්න ඕන. ඒ දිව්‍ය සැපය නිත්‍ය වූ සැපයක් නෙවෙයි. එය අනිත්‍ය වූ දෙයක්. ඒ නිසා අපි දක්‍ෂ වෙන්න ඕන කඨින වස්ත්‍රයක් පූජා කරල තියෙනව නම් මැරෙන වෙලාවේ අපිට ඒ කඨින වස්ත්‍ර පූජාව සිහිපත් වුනොත් ඒ සිත අනිත්‍යයි කියල දකින්න. ඒ කුසල් සංස්කාරය අනිත්‍යයි කියල දකින්න. අනිත්‍යයි කියල දකින මොහොතේ ම අපි ධර්මයයි දකින්නෙ. ඒ වගේම මාර්ගඵල ලාභී දෙවියෙක් දිව්‍යාංගනාවක් වෙලයි උත්පත්තිය සකස් කර ගන්නෙ.

ඒ නිසා නිරතුරුවම අපි කරන්නා වූ පින්කම විදර්ශනා නුවණින් දකින තැනයි ඒ පින්කමේ සැබෑම ඵලය, සැබෑම හරය අපේ ජීවිතයට එකතු කර ගන්නෙ.

ඇසළ පුන් පොහෝ දවසෙන් පස්සේ අපිට වස් තුන් මාසය එළඹෙනව. මේ වස් තුන් මාසය කියන්නෙ එක පැත්තකින් මේ උතුම් උපසම්පදා භික්ෂූන් වහන්සේලා, ඒ උතුම් ප්‍රාතිමෝක්ෂයන් ආරක්‍ෂා කරගෙන ජීවත් වෙන්නා වූ මාස තුනක්. ඒ වගේම ඒ උතුම් ප්‍රාතිමෝක්ෂයන් ආරක්‍ෂා කරගෙන මේ ශීල සමාධිය ප්‍රඥා මාර්ගයෙන් උතුම් අධිගමයන් කරා යන්න උත්සාහ ගන්න භික්ෂූන් වහන්සේලාට, සිවුපසෙන් ඇප උපස්ථාන කරල ගිහි පින්වතුන්ලාත් අප්‍රමාණ කුසල් රැස් කරගන්නා වූ මාස තුනක්. ඒ නිසා මේ වස් මාස තුන කියන්නෙ ගිහි පින්වතුන් සියලුදෙනාට අප්‍රමාණ කුසල් නිධියක් මතුකර ගන්න අවස්ථාවක් ලැබෙන මාස තුනක්. මේ මාස තුන තමයි සෑම උපසම්පදා ස්වාමීන් වහන්සේ නමක්ම තමන්ගේ ශීලයන් වඩාත් ශක්තිමත් ආකාරයෙන් පවත්වාගෙන යන්නෙ. ඒ ශක්තිමත් ආකාරයෙන් ශීලයන් පවත්වාගෙන යන්න, පවත්වාගෙන යන්න ඒ අයට ගිහි පින්වතුන්ලා දෙන්නා වූ දානයේ ආනිසංස වැඩියි. ඒ නිසා ගිහි පින්වතුන්ලා හැටියට නිරතුරුවම දක්‍ෂ වෙන්න මේ මාස තුනේ දි මේ සම්මා සම්බුද්ධ ශාසනයෙන් ගන්න තියෙන උපරිම කුසල් පක්‍ෂය මතු කරල ගන්න.

මොකද අපි යම් ධනයක් තැන්පත් කරල වැඩිම ප්‍රතිලාභයක් ලබන්න පුළුවන් එකම තැනයි තියෙන්නෙ. ඔබට යම් ධනයක් තියෙනව නම් ඒ ධනය තැන්පත් කරල වැඩිම ප්‍රතිලාභයක් ලබන්න පුළුවන් එකම තැන තමයි මේ සම්මා සම්බුද්ධ ශාසනය. සම්මා සම්බුද්ධ ශාසනයේ තැන්පත් කරන සෑම ධනයක්ම සෑම රුපියලක්ම මේ ලෝකයේ ඉහළම ප්‍රතිලාභයන් සකස් කරල දෙනව. එක්තරා මහත්මයෙක් හිටිය. අප්‍රමාණ ධනයකට හිමිකම් කියපු මහත්මයෙක්. මේ මහත්මයා කල්පනා කරනව දැන් මේ මගේ ධනයට මොකද කරන්නෙ කියලා. බැංකුවක තැන්පත් කරල ප්‍රතිලාභයක් ලබනව කියල කල්පනා කරල බැංකු කීපයකටම යනව. එක බැංකුවක් 9% ක්, තව බැංකුවක් 10% ක් තවත් එකක් 11% ක් පොලී දෙනව කියනව. නමුත් මේ පොලිය ඒ මහත්තයා ලබන ආදායම් සමඟ සසඳලා බලද්දී සොච්චම් මුදලක්. එයා හිතනව මගේ මේ මුදල් වලට ලැබෙන මේ ප්‍රතිලාභය මට මදි. එයා කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන කෙනෙක්. සද්ධර්මය ශ්‍රවණය කරන කෙනෙක්. නුවණින් මෙනෙහි කිරීමට දක්‍ෂ කෙනෙක්. ඒ නිසාම එයා දකිනව එයාට මතක් වෙනව බුදුරජාණන් වහන්සේගෙ කාලයේ සිදු වූ සිදුවීමක්.

දිරාගිය පැල්පතක එක් දිළිඳු මනුස්සයෙක් ඉතා අපහසුවෙන් ආර්ථික දුෂ්කරතා මැද දිරාගිය බිරිඳත් සමග ජීවත් වෙනව. රස්සාවක් නෑ. ජීවත් වෙන්න බැරි කම නිසාම මේ

පින්වත් අසරණ මනුස්සයා රැකියාවක් හොයාගෙන නගරයට යනවා. යන වෙලාවෙ බිරිඳ බත් මුලක් බැඳල දෙනව මගදි කන්න කියලා. ඒ බත් මුලේ තියෙන්නෙ බත් ටිකකුයි කරකොළ මැල්ලුමකුයි විතරයි. ඊට වඩා දෙයක් නැහැ. කැලය මැද්දෙන් යද්දි කුසගිනි දැනිල බත්මුල ලිහාගෙන කනව. බත් මුලෙන් භාගයක් කාල ඉවර වෙනකොට මෙතනට ස්වාමීන් වහන්සේ නමක් වඩිනව. ඒ අනුරුද්ධ මහරහතන් වහන්සේ. මේ මනුස්සය දන්නෙ නෑ මේ රහතන් වහන්සේ නමක් කියල. පිණ්ඩපාතයට වැඩ ඉන්න කොට මේ මනුස්සය හිතනව මම කනවට වඩා ඉතුරු බත් ටික ස්වාමීන් වහන්සේට පූජා කරන එක හොඳයි කියලා.. ස්වාමීන් වහන්සේට බත්මුලේ ඉතුරු කොටස පූජා කරනව. ස්වාමීන් වහන්සේ පින්දීල වඩිනව. මේ මනුස්සයා අඩ බඩගින්නේ එහෙමම නිදා ගන්නව. සර්පයෙක් දෂ්ඨ කරනව. මැරෙන වෙලාවෙ සිහිපත් වෙන්නෙ ස්වාමීන් වහන්සේට දුන්නු දානය. අනුරුද්ධ රහතන් වහන්සේ අසූ මහ ශ්‍රාවකයන් වහන්සේලාගෙන් කෙනෙක්. මැරෙන වෙලාවෙම මේ පුද්ගලයා ඕපපාතිකව සශ්‍රීක දිව්‍ය තලයක සශ්‍රීක දෙවියෙක් වෙලා උපදිනව.

එතකොට අර මුලින් කියපු ධනවත් මහත්මයා කල්පනා කරනව තමන් කාල ඉතුරුවෙච්ච බත්මුල දානය දීල, එහෙම නැත්නම් සම්මා සම්බුද්ධ ශාසනයේ තැන්පත් කරල අර තරම් සශ්‍රීක දිව්‍ය උපතක් අර දුප්පත් අසරණ මනුස්සය ලබාගත්ත කියලා. මේ මහත්තයා තීරණය කරනව මගේ ධනයත් මම සම්මා සම්බුද්ධ ශාසනයේ තැන්පත් කරනවා කියලා, එයා ඒ සියලුම ධනය සම්මා සම්බුද්ධ ශාසනයෙ තැන්පත් කරනව. දානය උදෙසා, පන්සල් හැදීම උදෙසා, ආරණ්‍ය සේනාසන හැදීම උදෙසා සියලු ධනය වියදම් කරනවා. ඉන්පස්සෙ කරන ලද පින්කම් දිහා බලල සතුටින් ජීවත් වෙනව.

මෙහෙම ජීවත් වෙනකොට එක්තරා අවස්ථාවක බරපතල රිය අනතුරකට ලක්වෙනව. ඒ රිය අනතුරේ දි මේ මහත්තයා ගමන් කළ වාහනය ප්‍රයෝජනයට ගන්න බැරි තරමට අබලන් වෙනවා. ඒ සා බරපතල රිය අනතුරක් සිද්ධ වෙද්දිත් ඒ මහත්තයාට රුපියල් දහයක ප්ලාස්ටර් කෑල්ලක් දාන්න තරම් වත් පුංචි තුවාලයක් සිදුවුනේ නැහැ. දැන් බලන්න සම්මා සම්බුද්ධ ශාසනයේ ධනය තැන්පත් කරල මේ ජීවිතයේ දීම ලැබුවා වූ එක ප්‍රතිලාභයක්. වාහනය අයින් කරන්න තරම් බරපතල රිය අනතුරකට පත් වෙලත් ප්ලාස්ටර් කෑල්ලක් දාන්න තරම් වත් තුවාලයක් නැහැ. පසුකාලීනව මට ඒ මහත්තයා මුණගැසුණ වෙලාවක මම ඇහුව ''මහත්තයා අර සා බරපතල අනතුරක් සිද්ධ වෙන වෙලාවෙ මහත්තයට මොනවද දැනුනෙ'' කියලා. මොකද වාහනය දෙතුන් පාරක් පෙරලිලා, ගිහිල්ලත් මොකක්ද දැනුනෙ

කියල ඇහුවම ඒ මහත්තය කිව්වෙ ''හාමුදුරුවනේ මට කිසිම දෙයක් දැනුනෙ නැහැ. කිසිම දෙයක් හිතුනෙත් නැහැ'' කියලා. ''ඒ අනතුර සිද්ධ වෙන වෙලාවෙම ප්‍රභාෂ්වර සුදු ආලෝකයක් මම දැක්ක. ඒ ආලෝකයේ ආශ්වාදය විඳිමින් හිටිය මිසක් මොකක්ද වුනේ කියල මම දන්නෙ නැහැ.'' මොකක්ද ඒ දැක්ක ප්‍රභාෂ්වර සුදු ආලෝකය? සශ්‍රීක දිව්‍ය සංඥාවක්. මොකද කුසලයට අදාළව ප්‍රතිලාභයක් එයා ලැබුවෙ. ඒ සශ්‍රීක දිව්‍ය සංඥාව දකිද්දි එයා එතන මැරුණ නම් ඒ වෙලාවෙම සශ්‍රීක දිව්‍ය තලයක උත්පත්තියක් ලබනව. බලන්න සම්මා සම්බුද්ධ ශාසනයේ ධනය තැන්පත් කරල එයා මේ ජීවිතයෙදිම උපරිම ප්‍රතිලාභය ලැබුව.

ඒ නිසා මේ වස් තුන් මාසය කියන්නෙ මේ සම්මා සම්බුද්ධ ශාසනයේ ඇතිතාක් ධනය තැන්පත් කිරීමට ලැබෙන අවස්ථාවක්. නමුත් බලන්න නිකම් හරි අර මහත්තයා කල්පනා කළා නම් ''නෑ මම මේ සල්ලි බැංකුවක තැන්පත් කරනවා කියලා මොකක්ද වෙන්නෙ? මැරෙන වෙලාවෙ බැංකු ගිණුම් පොත සිහිපත් වෙලා ඒ මොහොතේම ඒ බැංකුවේම පෙරේතයෙක් වෙලා උත්පත්තිය ලබනව. ලංකාවේ තියෙන ආයතන වලින් වැඩියෙන්ම පෙරේතයො ඉන්න ආයතනය තමයි බැංකුව කියන්නෙ. මොකද මුදල් තැන්පත් කරල තියෙන මහත්තුරු නෝනල (සමහර විට විශාල මුදල් ප්‍රමාණයක් තැන්පත් කරලා තියෙනව වෙන්න පුළුවන්) මැරෙන වෙලාවෙ බැංකු පොත උපාදානය වෙලා ඒ බැංකුවේම පෙරේතයෙක්, පෙරේතියක් වෙලා උත්පත්තිය සකස් කර ගන්නව. එහෙම ඉපදිලා ඔන්න දැන් මරණයේ කටයුතු ඔක්කොම සිද්ධ කලාට පස්සේ නෝන දිවුරුම් ප්‍රකාශයක් අරගෙන ඇවිල්ල මරණ සහතිකය ඉදිරිපත් කරල අර ගිණුම එයාගෙ නමට හරව ගෙන සල්ලි ටික ගෙදර අරන් යනව. ඔන්න එතකොට අර පෙරේතයා ගැටිල ඒ නෝනත් එක්ක ගැටි ගැටී තමයි නෝනත් එක්කම බැංකුවෙ ඉඳල ගෙදරට යන්නෙ. මොකද මැරෙන වෙලාවෙ බැංකු පොතයි උපාදානය වුනේ.

එහෙමනම් බලන්න ඔබේ ධනයට කරන්න තියෙන සැබෑම ආයෝජනය තමයි සම්මා සම්බුද්ධ ශාසනය තුළ ඒ ධනය ආයෝජනය කිරීම. සම්මා සම්බුද්ධ ශාසනය තුළ ආයෝජනය කරන ධනයට තමයි මේ ලෝකයේ ඔබට සැබෑම ප්‍රතිලාභය අත්කරල දෙන්නෙ. ඒ නිසා මේ වස් තුන් මාසය තුළ ඔබ දක්ෂ වෙන්න ඕන හැකිතාත් පින්කම් තුලින් දානය තුලින් හැම දෙයක් තුලින්ම හැකිතාත් තමන්ගේ අතිරික්ත ධනය මේ සම්මා සම්බුද්ධ ශාසනයේ තැන්පත් කරන්න.

**<u>ප්‍රශ්නය</u>**

*05. ස්වාමීන් වහන්ස, අපි කරන ලද අකුසල් වල විපාක වශයෙන් තිරිසන් ලෝකයට වැටුණ අයෙකුට නැවත සුගතිගාමී වීමට නොහැකිද? ඒ වගේම ස්වාමීන් වහන්ස අපි සුරතල් සතුන් ඇති කිරීම පිළිබඳව ධර්මානුකූලව අපට ලබාදිය හැකි උපදෙස් මොනවාද?*

**<u>පිළිතුර</u>**

තිරිසන් ලෝකයට වැටුන සත්වයෙක් කල්ප ගණනකින් ගොඩ එන්නේ නැහැ. ඒක හොඳට තේරුම් ගන්න ඕනෑ. තිරිසන් ලෝකයට වැටුන කුරුල්ලා ගත්තත් වෙන යම් සතෙකු ගත්තත් උන් වැඩිපුරම ජීවත් වන්නේ ප්‍රාණඝාතයන් කරමිනුයි. ඉතා සීමිත සතුන් ගණනක් ප්‍රාණඝාතය නොකරනවා වෙන්න පුළුවන්. ඔය සතුන්ට තව සතෙක් මරණ, මරණ මොහොතක් පාසා අකුසල් චිත්තය සකස් වෙනවා. නමුත් එයා කර්මඵල විශ්වාස දන්නේ නෑ. ඒක දැනගත්තෙ නැති වුනත් ඒ සතුන්ටත් අනිවාර්යෙන්ම කර්ම විපාකය පොදුයි. ඒ නිසා මේ තිරිසන් සත්තු දුකෙන් දුකට වැටිලා කවදාහරි නිරයෙන්ම තමයි මතු වෙන්නේ. නමුත් යම් අවස්ථාවන් වල දී නිරයෙන් ගොඩ ආපු අවස්ථා තියෙනවා.

එක මහත්තයෙක් ඉන්නවා. එයා පෙර ජීවිතයේ අලියෙක්. මේ අලියා හීලෑ අලියෙක්. පන්සල් ආශ්‍රිතව හැදුනා වූ දේවාල ආශ්‍රිතව හැදුනා වූ අලියෙක්. ඔය පන්සල්, දේවාල ආශ්‍රිතව ඉන්න අලි ඇතුන්ට උදේ හවස බුදුන් වන්දනාව, චෛත්‍ය වන්දනාව කරවනව, ධාතු කරඬුව වඩම්මනව. ස්වාමීන් වහන්සේට වන්දනා කරනව. දහස් ගණන් ජනයා සාදුකාර දෙනව. ඉතින් මැරෙන වෙලාවෙ යහපත් චිත්තයක් සකස් වුනොත් එයා මනුස්ස ලෝකේ උත්පත්තියක් ලබනවා. එහෙම උපත ලැබූ මනුස්සයා හරිම කීකරුයි. නමුත් කේන්ති ගියහම එයාව නවත්වන්න කාටවත් බැහැ. ඒ මොකද පෙර අලි ජීවිතයේ තිබුණා වූ හුරුව එයාට ආව. ඔය ඇත් අතුරු සෙවනෙ ඇති දැඩි වෙන අලි පැටව් ඉන්නවානෙ. ඒවගේම සත්ව උද්‍යානවල ජීවත්වන සත්තු, ඒ අයට කන්න බොන්න දෙන්නෙ නාවන්නෙ මනුස්සයො. ඒ සතුන්ට වෙන සත්තු, තමාගෙ කුලයේම සත්තු පවා ආශ්‍රය කරන්න ලැබෙන්නේ නැහැ. ඒ අය මැරිල නැවත මනුස්ස ජීවිත ලබන්න තියෙන ඉඩකඩ වැඩියි.

තව මහත්තයෙක් ඉන්නවා එයා පෙර ජීවිතයේ ගොනෙක්. ඒ කියන්නේ ගෙදරක ඇති කළා වූ ගොනෙක්. රංචුවක හිටපු සතෙක් නෙවෙයි. සමහර මහත්තුරු ඉන්නවා

කරත්තේ බඳින ගෙදර ගොනාට සලකන්නෙ දරුවෙකුට වගේ. කරත්තෙ බැඳල බර ඇදල ගෙදර ආවට පස්සෙ ගොනාගෙ කකුල් තවන මහත්තුරු අපි දැකල තියෙනවා. දැන් කාලෙ නම් එහෙම නැතුව ඇති. තමන්ගෙ බත් පිඟානෙන් බත් කටක් කවනව. නිදාගන්න ඇතිරිල්ලක් පවා දාල දෙනව. මෙහෙම ලෙන්ගතුව හදන හරක් මැරෙන වෙලාවෙ ස්වාමියාව උපාදානය කරගන්න පුළුවන්. එහෙම උපාදානය වුනහම සමහර විට මනුස්ස ප්‍රතිසංධියක් ලබන්නත් පුළුවන්. එම නිවසේම ප්‍රේත උපතක් ලබන්නත් පුළුවන්.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ අපිව තිරිසන් සතුන්ගෙන් සම්පූර්ණයෙන්ම ඈත් කරල තියෙනව. කුටියෙ පරෙවි ජෝඩුවක්, ගේ කුරුලු ජෝඩුවක් ඉන්නව නම් අපට ඒ කුටියෙ ඉන්න බැහැ. කැපකරුට කියන්න ඕන මේගොල්ලො ඉවත් කරන්න කියලා. මොකද ඒ ගොල්ලො නිරතුරුවම කාමයෙහි හැසිරෙන සත්තු. ඒ සත්තු නිසා කුටියේ වැඩවසන භික්ෂූන් තුළ කාමය සකස් වෙන්න පුළුවන්. ඒ නිසා බුදුරජාණන් වහන්සේ අපි වළඳල ඉතුරු බත් ටික පවා සතෙකුට දාන්න කියන්නේ නැහැ. සතුන් නැති පොළොවකට දාන්න කියනව. මොකද සතෙකුට දැම්මොත් හෙට ඒ සතා නැවත එනව. අනිද්දට තව සත්තු දෙන්නෙක් එක්කයි එන්නෙ, ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියනව එහෙම ආවට පස්සෙ ස්වාමීන් වහන්සේලා තුළ කාම රාගය පහළ වෙන්න පුළුවන්. අතීතයේ එහෙම වෙලා තියෙනවා. බුදුරජාණන් වහන්සේ විනය පනවන්නෙ ඒකයි. අපේ පිටිපස්සේ බැල්ලියක් ආවත් බුදුරජාණන් වහන්සේ කියන්නෙ කාන්තාවක් හැටියට දකින්න කියලයි. මොකද රාගය කියන දේ කාන්තාව තුළවත් බැල්ලිය තුළවත් නෙවෙයි, ඒ රූපය තුලයි සකස් වෙන්නේ කියලා බුදුරජාණන් වහන්සේ කියනව. ඒ නිසා තිරිසන් සත්ව සංඥා වලින් බුදුරජාණන් වහන්සේ අපිව ඈත් කරල තියෙනව. ඒවගේම ගිහි පින්වතුන්ලාත් මේ තිරිසන් සත්ව සංඥාවලින් හැකි තරම් ඈත්ව ඉන්න ඕනෑ. මොකද බුදුරජාණන් වහන්සේ යමක් දේශනා කළා නම් එය නුවණින් දැකලයි දේශනා කරන්නේ. අපිට ප්‍රශ්නයක් ඇයි මේ තිරිසන් සත්වයින්ගෙන් අපිව ඈත් කරන්නේ කියලා, නමුත් බුදුරජාණන් වහන්සේ නුවණින් දකිනව මේ කාරණයේ තියෙන බරපතලකම.

දැන් අපේ ගෙවල්වල බල්ලො හදනව. පූසො හදනව. එතනින් ගියහම ටැංකි වල දාල මාළු හදනව. මේ සත්තු හැදුවහම දැන් ගෙදර ඉන්න පූසා, ගෙදර ඉන්න බල්ලා ලෙන්ගතු කාටද? ගෙදර ඉන්න නෝනට, මහත්තයට, දරුවන්ට. එයාගෙ අම්ම තාත්ත ඔක්කෝම ගෙදර ඉන්න අයමයි. වෙන කවුරුත් නැහැ. කන්නෙ බොන්නෙ එයාගෙ ගෙදර ජීවිතය එයමයි.

මෙහෙම සත්තු මැරෙන වෙලාවට ඒ ස්වාමියාව උපාදානය කරනව. ඒ ගෙදරම භූත සත්වයෙක් වෙලා උත්පත්තිය ලබනව.

දැන් අපිට පෙනෙන තිරිසන් ලෝකය වගේම අපිට නොපෙනෙන තිරිසන් ලෝකයකුත් තියෙනව. භූත අලි, භූත හරක්, භූත බල්ලො, භූත කුකුල්ලු ආදී හැම සතෙක්ම ඒ භූත ලෝකය තුළ සිටිනවා. භූත තලගොයා ජීවත් වෙන්නේ භූත මකුළුවාව මරාගෙන කාලා, ඒ ගොල්ලො එකිනෙකා මරාගෙන කනවා. ගෙදරක හදපු සුරතල් බල්ලා, පූසා ස්වාමියාව උපාදානය කරගෙන ඒ ගෙදරම භූත සත්ත්වයෙක් වෙලා උපදිනව. නමුත් ඒ භූත සත්ත්වයා අපේ ගෙදරක ඉන්නවා අපි දන්නේ නෑ. අපේ ඇඳ උඩ ඉන්නවා. කෑම මේසෙ කෑම ටික ලෙව කනවා අපි දන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ සතර අපාය පෙළ ගස්සන කොට මුලින්ම පෙළ ගස්සන්නේ කවුද? ප්‍රේතයා, මොකද ප්‍රේතයාට පින් අරගෙන නිදහස් වෙන්න පුළුවන්. දෙවනියට තමයි තිරිසන් සතාව දාන්නෙ. මොකද තිරිසන් සතාට පින් අරගෙන නිදහස් වෙන්න බෑ. මහත්තයාගෙ ගෙදර ප්‍රේතයෙක් ඉන්නවට මහත්තයා කැමතිද? මහත්තයගෙ නිදන කාමරේ, කෑම කාමරේ, සාලයේ, වැරැන්ඩාවේ ප්‍රේතයෙක් ඉන්නවාට කැමතිද? නෑ. එහෙමනම් අපි ඔය ගේ ඇතුලෙ තියාගෙන ඉන්න තිරිසන් සතා ප්‍රේතයාටත් වඩා අන්තයි. ඒකයි බුදුරජාණන් වහන්සේ කියන්නේ සත්ව සංඥාවෙන් අයින් වෙන්න කියලා.

මොකද මේකෙ භයානක තැනක් තියෙනවා. භයානක තැන තමයි මහත්තයො ගෙදර ලෙන්ගතුකමින් හදපු බල්ලා, පූසා, ස්වාමියා උපාදානය කරගෙන මැරිල භූත සත්වයෙක් වෙලා ගේ ඇතුලෙ ඉන්නවා. අපි දන්නෙ නෑ. අපිත් අසනීපයක් වෙලා, අසරණ වෙලා, සමහර විට මැරෙන්න පුළුවන්. මැරෙන වෙලාවෙ අපි සීලයෙන් පරිපූර්ණ නැත්නම් අපි මැරෙන වෙලාවෙ අපේ සිත දුර්වල වෙනව. දුර්වල වෙනකොට අර භූත සත්වයො අපි ඉස්සරහ පෙනී ඉන්නවා. පෙනී ඉන්නකොට අනේ මගේ බිලැකී නැත්නම් අනේ මගේ බූලා කියාගෙන උපාදානය කර ගත්තොත් අපිත් ගිහිල්ල එතනටම වැටෙනව. ඒකයි බුදුරජාණන් වහන්සේ තිරිසන් සතුන්ගෙන් අපිව ඈත් කරන්නෙ මහත්තයො. ඒ නිසා තිරිසන් සතා කියන සතා තිරිසන් ලෝකයෙදිත් දුකෙන් දුකටමයි යන්නෙ. එතනින් මිදිල භූත සත්ත්වයෙක් වුනොත් එතනින් දුකටමයි පත් වෙන්නෙ.

දැන් බලන්න ලොකු ගාණක් දීල අරගෙන ගෙවල්වල මාලු ටැංකි තියෙනව. මාලු කොච්චර විසිතුරුද? ලස්සනද? මොකක්ද මේ විසිතුරු භාවය කියන්නෙ. පින. මේ මාලු වෙලා උපදින්නේ මේ සල්ලිකාර නෝනල මහත්තුරුම තමයි. ඒගොල්ලො ගේ ඇතුලේ සාලෙ තියාගෙන මාලුවව හදනව. කෑම දානව. එයාගෙ හැසිරීම බලනව. පීනන හැටි දැකලා සතුටු වෙනවා. අපේ දොස්තර මහත්තුරු කියනව අධික රුධිර පීඩනයට, හදවත් රෝගී තත්ත්වයන්ට මේ දිහා බලන් ඉන්න එක හොඳයි කියලා. ඉතින් අරක බල බලා ඉන්නව. බල බලා ඉන්න ගමන් අපේ ඇස් දෙක එක පාරටම පියවුනොත් මාලු උපාදානය මතක් වුනොත් ඒ මාලුවාගේම බිත්තරයක නැවත උපත සකස් කර ගන්නවා. දැන් මේ හොඳට පින් කරපු මහත්තුරු. නමුත් ධර්මය දන්නෙ නැහැ. ඉතින් ඉපදුනේ විසිතුරු මාලුවෙක් වෙලයි. හැමෝම කැමතියි. හැමෝම ආදරෙයි. හැමෝම දකින්න ප්‍රියයි. ඒකයි කියන්නේ සත්ව සංඥාව කියන්නෙ භයානකම දෙයක්. ඒ භයානකම තත්ත්වය නිසයි බුදුරජාණන් වහන්සේ අපිව තිරිසන් සතුන්ගෙන් ඈත්කර තබන්නෙ.

ඒ නිසා ධර්ම මාර්ගය තුළ ගමන් කරන කෙනා තිරිසන් සතාට කන්න දෙන්න, බොන්න දෙන්න. නමුත් තිරිසන් සතා ගෙදර සුරතලෙක් බවට පත්කර ගන්න එපා. ඒ ධර්ම මාර්ගය තුළ ගමන් කරන කෙනා ඒක හොඳට හිතට ගන්න ඕනෑ.

<u>ප්‍රශ්නය</u>

***06. කෙනෙක් මිය ගියා ම ඒ කෙනාට ගන්ධබ්බ අවදියක් කියලා කාලයක් තිබෙනවාද? ස්වාමීන් වහන්ස ...?***

<u>පිළිතුර</u>

ගන්ධබ්බ අවදියක් කියන කාරණය බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ කොතනකවත් නැති දෙයක්. ගන්ධබ්බ අවධිය කියන එකට තවත් සමහරු කියනවා අන්තර් භවය කියලා. බුදුරජාණන් වහන්සේ පැහැදිලිව දේශනා කරනවා යමෙකු මිය යන මොහොතේ බැහැර වන විඤ්ඤාණය (සකස් වෙන චුති සිත) ප්‍රතිසන්ධි චිත්තයක් සකස් වෙන්නේ නැතුව එහෙ මෙහ පාවී පාවී ඉන්න ක්‍රමයක් නැහැ කියලා. විඤ්ඤාණය බැහැරට ගමන් කරද්දී ම තවත් රූපයකට බැස ගන්නවා කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. රූපයකට බැස ගැනීමකින් තොරව විඤ්ඤාණයක පැවැත්මක් නැහැ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ නිසා කොහේ හරි ඊ ළඟ මව් කුසක් හොය

හොයා විඤ්ඤාණය කැරකී කැරකී ඉන්නවා, මේක අන්තර් භවයක් කියලා ධර්මයක් බුදුරජාණන් වහන්සේ කොතනකවත් දේශනා කරලා නැහැ. ඒක සම්පූර්ණයෙන්ම බුදු දහමින් බැහැර කරනවා. නමුත් මෙතනදී මෙහෙම දෙයක් තියෙනවා.

පුද්ගලයෙක් ක්ෂණිකව මිය යද්දී ... (ඒ කියන්නේ අපි හිතමු කෙනෙක් තද නින්දෙදි මැරෙනවා , එහෙම නැත්නම් බෝම්බයකින් මැරෙනවා, එහෙම නැත්නම් දියේ පීනන්න ගිහින් ගිලිලා මැරෙනවා, එහෙම නැත්නම් පුංචි දරුවෙක් මැරෙනවා කියලා) ඒ අයට ශක්තිමත් කුසල් අකුසල් චිත්තයක් සකස් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ ආකාරයෙන් මැරෙන අය භූත ස්වභාවයේ සත්ත්වයන් ලෙස උත්පත්තිය ලබනවා. භූත ස්වභාවයේ සත්ත්වයන් කියන්නේ පාවී පාවී ඉන්න සත්වයන් කොටසක්. මේ අය යක්ෂයන් ප්‍රේතයන් වගේ පොළවෙ පය තියලා ඉන්න අය නෙවෙයි.

වයස අවුරුදු 75 ක විතර අම්මා කෙනෙක් මිය යනවා. ඒ අම්මා තද නින්දෙදි මිය යන්නේ. මිය ගියාට පස්සේ ඒ අම්මා ඒ අම්මාගේ ප්‍රමාණයේම පාවී පාවී ඉන්න භූත ස්වභාවයේ සත්වයෙකු බවටයි පත් වෙලා තියෙන්නේ. ඒක ජාතියක් (උපතක්), එයාටත් ඇස, කණ, නාසය. දිව, ශරීරය සහ මනස කියන ආයතන හය තියෙනවා. ඒ ආයතන හය බාහිර රූප එක්ක එස්ස වෙලා පංච උපාදානස්කණ්ධය තියෙනවා. ඒක භවයේ උපතක්. ඒ උපත අන්තර් භවයක් නෙවෙයි. මෙන්න මේ පාවී පාවී ඉන්න භූත සත්ත්වයාට තමයි හත් දවසේ පිංකම පාංශුකූල පිංකම වටින්නේ. එක පුංචි දරුවෙක් මිය යනවා. ඒ දරුවා බෝනික්කෙක් වගේ පාවී පාවී ඉන්නවා. පුංචි දරුවන්ට ශක්තිමත් කුසල් අකුසල් චිත්තයක් සකස් වෙන්නේ නැහැ. හත් දවසේ පිංකම, පාංශුකූල පිංකම ආදියේ දී නිදාගෙන ඉන්න දරුවෙකුට වතුර ටිකක් ඉස්සහම නැගිටිනවා වගේ ඒ අය ඒ පින උපාදානය කරගෙන ශක්තිමත් ජාතියකට (උපතකට) යනවා. මෙන්න මෙතන තමයි අන්තර් භවයක් කියලා වරද්දගෙන තියෙන්නේ.

එතන අන්තර් භවයක් නෙවෙයි. ඒක භවයේ උපතක්මයි. එයාටත් ඇස, කණ, නාසය, දිව, ශරීරය සහ මනස කියන ආයතන හය තියෙනවා. ඒ ආයතන හය බාහිර රූප එක්ක එස්ස වෙලා පංච උපාදානස්කණ්ධය තියෙනවා. ඒ උපතේ එයා දීර්ඝ කාලයක් ඉන්නේ නැහැ. නමුත් මාස 6 ක් වගේ කාලයක් කෙනෙක් එහෙම ඉඳලා තියෙනවා. එහෙම ඉඳලා ශක්තිමත් පින් නිසා ඊළඟ ප්‍රතිසන්ධියට එයා යනවා. එහෙම නැතුව කොතනකවත් බුදු දහමේ අන්තර් භවයක් කියලා දෙයක් සඳහන් වෙන්නේ නැහැ.

**<u>ප්‍රශ්නය</u>**

***07. නිර්මාංශ වීම ශීලයක්ද ස්වාමීන් වහන්ස?***

**<u>පිළිතුර</u>**

නිර්මාංශ වීම ශීලයක් නෙමෙයි. මස් මාළු නොකා ඉඳීම ශීලයක් වෙන්නෙ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ දේයි අපිට කියන්න තියෙන්නෙ. අපේ පෞද්ගලික අදහසක් අපට කියන්න බැහැ. බුදුරජාණන් වහන්සේ කියන්නේ කැමති කෙනෙක් මස් මාළු කන්න. අකැමති කෙනෙක් මස් මාළු නොකා ඉන්න. කාටවත් කන්න කියන්නෙත් නැහැ. බුදුරජාණන් වහන්සේ එපා කියන්නෙත් නැහැ. කෑම හෝ නොකෑම ශීලයක් වෙනවා කියන්නේ නැහැ. කැමති කෙනෙක් දන් දෙනකොට ස්වාමීන් වහන්සේලාට මස් මාංශ පූජා කරන්න. අකමැති කෙනෙක් පූජා නොකරන්න. කිසිම ස්වාමීන් වහන්සේ නමකට කටින් මට මස් මාළු ඕනෙ කියලා ඉල්ලන්න බැහැ. ඉල්ලනවා නම් ඒක ස්වාමීන් වහන්සේගේ දුර්වලතාවයක් මිසක් ධර්මයේ දුර්වලතාවයක් නෙමේ.

බුදුරජාණන් වහන්සේ කෙනෙක් සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් කොච්චර අප්‍රමාණ දුක් කන්දක් විඳගෙන සම්මා සම්බුද්ධත්වය ලබා ගත්තේ හුදු පින ගැන කියන්න නෙමේ. පින ගැන කියන්න නම් ක්‍රිස්තුස් වහන්සේත් ඉන්නවා. අල්ලාහ්තුමත් ඉන්නවා. ඒ ගොල්ලො පින ගැන කියනවා. නමුත් බුදුරජාණන් වහන්සේ කෙනෙක් පහළ වෙන්නේ මෝහයෙන් සත්ත්වයා මුදවලා ප්‍රඥාව කියන තැනට අරන් එන්න. ඒක තමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ. එතකොට ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ ඉඳගෙන අපි හුදු පින කියන තැන අල්ලගෙන ඉන්නවා නම් ඒක මහා අවාසනාවක්. ඒ නිසා කැමති නම් කන්න. අකමැති නම් නොකන්න.

මම ගිහි කාලයේ අවුරුදු පහක් විතර පැවිදි වෙන්න ඉස්සෙල්ලා මස් මාළු කැවෙ නැහැ. මට මාළු කෑල්ල දකිනකොට මාළු කුරියෙක් පේනවා. කුකුල් මස් කෑල්ල දකිනකොට කුකුළෙක් පේනවා. ඒ නිසා මස් මාළු කැවේ නැහැ. නමුත් පැවිදි වෙලා වෙන්වුනාට පස්සෙ අපිට තේරුණා මෙතන දෘෂ්ටියක් තියෙන්නෙ කියලා. ඒ නිසා දැන් මෙතන දානෙ වළඳනවා. දානේ වළඳනකොට බැදපු හරි, තිකන් හරි මාළු කුරියෙක් ඉන්නවා. නිර්මාංශ කෙනෙක් ඇවිල්ලා මට කියනවා හාමුදුරුවනේ හාමුදුරුවෝ මේ පවක්නේ කරන්නෙ, හාමුදුරුවෝ මේ සතෙක් කනවානෙ කියලා. එතකොට මම කියනවා නැහැ මෙතන මැරිච්ච සතෙක් නෑ. මේ

මාළුවා මේ වලාවේ දෙවියෙක් වෙලා ඉපදිලා ඉන්න පුළුවන්. මේ මාළුවා මේ වෙලාවේ මනුෂ්‍යයෙක් වෙලා ඉපදිලා ඉන්න පුළුවන්. මේ මාළුවා මේ වෙලාවේ නැවත මාළුවෙක්ම වෙලා ඉපදිලා ඉන්න පුළුවන්. එහෙමනම් අපි මේ රණ්ඩු වෙන්නෙ කොහෙ හරි ඉපදිලා ඉන්න සත්ත්වයෙක් වෙනුවෙන්. අපි මේ දෘෂ්ටිගත වෙන්නේ අපි මේ අකුසල් සිදුකර ගන්නේ කොහෙ හරි ඉපදිලා ඉන්න සතෙක් වෙනුවෙන්. ඒක තමයි මෝහයෙන් මිදිලා ප්‍රඥාව කියන කාරණය. ප්‍රඥාව මතුකරගන්නයි බුදුරජාණන් වහන්සේ කෙනෙක් අපිට පාර කියලා දුන්නෙ. නමුත් එතකොට ඔබ කියනවා නෑ හාමුදුරුවනේ මෙතන මැරිච්ච සතෙක් ඉන්නවා. මේ සතා මැරුවා. ඔව් මැරුවා. ඒ මැරුනේ සංස්කාර නිසා. එයා මැරෙන්න තිබ්බා. මම තව විනාඩි පහකින් මැරෙන්න තිබෙනව නම් ශක්‍රයාටවත් බැහැ ඒක වළක්වන්න. මම මෙතන අපවත් වෙනවා. මම තව අවුරුදු 20 ක් ජීවත්වෙනවා නම් ශක්‍රයාටවත් බැහැ ඒක වළක්වන්න. මම තව අවුරුදු 20 ක් ජීවත් වෙනවා. ඒ සංස්කාරයන්ට අදාළවයි ලෝකය පනවන්නෙ. එතකොට මාළුවා දැලට අහුවෙලා මැරුණේ එයා ඒ වෙලාවේ මැරෙන්න තිබුණා නිසා. එයා ඒ වෙලාවේ මැරුණේ නැත්නම් දැලට අහු වුණේ නැත්නම් ලොකු මාළුවෙක් එයාව ගිලලා මරාවි. මහ මුහුදේ අවුරුදු පහක් වයස මාළු නැද්ද? මහ මුහුදේ අවුරුදු විසි පහක් වයස මාළු නැද්ද? මහ මුහුදේ මම වගේ දහයක් පහළොවක් ලොකු මාළු නැද්ද? ඒ ගොල්ලො කොහොමද ඉන්නෙ? ඒක තමයි සංස්කාර, දීර්ඝායුෂ. මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයෙක් උපතේදීම මැරෙනවා. අවුරුදු පහේදී මැරෙනවා. අවුරුදු දහයේ දී මැරෙනවා. නමුත් අවුරුදු අසූවක් අනූවක් ජීවත් වෙන මනුෂ්‍යයෝ ඉන්නවා. ඒ හේතුඵල ධර්ම. සංස්කාර.

එතකොට මෙන්න මේ සංස්කාරයන්ට අනුව තමයි බුදුරජාණන් වහන්සේ ලෝකයට දේශනා කළේ. එතකොට ඒ දැළට අහුකර ගත්ත කෙනාට අනිවාර්යෙන්ම ප්‍රාණඝාත අකුසලය තියෙනවා. මිච්ඡා ආජීවයට අහුවෙනවා, ඒ මාළු වෙළඳාම් කරපු කෙනා. එතකොට බුදුරජාණන් වහන්සේ එහෙම කියද්දී අපි එතන නවතින්න ඕනේ. බුදුරජාණන් වහන්සේ කියනවා එයා ප්‍රාණඝාතය කර ගත්තා කියලා. මාළු විකුණන කෙනාට කියනවා එයා මිච්ඡා ආජීවය කර ගත්තා කියලා. බුදුරජාණන් වහන්සේ මාළු කන කෙනාට එහෙම කියන්නේ නැහැ. ඒ කන කෙනාට එහෙම කියන්නේ නැත්නම් අපි එතන නතර වෙන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේයි කියන්නෙ.

**හරස් ප්‍රශ්නයක්**

***එතකොට ස්වාමීන් වහන්ස අනියම් වශයෙන් හරි ප්‍රාණඝාතයට හවුල් වීමක් වෙන්නේ නැද්ද?***

**පිළිතුර**

එහෙම වෙන්නෙ නැහැ. මොකද ඔහොම කියන අය කියන්නෙ, මම මස් මාළු කන නිසයි මාළු මැරෙන්නෙ කියලා. නමුත් හෙට නිර්මාංශ පාලකයෙක් මේ ලෝකෙ පහළ වෙනවා කියලා හිතමු. පහළ වෙලා එයා සම්පූර්ණයෙන්ම මාළු ඇල්ලීම සහ සත්තු මැරීම තහනම් කරනවා. හෙට ඉඳන් කුකුළෙක්, හරකෙක්, ඌරෙක්, එළුවෙක් මරන්න බැහැ. මුහුදට බෝට්ටුවක් යන්න බැහැ. මොකක්ද වෙන්නේ අවුරුද්දක් යනකොට මනුෂ්‍ය ගහණය ඉක්මවලා සත්ත්ව ගහණය වැඩි වෙනවා. සත්ත්ව ගහණය වැඩි වෙලා. මේ සතුන් නිසාම විෂබීජ පැතිරිලා මනුෂ්‍ය සංහතියම නැති වෙනවා. හේතුඵල ධර්මයක්. මේවා අපිට නවත්වන්න බැහැ.

අපි කවදා හරි මේ ගමන ගිහිල්ලා අවසානයේ දී බලාපොරොත්තු වන්නේ මොකක්ද? චතුරාර්ය සත්‍ය අවබෝධය. රහතන් වහන්සේ කෙනෙක්, රහත් මෙහෙණින් වහන්සේ කෙනෙක් වෙනවා කියලයි අපි මේ යන්නෙ. එතකොට රහතන් වහන්සේ කෙනෙක් වෙනවයි කියන්නේ මොකක්ද? මේ ඇහැ තුළ එයා සත්ත්වයෙක් පුද්ගලයෙක් දකින්නෙ නෑ. එතකොට එතෙන්ට නම් අපි යන්න ඕනෙ මාළු කෑල්ලක් තුළ එයා මාළුවෙක් දකියිද? කුකුල් මස් කෑල්ලක් තුළ එයා කුකුළෙක් දකියිද? යමෙක් මාළු කෑල්ලක් තුළ මාළුවෙක් දකිනවා නම්, කුකුල් මස් කෑල්ලක් තුළ කුකුළෙක් දකිනවා නම් එයා රහත් භාවයට පත් වෙලාද? නැහැ. එහෙමනම් මෙතෙන්ට යන්නයි බුදුරජාණන් වහන්සේ පාර කියන්නෙ. මේ කොහෙවත් තියෙන මාළු කෑල්ලක් අල්ලාගෙන අපි අච්චර වටිනා ගමනක් යන්නෙ නැතුව නවත්ව ගන්නව නම් මෝහයමයි ඒකට කියන්නේ. මොකද අපි මේ ආත්මීය සංඥාවෙන් මිදෙන්න ඕනෙ.

එක ආරණ්‍යයක මං ඉන්න කොට දාන ශාලාවේ දානෙ ගන්නවා. ඒ වෙලාවේ ස්වාමීන් වහන්සේලා වළඳ වළඳ හිටියේ මී කිරි. ආගන්තුක ස්වාමීන් වහන්සේ නමක් වැඩියා. ඒ ස්වාමීන් වහන්සේ නම වැඩම කරලා ඒ ස්වාමීන් වහන්සේ කිව්වා මං මේ කැළේ මැද්දෙන් වඩිනකොට මී හරකෙක් මැරිලා හිටියා. කුණු වෙලා ගඳ ගහනවා, සත්තු කනවා,

ගඳේ ඉන්න බැහැ කිව්වා. ඒ වෙලාවේ අර මී කිරි වළඳ වළඳ හිටිය හාමුදුරුවො ''ඉක්කේයියා'' කියලා මී කිරි කෝප්පේ අයින් කළා. මීකිරි කෝප්පෙන් මී හරකෙක් දැක්කා. ඒක තමයි කියන්නේ ආත්මීය දෘෂ්ටිය කියලා. ඕක කැඩෙන්නයි බුදුරජාණන් වහන්සේ පාර පෙන්නුවේ.

ඒ නිසා දරුවෝ බුදුරජාණන් වහන්සේ යමක් කියනවා නම් අපි ඒක අහන්න ඕනෙ. මොකද පොළොස් මාළුව තුළවත්, මාළු කැල්ල තුළවත් නෙමෙයි තෘෂ්ණාව තියෙන්නේ. අපි හිතනවා නම් මාළු කැල්ල තුළයි තෘෂ්ණාව තියෙන්නෙ කියලා, ඔබ කියනවා නම් මාළු කන්න එපා, පොළොස් මාලුව කන්න කියලා. බුදුරජාණන් වහන්සේ කියනවා, පොළොස් මාලුව තුළවත් මාළු කැල්ල තුලවත් නොවෙයි තෘෂ්ණාව තියෙන්නෙ, මේ රූපය කෙරෙහි ඇති කර ගන්නා වූ විඳීම තුළයි තෘෂ්ණාව තියෙන්නෙ කියලා. එහෙමනම් ප්‍රශ්නෙ තියෙන්නේ ඔබ මාළු කැල්ල අයින් කරලා පොළොස් කැල්ලට තෘෂ්ණාවෙන් බැඳුනනම් ඒත් තෘෂ්ණාවමයි. මාළු ද පොළොස් ද කියන කාරණය අදාළ නැහැ. ඔබ තෘෂ්ණාවෙන් ඒකට බැඳුන නම් මේකටත් තෘෂ්ණාවෙන් බැඳුනා හා සමානයි. ඒ නිසා තෘෂ්ණාව සකස් වෙන්නෙ අපි තුළයි. අපි තුළ සකස් වෙන්නා වූ තෘෂ්ණාවයි අපි ප්‍රහීන කර ගන්න ඕනෙ. ඒ විදිහටයි හිතල ගලපගන්න ඕනෑ.

**<u>ප්‍රශ්නය</u>**

***08. ස්වාමීන් වහන්ස, ශල්‍ය කර්ම වලදී භාවිතා කරන උපකරණ නිසා ඇතැම් ජීවීන් විනාශ වෙනවා. මේක පාපයක්ද?***

**<u>පිළිතුර</u>**

ජීවීන් විනාශ වෙනව නම් ඒක පාපයක්. **''චේතනා හං භික්ඛවේ කම්මං වදාමි''** කියලා තමයි බුදුහාමුදුරුවෝ දේශනා කරන්නෙ. නමුත් ඒ සතා මැරීම පිළිබඳ චේතනාවක් අපිට නැහැ. නමුත් තව කෙනෙක්ගේ සුවපත් භාවය උදෙසායි අපි ඒක කරන්නේ. සුවපත් භාවය උදෙසා හරි සතෙක් මැරෙනවා නම් ඒ අකුසලය අපිට එනවා. නමුත් තමා තුළ සකස් වන අනුන් සුවපත් වේවා කියන මෛත්‍රී චිත්තය තුළින් අර වෙන්නා වූ අකුසලය යටපත් වෙන්න පුළුවන්. එක වෛද්‍ය ශිෂ්‍යාවක් මගෙන් ඇවිල්ලා ඇහුවා ස්වාමීන් වහන්ස අපි සිහි නැති කරලා ගෙම්බො කපනවා. ඉතින් මේ ගෙම්බො කැපීම නිසා මට අකුසලයක් ද නැද්ද? කියලා. මම කිව්වා ප්‍රාණඝාත අකුසලයක් තියෙනවා. කිසි කතාවක් නැහැ. නමුත් ඔබට දැන්

ඕකෙන් මිදෙන්නත් බැහැ. ඒ නිසා ඔබ චිත්තයක් සකස් කර ගන්න, මම මේ සතාට මෙහෙම කරන්නේ අනාගතයේ දී තවත් මනුෂ්‍යයෝ දහස් ගාණකට ජීවිතය දෙන්න කියලා. නමුත් අකුසලය අකුසලයමයි. ප්‍රාණඝාත අකුසලය සිද්ධ වෙනවා. නමුත් චේතනාවෙන් අපිට ඒකෙ බලය දුර්වල කර ගන්න පුළුවන්. අපි ඒක දැනගන්න ඕනෙ.

හැම වෙලාවෙම තමන් කළා වූ ඕනෑම අකුසලයක් ඊට වඩා ශක්තිමත් කුසලයක් තුළින් යටපත් කර ගන්න පුළුවන්. ඒකට අපි දක්ෂ වෙන්න ඕනෙ. එක වැඩිවියට පත් වෙච්ච දෙපලක් ඇවිල්ලා මට කිව්වා ''හාමුදුරුවනේ අපි තරුණ කාලයේ ධර්මය තුළ හිටියෙ නැහැ. නමුත් දැන් අපි ධර්මය තුළ ඉන්නෙ. නමුත් දැන් ධර්මය තුළ ඉන්න කොට තරුණ කාලයේ අපි අතින් වෙච්ච වරදක් අපිට මතක් වෙනවා.'' මම ඇහුවා මොකක්ද කියලා. අපි බැඳපු අලුත අපිට දරුවෙක් අවශ්‍ය නැති නිසා අපි දරුවෙක් ගබ්සා කළා. නමුත් එදා අපි මේකෙ වරදක් දැක්කේ නැහැ. නමුත් ධර්මය තුළ ඉන්නකොට නිරතුරුවම දැන් අපිට ඒක මතක් වෙවී පීඩා දෙනවා හාමුදුරුවනේ. ''මම ඇහුවා ඇත්තටම ඒක නිරතුරුවම මතක් වෙනවද කියලා, ඔව් කිව්වා. මම කිව්වා එහෙමනම් ඒක හරිම දරුණුයි. මොකද මැරෙන වෙලාවට ගබ්සාව මතක් වුණොත් ඔබ ඒ ප්‍රාණඝාත අකුසලයට අදාළ ප්‍රතිසංධියට යනවා. ඒ නිසා දැන් ඔබට කරන්න තියෙන්නෙ එක දෙයයි. ඔබ ඒ කළා වූ අකුසලය ඊට වඩා ශක්තිමත් කුසලයකින් යටපත් කරන්න. ඔබ ළමා රෝහලේ දැඩි සත්කාර ඒකකයට යන්න. ළමා රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ඉන්නවා ජීවිතයත් මරණයත් අතර සටන් කරන දරුවෝ. ඒ අයගේ අම්මා තාත්තා දුප්පත්. බෙහෙතක් හේතක් අරන් දෙන්න බැහැ. මෙවැනි දරුවො දෙතුන් දෙනෙක් තෝරාගෙන ඒ ගොල්ලො ජීවත් වෙනකන් අවශ්‍ය සියලු දේ සපයන්න. ඒ ගොල්ලො ජීවත් වෙනවා දැකලා ඔබ චේතනාවක් සකස් කර ගන්න මගෙන් නැති වුණා වූ දරුවා වෙනුවට මම දරුවො තුන් දෙනෙකුට ජීවිතය ලබා දුන්නා. දැන් පරණ අකුසලය යටපත් කළා. හැබැයි ඔය සිද්ධිය කරලා ආයෙමත් හිතන්න ගියොත් තේරුමක් නැහැ. ඒ නිසා ඔබ දක්ෂ වෙන්න ඕනෙ. ඔබ ශක්තිමත් කුසලය තුළින් අර අකුසලය යටපත් කරලා දැන් ඒක අහවරයි කියලා අයින් කර ගන්න.

<u>ප්‍රශ්නය</u>

***09. හඳහන් ආශ්‍රිතව කටයුතු කරන එක, මිථ්‍යාදෘෂ්ඨික ස්වභාවයක් ද ස්වාමීන් වහන්ස?***

**පිළිතුර**

හඳහනක් බැලුවොත් ප්‍රශ්නයක්මනෙ. හඳහනක් බැලුවොත් අපලයක් නැහැ කියන්නේ කවුද කියන්නකො. හඳහනක් බලලා ඔබට සුගතියක් වෙනවා. ඔබට මේ අපල නැහැ කියන්නේ කවුද කියන්නකො. හඳහනක් බලන්න ගියොත් අත පෙන්නුවොත් එදා ඉඳන්ම ප්‍රශ්නයක්. ඊට පස්සේ දරුවො තව ප්‍රශ්න දාහක් එනවා. ඒ නිසා විවාහයක් වෙන වෙලාවට නැකතක් බලන්න. පෝරුවකට නගින්න වගේ කටයුතු වලට නැකතක් බලන්න. ගෙදරක මුල් ගලක් තියන්න ගිය වෙලාවට නැකතක් බලන්න. ඒවා එපා කියන්න අපිට බැහැ. ඉන් ඔබ්බට මෝහය වැඩෙන දිශාවට යන්න එපා. මම කාටවත් කියන්නේ නැහැ විවාහයක් වෙන වෙලාවෙ නැකතක් බලන්න එපා කියලා. ඒවා බැහැර කරන්න අපට බැහැ. ඒවායේ ප්‍රශ්නයක් නැහැ. ගෙයකට මුල් ගලක් තියන වෙලාවෙ නැකතක් බලලා ඒක කරන්න. නමුත් දරුවො පමණ ඉක්මවා ගිය දේවල් වලට යන්න එපා.

සංස්කාරයන් තුළ අපි ජීවිතය දකින්න දක්ෂ වෙන්න ඕනෙ. මෙතන ඉන්න කිසි කෙනෙකුට ලැබෙන්න තියෙන දෙයක් නොලැබිලා නෑ. නොලැබෙන්න තියෙන දෙයක් ලැබිලත් නෑ. අපි කරපු දේයි අපිට ලැබිලා තියෙන්නෙ. මම මෙතන ඉන්නේ මම කරගත්ත පින් නිසා, ඔබ ඔතන ඉන්නේ ඔබ කරගත්ත පින් නිසා. ඒ නිසා නොලැබෙනවා කියලා ඔබ මිථ්‍යාදෘෂ්ඨික පැත්තට ගිහින් වැඩක් නෑ. නොලැබෙනවා නම් දරුවො ඔබ කරගත්ත දෙයක් නිසාමයි නොලැබෙන්නෙ. එතකොට නොලැබෙන්න මොකක්ද ඔබ කරලා තියෙන්නේ. අකුසල්. ඒ නිසා කුසලය තුලින්ම මෙය පූර්ණය කරගන්න ඕනෙ.

ඉතින් හඳහන කියන පැත්තට ගියොත් දරුවො මේ ප්‍රශ්න වැඩිකර ගන්නවා මිසක් මේ ප්‍රශ්න අඩුවක් දකින්න නම් වෙන්නේ නැහැ. මොකද ඒවා තව තව ව්‍යාපාද පැත්තට බෙදිලා යනවා. එතකොට ඒවායින් කවමදාවත් අපිට ජයග්‍රහණයක් කියන තැනට එන්න බැහැ. ඒක දකින්න ඕනෙ. ඒ පැත්තට යනවා නම් අපිට එපා කියන්නත් බැහැ. නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනුවයි අපි යමක් විග්‍රහ කරන්නෙ. ඒ විග්‍රහ කරද්දී බුදුරජාණන් වහන්සෙ කියන්නෙ නැහැ නැකත් බලන්න කියලා. නමුත් අද සමාජයට අපිට එපා කියන්න බැහැ. කිසියම් ගැටළුවක් ඇති වුණොත් අතනයි හිත පිහිටන්නෙ. ඒ නිසා එවැනි දෙයක් කලාට එතන ගැටළුවක් නැහැ. නමුත් ඉතින් කේන්දර, සාස්තර වගේ දේවල් අපිට අනුමත කරන්න බැහැ. බුදුරජාණන් වහන්සේ අනුමත කරන්න කියලා නැහැ. කියලා නැති නිසා අපිට අනුමත කරන්න බැහැ.

**<u>ප්‍රශ්නය</u>**

***10. කොහොමද ස්වාමීන් වහන්ස, පුද්ගලයින් මන්ද බුද්ධිකභාවයට පත්වෙන්නේ?***

**<u>පිළිතුර</u>**

මන්ද බුද්ධිකභාවයට පත් වෙන්නෙ ගිහි ජීවිතයේ ජ්‍යොතිෂ්‍ය යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරන අය. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරනවා කියන්නේ මෝහයයි උගන්වන්නේ. හේතුඵල ධර්මයන් දකින්නේ නැහැ. සංස්කාරයන්ගේ ස්වභාවය දකින්නේ නැහැ. දැන් වර්තමානයේ කවුරු හරි යන්ත්‍ර මන්ත්‍ර හදි හූනියම් කරනවා නම් එයා අනිවාර්යෙන්ම ඊළඟ ජීවිතයේ මන්ද බුද්ධික මනුෂ්‍යයෙක් වෙන්න බලාපොරොත්තු වෙන්න ඕන. අනාගතයේ දී මන්ද බුද්ධික උපත් ලෝකයේ වේගයෙන් වැඩි වෙනවා. වෛද්‍ය තාක්ෂණය කොච්චර දියුණු වුණත්, ලෝකයේ වෛද්‍ය විද්‍යාව කොච්චර දියුණු වුණත්, ඒ වෛද්‍ය විද්‍යාවෙන් කොච්චර වටිනා බෙහෙත් හොයා ගත්තත්, කවදාවත් මේ සංස්කාරයන් යටත් කරන්න වෛද්‍ය විද්‍යාවට බැහැ. මේ ලෝකය නිරෝගී කරන්න වෛද්‍ය විද්‍යාවට බැහැ. ඒ ගොල්ලො කොච්චර දියුණු වුණත් බැහැ.

මොකද ඒ ගොල්ලො කොච්චර දියුණු බෙහෙත් නිපදෙව්වත් ඊට වඩා භයානක විෂබීජයක් මනුෂ්‍යයා තුළින් සකස් වෙනවා. මේ විෂබීජ සකස් කරන්නෙ කව්ද දුස්සීලභාවය විසින්. ඒඩ්ස් කියන රෝගය සකස් කළේ කවුද? දුස්සීලභාවයමයි. ඔය අනිත් කොලෙස්ටරෝල් වේවා, දියවැඩියාව වේවා, ඔය වකුගඩු රෝග වේවා, ඔය සියල්ලම දුස්සීලභාවයම නිසා සකස් කර ගන්නා වූ රෝග. කාමයන් කෙරෙහි තියෙන කැමැත්ත නිසාම. ඒ නිසා කවදාකවත් වෛද්‍ය විද්‍යාව දියුණු වුණා කියලා මේවට ප්‍රතිකාර හොයන්න බැහැ. මොකද ඊට වඩා ශක්තිමත් විෂ බීජයක් මනුෂ්‍යයා තුළින් මතු වෙනවා. මනුෂ්‍යයා තුළින් මතු කරලා දෙන්නෙ කව්ද? දුස්සීලභාවය විසින්. ඒ නිසා ලෝකය නිරෝගී කරන්න ඕනෙ නම් බෙහෙත් හොයලා වැඩක් නැහැ. ලෝකය නිරෝගී කරන්න ඕන නම් පන්සිල් පද පහ තුළ ජනතාව ශක්තිමත් කරන්න ඕනෙ. එතනින් තමයි ලෝකයා නිරෝගී වෙන්නෙ.

**<u>ප්‍රශ්නය</u>**

***11. ගෞරවනීය ස්වාමීන් වහන්ස, සංසාරගත බැඳීම් ඇති බව සමහරු දුටු විට හැඟෙනවා. ආශ්‍රය කරන්න හිතෙනවා. මෙය සසර කෙටි කරන්න බාධාවකි. ඒ සඳහා දහම් කරුණු කියා දෙන්න.***

**පිළිතුර**

සංසාරගත බැඳීම් ඇති බව සමහර අය දැක්කහම හැගෙනවා. ඉතින් ඒක ඇත්ත. මෙතන ඉන්න හැම කෙනෙක්ම මට සංසාරේ අම්මා කෙනෙක් වෙලා තියෙනවා. සංසාරේ තාත්තා කෙනෙක් වෙලා තියෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අර දඹදිව තියෙන මුළු කෝටුකැලි ඔක්කොම එක ගොඩක් ගහන්න කියලා. ගහලා ඒ හැම කෝටු කෑල්ලක්ම ඇඟිල්ලේ ප්‍රමාණයට කඩන්න කියනවා. ඒ ඇඟිල්ලේ ප්‍රමාණයට කඩලා මේ කෝටුව මේ ජීවිතයේ මගේ අම්මා, මේ පෙර ජීවිතයේ අම්මා, මේ ඊට පෙර ජීවිතයේ අම්මා කියලා අයින් කළොත් ඒ කෝටු කැලි ටික ඉවර වෙනවා, කවදාවත් අම්මා, තාත්තා ඉවර වෙන්නේ නැහැ කියලා. මේක තමයි සංසාර ගමන.

මේ ජීවිතයේ ඔබ මාව හමුවුනේ කවුරු හැටියටද? දායකයො හැටියට නේද? නමුත් මේ ජීවිතයේ දායකයෝ හැටියට හමුවුණා වගේම ඔබලා මගේ අම්මා වෙලා කොච්චර උපදින්න වෙන්න ඇත්ද? මගේ තාත්තා වෙලා කොච්චර ඔබ ඉපදිලා ඇත්ද? ඔබලා වැදිරියක් වෙලා ඉපදුන වෙලාවේ ඒ වැදිරිගෙ පැටියා වෙලා මං බඩේ එල්ලිලා කොච්චර ගහෙන් ගහට පනින්න ඇත්ද? ඔබ එළදෙනෙක් වෙලා ඉපදුණ වෙලාවේ මම ඒ එළදෙනගේ පැටියා වෙලා මම කොච්චර තන බුරුල්ලෙන් කිරි උරා බොන්න ඇත්ද? ඔබ පූසියෙක් වෙලා ඒ පූසිගේ පැටියා මම වෙලා ඔබ මාව කටින් එල්ලාගෙන කොච්චර තැන් තැන්වල ආරක්ෂාවට මාව හංගන්න ඇත්ද? ඔබ කිකිළියක් වෙලා ඒ කිකිළිගෙ පැටියා මං වෙලා ඔබ කොච්චර මට පණුවො ඇහුල අහුල කන්න දෙන්න ඇත්ද? ඕකයි භව ගමන. ඔය භව ගමන දකිද්දී දරුවො තවත් මේ භවයට බැඳෙන්න උවමනාවක් නැහැ. එහෙම බැඳෙන්න බැඳෙන්න තව තවත් ඒ සම්බන්ධතාවයන් මයි වැඩි වෙන්නේ. ඒ නිසා ඔබට දැනෙනවා නම් මේ මගේ ඥාතියා කියලා ඒ සංසාර බය දකිමින් මේ ඥාතිත්වයෙන් ඈත් වෙන්න.

ඒ නිසා සියල්ලෝම අපේ අම්මලා, තාත්තලා, නංගිලා, මල්ලිලා තමයි. අපි එතනට යන්න වෙනවා. එහෙමනම් ආවා වූ ඒ භව ගමනේ දුෂ්කර භාවයන් දකිද්දී තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට ආපු කෙනා චිත්තයක් සකස් කර ගන්නවා. මේ තමයි මගේ ජීවිතයේ අවසාන අම්මා. නැවත මේ භව ගමනේ අම්මා කෙනෙක් එපා. මේ තමයි මගේ භව ගමනේ අවසාන තාත්තා. නැවත මේ භව ගමනේ මට තාත්තා කෙනෙක් එපා. මේ තමයි මගේ භව ගමනේ අවසාන ස්වාමි පුරුෂයා, අවසාන බිරිඳ, අවසාන දරුවෝ, මට නැවත බිරිඳක්, ස්වාමි පුරුෂයෙක්, දරුවෙක් එපා. අම්මා කියන්නෙ දුකක් නම්, තාත්තා කියන්නෙ

දුකක් නම්, බිරිඳ කියන්නෙ, ස්වාමිපුරුෂයා කියන්නෙ දුකක් නම් දරුවා කියන්නෙත් දුකක් නම්, තවත් ඒ දුක ඔබ ප්‍රාර්ථනා කරන්න එපා. ඔබ ඒ දුකේ රූපයේ තෘෂ්ණාව සිටින තැන දි ඔබ පංච උපාදානස්ඛන්ධයේ අනිත්‍ය භාවය දුටුව තැනදී ඔබ නැවත අම්මාගේ මව් කුසට යන්නේ නෑ. ඔබ ඕපපාතික මාර්ගඵලලාභී දෙවියෙක්, මාර්ගඵලලාභී දිව්‍යාංගනාවක් වෙලාමයි උපත ලබන්නේ. ඒ නිසා ඒ ආකාරයෙන්ම ඔබට දැනෙන්නා වූ ඒ සිතුවිල්ල විදර්ශනා නුවණින් දකින්න. මේ සංසාරේ භය නැති කර ගන්න. අම්මා තාත්තා කෙනෙක් දරුවන් උදෙසා හෙළු කඳුළු මේ මහා සාගරේ ජලයට වැඩියි කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. එහෙමනම් ඔබලා මේ නෙතින් පිංවතුනි, ඔබලාගේ දරුවන් උදෙසා මහා සාගරයේ ජලයට වඩා කඳුළු හෙලලා තියෙනවා. ඒ කඳුළු සාගරයට මේ ජීවිතේ, තවත් කඳුළු බාල්දි දෙක තුනක් එකතු කරලා ඔබ ආයෙමත් මව් කුසකට යනවා නම් ඒකෙ තේරුමක් වෙන්නේ නැහැ.

ඒ නිසා නිරතුරුවම ඒ අනිත්‍ය සංඥාව දකින්න. ආස්වාදයට බැඳෙන්න එපා. මෙතන ඉන්න හැම කෙනෙක්ම තමන්ගේ මව් කුසෙන් රහතන් වහන්සේලා අතීතයේ බිහිකරලා තියෙනවා. මෙතන ඉන්න හැම කෙනෙක්ම තමන්ගේ කුසෙන් රහත් මෙහෙණින් වහන්සේලා බිහි කරලා තියෙනවා. තමන්ගේ දරුවා රහත් වෙලා, රහත් භික්ෂුණියක් වෙලා එදා ඍද්ධියෙන් ඒ ගොල්ලො යද්දී ඔබ සාධු කාර දුන්නා, මගේ ඥාතියා කියලා. එවැනි දරුවෙක් ලබන්න ඔබ කොයි තරම් පින්වන්ත ද කියලා කොයි මොහොතකවත් හිතුවේ නෑ. ඒ නිසා මේ මොහොතේ ඔබ කොයි තරම් පින්වන්ත ද කියලා ඔබ දකින්න. පින්වන්ත ද කියලා දැකලා ඒ පින තුළින් ලබාගන්නා ඒ උපරිම ඵලය ලබාගන්න දක්ෂ වෙන්න ඕනෙ. බැඳීම් වලට බැඳෙන්න එපා !

<u>ප්‍රශ්නය</u>

12. ***ස්වාමීන් වහන්ස, සමහරු කරනු ලබන පින්කම් අවස්ථාවල දී, ධර්ම දේශනා පවත්වන වේලාවල දී ඡායාරූප ගැනීමේ දී යම්කිසි එළියක්, ආලෝක සංඥා එළි ආදිය දක්නට ලැබෙන අවස්ථා ඇත. මෙවන් ආලෝක යනු සශ්‍රීක දෙවිවරුද?***

<u>පිළිතුර</u>

නැහැ. සශ්‍රීක දෙවිවරු නෙමෙ. කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ එක්තරා අවස්ථාවක දේශනා කරනවා ඔය සශ්‍රීක දෙවිවරු කියන අය මේ මනුෂ්‍යයාට යොදුන් සීයක්

ඇතින් ඉන්නෙ කියලා. යොදුන් 100 කට මෙහා ඒ ගොල්ලො ළං වෙන්නෙ නැහැ කියලා කුමාර කාශ්‍යප හාමුදුරුවෝ දේශනා කරනවා. එයාලා යොදුන් සියයක් ඇතින් ඉන්නෙ මොකද? මනුෂ්‍යයින්ගේ ගඳ උහුලන්න බැරි නිසයි කියලා කියනවා. එතන මනුෂ්‍යයාගේ ගඳ කියන්නෙ දහඩිය ගඳ නෙමෙයි. දුසිල්වත්භාවයේ ගඳ. ඒ නිසා ඒක උහුලන්න බැරි නිසා යොදුන් සියයක් ඇතින් ඉන්නෙ කියලා කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ දේශනා කරනවා.

නමුත් අපි දකින්නා වූ ඡායාරූප වල ඉන්න දෙවිවරු මේ පල්ලෙහා ලෝකය ආශ්‍රිතව ඉන්න දෙවිවරු හා ඒ අයගෙන් වරම් ගත්තා වූ දෙවිවරු. දූන් සතර වරම් දෙවියෝ ඉහළ තලයේ හිටියට ඒ ගොල්ලන්ගෙන් වරම් ගත්ත අප්‍රමාණ දෙවිවරු පහළින් ඉන්නවා. අප්‍රමාණ වූ බලවත් යක්ෂයෝ ඉන්නවා. පන්සලකට ගියහම පන්සල් වල උපාසක අම්මලා උපාසක සීයලා ඉන්නවා. මේ අයගේ ජීවිත පන්සල තුළමයි ගතවෙන්නේ. බෝධි පූජා තියෙනවා පින්කම් කරනව. පන්සලේ හැමදේම හදනවා. පන්සලේ ස්වාමීන් වහන්සේත් ප්‍රඥාව වැඩෙන බණක් කියන්නෙ නැහැ. කරන පින්කම් වලට පින්දීලා තව තවත් පින කෙරෙහි උපාදානය සකස් කරනවා. ඉතින් දූන් මෙහෙම උපාසක අම්මලා උපාසක සීයලා මැරෙන වෙලාවෙ ඒ ගොල්ලන්ට සංසයා කියන තැන උපාදානයක් සකස් වෙන්නේ නැහැ. පන්සලේ හාමුදුරුවොයි උපාදානය වෙන්නෙ. නැත්නම් පන්සලේ හදපු පහන් වැට, පහන් කණුව, තාප්පෙ තමයි උපාදානය වෙන්නේ.

එහෙම උපාදානය වෙලා මැරිල ගියහම අර පන්සලේ තියෙන බෝධීන් වහන්සේගේ හරි නුග ගසක, රුක් අත්තන ගහක, කිරි ගහක ගිහිල්ලා අර ආලෝකයක් හැටියට උත්පත්තිය ලබනවා. සතර අපායෙන් මිදිලා නැහැ. ඔතන ඉඳගෙන මෙච්චර කල් පන්සලට ගිහිල්ලනෙ පින්කම් කර ගත්තෙ. දූන් පන්සලෙන් යන්න බැහැ. දූන් ගහේ ඉන්නවා. ඒ නිසා මින් පස්සේ ඒ ගොල්ලො මොකද කරන්නෙ. හාමුදුරුවෝ පිරිත් ගෙදරක යනකොට ඔන්න පස්සෙන් යනවා. ගිහිල්ලා අර පිරිත් ගෙදර පිරිත් මණ්ඩපය උඩ නැත්නම් ඔය කොතන හරි තැනක ඉන්නවා. නැත්නම් හාමුදුරුවො දානෙකට යනකොට එතනට යනවා. කඨින පිංකමක පෙරහැරේ යනකොට ඒ පෙරහැරේ යනවා, අර පෙර ගිය පුරුද්දට. ඉතින් මෙහෙම වේලාවේ ඡායාරූපයක් ගනිද්දී අධි තාක්ෂණික හේතූන් නිසා අර පුංචි ආලෝකයක් තියෙනවා. ඒ නිසා ඒ ආලෝකයන්ට ගොඩක් වටිනාකමක් දිය යුතු නැහැ.

නමුත් ඒ දෙවියන් අතරත් ශක්තිමත් දෙවිවරු ඒ ආලෝක තුළ ඉන්නවා. ඒ ගොල්ලො අර සතර වරම් දෙවියන්ගෙන් වරම්ගත්ත බලවත් දෙවිවරු. නමුත් සශ්‍රීක දිව්‍ය තලවල ඉන්න දෙවිවරු නෙවෙයි. දිව්‍ය තල වල ඉන්න දෙවියන්ට පල්ලෙහාට එන්න අවශ්‍යතාවයක් නැහැ. ඒ ගොල්ලන්ට දිව්‍ය ශ්‍රෝත වලින් උඩ ඉඳන් ඕන දෙයක් අහන්න පුළුවන්. ඒ නිසා පල්ලෙහා දිව්‍ය ආලෝක වශයෙන් හුඟාක් වෙලාවට ඉන්නෙ අර පන්සල උපාදානය කරගත්ත, ආරණ්‍ය උපාදානය කර ගත්ත, අර මැරෙන වෙලාවෙ ඒවා සිහිපත් වෙලා ඒවා තුළම දිව්‍ය ආත්ම බවට පත් වෙලා ඉන්න අය. ඒ අය සතර අපායෙන් මිදිලා නැහැ. හරි භයානකයි. මොකද දැන් එයා ගහ උඩ ඉන්නවා ආලෝකමත් දෙවියෙක් හැටියට. නමුත් එයා ඉන්නකොට ජේනවා එයා හදපු පහන් පැළ කවුරු හරි කඩලා දානවා. වෙන කෙනෙක් ඇවිල්ලා කියනවා මේ පහන් පැල පොඩියි මම මේක අයින් කරලා ලොකු එකක් හදනවා කියලා. දැන් එයා දන්නෙ නැහැ මේ මොකුත් කතාවක්. දැන් අර පහන් පැල කඩලා දානකොට අර දෙවියා උඩ ඉඳලා ගැටෙනවා. මොකද එයාටනේ උපාදානෙ. එයානෙ හැදුවේ. ගැටෙනකොට වෛරය ද්වේෂය සකස් වෙනවා. එතනින් පල්ලෙහාට නිරයට වැටෙන්නත් පුළුවන්. ඒ තමයි දිව්‍ය ආත්මවල අනතුරුදායක තැන්.

ඒ නිසා කොයි වෙලාවකවත් පන්සල ඇසුරු කරගෙන පන්සල උපාදානය කර ගන්න එපා. හාමුදුරුවො උපාදානය කර ගන්න එපා. සංඝයාම උපාදානය කර ගන්න. සාරිපුත්ත මහරහතන් වහන්සේ ප්‍රධාන මහාසංඝ පරම්පරාව උපාදානය කරගන්න. අපිව උපාදානය කරලා වැඩක් නැහැ. ඒ නිසා එතනම උපාදානය කර ගන්න. කළා වූ පින්කම් වලින් ඇත්ත වශයෙන්ම පන්සල කියන තැන උපාදානය කරගන්න එපා. එහෙම කළොත් අපිටත් වෙනවා ආලෝකයක් වෙලා ඔය ටික කාලයක් ගහක් උඩට වෙලා ඉන්න. පින්කම් කරලා ගහක් උඩට නැගලා ඉන්නවා නේද? ඒක තේරුමක් නැහැ. ඒ නිසා පින්කම් කරලා ගස් උඩ ඉන්න යන්න එපා. පින්කරලා කොහොම හරි සතර අපායෙන් මිදෙනවා කියන තැනට යන්න.

<u>ප්‍රශ්නය</u>

***13. ධර්ම ශ්‍රවණය කිරීමට දෙවිවරුන් පැමිණ සිටින්නේද? දෙවියන් මිනිසුන්ට විශේෂයෙන් මේ අවස්ථාවේ පැමිණ සිටින පින්වත් මිනිසුන්ට දර්ශනය නොවී ඉන්නේ ඇයි? දෙවියන් කැමරාවට හසු වන්නේද? එහෙමනම් මිනිස් ඇසට නොපෙනෙන්නේ ඇයි ස්වාමීන් වහන්ස?***

**පිළිතුර**

දෙවියන් කියන්නේ ඕපපාතිකව උත්පත්තිය ලබන කෙනෙක්. අපි වගේ ඝණ කයක් තියෙන කෙනෙක් නෙමේ. නමුත් සමාධියෙන් දෙවියන්ගේ රූපය ඝන කරලා දකින්න පුළුවන් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. සමාධියෙන් දකින දෙවියා කියලා කියන්නේ මනුෂ්‍ය රූපයේම කෙනෙක් තමයි. මනුෂ්‍යයාට වඩා ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, බලයෙන් පරිපූර්ණ කෙනෙක්. ඒ කියන්නේ පින් අනුව ඒ ගොල්ලො ගිහිල්ලා උත්පත්තිය ලබනවා. දැන් එක ස්වාමීන් වහන්සේ කෙනෙක් ආරණ්‍යයක ඉන්න කොට එයාට පේනවා මේ මනුෂ්‍ය ලෝකයේ ජීවත් වෙන දිව්‍යාංගනාවක්. එයා මේ දිව්‍ය තලයක ඉන්න කෙනෙක් නෙමේ. මේ මනුෂ්‍ය ලෝකයේ ඉන්න කෙනෙක්. එයා අවුරුදු 65 ක් පමණ වයස කාන්තාවක්. එයා ලස්සන දිලිසෙන සුදු සාරියක් සුදු හැට්ටයක් ඇඳලා එයාට සිංහාසනයකුත් පහළ වෙලා තියෙනවා. සිංහාසනයක් කියන්නේ මේ වගේ පුටුවක්. ස්වාමීන් වහන්සේලා පන්සල් වල ඉඳ ගන්නෙ. මේ ආසනය මෙයාට බද්ධ වෙලා තියෙන්නෙ. දැන් අර ස්වාමීන් වහන්සේ සමාධියෙන් දකින කොට මේ ආසනය මත වාඩි වෙලා ඉන්න ඍද්ධියෙන් ගමන් කරන දිව්‍යාංගනාව තමයි දකින්නෙ. දැන් මේ මෙයා යන යන තැන පුටුවත් යනවා. පුටුව එයාට බද්ධ වෙලා වගේ තියෙන්නෙ. ඒ කියන්නේ මේක අරුම පුදුම දෙයක්. කෙනෙක් විශ්වාස කරන්නෙ නැහැනෙ. දැන් මම මහත්තයො මෙහෙම එහාට මෙහාට යනකොට පුටුවත් ඇලිලා යනවද නැහැනෙ. නමුත් මේ දිව්‍යාංගනාව පුටුවට බද්ධ වෙලා තියෙන්නෙ. මේ සිංහාසනය ලැබිලා තියෙනවා. එතකොට දැන් ස්වාමීන් වහන්සේ මේක හොයලා තියෙනවා. මෙයා කව්ද කියලා. බලනකොට මෙයා මේ ගමේ ම හිටිය උපාසකම්මා කෙනෙක්. මේ ගමේම උපාසකම්මා. මහත්තයෝ ගිහි ජීවිතයේ දී එයා උපාසිකා කාලයේ දී හරිම ආසයි ආසන පනවන්න. හාමුදුරුවන්ට ලස්සන සුදු රෙදි එළලා, මේ උස ආසන පනවලා ඒ ආසන පනවන්න තමයි එයා වැඩිය ආස. එයා දන් දෙන්න නෙමෙයි කැමති. හාමුදුරුවන්ට ආසන පනවලා. ලස්සන සුදු රෙදි එළලා. මල් අතුරලා. එයා ඒ මැරෙන වෙලාවේ ආසන පනවන කුසලයක් තමයි මතක් වුණේ. ඒක තමයි මහත්තයො සිංහාසනයක් වගේ පුටුවකට බද්ධ වෙලා යන යන තැනට ඒ පුටුවේ වාඩි වෙලා යනවා. එයා ඍද්ධියෙන් යනකොට ඒ පුටුවත් යනවා. එතකොට මහත්තයෝ ඒ පින.

තවත් අපි දන්න ස්වාමීන් වහන්සේ කෙනෙක් උතුම් සමාධියෙන් බලන කොට දර්ශනය වෙලා තියෙනවා දිව්‍ය තලයේ ඉන්න දිව්‍යාංගනාවො ටිකක්. ඒ දිව්‍යාංගනාවො පිරිස ගත්තොත් ඒ ගොල්ලො මලින් හැදිලා තියෙන්නෙ. අපි වගේ මේ රෝම කූප එයාට

නැහැ. මහත්තයා හොඳ සුදු විනිවිද පෙනෙන පොලිතීන් එකක් අරගෙන පොලිතීන් එකට රෝස පාට ඕකිඩ් මල් පුරවන්න. රෝස පාට ඕකිඩ් මල් සම්පූර්ණයෙන්ම පිරෙව්වහම දැන් මෙතන ඉඳන් බලද්දී පේන ස්වභාවයක් තියෙනවා නේද? ඒ දිව්‍යාංගනාව ඒ වගේ. මලින් හැදිලා තියෙන්නෙ.

ඒ කියන්නෙ බුදුරජාණන් වහන්සේට මහත්තයා දැන් මේ කළා වගේ මලින් කරන පූජාවන් මැරෙන වෙලාවේ දී මතක් වුණොත් මහත්තයත් මේවගේ මලින් හැදුන දෙවියෙක් වෙලා උපදියි. ඒ වගේ කළා වූ කුසලයට අදාළව තමයි ප්‍රතිසන්ධිය සකස් වෙන්නෙ.

එක ස්වාමීන් වහන්සේ නමක් හිටියා ඒ ස්වාමීන් වහන්සේ අපවත් වෙන වෙලාවේ සතර අපායෙන් මිදිලා හිටියේ නැහැ. එයා අනතුරකට ලක් වෙලයි අපවත් වෙන්නෙ. අනතුරට ලක් වෙද්දී එයා දැඩි විදිහට ගැටෙනවා ඒ අතරතුරේ දී. ඒ ගැටෙන වෙලාවෙ එයා එකපාරටම ගිහිල්ලා සතර අපායේ සද්ධන්ත ප්‍රේතයෙක් වෙලා උපදිනවා. මොකද ප්‍රේත ලෝකෙත් ඉන්නවා සද්ධන්ත ප්‍රේතයෝ. පිනෙන් වැඩි ප්‍රේතයෝ ඉන්නවනෙ. උපාදානය සකස් වුණේ එතනට. නමුත් පින වැඩියි. ඒ ගොල්ලො අනිත් අයට වඩා අඩි 8 ක් 10 ක් උස සද්ධන්ත ප්‍රේතයෝ. ඒ ප්‍රේතයො දැක්කහම අනිත් ප්‍රේතයො පලා යනවා. මේ වගේ සද්ධන්ත ප්‍රේතයෙක් වෙලා මෙයා ඉපදුනේ. මෙයා මෙහෙම ඉපදිලා ඊට පස්සේ කොහොම හරි පින් අනුමෝදන් වෙලා (දැඩි විදිහට සිල් රැකපු කෙනෙක් මෙයා. අනතුරින් මැරුණ නිසයි එක පාරට එයා එතනට වැටුනේ. නමුත් පින තිබ්බා හොඳට) මෙතනින් ගිහිල්ලා මහත්තයො සශ්‍රීක දෙවියෙක් වෙලා උපදිනවා. එතකොට ඒ ස්වාමීන් වහන්සේ දකිනවා ඒ සශ්‍රීක දෙවියා. ඒ දෙවියා එරමිණියා ගොතාගෙන ඉන්න ස්වභාවයෙන්ම දඹ රත්තරං වලින් කළා වූ දෙයක් වගේ තමයි තියෙන්නෙ. දඹ රත්තරං. ඒ කියන්නෙ එයාගේ ඇඳුම් පැළඳුම් තියෙනවා. ඒ සියල්ලම දඹ රත්තරනින්ම කොටලා වගේ. විශාල රත්තරං තැටියක් අරගෙන ඒ තැටියෙ කොටන්නකො ඇඳුමක්. ඒ වගේ තමයි එයාලට එන ඒ පාට. රනින් සැදුණා වූ දඹ රන් දෙවියෙක් කියලා තමයි ඒ ස්වාමීන් වහන්සේ කියලා තියෙන්නෙ. මොකද දඹ රත්තරනින්ම එයා සැදිලා තියෙන්නෙ. ඒ නිසා තමා කළා වූ කුසල් වලට අදාළව මහත්තයො උපදින තැන දී ඒ ඒ ස්වභාවයන් ලබලා උපදිනවා.

බුදුරජාණන් වහන්සේ මාලබාරි දෙවියා ගැන කියනවා. බිරින්දෑවරු ඒ කියන්නෙ දිව්‍යාංගනාවො පන්සියයක් එයාට ලැබෙනවා. එයා ඉපදෙන වෙලාවෙ. ඒ එයාගේ පින. ඒ

දිව්‍යාංගනාවො පන්සිය දෙනා මොකද කරන්නේ? හැමදාම නන්දන උයනට ගිහිල්ලා මල් අහුල අහුලා අර දෙවියන්ව මලින් වට කරනවා ඒ එයාගෙ පින. ඒ වගේ කරන පිනට අදාළව මහත්තයො ඒවා සකස් වෙනවා. ඉතින් එහෙම තමයි. අපි මැරිලා දිව්‍ය තලයේ උත්පත්තියක් ලැබුවොත්, ඒ දෙවිවරු මේ වෙලාවෙ අපි කියන බණ අහගෙන අනන්තවත් ඇති. මොකද දිව්‍ය ශ්‍රෝත වලින් ඒ ගොල්ලන්ට මේ බණ අහන්න පුළුවන්. දිව්‍ය චක්ඛු වලින් ඒ ගොල්ලන්ට මේ දේ දකින්න පුළුවන්. නමුත් දිව්‍ය ලෝකය කියන්නෙ මහත්තයො කාම පුරයක්. දැන් අපිට මහත්තයො මනුෂ්‍යයින්ට දුක කියන කාරණය ප්‍රකටයි. මනුෂ්‍යයාට දුක ප්‍රකටයි. නමුත් දෙවියාට ප්‍රකට නැහැ. දෙවියාට දුක ප්‍රකට නැහැ. මොකද ඒ ගොල්ලන්ට පින වැඩියි. පින වැඩි නිසා දුක ප්‍රකට නැහැ. ඒ ගොල්ලන් හම්බ කරලා උයලා පිහලා නෙමෙයි කන්නෙ. ඒ ගොල්ලන්ට පිනට සියල්ලම ලැබෙන්නෙ. එයාට අයිස් ක්‍රීම් එකක් වළඳන්න ඕනෙ කියලා හිතුණොත් මහත්තයො ඒ වෙලාවෙම එයාලා ඒ අයිස්ක්‍රීම් එක වළඳනවා. ඒ සැපයෙන් තෘප්තිමත් වෙනවා. එහෙම නැත්නම් කඩේට ගිහිල්ලා අයිස් ක්‍රීම් එකක් ගෙන්න ඕනෙ නැහැ. දෙවියාගේ පින අනුව තෘප්තිමත් වෙනවා. පිනෙන් වැඩි දෙවියන්ට දැනෙන්නා වූ රසය වැඩියි. දැන් කෙනෙක් ගිහිල්ලා හම්බන්තොට පොළට ගිහිල්ලා අයිස්ක්‍රීම් එකක් කනවා, රුපියල් දහයක් දීලා. තව කෙනෙක් කාගිල්ස් එකට ගිහිල්ලා රු. 200 ක් දීලා අයිස් ක්‍රීම් එකක් කනවා. දෙන්නම කන්නෙ අයිස් ක්‍රීම්. නමුත් දෙන්නා කන අයිස් ක්‍රීම් දෙකේ රස දෙකක් තියෙනවා නේද? ඒ වගේ පිනෙන් වැඩි දෙවියාට ලැබෙන සැපය වැඩියි. පිනෙන් අඩු කෙනාට අර සැපය ලැබෙන කොට දැනෙන්නා වූ සැපය අඩුයි. ඉතින් මේ වගේ මනුෂ්‍ය ලෝකයෙ වගේ පන්ති භේදයකින් තමයි මේ දෙවියොත් වෙන්නෙ.

ඉතින් ඒ වගේ දෙවියන් අර කාමයන් තුළ ජීවත් වෙන නිසා, සැපය වැඩි නිසා මහත්තයො ධර්මයට හිත යොමු කරන්න අවස්ථා ලැබෙන්නේ නැහැ. නමුත් මාර්ගඵලලාභී දෙවියන්ට ඕනෙම වෙලාවක අනුන්ගෙන් ධර්මයක් අහලා ඒ ධර්මය නුවණින් මෙනෙහි කරල නිවන් අවබෝධ කර ගැනීමේ ශක්තියක් තියෙනවා. කාමයන්ට බර වුණ දෙවිවරු මහත්තයො මෙවැනි ධර්ම දේශනා වලට හිත යොමු කරන්න තියෙන අවස්ථා අඩුයි. මොකද ඒ ගොල්ලන්ට දුක ප්‍රකට වෙන්නෙ නැහැ. දිව්‍ය ලෝකයේ තියෙන ස්වභාවයක් තමයි ඒක.

<u>ප්‍රශ්නය</u>

***14. මිථ්‍යාදෘෂ්ඨික දෙවියන් වෙනුවෙන් පහන් දැල්වීම නැවැත්වීමෙන් පසු යම්කිසි ගැටළුවක් වේද ස්වාමීන් වහන්ස?***

**පිළිතුර**

නැහැ එහෙම වෙන්නෙ නැහැ. ඒ කියන්නේ ශ්‍රද්ධාව තියෙන්න ඕනෙ. මේ මනුෂ්‍ය ලෝකයේ ඉන්න මනුෂ්‍යයින් අතරින් ශ්‍රේෂ්ඨම මනුෂ්‍යයා කව්ද? සක්විති රජ. අද සක්විති රජ කෙනෙක් නැහැ. නමුත් ඒ සක්විති රජුත් බුදුරජාණන් වහන්සේට වඳිනවා. මුළු දිව්‍ය තල වලටම ශ්‍රේෂ්ඨ කව්ද? ශක්‍රයා, ඒ ශක්‍රයාත් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට වඳිනවා. මුළු බ්‍රහ්ම තලයන්ට අධිපති කව්ද, මහා බ්‍රහ්මයා, ඒ මහා බ්‍රහ්මයත් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට වඳිනවා, මෙසා අසිරිමත් අය ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට වඳිනවා නම් කොහෙවත් ඉන්න අමනුෂ්‍යයෙකුට අපි බය වෙන්න ඕනෙද? අපි බය වෙනවා නම් අපි තුළ ශ්‍රද්ධාව තිබිලා නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ තුළ තියෙන අයෝමීය ගුණය ශක්තිය තමන් තුළට ලැබෙන්න ඕනෙ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ලෝකයේ තියෙන ශ්‍රේෂ්ඨතම ආරක්ෂාව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, සීලයත්, දානයත් කියලා. මොකද අපි ආරක්‍ෂාව කියල කියන්නේ එක්කෝ ත්‍රිවිධ හමුදාවේ එහෙම නැත්නම් පොලීසියේ හරි අයටනෙ. නමුත් බුදුරජාණන් වහන්සේ එහෙම කියන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ කියන්නේ මේ ලෝකේ ශ්‍රේෂ්ඨතම ආරක්ෂාව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, සීලයත්, දානයත් කියලා. මේවා ශ්‍රේෂ්ඨයි කියන්නේ මේ ගෙදරක ඉන්න මේ මහත්තයා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කරගෙන, හොඳට සිල් පද පහ ආරක්‍ෂා කරගෙන, දන් දෙමින් ජීවත් වෙනවා නම්, මොකක්ද සිද්ධ වෙන්නේ? සම්‍යක්දෘෂ්ඨික බලවේග තමන් ළඟට එනවා. මේ මනුෂ්‍ය ලෝකයේ ඉන්නවා මහා විශාල සම්‍යක්දෘෂ්ඨික යක්‍ෂයෝ. ඒ යක්ෂයෝ කියන්නේ දිව්‍ය ස්වභාවයේ යක්‍ෂයෝ. සම්‍යක්දෘෂ්ඨික අය, පෙර ජීවිත වල ස්වාමීන් වහන්සේලා අපවත් වෙලා ඒ වගේ අය සම්‍යක්දෘෂ්ඨික යක්‍ෂයෝ වෙලා උපදිනවා, සමහරවිට. ඒගොල්ලන්ට පිරිවර සිය දහස් ගානක් ඉන්නවා. ඒ ගොල්ලො පිනට කැමතියි. සතර වරම් දෙවියන්ගෙන් වරම් අරන් ඉන්නේ ඒ ගොල්ලෝ. එතකොට මෙතන දූන් පින් කරන කොට, දන් දෙනකොට, සිල් රකිනකොට, මේ ගොල්ලො දූන් මෙතෙන්ට එනවා. මේ ගොල්ලෝ මෙතෙන්ට එනකොට අමනුෂ්‍ය කොටස් වලට යන්න සිද්ධ වෙනවා. අමනුෂ්‍ය කොටස් වලට ඉන්න බැහැ පින් කරන කොට.

යමෙක් ගෙදර පින් කරන්නේ නැත්නම් දන් දෙන්නේ නැත්නම්, සීලයක් රකින්නෙ නැත්නම්, මොකුත්ම කරන්නේ නැත්නම් ඒ ගෙදර පිරිලා තියෙන්නේ අමනුෂ්‍යයින්ගෙන්මයි.

මොකද එතන අමනුෂ්‍යයින්ට ප්‍රිය තැනක්. මොකද පින් දහම් කරන්නේ නැහැ. එතන අමනුෂ්‍යයෝ ඉන්නවා. එතකොට ඔබ ගේ ඇතුළේ මේ සියලු පින් දහම් කරලා මේ විදිහට ජීවත් වෙන කොට සම්‍යක්දෘෂ්ඨික බලවේග ඔබ ළඟට එනවා. මේ ගොල්ලො ගෙදර ඉන්නවා, වත්තෙ ඉන්නවා, මේ ගොල්ලොන්ගෙන් කිසි හානියක් නැහැ. තමන්ව ආරක්ෂා කරනවා. තමන් වාහනේ නැගලා යනකොට ඒ ගොල්ලන් වාහනේ නැගලා වාහනේ ඇතුළේ ඉන්නවා. අපිට පේන්නේ නැහැ, තමන් රැකියාවට කාර්යාලයට යනකොට ඒගොල්ලන් කාර්යාලයේ ඉන්නවා, අපිට පේන්නේ නැහැ. අපි වාහනේ යනකොට සමහර විට අපිට අනතුරක් වෙනවා. අපි හිතමු කවුරු හරි මරාගෙන මැරෙන මනුෂ්‍යයෙක් බෝම්බයක් විසිකරනවා කියලා. එතකොට ඒ මරාගෙන මැරෙන මනුෂ්‍යයා බෝම්බයක් විසි කරන කොට ඒගොල්ලන්ට පුළුවන් අත හරස් කරලා ඉලක්කේ වරද්දන්න. ඒගොල්ලන්ට පුළුවන් ඇක්සලරේටරයේ බලය වැඩි කරලා වේගය වැඩි කරලා ඒ අනතුරින් අපිව ගලවන්න. ඒවගේ ශක්තියක් ඒගොල්ලන්ට තියෙනවා. නමුත් අපි දන්නෙ නැහැ. නමුත් කෙනෙක් එහෙම ගිහිල්ලා මරාගෙන මැරෙන බෝම්බයක් විසි කරලා යද්දී එයාව බේරෙනවා. බේරුනහම එයා හිතන්නෙ ආරක්ෂක හමුදාව නිසා බේරුණා කියලා. නැහැ. අර වගේ බලවේගයන් ක්‍රියාත්මක වෙනවා, අර ගොල්ලො ශ්‍රද්ධාවයි, දානයයි, සීලයයි තුළ ඉන්නවා නම්.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ශ්‍රද්ධාවයි ලොකුම ආරක්ෂාව, සීලයයි ලොකුම ආරක්ෂාව, දානයයි ලොකුම ආරක්ෂාව, මේ තුන කරන්න කරන්න, සම්‍යක්දෘෂ්ඨික බලවේග ඔබ ළඟට එනවා. තමන්ට ගමනක් යන්න තියෙද්දි අනතුරක් වෙන්න තියෙනවා නම් ලිස්සලා වැටිල හරි ඒ ගමන වළක්වනවා. එහෙම නැත්නම් හිතක් සකස් කරනවා ඒ ගමන යන්න එපා කියලා. ඒ බලවේගයන්ට එහෙම කරන්න පුළුවන්. මොකද ඒක සම්‍යක්දෘෂ්ඨිකයි. පින් වලට කැමති පින් කරපු අය ඒ.. ඒ නිසා මේසා බලයක් මෙහි තියෙනව නම් අමනුෂ්‍යයා කියන කාරණයට අපට බය වෙන්න කිසිම හේතුවක් නැහැ.

<u>ප්‍රශ්නය</u>

***15. කාමයෙහි වරදවා හැසිරෙන බොහෝ අය ප්‍රේත ලෝක වලට වැටෙන බව සඳහන් කළා. ඒ පිළිබඳව ඔබ වහන්සේගෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි ස්වාමීන් වහන්ස,***

**පිළිතුර**

ඒ ගොල්ලො ප්‍රේත ලෝක වලට වැටුණට පස්සෙ හරි අපුලයි. අපුලයි කියන්නේ ඒ ගොල්ලන්ගේ ශරීරයේ හැමතැනම කුණු වෙලා වණ වෙලා තියෙන්නෙ. ඒ කුණු වෙලා වණ වෙලා තියෙන ශරීරය දරාගෙන ඒ ගොල්ලො ජීවත් වෙනවා. ඒ ගොල්ලො අනික් ප්‍රේතයින් ළඟට කාමය ඉල්ලගෙන යනවා. කිසිම කෙනෙක් ඒ ගොල්ලො ළඟට එන්නෙ නැහැ. එතකොට කාමය නොලැබීමේ දුක එක පැත්තකින් දරාගෙන අනිත් පැත්තෙන් ශරීරයේ තුවාල වල දුක දරාගෙන ප්‍රේත ලෝකයේ ඒ ගොල්ලො කල්ප ගණන් දුක් විඳිනවා. ඉතින් ඒ නිසා කාමයෙහි වරදවා හැසිරෙනවා කියන එක, කාම වස්තුව වැරදි ආකාරයෙන් අපි පරිහරණය කරන්න නරකයි. මේ ශරීරය කියන්නේ කාම වස්තුවක්. අපි මේ ශරීරය ඇඳුමෙන් පැළඳුමෙන් හරි අපි ලෝකයාට ප්‍රදර්ශනය කරනවා නම් ඒක නිරයගාමී අකුසලයක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා.

**ප්‍රශ්නය**

***16. නූතන පරම්පරාවේ මව්පියවරු තමන්ගේ කුසින් බිහි කරන දරුවන් ඝාතනය කරනවා. දියණියන්ව ගණිකා සේවයට යොදවනවා. තම දරුවන් දූෂණයට අපයෝජනයට ලක් කරනවා. මේ වගේ තත්ත්වයන් ඇති වෙන්නේ කොහොමද ස්වාමීන් වහන්ස...?***

**පිළිතුර**

මේක හේතුඵල ධර්මයක්. මේ දේවල් වැඩි වෙන්න වැඩි වෙන්න ඔය වගේ හේතුන් නිසා සකස් වෙන්නා වූ ඵලයන් වැඩි වෙනවා. සමහර අම්මලා තාත්තලා කියනවා ''මම උඹව මරාගෙන කනවා'' කියලා. සමහර දරුවෝ කියනවා ''මම උඹව මරාගෙන කනවා'' කියලා. ඒ වගේ අය මැරෙන වෙලාවට ඒ තෘෂ්ණාවන් සකස් වුනොත් ඊට අදාළ කුලයන් වල ඉපදිලා ඒ දරුවාව ඒ අය මරාගෙන කනවා. ඒවායේ ඵලය තමයි අපි දකින්නේ.

මනුෂ්‍යයෝ දුස්සීල වෙන්න දුස්සීල වෙන්න, මනුෂ්‍යයාගේ හැසිරීම් රටාව පිරිහෙන්න පිරිහෙන්න ඊට අදාළ පරිසරයන් තමයි ලෝකය තුළ සකස් වෙන්නේ. ඒ නිසා ඒවායේ විපාකයන් තමයි අපට මේ අත්විඳින්න වෙන්නේ. නුවණින් කල්පනා කරලා බලන්න කොතනකවත් කාටවත් අසාධාරණයක් වෙලා නහැ. සංසාරෙදි අපි කරපු දේවල් අපිට

ලැබෙනවා. ඒ නිසා අපි දක්‍ෂ වෙන්න ඕන, අපි ඒ වගේ දේවල් වලට අකමැති නම් අපි එවැනි දේවල් වලින් මිදිලා නිවැරදි දේ තුළ ජීවත් වෙන්න.

අපි මේ ජීවිතයේ අම්මාට තාත්තාට පීඩා කරමින් අකීකරු වෙමින් ජීවත් වෙනවා නම් ඊළඟ ජීවිතයේ අපි කුඩා කාලයේ දීම අපේ අම්මා තාත්තා මැරිලා යනවා. එහෙම වුනාට පස්සේ ළමා නිවාසෙකට හරි කොහේ හරි තමයි හැදෙන්න වෙන්නේ. එහෙමනම් ඒ ළමා නිවාසේ ඉන්න දරුවෝ පෙර ජීවිතයේ අම්මා තාත්තාට දැඩි ආකාරයෙන් අකීකරු වුන දරුවෝ. ඒවායේ ඵලය ඒ දරුවො විඳිනවා. ඒ නිසා මෙතෙන්දී කාටවත් අසාධාරණයක් වෙලා නැහැ.

එහෙමනම් මේ සමාජය අකුසල් කරා යන්න අකුසල් වලට සුදුසු ලෝකයක් තමයි අපි ඉදිරියේ ගොඩනැගෙන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අනාගතයේ දී කිසිම අම්මා කෙනෙකුට තාත්තා කෙනෙකුට තමන්ගේ දරුවා ගැන හිතලා සතුටු වෙන්න බැහැ කියලා. ඒ වගේම කිසිම දරුවෙකුට තමන්ගේ අම්මා තාත්තා ගැන හිතලා සතුටු වෙන්න බැහැ කියලා. ඒ තරමට මනුෂ්‍යයාගේ දුස්සීල භාවය නිසා විකෘති අදහස් විකෘති සිතුම් පැතුම් නිසා මේ සමාජය පිරිහෙනවා කියලා. මේ සඳහා තියෙන එකම විසඳුම තමයි මේ ව්‍යසනය අපි දැකලා ලෝකයට ලෝකයේ ස්වභාවයෙන් ගමන් කරන්න ඉඩ දීලා අපි නැවතිලා ඉන්න එක. අපි නැවතිලා ඉන්නවා කියන්නේ ලෝකය කුසල් අකුසල් සංස්කාර රැස් කරමින් ගලාගෙන යනවා. අපි මේ කුසල් අකුසල් සංස්කාරයන්ගේ අනිත්‍යය දැකලා මේ ලෝකය තුළ නැවතිලා ඉන්න එක. ඒ විසඳුම හැර අපිට වෙන විසඳුමක් නැහැ.

**<u>ප්‍රශ්නය</u>**

***17. පෞරුෂත්වයෙන් ඉහළ ඉතාමත්ම බලවන්ත මිනිසුන් අපි දකිනවා. ඒ වගේම මනුෂ්‍යත්වය ලැබුවත් ඒ මනුෂ්‍යත්වයට සරිලන පෞරුෂත්වයක් නැති මිනිසුන් අපි දකිනවා. මෙවන් විෂමතාවයන් ඇති වන්නේ කොහොමද ස්වාමීන් වහන්ස ...?***

**<u>පිළිතුර</u>**

බුදුරජාණන් වහන්සේ ඒක කම්ම දායාද කියන සූත්‍රයේ දී දේශනා කරනවා මේ සත්වයා කර්මය දායාද කොට ගෙන ඉපදෙනවා කියලා. කර්මය මගේ කොට ගෙන ඉපදෙනවා කියලා. එතන දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යමෙක් හීන ආයුෂ

ලබනව නම් නිරතුරුවම රෝගී භාවයන්ට පත්වෙනවා නම් ඒකට හේතුව පෙර ජීවිතයේ එයා සත්ව හිංසාව, සත්ව ඝාතනය කරලා තියෙනවා කියලා. ඒ නිසා අපේ වර්තමාන සමාජයේ අපට පේනවා යමෙක් මව්කුසේ දීම මිය යනවා, අවුරුද්දේ දී දෙකේ දී, තුනේ දී .... දහයේ දී පහළොවේ දී නැතිවෙනවා. එහෙම නැති වෙන්නේ සමාජයේ වරදකින්වත් එහෙම තැන්තම් කාගේවත් වරදකින් වත් නෙවෙයි. ඒ පෙර සංසාරේ පෙර ජීවිත වල දී ඒ අය සත්ව ඝාතන, සත්ව හිංසනයන් සිදු කරපු නිසා.

එක දරුවෙක් හිටියා අවුරුදු දහය දොළහ වයසෙදි ම ඒ දරුවා අධිවේගී සුඛෝපභෝගී බස් රථයක ගමනක් යද්දී දරුණු හදිසි අනතුරකට ලක්වෙලා මිය පරලොව යනවා. සියල්ලෝම බැන්නේ කාටද? ... අර රියදුරන් දෙන්නට. මේගොල්ලන්ගෙ වරදින් මෙය සිදුවුනා කියලා මහා චෝදනා ගොඩක්, පොලීසියට ද එක පැත්තකින් බැනලා ප්‍රශ්න රාශියක් මතු වුණා. අපි දන්න ස්වාමීන් වහන්සේ කෙනෙක් උතුම් සමාධියෙන් අරමුණු කරලා බලන කොට උන්වහන්සේ දැකලා තියෙනවා මේ දරුවා මේ ජීවිතයේ අකුසල් කරපු කෙනෙක් නෙමෙයි. බොහොම කීකරුව ජීවත් වෙච්ච හොඳ දරුවෙක්. පෙර ජීවිතයේ මේ දරුවා ඉහළ පෙළේ නිවසක මෙහෙකාර වෘත්තියක් වගේ දෙයක් කරපු කෙනෙක්. සුදු කෝට් එක ඇඳලා සුදු සරම ඇඳලා ඉන්න ඉහළ පෙළේ නිවසක මෙහෙකරුවෙක්. ඒ ස්වාමීන් වහන්සේ කියනව මේ පුද්ගලයා වත්තේ වැඩ කරමින් ඉන්න අවස්ථාවේ දී එයා තියුණු කැත්තකින් සර්පයෙකුට ගහලා කපනවා. ඒ සර්පයා කහ පාටට හුරු සර්පයෙක් කියලා ස්වාමීන් වහන්සේ කියනවා. ඒ කියන්නේ ගැරඬියෙක් වගේ විස නැති සර්පයෙක්. මේ සර්පයා අර විදිහට මැරීමේ අකුසලය නිසයි මේ දරුවා වාහනේ ගමන් කරද්දී දරුණු විදිහට අනතුරට ලක් වෙලා මිය ගියේ. ඒක හේතුඵල ධර්මයක්.

ඒක අපි මේ විදිහට ගලප ගන්න බලමු. දැන් මෙතන සර්පයෙක් ඉන්නවා කියලා අපි හිතමු. ඒ සර්පයා විසකුරු සර්පයෙක්. දැන් මෙතනට මහත්මයෙක් එනවා. ඇවිත් මේ සර්පයා දැකලා හිතනවා හාමුදුරුවො මෙතෙන්ට ආවොත් මේ සර්පයා දෂ්ඨ කරන්න පුළුවන් කියලා. නැත්නම් වෙන දායකයෙකුට දෂ්ඨ කරන්න පුළුවන් කියලා. ඒක නිසා මම මේ සර්පයාට ගහලා මරණවා කියලා එයා ඒ සර්පයා මරලා දානවා. නමුත් තව තැනකට ඒ මහත්තයා යනවා. එතනදි එයාට පේනවා ගැරඬියෙක්. ඒ ගැරඬියා එයාගේ පාඩුවේ යනවා. මේ තමන්ගේ පාඩුවේ යන ගැරඬියා දකින අර මහත්තයා පොල්ලක් අරන් ගහලා මරණවා. දැන් මේ දෙකෙන් අකුසලය බලවත් කුමන අවස්ථාවේ දී ද? අර අහිංසක සතාට ගහපු එකේ

තමයි අකුසලය බලවත්ම. අනෙකදී විසකුරු සතාට ඒ මහත්තයා ගහද්දී ඒ සතාව මරණීය චේතනාව සකස් වුනා වාගේම ඒ මහත්තයා තුළ මෛත්‍රී චේතනාවකුත් සකස් වෙනවා. ''ස්වාමීන් වහන්සේට දෂ්ඨ කරයි, මෙතෙන්ට එන වෙනත් දායකයෙකුට දෂ්ඨ කරයි. දෂ්ඨ කළොත් මැරෙයි'' කියන මෛත්‍රී චින්තනයක් අර සත්වයා මරණීය චේතනාව තුළ සකස් වෙනවා. නමුත් අනෙක් සිද්ධියේ දී ඒ මහත්තයා තුළ සකස් වෙන්නේ අහිංසක සතෙක් මරණ බරපතල අකුසල් චිත්තයක්.

එහෙමනම් එදා ඒ මෙහෙකරුවා මරලා තියෙන්නේ අහිංසක සත්වයෙක්. එයා තියුණු කැත්තක් වගේ ආයුධයකින් අර සත්වයා කෑලි කෑලි වලට කපලා මරණවා ස්වාමීන් වහන්සේ උතුම් සමාධියෙන් දකිනවා. එහෙමනම් අර දරුවා දරුණු හදිසි අනතුරකට ලක්වෙලා මිය පරලොව යන්න විපාකය සකස් වුනේ කුමක් නිසාද? පෙර ජීවිතයේ දී කළා වූ අකුසලය විපාක දීලා ආපිට ආවා. එහෙමනම් ඒ අකුසලය විපාක දෙද්දී අපි බස් ගිනි තියලා වැඩක් තියෙනවද? ඒක හේතුඵල ධර්මයක්.

බුදුරජාණන් වහන්සේ බුදු දහමෙන් තමයි මේ හේතුඵල ධර්මය මතු කරලා දෙන්නේ. නමුත් අපි හේතුඵල ධර්මය දකින්න දක්ෂ නැති නිසා අපිට දරා ගැනීමේ ශක්තියක් නැති නිසා අපි මහා විනාශයක් සමාජය තුළ සිද්ධ කර ගන්නවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යමෙක් හීන ආයුෂ ලබනවා නම් නිරතුරුවම රෝගී භාවයන්ට පත්වෙනවා නම් ඒකට හේතුව පෙර ජීවිතයේ එයා සත්ව හිංසාව, සත්ව ඝාතනය කරලා තියෙනවා කියලා. යමෙක් මේ ජීවිතයේ දී දුප්පත් භාවයට පත් වෙලා, අල්පේශාක්‍ය භාවයට පත් වෙලා ජීවත් වෙන්නේ එයා පෙර ජීවිතයේ දන් පූජා කරපු නැති නිසා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. යමෙක් මේ ජීවිතයේ දී විරූපී භාවයට පත් වෙලා සමාජයේ අප්‍රසාදයට ලක් වෙලා ජීවත් වෙන්නේ එයා පෙර ජීවිතයේ ක්‍රෝධය ව්‍යාපාදයන් වඩපු කෙනෙක් නිසා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. කෙනෙක් මේ ජීවිතයේ ඉහළ තනතුරු දරන්නේ (ඒ කියන්නේ වෘත්තීය මට්ටමෙන් වෛද්‍යවරු, ඉංජිනේරුවන් වගේ) එයා පෙර ජීවිතයේ දී මහණ බමුණන් ළඟට ගිහිල්ලා ධර්මය, අධර්මය මොකක් ද කියලා අහලා දැනගෙන ඒ අනුව ජීවත්වෙලා තියෙනවා. හොඳ නරක මොකක් ද කියලා අහලා දැනගෙන තියෙනවා. ඒවායේ හේතුඵලයක් ලෙස තමයි මේ ජීවිතයේ ඉහළ වෘත්තීන් දරන්නේ.

දැන් අපි හිතමු දොස්තර මහත්තයෙක් ඉන්නවා කියලා. එයා ඇත්තටම සතුටු වෙනවා ''මම වෛද්‍යවරයෙක් වුනේ අපේ රටේ තියෙන නිදහස් අධ්‍යාපනය නිසා'' කියලා. නමුත් නිදහස් අධ්‍යාපනය නිසා නෙවෙයි ඒ මහත්තයා වෛද්‍යවරයෙක් වුනේ. එහෙමනම් ඒ මහත්තයා වගේම අනෙක් හැම දරුවෙක්ම වෛද්‍යවරයෙක් වෙන්න ඕන. එයා වෛද්‍යවරයෙක් වුනේ වෛද්‍යවරයෙක් වීමට අදාළ සංස්කාරයන් රැස්කළ නිසායි. සංස්කාර මොකක්ද? .... එයා පෙර ජීවිතයේ දී මහණ බමුණන් ළඟට ගිහිල්ලා ධර්මය අධර්මය මොකක්ද කියලා අහලා දැනගෙන තියෙනවා. හොඳ නරක මොකක්ද කියලා අහලා දැනගෙන තියෙනවා. ඒ අනුව ජීවත් වුනා. ඒ වගේම මේ ජීවිතයේ ද කෙනෙක් ද්වේශය, ඊර්ෂ්‍යාව, ගුණමකුකම වගේ දේවල් වඩන කොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඒ අය අල්පේශාක්‍ය ජීවිත වල උපදිනවා කියලා. කිසිදු තැනක පිළිගැනීමක් එයා ලබන්නේ නැහැ. පෙර ජීවිත වල අනුන්ව දෙවැනි තැනට දාලා, පල්ලෙහාට දාලා කතා කරපු නිසාම මේ ජීවිතයේ අල්පේශාක්‍ය ජීවිත ලබනවා කියනවා.

රාජ්‍ය නායකයෝ කියන්නේ පෙර ජීවිත වල සිල් ආරක්ෂා කරගෙන දන් දීපු අය. ඒ අය පිරිවර සම්පත් ඇතුව උපදින්නේ පෙර සංසාරේ හැමෝම එකතු කරගෙන පිංකම් කරපු නිසා. එහි ඵලය තමයි ඒ අය ලබන්නේ. පාලකයෙක් බවට ඡන්දයෙන් පත් වෙන්නේ ජනතාව ඡන්දය දෙන නිසා නෙවෙයි. අපි හිතනවා අපි තමයි එයාලව පත් කළේ කියලා. අපි පත් කළා නෙවෙයි. අපිට ඒ අයව පත් කරන්න හිතෙන්නේ කුමක් නිසාද? ... ඒ අය රැස් කරපු ආයුෂ, වර්ණය, සැපය, බලය නිසා. ඒවට වශී වෙලයි අපි ඒ අයට ඡන්දෙ දෙන්නේ. එහෙමනම් අපි ඡන්දෙ දෙනවා කියන්නේ අපිට ඒකට හිත සකස් වෙනවා කියන්නේ ඒ අය ළඟ තියෙන ඒ ශක්තිය නිසා. ඒ ශක්තිය නැත්නම් කවදාවත් අපට ඒ අයට ඡන්දය දෙන්න හිත සකස් වෙන්නේ නැහැ. එහෙමනම් ඒ අයට ඒ ශක්තිය ලැබුණේ කුමක් නිසාද? පෙර ජීවිතයේ දානය, ශීලය වගේම මෛත්‍රිය කියන කාරණය ඒ අය වඩලා තියෙනවා. එහෙමනම් ඒවායේ ඵලය තමයි අපි මේ සමාජයේ දකින්නේ. කොතැනකවත් කාටවත් ආසාධාරණයක් වුනාය කියන කාරණය අපේ ධර්මයේ කියන්නේ නැහැ. එහෙම තමයි අපි මේවා ගලපා ගන්න ඕන.

***<u>ප්‍රශ්ණකරු</u>***

***තේජවන්ත පෞරුෂයක් ලැබීමට හේතුව වන්නේ අප කරනු ලබන කුසල කර්මයන්ම ද ස්වාමීන් වහන්ස?***

**<u>පිළිතුර</u>**

නියත වශයෙන්ම මේ පෞරුෂත්වය ලැබෙන්නේ අප කළා වූ කුසල කර්මයන් මතයි. යම් පුද්ගලයෙකුට පෞරුෂත්වයක් නැත්නම් එයාට කිසිවෙකුගේ ආකර්ශනයක් ලැබෙන්නේ නැහැ. යම් කෙනෙකුට තව කෙනෙකුගේ ආකර්ශනයක් ලබා ගැනීමේ ශක්තිය නැත්නම් අපි කරන්න ඕන පුළුවන් තරම් දානය තුළ ශක්තිමත් භාවයට පත්වෙන එකයි. එතනින්ම තමයි අපිට ආයුෂ, වර්ණය, සැපය, බලය ලැබෙන්නේ.

**<u>ප්‍රශ්නය</u>**

***18. මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දකින එක බොහෝ දෙනාගේ ප්‍රාර්ථනයක් ... උන්වහන්සේගෙන් දහම් ශ්‍රවණය කොට නිර්වාණය ප්‍රාර්ථනා කිරීම ඒ අයගේ එකම අරමුණ ... ඒ සඳහා කළ යුතු පුණ්‍ය ක්‍රියා මොනවාද කියල දැනගන්න කැමතියි ස්වාමීන් වහන්ස?***

**<u>පිළිතුර</u>**

ඒකට උත්තරයක් වත් කියන්න කැමති නැහැ. මොකද මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහල වෙන්න නම් තව අවුරුදු ලක්ෂ 25 ක් වත් යනවා අඩුම ගණනේ. අවුරුදු ලක්‍ෂ විසිපහක් ගත වෙනවා කියන්නේ මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ බොහොම පැහැදිලිව දේශනා කරනවා මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වෙන්නේ මනුෂ්‍යයාට අවුරුදු 80,000 ක් ආයුෂ තියෙන කාලේ කියලා. එතකොට අවුරුදු 80,000 ක් ආයුෂ තියෙන මනුෂ්‍යයෝ බිහිවෙන්න නම් අපි ගණනය කරලා බලන්න ඕන. බුදුරජාණන් වහන්සේගේ කාලේ පරමායුෂ අවුරුදු 120 යි. අද වෙනකොට ඒක අවුරුදු 70 කට වගේ අඩු වෙලා තියෙනවා. ඒ කියන්නේ අවුරුදු 50 ක ආයුෂ වෙනස්වීමක් සිද්ධ වෙලා තියෙනවා. මේ අවුරුදු 50 ක ආයුෂ වෙනස්වීමක් සිද්ධ වෙන්න අවුරුදු 2600 ක කාලයක් ගිහිල්ලා තියෙනවා. අවුරුදු 2600 ක කාලයක් තුළ තමයි අවුරුද 50 ක ආයුෂ වෙනස්වීමක් සිද්ධ වුනේ.

මෙහෙම ගිහිල්ලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ මනුෂ්‍යයාගේ දුස්සීල භාවය නිසා මනුෂ්‍යයාගේ ආයුෂ අවුරුදු 10 කියන තැනට පහළ බහිනවා කියලා. එතකොට අවුරුදු 10 දී මනුෂ්‍යයා ජීවත් වෙලා, ඉගෙන ගෙන, විවාහ වෙලා මැරිලා ගිහිල්ල ඉවරයි. මෙහෙම ගිහින් මෘග සංඥාවෙන් මනුෂ්‍ය ප්‍රජාව දුර්වල වී පරමායුෂ අවුරුදු 10 ට අඩුවෙලා,

අවුරුදු 10 ඉඳන් නැවතත් සිල්වත් භාවය විසින් මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු 80,000 කියන තැනට රැගෙන එනවා. එහෙමනම් පෑනක් කොළයක් අරගෙන ගණන් හදලා බලන්න. මේ ආයුෂ අවුරුදු 50 වෙනස්වීම සිද්ධ වෙන්න අවුරුදු 2600 ක් ගිහිල්ලා තියෙනවා. එහෙමනම් අවුරුදු 80,000 ක පරමායුෂ තියෙන මනුෂ්‍යයෝ බිහිවෙන්න අවුරුදු කොච්චර යයි ද කියලා.

අවුරුදු ලක්ෂ 25 ක් වූ දීර්ඝ අබුද්ධෝත්පාද කාලයක්. ධර්මයක් නෑ. මිථ්‍යාදෘෂ්ඨික භාවය තුළ වැසුණු, ගිලුණු ලෝකයක්. බුද්ධ, ධම්ම, සංඝ යන වචනයක් ඇහෙන්න නැහැ. ඒ කාලයෙ අපි කොතනක ඉපදුනත් දුක තුලයි ඉපදෙන්නේ. ඔබ හිතන්න අවුරුදු ලක්ෂ 25 ක් කියන්නේ මේ අවුරුදු 60-70 ත් එක්ක හිතලා බලන්න, හිතාගන්නවත් බැරි තරම් කාල පරාසයක්.

ඒ නිසා යමෙක් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දකින්න බලාපොරොත්තු වෙනවා නම් ඒක මේ ලෝකේ තියෙන අවිද්‍යාවේ බරපතලම තැනක්. ඒ නිසා අපට පුළුවන් මේ මොහොතේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දකින්න. ඔබට මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ නිවන් දකිනවාය කියලා සකස් වෙන හිත අනිත්‍යයි කියලා දකින මොහොතේම ඔබ දකින්නේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මයයි. පංච උපාදානස්ඛන්ධය අනිත්‍යයි කියන ධර්මයයි. එහෙමනම් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වුනත් මේ ධර්මයමයි දේශනා කරන්නේ. මොකක්ද දේශනා කරන්නේ පංච උපාදානස්ඛන්ධය අනිත්‍යයි කියන ධර්මයයි. එහෙමනම් ඔබ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දැකලා නිවන් දකිනවාය කියන හිත අනිත්‍යයි කියලා දකින ඒ තත්පරයේදී ම ඔබ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය දකිනවා. මෛත්‍රී බුදුරජාණන් වහන්සේව ජීවමානව දකිනවා. එහෙමනම් මේ මොහොතේ සකස් වෙන හිත අනිත්‍යයි කියලා ඔබට පුළුවන් නම් දකින්න, ඔබට පුළුවන් මෛත්‍රී බුදුරජාණන් වහන්සේව ජීවමානව දකින්න. මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය දකින්න. අපි අවුරුදු ලක්‍ෂ 25 ක දීර්ඝ අබුද්ධෝත්පාද කාලයක් පහු කරගෙන යනවා කියන්නේ මේ ලෝකයේ තියෙන බරපතලම මෝහ හරිත ක්‍රියාවක්. ඒ නිසා ඔබ දක්‍ෂ වෙන්න මේ මොහොතේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේව දකින්න. ඒ දකින වෙලාවේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ වගේම ගෞතම බුදුරජාණන් වහන්සේත් දැක්කා වෙනවා. මොන බුදුරජාණන් වහන්සේ පහළ වුනත් දේශනා කරන්නේ පංච උපාදානස්කන්ධය අනිත්‍යයයි කියන ධර්මය විතරයි.

**ප්‍රශ්නය**

***19. යමෙක් තමාට චෝදනාවක් කරන විටදී, තමාට දොස් කියන විටදී, අපහාස කරන විටදී, ඉබේ හට ගන්නා දුක් වේදනාව පිසදා ගන්නට අමාරු ස්වභාවයක් ඇති වෙනවා. එයින් මිදීමට බොහෝ වේලාවක් ගත වෙනවා. ඉන් මිදෙන්නේ කොහොමද ස්වාමීන් වහන්ස?***

**පිළිතුර**

ඒක මිදෙන්න නම් දරුවෝ තමන් කවදා හරි තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට එන්න ඕනේ. ධර්මය කෙරෙහි ශ්‍රද්ධාවට. ධර්මය කෙරෙහි ශ්‍රද්ධාවට ආපු කෙනා ජීවිතය ධර්මානුකූලවයි ගලපා ගන්නේ. ඔබලා කිසිම කෙනෙකුට ඔබලාට නොලැබෙන්න තියෙන දෙයක් ලැබිලත් නැහැ. ලැබෙන්න තියෙන දෙයක් නොලැබිලත් නැහැ. ඔබලාට ලැබුණේ ඔබලා කර ගත්තා වූ දේයි. එතකොට මේ ඔබලා කරගත්තා වූ දේ නම් ඔබලාට ලැබුණදේට ඔබලා ගැටිල වැඩක් නැහැ. මේ මොහොතේ ඔබ කඳුලක් හෙලනව නම් දරුවෝ ඔබ ඒ කඳුළ හෙලන්නේ ඔබ මේ සංසාරෙ කාට හරි කඳුලක් දීල තියෙන හින්දයි. ඔබ මේ මොහොතේ හිනාවෙනවා නම් ඔබ හිනාවෙන්නේ සංසාරේ කාවහරි හිනස්සලා තියෙනවා. හේතුඵල ධර්මයක්. එහෙමනම් ඔබ කඳුලක් එන වෙලාවෙ කඳුලට ගැටෙනවා නම්, සිනහවක් එන වෙලාවෙ සිනහවට ඇලෙනවා නම් ඒකෙ තේරුමක් නැහැ. ඒ දෙකම ඔබ කරගත්තා වූ දෙයක්මයි.

ඔබේ බිරිඳ ඔබට අකීකරු නම් එය ධර්මානුකූලව ගලපාගන්නේ කොහොමද? මම ගිය ජීවිතයේ මගේ බිරිඳට අකීකරු වෙලා ඉන්න ඇති. ඔබේ දරුවා ඔබට අකීකරු නම් ඔබ හිතනවා මං පුංචි කාලේ මගේ තාත්තාට අකීකරු වෙලා ඉන්න ඇති. හේතුඵල ධර්මයන් අනුව ගලපනවා. එතකොට මෙහෙම ගලපද්දී මෙයා දකිනවා මම මේ විඳින්නා වූ මානසික පීඩාව මම විසින් කර ගත්තා වූ දෙයක් කියලා. කවුරුත් කරපු දෙයක් නෙමේ. මම විසින් කර ගත්තා වූ දේට මම ගැටිලා වැඩක් නැහැ. මම විසින්ම කරගත්තා වූ දේට මම ඇලිලා වැඩක් නැහැ. මම මෙතන ඉන්නේ මම කරගත්තා වූ දේ නිසා. ඔබලා ඔතන ඉන්නේ ඔබලා කරගත්තා වූ දේ නිසා. ඒ නිසා ධර්මානුකූලව ජීවිතය ගලපනකොට එයා ගැටෙන්නේ නැහැ. එයා ඉස්සරහට ඇවිල්ලා කව්රුහරි බනිනකොට එයා හිතන්නේ අනේ මමත් කාටහරි බැනලා ඇති. කවුරුහරි චෝදනා කරනකොට එයා හිතන්නේ අනේ කාටහරි මමත් චෝදනා කරලා ඇති. අන්න හේතුඵල ධර්මයන් අනුව ගලපලා එයා අයින් වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රූපය මාරයා කියලා. ආයෙමත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හිත කියන්නේ, පංචුපාදානස්කන්ධය කියන්නේ මාරයා කියලා. එහෙමනම් අපි දැනගන්නවා අපේ ඉස්සරහට එන මොන රූපයත් මාරයා හැටියට දකින්න. එක ස්වාමීන් වහන්සේ නමක් ගෙදරකට ආවා ටිකට් පොතක් විකුණන්න. රු. 25/- ටිකට් එකක්. මේ ළමා නිවාසයකට ආධාර පිණිස. එතකොට ඒ ගෙදර මහත්තයා මොකද කරල තියෙන්නේ ඒ ස්වාමීන් වහන්සේට බැනල එළවගෙන. මේවා විනයට අදාළ නැහැ කියලා. ඇත්තටම මුදල් පරිහරණය කරන්න බැහැ ස්වාමීන් වහන්සේ කෙනෙකුට, උපසම්පදා භික්ෂුවකට. ඒක තමයි විනය නීතිය. නමුත් අර මහත්මයා ස්වාමීන් වහන්සේට බැනල එළවගෙන, එතනින් නැවතුනේ නැහැ. මටත් ඇවිල්ලා දවසක් කිව්වා. දකින දකින කෙනාට මේක කියනවා. දැන් මේ මොකක්ද මෙයා කර ගන්නේ අකුසලයක්. නමුත් අර ස්වාමීන් වහන්සේ ගෙදරට ආපු වෙලාවේ හාමුදුරුවනේ, මට නම් ටිකට් එකක් ගන්න බැහැ. කරුණාකරලා යන්න කිව්ව නම් ප්‍රශ්නය ඉවරයි නේද? නැත්නම් මගේ ළඟ තියෙන්නෙ රුපියල් 10 නම් මේ රුපියල් 10 ආධාරයට තියාගන්න කියල දුන්න නම් ප්‍රශ්නය ඉවරයි නේද? මුදල් නෑ කියල කිව්ව නම් ප්‍රශ්නය ඉවරයි නේද? ඇයි ප්‍රශ්නයක් මතුකර ගත්තෙ? රූපය මාරයා විදිහට දැක්කේ නැහැ. ඒ ආවේ මාරයා කියලා දැක්කේ නැහැ. ඒ නිසා එයා අකුසලයක් කරා ගියා.

දැන් මට මදුරුවෙක් වහලා මෙතන කනවා. බුදුරජාණන් වහන්සේ කියනවා රූපය මාරයා කියලා. නමුත් මම මේ මදුරුවා මාරයා හැටියට දකින්නේ නැහැ. මම මදුරුවාට ගහන මොහොතේම මම අකුසලයක් කර ගත්තා. මම මේ මදුරුවා මාරයා විදිහට දැක්ක නම් මේ ආවේ මට අකුසලයක් කර ගන්න කියලා දැක්ක නම් මම මේ මදුරුවාව එළෙව්ව නම් අකුසලයක් සිදු වෙනවද? නැහැ. එහෙමනම් තමන්ට අනුන් නිසා හිත් වේදනාවක් ඇති වෙනවා නම් හැම වෙලාවෙම ඒ රූපය මාරයා විදිහට දකින්න. ඒ රූපය ඔබ ඔබේ කර ගන්න එපා.

එක තරුණයෙක් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට කියනවා භාග්‍යවතුන් වහන්ස, මට හරිම දුකයි. නිතරම මට ඇඬෙනවා කියලා. බුදුරජාණන් වහන්සේ අහනවා තරුණය, ඔබේ ගමේ ඥාති කෙනෙක් මැරෙනවා, ඔබ ඒ මරණයට ගිහිල්ලා මොකද කරන්නේ කියලා. ස්වාමීන් වහන්ස මම ඉකි ගස ගසා අඬනවා කියනවා. හොඳයි ඒ ගමේම තවත් කෙනෙක් මැරෙනවා. නමුත් එයා ඔබේ ඥාතියෙක් / හිතවතෙක් නෙමේ. ඔබ ඒ මරණයට ගිහිල්ලා

මොකද කරන්නේ. නැහැ. මට ඒකට ගියාට ඇඬෙන්නේ නැහැ කියනවා. ඔබේ ඥාතියෙක් ලෙඩ වෙනවා. ඒ ඥාතියා බලන්න ගියහම මොකද සිද්ධ වෙන්නේ. මම අඬනවා කියනවා. ඥාතියෙක්, යාළුවෙක් නොවන කෙනෙක් ලෙඩ වෙනවා. ඔබ එයා බලන්න ගියොත් මොකද වෙන්නේ. නෑ. මට ඇඬෙන්නේ නෑ. එහෙමනම් ඔබ දැන ගන්න යමෙක් කෙරෙහි ද තෘෂ්ණාවෙන් බැඳුනේ, තෘෂ්ණාවෙන් බැඳුන තරමටයි දුක සකස් වෙන්නේ කියලා. ඒ නිසා ඔබ කියනවා නම් අනුන් නිසා දුක ඔබට වැඩි වෙනවා කියලා ඒ අනුන්ගේ ප්‍රශ්නයක් නෙමෙයි. ඔබ කෙරෙහි ඔබ සකස් කර ගත්තා වූ තෘෂ්ණාවයි.

<u>ප්‍රශ්නය</u>

***20. ගෞරවනීය ස්වාමීන් වහන්ස, ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම හෙවත් ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගය විදර්ශනාවට හරවන්නේ කෙසේදැයි අපට පහදා දෙනු මැනවි ස්වාමීන් වහන්ස!***

<u>පිළිතුර</u>

ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලෞකික හා ලෝකෝත්තර වශයෙන් කොටස් දෙකකට බෙදනව. ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගය අපිව අරන් යන්නේ භවයට. ඒ කියන්නේ සුගතිගාමී උපතකට. ඔබ ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ ගමන් කරන කෙනෙක් නම් ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ඵලය හැටියට ඔබට ලැබෙන්නේ නැවත සුගතියේ උපතක් විතරයි පින්වතුනි. ඒක හොඳට තේරුම් ගන්න. දැන් ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා දිට්ඨිය කියල කියන්නේ මොකක්ද?

- තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව
- කර්මය කර්මඵල විශ්වාසය
- මැරිල හේතුඵල ධර්මයන් අනුව උපතක් තියෙනවා කියන විශ්වාසය
- අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳව ඇති කරගන්නා වූ විශ්වාසය
- දන් දුන්නොත්, සිල් සමාදන් වුනොත් ආනිසංස තියෙනවාය කියල ඇතිකර ගන්නා වූ විශ්වාසය

දැන් මේ විස්වාසයන් ඔබලා තුළ තියෙනවද? නැද්ද? ඔබලා තුළ මේ විශ්වාසය තියෙනව නම් ඔබලා ලෞකික සම්මා දිට්ඨිය තුළ ඉන්නවා.

තාම ඔබලා තුළ විශ්වාසයක් නැත්නම් මම මැරුණට පස්සේ උපදිනවා කියලා, එහෙමනම් ඔබ ලෞකික සම්මා දිට්ඨිය තුළ නැහැ. ඔබ තුළ විශ්වාසයක් තියෙනවානම් අම්මා, තාත්තාට සැලකීම තුළ කුසලයක් ලැබෙන්නේ නැහැ කියලා, එහෙම නම් ඔබ ලෞකික සම්මා දිට්ඨිය තුළ නැහැ. එහෙම නම් ලෞකික සම්මා දිට්ඨිය තුළ ඉන්නවා කියන්නේ මොකක්ද? අනිවාර්යෙන්ම ඔබව සුගතියේ උපතක් කරා අරන් යනව පින්වතුනි.

භව නිරෝධයට අරන් යන්නේ නැහැ. මේ සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනක් පසුකරගෙන ආවා වූ ගමනේ දී තාම අපි ලෞකික සම්මා දිට්ඨියෙන් ඔබ්බට ගිහිල්ල නෑ පින්වතුනි. ලෞකික සම්මා දිට්ඨිය තුලමයි අපි ජීවත්වෙලා තියෙන්නෙ. එහෙමනම් මුලින්ම අපි ලෞකික සම්මා දිට්ඨිය තුළ ශක්තිමත් වෙන්න ඕන. ලෞකික සම්මා දිට්ඨිය තුළ ශක්තිමත් වෙලා ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දක්ක තැනයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙන්නේ. අන්න ඒක හොඳට තේරුම් ගන්න ඕනෑ ඉහතින් මා සඳහන් කරන ලද සියලුම කරුණු ලෞකික දේවල්. අපි සම්මා සම්බුද්ධ ශාසන ලක්‍ෂ ගණනක ඉපදිලා, කොච්චර නම් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගෙන ඉන්න ඇද්ද?

ඒ ශ්‍රද්ධාව නිත්‍යද? අනිත්‍යද? අනිත්‍යයි පින්වතුනි. කොච්චර ශ්‍රද්ධාව ඇති කරගෙන හිටියත් ආයිමත් අබුද්ධෝත්පාද කාලවල මිථ්‍යාදෘෂ්ඨික ස්වභාවයට පත් වෙනව. බලන්න ඔබලා මේ ආවා වූ දීර්ඝ භව ගමනේ දී අම්මලා තාත්තලා කරේ තියාගෙන ගිහිල්ල කොච්චර නම් සලකන්න ඇද්ද? ඒ සලකලා ඔබලා කොච්චර සුගතියේ ඉපදෙන්න ඇද්ද? බ්‍රහ්ම ලෝකවල ඉපදෙන්න ඇද්ද? ඒ උපතවල් ඒ සැප නිත්‍යද? අනිත්‍යද? අනිත්‍යයි. කොච්චර අපි සිල් සමාදන් වෙන්න ඇත්ද? කොච්චර අපි දන් දෙන්න ඇද්ද? මේවා නිසා කොච්චර නම් කුසල් සංස්කාර රැස් කරගන්න ඇද්ද? ඒ සෑම සංස්කාරයක්ම විපාක දීලා අනිත්‍ය භාවයට පත්වුනා. අපි කොච්චර හේතුඵල ධර්මයන් අනුව නැවත ඉපදෙන්න ඇද්ද? ඒ උපත් ආයිමත් මරණයක් කරා ගිහිල්ල ආයිමත් උපතක් සිද්ධ වුනා.

එහෙමනම් මේ ලෞකික සම්මා දිට්ඨිය කියන්නේ පින්වතුනි, නිරතුරුවම විපාක දීලා අනිත්‍ය වෙන දෙයක්. එහෙමනම් මුලින්ම ලෞකික සම්මා දිට්ඨිය තුළ ජීවත් වෙන්න. ජීවත් වෙලා ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දක්ක තැනයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙන්නේ. එතකොට එයා ශ්‍රද්ධාවට බැඳී යන්නේ නැහැ. එයා දන්නව ශ්‍රද්ධාව කියන්නෙත් අනිත්‍ය වූ ධර්මතාවයක් කියලා. කොච්චර ශ්‍රද්ධාවෙන් ජීවත් වුනත් සුගතියේ

උපතක් ලැබෙයි. ආයිමත් දුගතියේ උපතක් ලැබෙනවා කියලා එයා දකිනවා. ඒවගේම ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සෑම අංගයක්ම විදර්ශනා නුවණින් දක්ක තැනයි ලෝකෝත්තර ආර්ය අෂ්ඨාංගික මාර්ගය සකස් වෙන්නේ. දැන් සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දකින හැටි කිවුව. ඊළඟට බලන්න සම්මා සංකප්පය. සම්මා සංකප්පය කියන්නේ මොකක්ද? අවිහිංසා සංකප්පය. අව්‍යාපාද සංකප්පය, නෙක්ඛම්ම සංකප්පය.

අවිහිංසාව කියන්නේ අපි හිංසනයට ලක් කරන්නේ නෑ කියන එක. හිංසනයට ලක් කරන්නේ නැතිව කෙනෙක් ජීවත් වෙනව නම් ඒක ලෞකික සම්මා සංකප්පය පින්වතුනි. කෙනෙක් ව්‍යාපාදයෙන් තොරව ජීවත් වෙනව නම් ඒක ලෞකික සම්මා සංකප්පය. කෙනෙක් නෙක්ඛම්මය තුළ ජීවත් වෙනවනම්, නෙක්ඛම්මය කියන්නේ අත්හැරීම. මොනවද අත්හරින්නේ? ලෝභ, ද්වේශ, මෝහයන් අත් හැරලා ජීවත් වෙනව නම් ඒක නෙක්ඛම්ම සංකප්පය. දැන් මේ කාරණා තුන තුළ ඔබ ජීවත් වෙනවනම් අන්න ලෞකික සම්මා සංකප්පය තුළ ඔබ ජීවත් වෙනවා පින්වත්නි.

දැන් බලන්න මේ ලෞකික සම්මා සංකප්පය බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ප්‍රඥාවට අදාළ අංගයක් හැටියට. මේ සම්මා දිට්ඨියයි. සම්මා සංකප්පය කියන කාරණා දෙක ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රඥාවට අදාළ අංගයක් හැටියටයි පනවන්නේ. එහෙමනම් මේ සම්මා සංකප්පය පින්වතුනි අපේ ගිහි ජීවිතයේ දී නිතරම අපි අනතුරකට දාගන්න තැනක්. මොකද අපි රාජකාරි කරන්න යන පැය අටේ දී ඔබ රාජකාරියේ යෙදිල ඉන්න වෙලාවේ ඔබේ ළඟට යම් කෙනෙක් එනව ඔබේ සේවාව අපේක්ෂාවෙන්. ඔබ ඒ තැනැත්තාව ප්‍රමාද කරවනව නම්, හරවල අරිනවනම් හෙට එන්න, අනිද්ද එන්න කියලා අරිනවනම් ඒ කරන මොහොතේම ඔබ අවිහිංසා සංකප්පයෙන් බැහැර වනවා, පින්වතුනි. හිංසාවක් ඔබ සිද්ධ කරනවා, ඔබ ඒ මනුස්සයාට. ඒ මොහොතෙම ඔබ සම්මා සංකප්පයන්ගෙන් බැහැරට යනව පින්වතුනි. ඔබ හිතන්න ඔබ ඉස්සරහට එන ඔබේ සේවාව අපේක්ෂා කරන තැනැත්තා හෝ තැනැත්තිය නිසා ඔබ ද්වේශය සකස් කර ගන්නව නම්, ව්‍යාපාදය සකස් කර ගන්නව නම් ඒ මොහොතේම ඔබ සම්මා සංකප්පයන්ගෙන් බැහැරට යනව පින්වත්ති,

ඔබ ගෙදර දොරේ ජීවිතයේ දී ඔබේ ස්වාමි පුරුෂයා සමග ඔබේ බිරිඳ සමග ද්වේශය ඇතිකර ගන්නව නම් දරුවන් නිසා ඔබ ද්වේශය ඇතිකර ගන්නව නම් ඒ මොහොතේම ඔබ සම්මා සංකප්පයන්ගෙන් බැහැරට යනවා පින්වත්ති, එහෙමනම් බලන්න දවසේ පැය 24 තුළ

ඔබ ජීවත් වෙන තුරාවට ඔබ අවදියෙන් ඉන්නෙ පැය 12 ද මේ පැය 12 තුළ කොච්චර නම් සම්මා සංකප්පයන්ගෙන් අපට බැහැර වෙන්න සිද්ධ වෙනවද කියලා. එහෙම නම් එහෙම බැහැර වෙන මොහොතේම පින්වතුනි අපි ලෞකික සම්මා සංකප්පය දුර්වල කර ගන්නවා. ඒ නිසා මුලින්ම මේ ලෞකික සම්මා සංකප්පයන් ශක්තිමත් කර ගන්න ඔබේ ඉදිරියට ඔබේ සේවාව අපේක්ෂාවෙන් කෙනෙක් ආවත් අමුත්තෙක් ආවත්, ඥාතියෙක් ආවත් ඔබට තියෙන රාජකාරි රාමුව තුළ ඔහුව සතුටු කරන්න බැරි වෙන්න පුළුවන්. ඔහුව සතුටු කරන්න බැරි වුණත් ඔබ සිනහවකින් හෝ ඔහුව සතුටු කරල අරින්න ඔබ දක්ෂ වෙන්න ඕන.

ඔබ හිනාවකින් ඒ කෙනාව සතුටු කරන මෙහොතේම ඔබ සම්මා සංකප්පයන් තුළට යනව පින්වතුනි. මේ හිනාවක් තුළින් ඔබට පුළුවන් සම්මා සංකප්පයක් සකස් කර ගන්න. නමුත් ඒ සා පහසුවෙන් සම්මා සංකප්පයන් ජීවිතයට ඇතුළු කරගන්න අවස්ථාව තියෙද්දිත් අපි මේ ජීවිතයේ දී කොච්චර නම් අවිහිංසා සංකප්පයෙන්, අව්‍යාපාද සංකප්පයෙන් බැහැරට යනවද කියලා බලන්න.

කොච්චර ලෝභ, දෝස, මෝහ සිත් අතහැරලා ඒවායෙහි අනිත්‍ය භාවය දැකලා කොච්චර නම් නෙක්ඛම්ම සංකප්පය තුළ ජීවත් වෙන්න පුළුවන්ද? එහෙම නම් මුලින්ම පින්වත්නි, ලෞකික සම්මා සංකප්පයන් තුළ ජීවත් වෙන්න. ලෞකික සම්මා සංකප්පයන්ගෙන් ජීවිතය පරිපූර්ණ කරගත්තට පස්සෙ මේ ලෞකික සම්මා සංකප්පයක් විදර්ශනා නුවණින් දකින්න පින්වත්නි.

ලෞකික සම්මා සංකප්පය විදර්ශනා නුවණින් දකින්නෙ කොහොමද? අපි කොච්චර නම් අවිහිංසාවෙන් ජීවත් වුණත් එහි ඵලය හැටියට අපට ලැබෙන්නේ මොකක්ද? සුගතියේ උපතක්.

කොච්චර අපි ද්වේශයෙන් තොරව, ව්‍යාපාදයෙන් තොරව ජීවත් වුනත් අපට ලැබෙන්නේ මොකක්ද? සුගතියේ උපතක්. කොච්චර අපි ලෝභ, දෝස, මෝහ සිතුවිලි වලින් බැහැරව ජීවත් වුනත් අපිට ලැබෙන්නේ මොකක්ද? සුගතියේ උපතක්.

එහෙමනම් මෙන්න මේ ලැබෙන්නා වූ සුගතියේ උපත අනිත්‍යයි කියල අපි දකින්න ඕන. ඒ දකින වෙලාවෙ සම්මා සංකප්පය විදර්ශනා නුවණින් දැක්කා වෙනව. මේකෙ

ආශ්වාදයට බැඳෙන්නේ නෑ. මොකද ලෞකික සම්මා සංකප්පයන් අපිව භවයටයි අරන් යන්නේ පින්වතුනි. භවයේ සුගතිගාමී උපතක් කරායි අපව අරන් යන්නේ. ඒ නිසා නිරතුරුවම මුලින්ම සම්මා සංකප්පයන් තුළ ශක්තිමත් වෙලා ඊළඟට සම්මා සංකප්පයන්ගෙන් ලැබෙන්නා වූ ඵලය විදර්ශනා නුවණින් දැකල ලෝකෝත්තර සම්මා සංකප්පය ඇති කරගන්න අපි දක්ෂ වෙන්න ඕනෑ.

දැන් සම්මා වාචා කියන්නේ මොකක්ද? යහපත් වචන, මුසාවාදා, පිසුණාවාචා, පරුෂාවාචා, සම්ඵප්ප්‍රලාපා. යමෙක් කොච්චර යහපත් වචන කථා කලත් මොකක් ද ලැබෙන්නේ? සුගතියේ උපතක්. ඊට වඩා දෙයක් නැහැ. මේ ලැබෙන්නා වූ සුගතියේ උපත කියන්නේ ලෞකික සම්මා වාචාවේ ඵලය. මේ ලැබෙන්නා වූ සුගතියේ උපත අනිත්‍යයි කියල අපි දකිනවනම් මේ සුගතිය ආයිමත් දුගතියක් කරා වැටෙනවා කියල අපි දකිද්දී අන්න ලෞකික සම්මා වාචාව විදර්ශනා නුවණින් ගලපා ගත්තා පින්වතුනි.

ඒවගේ මුලින්ම ඔබ ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගය ශක්තිමත් කරමින් මේ ලෞකික ආර්ය අෂ්ඨාංගික මාර්ගය විදර්ශනා නුවණින් දැක්ක තැනයි ලෝකෝත්තර ආර්ය අෂ්ඨාංගික මාර්ගය සකස් වෙන්නේ.

**ප්‍රශ්නය**

***21. ස්වාමීන් වහන්ස, සමාධිය විදර්ශනාවට නංවන්නේ කෙසේද?***

**පිළිතුර**

සමාධිය විදර්ශනාවට නංවනවා කියන්නේ මහත්තයෝ දැන් අපි බලමු මේ ආශ්වාසයේ සහ ප්‍රාශ්වාසයේ දිග භාවය, කෙටි භාවය බලමින් අපි ජීවත් වෙනවා කියලා. මුලින්ම ආශ්වාසයේ දිග භාවය දකිමින් ජීවත් වෙනව. ඊට පස්සේ ක්‍රමානුකූලව ඒ ආශ්වාදයේ කෙටි භාවය සකස් වෙනව. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ප්‍රීතිය, සැපය කියන කාරණාව සකස් වෙනව කියලා. ඊට පස්සේ මේ නාසයෙන් අපට මේ ආශ්වාසය ප්‍රාශ්වාසය කියල දෙයක් දැනෙන්නේ නැහැ. නමුත් මේ සියුම් ආශ්වාස ප්‍රාශ්වාසයන් උදරය හරහා ක්‍රියාත්මක වෙනව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. උදරය හරහා ක්‍රියාත්මක වන සියුම් ආශ්වාස සහ ප්‍රාශ්වාසයේ සංහිඳීම දකිමින් ජීවත් වෙනව කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. ප්‍රීතිය සකස් වෙන වෙලාවෙහි, සැපය සකස්

වෙන වේලාවේ දී ඒ ප්‍රීතිය, සැපය දකිමින් ජීවත් වෙනව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. එහෙම මේ හිත උපේක්ෂාව කියන තැනට පත්වෙනවා. ඇලීම් ගැටීම් වලින් තොර ස්වභාවය, මේ උපේක්ෂාව කියන තැන බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ සමාධිය විදර්ශනාවට හරව ගන්න පුළුවන් තැන කියලයි. කම්මල් කරුවෙක් යකඩයක් හොඳින් රත් කරල, රත්කරල කැමති හැඩයන්ට ඒ යකඩය නවා ගන්නවා වගේ මේ උපේක්ෂාව කියන තැන දී කැමති ආකාරයෙන් තමන්ට කැමති පැත්තට හිත යොමු කරගන්න පුළුවන්.

දක්‍ෂයා විදර්ශනාව පැත්තට හිත යොමුකරගන්නවා. තවත් කෙනෙක් ඒ හිත යොමුකරනව මේ පූර්වේ නිවාසානුස්සති, චුතුපපාත ඥාණ වගේ තැන් වලට. දිව්‍ය චක්ඛු, දිව්‍ය ශ්‍රෝත වගේ ඥාණයන් ඇතිකර ගන්න යොමු කරගන්න අයත් ඉන්නවා. ඒ පැත්තට යන අයට ඒ පැත්තට යන්න පුළුවන්. විදර්ශනාව ඇතිකර ගන්න කෙනෙකුට විදර්ශනාව පැත්තට යන්න පුළුවන්. ඉනුත් ඉස්සරහට යනව නම් සමාධියම වඩාගෙන අර ආකාසඤ්ඤා, නේවාසඤ්ඤා, නාසඤ්ඤා වගේ අරූපී ධ්‍යාන වඩාගෙන ඉස්සරහට යන්නත් පුළුවන්. මේ සමාධිය තුළින් මේ පැති තුනටම ගමන් කරන්න පුළුවන්. කැමති කෙනෙකුට ඥාණයන් සකස් කරගන්න පුළුවන්. චුතුපපාත ඥාණ, පුබ්බේ නිවාසානුස්සති ඥාණ, දිව්‍ය චක්ඛු, දිව්‍ය ශ්‍රෝත වගේ ඒ ඥාණයන් ඇතිකර ගන්න පුළුවන්. කැමති කෙනෙකුට ආකාසඤ්ඤායතනය, නේවසඤ්ඤා, නාසඤ්ඤායතන වගේ අරූපී ධ්‍යානයන් සකස් කරගන්නත් පුළුවන්. වඩාත්ම දක්ෂයා මොකද කරන්නේ. උපේක්ෂාව කියන තැන විදර්ශනාවට හිත යොමු කර ගන්නව. උපේක්ෂාව විදර්ශනාවට යොමුකරගන්න තැනදි එයා මුලින්ම සමාධියේ අනිත්‍යභාවය විදර්ශනා නුවණින් දකිනවා. මේ සමාධිය කියන්නේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නිරතුරුවම හරි ආශ්වාදජනක තැනක් කියලා. සමාධිය සකස් වෙච්ච තැන එයා තුළ සප්ත බොජ්ජංගයන් සකස් වෙනවා. මේ ප්‍රීතිය එස්සද්ධිය කියන කාරණය සමාධිය තුළ සකස් වෙද්දී නිරතුරුවම එයා ඒ සමාධිය තුළට ඇලී යනවා. බැඳී යනවා කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ නිසා මේ උපේක්ෂාව කියන තැනට හිත ගත්තට පස්සේ මුලින්ම මේ සමාධිය විදර්ශනාවට ලක් කරන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. සමාධිය විදර්ශනාවට ලක්කරන්නේ කොහොමද?

එයා දැන් මේ සමාධිමත් උපේක්ෂාව කියන හිත හදාගත්තේ කොහොමද? මුලින්ම එයා ආශ්වාසයේ දිගභාවය දකිමින් ජීවත් වෙනවා. ආශ්වාසයේ දිග භාවය අනිත්‍යභාවයට

පත් වෙලයි ආශ්වාසයේ කෙටි භාවය සකස් වෙන්නේ. ඉන්පස්සේ ප්‍රීතිය සැපය සකස් වුණා. මේ ප්‍රීතියත් සැපයත් අනිත්‍යභාවයට පත්වෙලයි උපේක්ෂාව කියන තැන සකස් වෙන්නේ. එහෙමනම් එයා දැන් මේ සමාධියේ තියෙන්නා වූ අනිත්‍යභාවය නුවණින් දකිනව. එතකොට එයා කවදාවත් මේ සමාධිය තුළ සකස් වෙන්නා වූ ප්‍රීතිය, සැපය, සංහිඳීම, උපේක්ෂාව කියන තැනට යොමු වෙන්නෙ, පුරුදු වෙන්නේ නෑ. මොකද එයා දන්නව මේ උතුම් ධර්මතාවයනුත් අනිත්‍යය කියන කාරණය. ඉතින් එහෙම කරල උපේක්ෂාව කියන තැනින් ... අර සතර සතිපට්ඨාන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනව, මේ ආයතන හැටියට. සතර මහා ධාතුව හැටියට දෙතිස් කුණපයන් හැටියට මේ රූපයේ අනිත්‍යභාවය දකින්න කියලා.

**ප්‍රශ්නය**

***22. කුසල මූල පටිච්ච සමුප්පාදය තුළ තිපරිවට්ටයක් මම යෝගී අවස්ථාවක දැක්කා. ඒ තිපරිවිට්ඨය විග්‍රහ කරල තියෙනව සාවට්ඨ, පරිවට්ඨ, විවට්ඨ කියලා. අවිද්‍යා මූල පටිච්ච සමුප්පාදය ගැන අපිට අහන්න ලැබිල තියෙන්නේ එහෙමයි. අනිත් එක මොකක්ද කියල දැනගන්නයි, මේ ප්‍රශ්නය යොමු කරන්නේ ස්වාමීන් වහන්ස?***

**පිළිතුර**

මෙහෙමයි මහත්තයො, ඔය දෙක කියන්න මම නම් දන්නේ නැහැ. අපි හැම වෙලාවෙම මහත්තයො සරල තැනින් අල්ලගන්න ඕනෑ. අපි ධර්මයේ ගැඹුරුම තැන් අල්ලාගන්න ගියොත් අපි හැමදාම හොය හොය ඉන්නව මිසක් ඵලයක් ලබන්නේ නැහැ. එතකොට මගේ ජීවිතයේ මං කැමතිම ධර්මයක් දේශනා කරනව නම් මම දැක්කා වූ දේ මම ඇල්ලුවා වූ තැනින් තමයි මම ඒක දේශනා කරන්නේ. මොකද අපේ ජීවිතයේ අපි පැවිදි වෙච්ච දවසේ පටන්, පැවිදි වෙච්ච මොහොතේ පටන් මම කළේ මගේ ළඟ තිබ්බා වූ දැනුම හිස් කළා මහත්තයො. ගිහි ජීවිතයක් පුරාවට අපි අප්‍රමාණ දේවල් කියෙවුව. අප්‍රමාණ දේවල් පරිශීලනය කළා. අප්‍රමාණ බණ ඇහුවා. ඒ සෑම දෙයක්ම ගිහි ජීවිතය තුළ සිද්ධ කළා. නමුත් අවසානයේ දී අපි පැවිදිවෙලා දැනගත්තා මේ දැනුම කියන්නේ පලිබෝධයක්ය කියන කාරණය. ඒ නිසා දැනුම කෙරෙහි තියෙන තෘෂ්ණාව අපි අයින් කර ගත්තා.

ඒ නිසා කොතනකවත් මහත්තයො ඔය සූත්‍රයක් කියවන වෙලාවෙ මහත්තයා කියන කාරණය මම නම් දැකල නැහැ. පටිච්ච සමුප්පාදය විස්තර කරද්දී මට විස්තර කරන්න

පුළුවන් මේ අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං මේ ආදී වශයෙන් අවසානෙට ගිහිල්ල ජාති, ජරා, ව්‍යාධි, මරණ කියන කාරණය තමයි මම නම් දැක්ක තැන. ඉතින් ඒ තැන මට ගොඩක් පහසු වුණා. ඒ නිසා හැම වෙලාවෙම මහත්තයො සමහර විට ඔය වැනි විග්‍රහයක් කොහේ හරි තියෙන්න පුළුවන්. නමුත් මහත්තයො අපට ඕන ලේසි තැනින් මේක අල්ලගන්නයි නේද?

__ප්‍රශ්නකරු__

***මම ඒක දැක්ක හින්දයි ඇහුවෙ. කොහේවත් ඊට උත්තර ලැබුණේ නැහැ. ඒකයි ඇහුවේ, ස්වාමීන් වහන්ස.***

__පිළිතුර__

එහෙමයි, ඉතින් හම්බවුනේ නැත්නම් මහත්තයො හොයන්න යන්න එපා. දැන් මම සරල ආකාරයෙන් පෙන්නුවනේ. ඒ නිසා අපි හැම වෙලාවෙම සරල තැනින් අල්ල ගන්න ඕනෑ. බුදුරජාණන් වහන්සේගේ කාලේ එක ස්වාමීන් වහන්සේ නමක් හිටියා. එයා අවුරුදු 50 ක් දැඩි ආකාරයෙන් වෙහෙස වෙලා තමයි සෝවාන් ඵලයට පත් වුනේ. අවුරුදු 50 ක් විතර ඒ වෙනුවෙන් කැප වුනා. ඒ මාර්ගය තුළ ගමන් කරල අවුරුදු 50 ක් ගත වෙලයි එයා සෝවාන් ඵලයට පත් වෙන්නේ. නමුත් අංගුලිමාල කියන කෙනා බුදුරජාණන් වහන්සේ දේශනා කරන එක ධර්ම කාරණයක් අහලයි චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත්තේ. කිසාගෝතමී, පටාචාරා, සුනීත වගේ අය එක ක්ෂණයකින් ධර්මය අවබෝධ කර ගන්නව. එතකොට මහත්තයෝ අපි හැම වෙලාවෙම මාර්ගය තුළ යද්දී අර අවුරුදු 50 ක් ගිහිල්ල මාර්ග ඵල අවබෝධ කරගත්ත භික්ෂූන් වහන්සේ අනුගමනය කරගෙන යනව නම් ඒක අපේ දුර්වලතාවයක්. අපි දක්ෂ වෙන්න ඕනෑ දකින්න අංගුලිමාල කොහොමද ක්ෂණයකින් මේ ධර්මය අවබෝධ කරගත්තේ කියලා. එහෙම නම් සුනීතල, සෝපාකල, පටාචාරල ගිහි ජීවිතය තුළ ධර්මය ගැන කිසිම දැනීමක් තිබ්බේ නැහැ. අර කිසාගෝතමිය මැරිච්ච දරුවෙක් කරගහගෙන නුවරක් පුරා ඇවිද්දා තමාගේ දරුවා මැරිල කියල අවබෝධ කරගන්නවත් දැනීමක්, ශක්තියක් ඇය තුළ තිබුණේ නැහැ. එහෙම දෙයක් වත් එයා දන්නේ නෑ. ඉතින් එවැනි කෙනෙකුත් අර සා පුංචි තැනකින්, පුංචි කමටහනකින් ධර්මය අවබෝධ කරගත්තා මහත්තයො.

ඒ නිසා අපි සෑම විටම ධර්මයේ ගැඹුරු තැන් සොයාගෙන යා යුතු නැහැ. ධර්මය කියන්නේ අතිශයින් සරලම දෙයක්. ධර්මය සරලම දෙයක් කියන්නේ මොකද ධර්මයට තියෙන්නේ එකම එක අර්ථයයි මහත්තයෝ. කුමක්ද ඒ අර්ථය? අනිත්‍යයි කියන අර්ථය විතරයි. කුමක්ද අනිත්‍යයි කියන්නේ. පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි ඔච්චරයි තියෙන්නේ.

කවදාහරි දවසක මහත්තයා සෝවාන් ඵලයට පත්වෙනව නම් මහත්තයා දකින්නේ පංච උපාදානස්ඛන්ධය අනිත්‍යයි කියන කාරණය. කවදාහරි මහත්තයා රහත් ඵලයට පත් වෙනව නම් මහත්තයා දකින්නේ පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියල ලබන අවබෝධය. අතන අනිත්‍යයි කියලා දකිනවා. මෙතැන දී අනිත්‍යයි කියලා අවබෝධ කරගන්නව. එහෙමනම් ඔය තුළ තමයි මේ ධර්මාවබෝධය සැඟවිලා තියෙන්නේ මහත්තයෝ. තේරුණාද? ඒ නිසා අපි හැම වෙලාවෙම දක්ෂ වෙන්න ඕනෑ සරල තැනින් මේක මතු කරල ගන්න.

මගේ ජීවිතයේ මම හැම වෙලාවෙම දැක්කේ අංගුලිමාල කොහොමද ධර්මය අවබෝධ කරගත්තේ කියලා. මේ සුනීතල, පටාචාරල, සෝපාකල කොහොමද ධර්මය අවබෝධ කර ගත්තේ කියලා. අර නිග්‍රෝධ වගේ පුංචි සාමණේරයන් වහන්සේලා, සංකිච්ච වගේ පුංචි සාමණේරයන් වහන්සේලා කොහොමද පුංචි වයසෙදි මේ ධර්මය මතු කරගත්තේ? එතනින් තමයි මහත්තයො අපි මේකට අවතීර්ණ වෙලා ඉන්න ඕනෑ. එහෙම නැත්නම් ධර්මය කියන්නේ අනිත්‍යයි කියන වචනයේ අර්ථය විතරයි. ඒ ධර්මය ඒ සා සරල තැනක්. නමුත් අපේ කෙලෙස් ගැඹුරු වෙන්න ගැඹුරු වෙන්න අපට ධර්මය ගැඹුරු භාවයට පත්වෙනව. ඒ නිසා ධර්ම මාර්ගය පිළිබඳව මට තියෙන අත්දැකීම නම් මහත්තයෝ මම සරලම තැනින් මතුකර ගත්තා කියන කාරණයයි. මහත්තයා කියන කාරණය කොතන හරි සඳහන් වෙනව ඇති. ඇත්තටම මම ඒ කතාව දන්නේ නෑ. (සාකච්ඡාවට වැඩම කර සිටි ස්වාමීන් වහන්සේලා අමතමින් දන්නව නම් කියලා දෙන්න යැයි ඉල්ලා සිටියහ. එහෙත් එම ස්වාමීන් වහන්සේලා ද මුනිවත රැක්කාහ)

අර කියපු විදිහට පටන්ගන්න මහත්තයො ගොඩක් ගැඹුරු තැන් හොයාගෙන යන්න එපා. දැනුම අවබෝධය අත්‍යවශ්‍යයි. දැනුමෙන් තොරව නිවන් දකින්න බැහැ. දැනුම කෙරෙහි තියෙන තෘෂ්ණාවත් අතහැරුණු තැනයි අවබෝධය ලබන්නෙ. තේරුණාද? දැනුමට ඇති

තෘෂ්ණාව අත හැරුණ කියලා දැනුම අපෙන් ගිලිහෙන්නේ නැහැ. අපි දැනුම කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහැරිය. තෘෂ්ණාව අතහැරිය කියල අපි ලැබූ දැනුම මොට වුණාද? නැහැ. දැනුම අප ළඟ තියෙනව. නමුත් දැනුම කෙරෙහි තියෙන තෘෂ්ණාවයි, අපි අයින් කරගන්න ඕනෑ. එතකොට දැනුම කෙරෙහි තියෙන තෘෂ්ණාව අතහැර ගන්න නම් හුඟක් වෙලාවට අපි සරලම තැනට ගිහිල්ල ඒ සරලම දේ අපි අල්ලා ගන්න දක්ෂ වෙන්න ඕනෑ.

ඔය සමාධිය තුළ අපට ගොඩක් දේවල් ඇහෙනව මහත්තයො. ඉතින් ඒ ඇහෙන හැම දෙයක්ම අපි ගන්න ගියානම් අපට ප්‍රශ්නයක් වෙනව. ඒ නිසා හැම වෙලාවෙම බුදුරජාණන් වහන්සේ දේශනා කරපු දේ පමණක් ගන්න අපි දක්ෂ වෙන්න ඕන. බුදුරජාණන් වහන්සේ සූත්‍රයක් තුළින් දේශනා කරපු ධර්මයක් තියෙනව නම් ඒ ධර්මය විතරක් අවශ්‍යතා සඳහා පරිහරණය කරන්න අපි දක්ෂ වෙන්න ඕන. මොකද ඉන් එහා අපට ලෝකයේ යම් කෙනෙක්, යම් දෙයක් ප්‍රකාශ කරන්නේ එයාගේ ඉන්ද්‍රිය ධර්මයන් වැඩිලා තියෙන ප්‍රමාණය මත. එතකොට එයාගේ ඉන්ද්‍රිය ධර්මයන් වැඩිලා තියෙන ප්‍රමාණය මත යමක් දේශනා කළහම අපට ඒ හැම ධර්මයම සීයට සීයක් නිවැරදි හැටියට දකින්න බැහැ. ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන බුදුරජාණන් වහන්සේ සරල ආකාරයෙන් දේශනා කරල තියෙන ධර්මය තුළින් අපේ ධර්ම මාර්ගය මතුකරල ගන්න.

<u>ප්‍රශ්නය</u>

***23. ස්වාමීන් වහන්ස, දෙමාපියන් දරුවන්ට තම යුතුකම් හා වගකීම් නිසිලෙස ඉටුකළ පමණින් එය සසර ගමනට ප්‍රමාණවත් වේද?***

<u>**පිළිතුර**</u>

බුදුරජාණන් වහන්සේ දේශනා කරනව අපි මේ සංසාර භව ගමනේ දී අම්මා, තාත්තා වෙලා දරුවන් උදෙසා හෙළු කඳුළු මහා සාගරයේ ජලයට වැඩියි කියල මහත්තයො. විශ්වාස කරනවද? මහා සාගරය කියන්නේ කොච්චර විශාල වූ දෙයක්ද? මහා සාගරයේ ජලයට වැඩිය අපි දරුවන් උදෙසා කඳුළු වගුරුවල තියෙනව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එතකොට මේ ජීවිතයෙ අපට ඉන්නෙ දරුවො දෙන්නයි, තුන්දෙනයි හෝ හතරදෙනයි. එතකොට මේ ජීවිතයේ දරුවො තුන්හතර දෙනා දිහා බලල අපි හිතනව කොච්චර නම් කඳුළු හෙළුවා කියලා විශ්වාස කරන්න බැහැ කියලා. ඉතින් මේක අපට ඇත්ත බවට පත් කරලා දෙන්නේ කවුද? ශ්‍රද්ධාව විසින්මයි. මොකද බුදුරජාණන් වහන්සේ

දේශනා කරනවා අපි ආවා වූ දීර්ඝ භව ගමන කොච්චරක් දුර ද කියලා. මහා පොළොවේ පස් වෙරළු ගෙඩි ගාණට ගුලි කරලා ගණන් කරලා බලද්දි ඊටත් වඩා දීර්ඝ වූ ගමනක් අපි ඇවිල්ල තියෙනව. ඉතින් ඒ ගමනෙදි බුදුරජාණන් වහන්සේ දේශනා කරනව දරුවන් උදෙසා හෙළු කඳුළු මහා සාගරයේ ජලයට වැඩියි කියලා.

අපි බලමු තිරිසන් ලෝකයේ සතෙක්, මාළුවෙක් කියන සතා ගන්නකො. අපිත් මාළු වෙලා, සංසාරෙ කොච්චර ඉපදිලා ඉන්න ඇත්ද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනව තිරිසන් කුලවල ඉපදුනහම එක දිගට ආත්ම භව 500 ක් විතර ඒ තිරිසන් කුලයේම ඉපදෙනව කියලා. ඔය ලොකු මාළුවෙක් ගත්තහම එක මුරයකට පැටව් දස දහස් ගණනක් බිහි කරනව. දස දහස් ගණනක් පැටව් දානව කියන්නේ එයා එක මොහොතක දි දස දහස් ගණනකට අම්මා කෙනෙක් වෙනවා. ඒ මාලුවා අවුරුදු 25 ක් ජීවත් වුනොත් එයා නිසා දරුවන් ලක්‍ෂ කීයක් බිහි වෙන්න ඇත්ද? ඔය වඳුරු රැළක ඉන්න නායක වඳුරෙක් අවුරුදු 20 ක් ජීවත් වුනොත් ඒ වඳුරාට දාව ඒ ජීවිතයේ විතරක් දරුවන් දහස් ගාණක් බිහි වෙනවා. ඔය හරක් රැලක ඉන්න හරකෙක් අවුරුදු 20 ක් ජීවත් වුනොත් ඒ හරකාට දාව දරුවන් දහස් ගණනක් ඒ ජීවිත කාලය තුළ ලබනවා. එහෙම බලද්දී බලන්න කොයි සා නම් සත්‍යභාවයකට බුදුරජාණන් වහන්සේගේ ධර්මය පත්වෙනවාද කියන කාරණය. අපි ආවා වූ අර සා දීර්ඝ ගමනේ දී අපි දරුවන් උදෙසා ඒ සා කඳුළු හෙලළා තියෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනව අවුරුදු 84000 ක් ආයුෂ තියෙන කාලෙ දි පහළ වෙන සක්විති රජ්ජුරුවන්ට දරුවන් 1000 ක් ලැබෙනවා කියා.

ඔබලා දරුවන් කොයි සා ලබල ඇත්ද, එවැනි කාලවල, එතකොට ඒ සා දරුවන් උදෙසා අපි කොච්චර නම් කඳුළු හෙලල ඇත්ද? ඒ නිසා දරුවා කියන කාරණයේ දී අපි මෙන්න මේ සංසාර භය මතුකරල දකින්න ඕන.

මේ සංසාර භය මතුකරල දකිද්දී අපි දකිනව මේ ලෝකයේ ඔබට දරුවෙක් නොවූ කෙනෙක් නැහැ කියලා. මේ මනුස්ස ලෝකයේ ඉන්න සෑම මනුස්සයෙක්ම සංසාරේ ඔබට දරුවෙක් වෙලා තියෙනව. මේ තිරිසන් ලෝකයේ ඉන්න සෑම සතෙක්ම සංසාරේ ඔබට දරුවෙක් වෙලා තියෙනවා. මේ ප්‍රේත ලෝකයේ, නිරයේ ඉන්න සෑම සත්වයෙක්ම සංසාරේ ඔබට දරුවෙක් වෙලා තියෙනව. බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මේ දරුවන් නිසා අපි සතර අපායන්ට වැටිල කල්ප ගණන් දුක් විඳල තියෙනව කියලා. දරුවාට ආදරයෙන්

බැඳිලා, දරුවා නිසා ද්වේශය සකස් කරගෙන අපි සංසාරේ සතර අපායන්ට වැටිල කල්ප ගාණක් දුක් විඳල තියෙනව කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනව.

බුදුරජාණන් වහන්සේ කියනව දරුවා තමයි මේ ලෝකයේ තියෙන බරපතලම කාම වස්තුව කියලා. මේ දරුවා කියන කාම වස්තුව නිසාමයි, අපි මේ සා දීර්ඝ භව ගමනේ දී මැරෙමින් ඉපදෙමින්, මැරෙමින් ඉපදෙමින් ආවෙ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. ඒ දරුවා කියන කාම වස්තුව කෙරෙහි තියෙන බිය නිසාමයි අර බෝධිසත්වයො ගිහිගෙයින් නික්මිලා යන වෙලාවෙ එදා ඉපදුනු රාහුල පුංචි දරුවා සිපගන්න වත් ගියේ නැත්තේ. ඔලුව අතගාන්න වත් ගියේ නෑ. මොකද එහෙම කරන්න ගියා නම් මේ මුලු ගමනම ඉන් වැළකෙනව කියලා සිද්ධාර්ථ කුමාරයා දැනගෙන හිටියා. දරුවා කියන්නේ ඒ සා බරපතල වූ කාම වස්තුවක්. ඒ දරුවන් නිසා අපි සංසාරයේ නිරයන්ට වැටිල, ගින්දරත් ලෝදියත් එක්ක කල්ප ගාණක් අපි අප්‍රමාණ දුක් විඳල තියෙනව. ඒ නිසා මේ සංසාර බය තමයි දරුවා කියලා අපි මතුකර ගන්නේ.

මේ සංසාර බය අපි දරුවා තුළින් මතුකර ගනිද්දී අපි මොකක්ද දකින්නේ. මේ දරුවා මගේ භව ගමනේ දී මම ලබන අවසාන දරුවාය කියන තැනට එන්න අපි දක්ෂ වෙන්න ඕනෑ. එතන තමයි දරුවන්ගෙන් මිදෙන්න තියෙන එකම තැන. එහෙම නැතුව අපි දරුවන් උදෙසා මේ ජීවිතයේ දීත් කඳුළු බාල්දි තුන හතරක් හලලා ඒ කඳුළු බාල්දි ටික ආයිමත් අර මහ සාගරයේ ජලයට එකතු කරල මැරිලා යනවා කියන කාරණය තේරුමක් නැහැ. ඒක තමයි ධර්මානුකූලව දරුවා ගැන හිතන්න තියෙන දේ.

ඔබට දරුවෙක් ලැබිල තියෙනව නම් ඒ ඔබේ සංස්කාරයන්ට ගැලපෙන දරුවයි ඔබට ලැබිල තියෙන්නෙ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මෙතන ඉන්න කාටවත් අසාධාරණයක් වෙලා නැහැ කියලා. ඔබට ස්වාමි පුරුෂයෙක් ලැබිල තියෙනව නම් ඔබේ සංස්කාරයන්ට ගැලපෙන ස්වාමි පුරුෂයෙකු ලැබිලා තියෙන්නෙ. ඔබට බිරිඳක් ලැබිල තියෙනව නම් ඔබේ සංස්කාරයන්ට ගැලපෙන බිරිඳක් ඔබට ලැබිල තියෙන්නෙ. ඔබට අම්මා, තාත්තා කෙනෙක් ලැබිල තියෙනව නම් ඒ ඔබේ සංස්කාරයන්ට ගැලපෙන අම්මා, තාත්තා කෙනෙක් ඔබට ලැබිල තියෙන්නෙ. යම් සමාජ තත්ත්වයක් ලැබිල තියෙනවනම් ඒ ඔබේ සංස්කාරයන්ට ගැලපෙන සමාජ තත්ත්වයක් ඔබට ලැබිල තියෙන්නෙ. එහෙමනම් ඔබට

දරුවෙක් ලැබිල තියෙනවනම් ඒ දරුවා ඔබේ සංස්කාරයන්ට ගැලපෙන දරුවෙක් තමයි ලැබිල තියෙන්නෙ.

එහෙනම් අපේ සංස්කාරයන් කියන්නේ මොකක්ද? අපි කර ගත්තා වූ දෙයමයි. එහෙනම් දරුවෙක් ලෙස ඔබට ලැබිල තියෙන්නෙ ඔබ කරගත්තා වූ දෙයයි. එහෙම නම් කොතැනකදීවත් අපි දරුවා නිසා ගැටෙන්න යන්න අවශ්‍යතාවයක් නැහැ. මොකද ඔබට ලැබිල තියෙන්නේ ඔබේ සංස්කාරයන්ට ගැලපෙන දරුවායි. ඉතින් එහෙම ලැබුන නම් අපි මොනවට ද දක්ෂ වෙන්න ඕනෑ. නිරතුරුවම ඒ දරුවා උදෙසා අපෙන් වෙන්න තියෙන යුතුකම් ඉටු කරන්න කියනව. බුදුරජාණන් වහන්සේ දරුවන් උදෙසා ඉටුවිය යුතු යුතුකම් දේශනා කරනවනෙ. ඉතින් ඒ දරුවා උදෙසා යුතුකම් ඉටු කරල, ඒ දරුවට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර කියල දීල, ඒ දරුව ධර්මයට යොමු කරල යහපත් පුරවැසියෙකු හැටියට සමාජගත කරනවා කියන කාරණයයි, අපට කරන්න තියෙන්නෙ නේද? ඉතින් එහෙම කරල ආයිමත් මැරිල ආයිමත් ඉපදෙනව. ඉතින් ඕක කතා කරල තේරුමක් නැති වැඩක්.

ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕන දරුවන් නිසා අපි සංසාරේ කල්ප ගණන් සතර අපායන්ට වැටිල දුක් වින්දාය කියන කාරණය මතු කරල ගන්න. ඒ නිසා දරුවන් නිසා සතර අපායන්ට වැටිල කල්ප ගණන් දුක් වින්ද වගේ මේ ජීවිතයේ දී දරුවා නිසා මම සතර අපායන්ට වැටෙන්නෙ නෑ කියල දකින්න පුළුවන්නම් ඒක තමයි දරුවා උදෙසා කරන්න පුළුවන් සැබෑම යුතුකම. එතනට තමයි අපි එන්න ඕන. එහෙම නැතුව කොච්චර අපි දරුවන්ට සැලකුවත්, කොච්චර දරුවන්ට ඉගැන්නුවත්, කොච්චර කලත් වැඩක් නෑ. ඔය දරුවන්ට කරපු අයනෙ වයෝවෘද්ධ වෙලා අවසානයේ මැරිල යන්නෙ නේද? ඉතින් දරුවාට කොච්චර දේවල් කළත් කොච්චර යුතුකම් ඉටුකලත් මේ දේවල් අපට අයිති නෑ කියන කාරණය දකින්න. දරුවාට කොච්චර අධ්‍යාපනය ලබල දීල, ලොකු මහත් කරල දුන්නට පස්සේ ඒ දරුවා අපට අයිතිද? නැහැ. අපි ඒ දරුව ඉදිරියේ දෙවැනියෙක් බවටයි පත් වෙන්නේ. මේ යථාර්ථය අපි තේරුම් ගන්න ඕනෑ. ඒ යථාර්ථය තේරුම් අරගෙන දරුවා උදෙසා කරන්න තියෙන යුතුකම් අකුරට ඉටු කරන්න ඕන. මේ ධර්ම මාර්ගයෙහි යන කෙනා කොතැනකවත් යුතුකම් පැහැර හරින කෙනෙක් නෙවෙයි. අනිත්‍යයි කියල සියල්ල දමල ගහල, පැත්තකින් දාල ඉන්න කෙනෙක් නෙවෙයි. මේවා අනිත්‍යයි කියලා දරුවාට උගන්වන්නේ නැතුව ඉන්න කෙනෙක් නෙවෙයි.

මේ ධර්ම මාර්ගයේ යන කෙනා මේ යුතුකම් ශක්තිමත් ආකාරයෙන් ඉටු කරන කෙනෙක්. එයා දක්‍ෂයි දරුවා තුලිනුත් කුසලයක් මතු කරල ගන්න. කොහොමද දරුවා තුළින් කුසලයක් මතුකර ගන්නේ? දරුවා කෙරෙහි කරන්න තියෙන යුතුකම එයා අකුරට ඉටු කරනවා. අධ්‍යාපනය ලබා දීමට සියලු දේවල් අකුරට කරමින් දරුවා තුලින් කුසලයක් මතුකරගෙන ඒ කුසලයන් ධර්ම මාර්ගයට ශක්තියක් කර ගන්න අපි දක්‍ෂ වෙන්න ඕන.

ඊළඟ කාරණය කොතැනකදිවත් දෙමාපියන් දරුවන් නිසා ගැටෙන ස්වභාවයට යන්න නරකයි. මොකද ආනන්තරීය පාප කර්ම වලින් එක පාප කර්මයක් තමයි අම්මා තාත්තා මැරීම කියන පාප කර්මය. වර්තමාන සමාජයේ දරුවෙක් අම්මා තාත්තා මරන්නෙ නැති වෙන්න පුළුවන්. නමුත් අම්මා තාත්තාට දරුවන් විසින් මරණීය හිත් වේදනාවන් සකස් කරල දෙන්නෙ අකීකරු භාවය නිසා. සමහර දරුවො ඉන්නව අකීකරු භාවය නිසා මානසිකව අම්මා, තාත්තා මරල දානවා. මෙවැනි කාරණා දරුවන්ට බරපතල විපාක ලබාදෙන කාරණා. බරපතල විපාක ලබාදෙන කාරණා. ඒ නිසා අම්මා, තාත්තා දක්‍ෂ වෙන්න ඕනෑ නිරතුරුවම දරුවා කියන කෙනා අම්මා තාත්තාට එරෙහි නොවන තැනට කටයුතු කරන්න. අම්මා, තාත්තා නිසා දරුවා නිතරම කේන්ති ගන්නව නම් ඒ කේන්තිය නිසා දරුවා අම්මා, තාත්තා කෙරෙහි නිතරම ද්වේශයක් ඇතිකර ගන්නව නම් ඒ අම්මා තාත්තා සෑම මොහොතකම ඒ දරුවාව නිරයගාමී අකුසලයකට හිමිකරුවෙකු බවට පත් කරනවා. නමුත් මේව එච්චර හිතන්නේ නෑ අද සමාජය. ඒ නිසා අම්මා දරුවාට ගහනව. දරුවා අම්මා කෙරෙහි කේන්තියක්, ද්වේශයක් ඇතිකර ගන්නවා. ඒක එතනින් ඉවරයි. නමුත් අම්මාට එරෙහිව දරුවා කේන්ති ගන්නා මොහොතක් මොහොතක් පාසා ඒ දරුවා නිරයගාමී අකුසලයක් රැස් කරගත්ත කෙනෙක් වෙනවා. ඒ නිසා නිරතුරුවම අම්මා තාත්තලා දරුවන් පිළිබඳව කටයුතු කරද්දී මේ කාරණය දකින්න ඕන. මොකද දරුවන් අම්මා, තාත්තා කෙරෙහි ද්වේශයක් ඇතිකර ගන්නෙ නැති තැනට කටයුතු සලස්සන්න අපි දක්‍ෂ වෙන්න ඕන. දරුවා ද්වේශයක් සකස් කරගන්න තැනට යන මොහොතක් පාසා අපි දකින්න ඕන ඒ දරුවා නිරයගාමී අකුසලයකට උරුමකරුවෙකු වුන බව.

ඒ නිසා දෙමාපියන් දරුවන්ට සැබවින්ම ආදරය කරනවා කියන්නෙ අපිට තේරෙනව නම් දරුවන් අපි නිසා ගැටෙනවා කියලා වහාම අපි ප්‍රශ්නෙන් අයින් වෙන්න ඕනෑ. මොකද ඒ ප්‍රශ්නයට අපි තව තවත් මැදිහත් වුනොත් ඒ මැදිහත් වීම තුළ බලවත් නිරයගාමී අකුසලයක් කරා අපි ඒ දරුව යොමු කරනවා. මොකද බුදුරජාණන් වහන්සේ දෙමාපියන්ට

ඔය ආකාරයෙන් මානසිකව පීඩා කිරීම කියන කාරණය බරපතල අකුසල් ගණයට දාල තියෙන දෙයක්. ඒ නිසා හැම වෙලාවෙම අපි හිතට ගන්න ඕන දරුවන් දිහා උපේක්ෂාවෙන් බලල දරුවන්ට ඒ බරපතල අකුසල් සිද්ධ නොවන ආකාරයෙන් කටයුතු කරන්න දක්ෂ වෙන්න.

**ප්‍රශ්නය**

***24. ගෞරවනීය ස්වාමීන් වහන්ස! ධ්‍යාන ලැබීම සහ එය සමාධියට කෙසේ බලපාන්නේ දැයි පැහැදිලි කරදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.***

**පිළිතුර**

මෙහෙමයි මහත්තයො. සමාධියෙ ඵලය තමයි ධ්‍යානය කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. එය බුදුරජාණන් වහන්සේ ආනාපාන සති සූත්‍රයට අදාළව දේශනා කරන්නා වූ ධර්මයක්. ඉතින් සමාධියක් සකස් කර ගන්නවා කියන්නේ මේ ආනාපාන සතිය තුළින් අපි ආශ්වාසය ප්‍රාශ්වාසයට අපේ හිත යොමු කරල බුදුරජාණන් වහන්සේ ආනාපාන සති සූත්‍රයේ දී දේශනා කරනව කය ඍජුව තියාගෙන මේ ආශ්වාසයට හිත යොමු කරන්න කියලා. මුලින්ම සකස් වෙන්නා වූ ආශ්වාසයේ දිග භාවය දකිමින් ජීවත් වෙන්න කියලා කියනව. ක්‍රමානුකූලව ආශ්වාසයේ දිග භාවය කෙටි වෙන කොට ඒ කෙටි වන ස්වභාවය දකිමින් ජීවත් වෙන්න කියනව. කුමක්ද මේ ආශ්වාසය තුල සිද්ධ වෙමින් පවතින්නේ? ඒ සිද්ධ වෙන දේ ඒ ආකාරයෙන් දකිමින් ජීවත් වෙන්න කියනව. බලෙන් ඇතිකර ගැනීමක් නැහැ. කුමක්ද සිද්ධ වෙන්නේ. සිදුවන දේ දකිමින් ජීවත් වෙන්න කියනව. මේ ආකාරයෙන් සිත එක අරමුණකට අරන් ජීවත් වෙනකොට මහත්තයෝ බුදුරජාණන් වහන්සේ ක්‍රමානුකූලව එයා තුළින් පංච නීවරණයන් යටපත් වෙනව කියනව. පංච නීවරණ කියන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා. මේ පංච නීවරණයන් යටපත් වෙන්න යටපත් වෙන්න එයා තුළ සමාධිමත් සිතක් සකස් වෙනවා.

ඒ සමාධිමත් සිත තමයි ඔය ධ්‍යාන ගත සිත කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ තේරුණාද? එතකොට පළමුවන ධ්‍යානය, දෙවන ධ්‍යානය, තුන්වන, හතරවන ධ්‍යාන වශයෙන් ධ්‍යාන බුදුරජාණන් වහන්සේ බෙදල වෙන් කරනවා. මගේ පැවිදි ජීවිතයේ දී කොතැනකවත් ඔය ධ්‍යාන කියන කාරණය මම හිතන්න ගිහිල්ල නැහැ. මං හැම වෙලාවෙම සමාධිය උපයෝගී කරගෙන තියෙන්නෙ විදර්ශනාව උදෙසා විතරයි මහත්තයො. ඒ නිසා

මම හැම වෙලාවෙම මේ ආශ්වාස ප්‍රාශ්වාස කෙරෙහි හිත යොමු කරලා ආශ්වාසයේ ප්‍රාශ්වාසයේ දිග භාවය, කෙටි භාවය දකිමින් හිත සංහිඳීම නම් වූ උපේක්ෂාව කියන තැනට හිත අරන් ගිහිල්ල එතන ඉඳන් මං විදර්ශනාවට හිත යොමු කරනව. එහෙම නැත්නම් ඇස් දෙක පියාගෙන ආනාපානසතියෙන් බැහැර වෙලා මේ ආශ්වාස ප්‍රාශ්වාසයේ ඇතිවීම නැතිවීම දකිමින් හිත සමාධිමත් උපේක්ෂාව කියන තැනට අරන් යනවා. මේක ආනාපාන සතියට අදාළ නැහැ. ඇස් දෙක පියාගෙන මේ ආශ්වාසය ඉහළට යනකොට ඇතිවීම කියලා දකිනවා. පහළට යනකොට නැතිවීම කියලා දකිනවා. ඇතිවීම-නැතිවීම, ඇතිවීම, නැතිවීම, ඇතිවීම-නැතිවීම දකිමින් ඉඳල හිත උපේක්ෂාව කියන තැනට අරන් ආවට පස්සේ එතන ඉඳන් විදර්ශනාවට හිත යොමු කරනව.

ඒ නිසා මගේ පැවිදි ජීවිතයේ මං කොතනකවත් මේකයි පළමුවෙනි ධ්‍යානය මේකයි, දෙවැනි තුන්වෙනි හතරවෙනි ධ්‍යාන කියල මම නම් හිතන්න ගිහිල්ල නැහැ. ඒ හිත සකස් වෙන ඕනෑම මොහොතක ඒ හිත අනිත්‍යයි කියල අතහැර දාන්න මම දක්ෂ වුණා. මොකද සංසාරෙන් ඉවත්වීම සඳහා අපි මේ ධ්‍යානයන් සංසාරයේ වඩල තියෙනව. බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මෙතැන ඉන්න සෑම කෙනෙක්ම මේ පළවෙනි, දෙවෙනි, තෙවැනි, හතරවැනි ධ්‍යානයන් සකස් කරගෙන රූපාවචර බ්‍රහ්මතලවල කල්ප ගණන් ජීවත් වෙලා තියෙනව කියලා. හතරවෙනි ධ්‍යානයෙන් ඔබ්බට ඔය ආකාසඤ්ඤායතනය නේවසඤ්ඤානාසඤ්ඤායතන වගේ ධ්‍යානයන් සකස් කරගෙන අරූපාවචර බ්‍රහ්ම ලෝකවල කල්ප ගණන් අපි ජීවත් වෙලා තියෙනවා. ඒවගේම මෙතන ඉන්න හැම කෙනෙක්ම ධ්‍යානයන් සකස් කරගෙන සංසාරයේ දී ඍද්ධියෙන් ගියා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනව.

ඔය ධ්‍යානයන්ගේ තියෙන අනිත්‍ය භාවය ධ්‍යානයන්ගේ ආශ්වාදය පිළිබඳව කුමක් හෝ ඉවක් මගේ ජීවිතයේ මට තිබුණා. ඒ නිසා මම කොතැනකවත් ධ්‍යාන සැපය කියන එකට මොහොතකටවත් ඇලෙන්න ගියේ නැහැ. ඒ නිසා මම අද දකින්න යන්නෙත් නෑ. මම ඉන්නෙ පළවෙනි ධ්‍යානයෙද, හතරවන ධ්‍යානයෙ ද කියලා මහත්තයෝ. මට ඒක අදාළ නැහැ. මොකද සමාධිය අපි නිරතුරුවම උපයෝගී කරගන්න ඕන විදර්ශනාව නුවණින් විමසන්න. මොකද බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ කාමයේ ආශ්වාදයන් ගැන. ඊළඟට දේශනා කරනවා රූපයේ ආශ්වාදය පිළිබඳව. තුන්වනුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා වේදනාවේ ආශ්වාදය පිළිබඳව. මොකක්ද මේ වේදනාවේ ආශ්වාදය

කියන්නෙ? මේ ධ්‍යානවල තියෙන සමාධියේ ආශ්වාදය තේරුණාද? එතකොට මේ සමාධියේ ආශ්වාදයත්, ධ්‍යාන තලයන්ගේ ආශ්වාදයත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ ආශ්වාදය නිසා සකස් වෙන්නා වූ ආදීනවයත් කියලා. එහෙමනම් මේ සමාධියේ ආශ්වාදයට බැඳුනොත් මහත්තයෝ එතනත් අපි බැඳෙන්න් දුකටමයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. නමුත් සමාධියෙන් තොරව විදර්ශනාවක් සකස් වෙන්නේ නැහැ. ඒ නිසා සමාධිය අත්‍යවශ්‍ය දෙයක්. මේ ගමනෙදි. මොකද ශීල, සමාධි, ප්‍රඥා මාර්ගයක් මේක. සමාධියෙන් තොර විදර්ශනාවක් ගැන අපට කතාකරන්න බැහැ. ධ්‍යාන වලින් තොරව විදර්ශනාවක් ගැන කතා කරන්න බැහැ. නමුත් මගේ ජීවිතයේ මම කොයි ධ්‍යානයෙද ඉන්නෙ කියන කාරණය කවදාවත් හිතල නැහැ. හැම වෙලාවෙම ඒ හිතත් අනිත්‍යයි කියල දැක්ක තැනදී ඒ ධ්‍යානය තුලින්ම විදර්ශනාව සකස් කර ගන්න අපි දක්ෂ වුණා.

ඒ නිසා මේ ධර්ම මාර්ගය තුළ ගමන් කරද්දී අපි හැම වෙලාවෙම දකින්න ඕනෑ මේ ශාසනය අපට මුණගැහුනෙ ආයිමත් පළවෙනි ධ්‍යාන, දෙවෙනි ධ්‍යාන තුන්වෙනි ධ්‍යාන, හතරවෙනි ධ්‍යාන හොයන්න නෙවෙයි කියන කාරණය. හැම වෙලාවෙම අපි දක්ෂ වෙන්න ඕන මේ ශාසනය තුළ සමාධිය විදර්ශනාව උදෙසාම යොමු කරගන්න. මොකද යමෙක් ධ්‍යානතල වලට ලොල් වුනොත් මැරෙන වෙලාවෙ එයා මොකද කරන්නේ එක පාරටම එයාගෙ හිත ධ්‍යාන තලයකට ගන්න පුළුවන්. දැන් එතකොට පළමුවෙනි ධ්‍යානයට කෙනෙක් ලොල් වෙලා තියෙනවා. එයා ක්ෂණයෙන් හිත පළමුවෙනි ධ්‍යානයට ගන්නව. පළමුවෙනි ධ්‍යානයට හිත ගත්ත ගමන් එයා මොකද කරන්නේ? මැරිච්ච ගමන් එයා රූපාවචර බ්‍රහ්මතලයක උත්පත්තිය සකස් කර ගන්නව. භවයෙන් මිදුනද? නැහැ. සතර අපායෙන් මිදුනද? නැහැ. බ්‍රහ්මතලවල හෝ කල්ප ගණනක් එරමිණියා ගොතාගෙන ඔහේ ඉඳල ආයිමත් සතර අපායට වැටෙනව.

ඒ නිසා මේ නිවන් මාර්ගයේ ගමන් කරද්දී කොතැනකවත් මේ සමාධිය කෙරෙහි ඇලීමක් සකස් කර ගන්න එපා. හැම වෙලාවෙම සීලයෙන් පරිපූර්ණ භාවයට පත් වෙලා, ඒ පරිපූර්ණ භාවය තුළ සමාධිමත් සිතක් සකස් කරගෙන ඒ සමාධිය නිරතුරුවම විදර්ශනා නුවණින් දකින්න ඔබ දක්ෂ වෙන්න ඕනෑ. එතනින් විදර්ශනාව ඇතිකර ගන්න යොමු කරන්න ඕනෑ. එතන තමයි අපේ ධර්ම මාර්ගය.

එහෙම නැතුව යම් කෙනෙකුට අවශ්‍ය නම් මේ ශාසනය කායික මානසික සැනසිල්ල සඳහා විතරක් යොදා ගන්න. එහෙම නම් ඒ ධ්‍යාන ප්‍රශ්නය ඒගොල්ලන්ට වටිනව. මොකද ඒ ගොල්ලො බලාපොරොත්තු වෙන්නේ ශාසනයෙන් කායික, මානසික සැනසිල්ලක් ලබාගන්න. මේ සංකීර්ණ ජීවිතයෙන් මිදිල මොහොතක්වත් සැනසිල්ලක් ලබන්න. එහෙම කෙනෙකුට ධ්‍යානය වටිනව තේරුණාද? නමුත් මම එහෙම ධර්මයක් දේශනා කරන්නේ නැහැ.

**<u>ප්‍රශ්නය</u>**

***25. ගරු ස්වාමීන් වහන්ස, චතුරාර්ය සත්‍ය අවබෝධය සඳහා පාරමී ධර්ම සම්පූර්ණ කර ගැනීමට අවශ්‍යද?***

**<u>පිළිතුර</u>**

බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ ජීවිතයේ දී කාරණා තුනකින් ඔබ පරිපූර්ණ නම් චතුරාර්ය සත්‍යය දකින්න පුළුවන් කියලයි. මොනවද ඒ කාරණා තුන?

- පළවෙනි කාරණය තමයි ශ්‍රද්ධාව
- දෙවන කාරණය තමයි වීර්යය
- තුන්වන කාරණය හිරිඔතප්

මේ කාරණා තුනෙන් මහත්තයා පරිපූර්ණ නම් මහත්තයාට මේ ජීවිතයේ දී ම චතුරාර්ය සත්‍යය දකින්න පුළුවන් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

කොතනකවත් බුදුරජාණන් වහන්සේ පාරමී ප්‍රශ්නයක් මතුකරන්නේ නැහැ. එතකොට අපි පාරමී ප්‍රශ්නයක් මතුකර ගන්නේ කුමක් නිසාද? ඔබ තුළ ශ්‍රද්ධාව සකස් වෙලා නැති නිසා. මේ ශ්‍රද්ධාව තුළ තමයි මහත්තයො අපිට මේ මාර්ගය අපි යා යුතු ගමන අපට පැහැදිලි කරල දෙන්නේ. තේරුණාද? එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අපි මේ අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂ කෝටි ගණනාවක් ඈත ඉඳන් ආපු ගමනක් කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ මහ පොළොවේ තියෙන මුළු පස් ප්‍රමාණයම අරගෙන ඒක වෙරළු ගෙඩි ගානට ගුලි කරන්න කියලා. මේ මුළු මහ පොළොවෙම තියෙන පස් මහත්තයො ගුලි කරල එක වෙරලු ගෙඩිය එක වෙරළු ගෙඩිය අයින් කරන්න කියනවා. මේ

මම ගෙවාගෙන පැමිණි එක කල්පයක්, මේ මම ගෙවාගෙන පැමිණි දෙවන කල්පය.... ආදී වශයෙන් මෙහෙම වෙරළු ගෙඩි කල්පෙ, කල්පෙ වෙනුවෙන් අයින් කරල බලන කොට වෙරළු ගෙඩි ඉවර වෙනවා. අපි ගෙවාගෙන ආපු කල්ප ප්‍රමාණය ඉවර වෙන්නේ නෑ කියනව.

එහෙමනම් මහත්තයො මොනතරම් දීර්ඝ කාලයක් අපි සංසාරයේ ඇවිල්ල තියෙනවද? ඒ ආවා වූ ගමනේ දී මහත්තයාට බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගාණක් මුණගැසී තියෙනව කියල බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ බුදුරජාණන් වහන්සේලා මුණ ගැහිල බුදුරජාණන් වහන්සේලා ධර්මය දේශනා කරන වෙලාවල් වල දී මහත්තය ඒ බණ හොඳින් අහල බුදුරජාණන් වහන්සේ ගාථා පද තුනක් කියද්දී මට දැන් ප්‍රමාද වෙනව කියලා මහත්තයා නැගිටලා ගිහිල්ලා තියෙනවා. හතරවෙනි බණ පදය ඇහුව නම් මහත්තය සෝවාන් ඵලයට පත් වෙනව. හතරවන බණ පදය අහන්න හිටියෙ නැහැ. ඒ වගේ ශක්තිමත් තැන් අතීතයේ තියෙනව මහත්තයෝ.

සමහර සම්මා සම්බුද්ධ ශාසනවල මහත්තයා උතුම් පැවිදි උපසම්පදාව ලබල ඒ වගේම ස්ත්‍රීත්වය ලැබූ කාල වල දී උතුම් වූ භික්ෂුණී පැවිදි උපසම්පදාව ලබල මහත්තයා අවුරුදු දස දහස් ගණන් ජීවත් වෙලා ඉඳල තියෙනව. එහෙමනම් බලන්න ඒ සා ශක්තිමත් වූ තැන් අපේ අතීතයේ තියෙනව. එතකොට ඒ ශක්තිමත් තැන් අපට මතුකරල දෙන්නේ කවුද? ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව විසිනුයි මතු කරලා දෙන්නේ. ධර්මය කෙරෙහි වූ ශ්‍රද්ධාව, සංඝයා කෙරෙහි වූ ශ්‍රද්ධාව. මේ සද්ධර්මය තුලිනුයි අපිට මේ අතීතයේ සශ්‍රීක තැන් තිබුණා කියලා මතු කරලා දෙන්නේ. ඒවගේ සශ්‍රීක තැන් වලින් ජීවිතය මතු කරල ගන්න අපි දක්ෂ වෙන්න ඕනෑ.

දැන් අපේ ජීවිතයේ අපි හැමදාම දකින්නේ මොකක්ද? අපි මතුකරල ගන්න හදන්නේ කොතනින්ද? අපි දහම් පාසල් ගියා. පන්සල් ගියා. පින්කම් කළා. කඨින පින්කම් කළා, කියලා ඔතනින් තමයි අපි මතුකරලා ගන්න හදන්නේ. ඔතනින් මතු කරල ගනිද්දී පාරමී පිළිබඳ අනිවාර්ය ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසා අපේ ජීවිතයේ මං හැමදාම මතු කරල ගත්තේ ඉතා ශක්තිමත් වූ තැනකින්මයි. ඒ සා ශ්‍රේෂ්ඨ තැන් අපේ අතීතයේ තියෙනව. එහෙමනම් අපි මේ පළමුවෙනි වතාවට මහණදම් පුරනවා නෙවෙයි. අතීත සම්මා සම්බුද්ධ ශාසනවල ඉපදිලා දැරුවා වූ චීවර එක ගොඩකට ගැහුවොත් ඒක ගිජ්ජකූට පර්වතයකට වඩා

විශාලයි කියනවා මහත්තයෝ. නමුත් ඒ සෑම ශාසනයකම අපි මොකද කළේ? මේ චීවරය ඇන්දා. මඩේ දැම්මා. ආයිමත් හේදුවා, මඩේ දැම්මා හේදුවා. මඩේ දැම්මා විතරයි.

ඒ නිසා සංසාරයේ අතීතයේ ඒ සා රැස්කර ගත් සංස්කාරයන් ශක්තිමත්ව නතර කරපු තැන් අපේ ජීවිතයේ තියෙනව. ඒ නතර කරපු තැනකින් මතු කරද්දී පාරමී පිළිබඳව ප්‍රශ්නයක් මතුවෙන්නේ නැහැ. දැන් මහත්තයා දකින්න ඕන තවත් පුරන්න පාරමිතාවක් මහත්තයට නැහැ කියලා. ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේ අතීත කාරණය මතු කරගන්න බැරි ශ්‍රද්ධාවේ තියෙන දුර්වල භාවයක් නිසයි. එතකොට ඒක ඇති කරලා දෙන්නේ කවුද? කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්මය ශ්‍රවණය සහ ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම. අන්න ශ්‍රද්ධාව ඇතිවෙනව. එතකොට එයා හිතන්න පටන් ගන්නවා දෙවියනේ කොයි සා ඈත භව ගමනක් පසුකර ගෙන ආපු ගමනක් ද මේ කියලා. ඒ පසුකරගෙන ආවා වූ භව ගමනේ දි කොයි සා බුදුරජාණන් වහන්සේලා මම ඇසුරු කරල තියෙනවද? කොයි සා පසේ බුදුරජාණන් වහන්සේලා, රහතන් වහන්සේලා මම ඇසුරු කරල තියෙනවද? එහෙමනම් එවැනි තැනකින් මතු කරලා ගනිද්දී මහත්තයෝ පාරමී පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. අන්න ශ්‍රද්ධාවයි ඒකට මුල් වෙන්නේ.

ශ්‍රද්ධාව සකස් වුන තැන දී ඊළඟට මොකක්ද සකස් වෙන්නේ. වීර්යය. කුමක් කෙරෙහි වීර්යය ද? ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ ගමන් කිරීම කෙරෙහි ඇතිවන වීර්යය. එතකොට ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ ගමන් කිරීමට වීර්යය මදි නම් අපි වීර්යය ගැන නෙවෙයි හිතන්න ඕන. මොකද? වීර්යය හේතු වෙන්නේ කුමක් නිසාද? ශ්‍රද්ධාව නිසා, ශ්‍රද්ධාවේ ඵලයයි වීර්යය. එහෙමනම් මේ මාර්ගය තුළ ගමන් කිරීමේ දී වීර්යය මඳ භාවයක් තියෙනවා නම් අපි හිතන්න ඕන ශ්‍රද්ධාව ගැන. මොකද ශ්‍රද්ධාවේ දුර්වලතාවයක් තුලයි වීර්යයේ මඳ භාවය සකස් වෙන්නේ. එහෙමනම් ශ්‍රද්ධාවෙනුත් පරිපූර්ණ වුනා නම් ඒ තුළින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුල වීර්යයෙන් ගමන් ගත්තා නම් ඊළඟට මොකක්ද? සකස් වෙන්නේ? හිරි ඔතප්; ලැජ්ජා භය, කුමක් කෙරෙහි ලැජ්ජා භයද? නැවත සතර අපායට වැටීමට තියෙන ලැජ්ජාව සහ භය.

මොකද අපි තාම සෝවාන් ඵලයට පත් වෙලා නැත්නම් සතර අපායට වැටෙන්න තියෙන ලැජ්ජා භයෙන් අපි මිදිලා නැහැ. අපි සෝවාන් ඵලයට පත් වුනේ නැත්නම් කිසිම සහතිකයක් නැහැ අපි නැවත සතර අපායට වැටෙන්නේ නැහැ කියලා. එහෙමනම් මේ

හේතුඵල ධර්මයන් ලස්සනට ගැලපෙනව. එහෙමනම් පාරමී පිළිබඳව ප්‍රශ්නයක් අපට මතු වෙන්නේ නැහැ. ඒක මතු කරල ගන්න නම් අර වගේ ශක්තිමත් තැනකින් මතු කරල ගන්න ඕන. ශක්තිමත් තැන් මතු කරන්න නම් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය අනිවාර්යයෙන්ම ලබන්න ඕන. සංසාර භය දකින්නා තමයි ශ්‍රද්ධාව තුළ පරිපූර්ණ වෙන්නෙ. එයා සංසාරෙ දකිනවා. එයා අනිවාර්යයෙන් දකිනවා කොයි සා දීර්ඝ භව ගමනක් පසුකරගෙන ද ආවෙ කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මහත්තයෝ මමත් හරකෙක් වෙලා, ඌරෙක් වෙලා, කුකුලෙක් වෙලා, එළුවෙක් වෙලා ඉපදුන වෙලාවල අපේ බෙල්ල කපපු අවස්ථාවල දී ගලාගිය රුධිරය මහා සාගරයේ ජලයට වැඩියි කියලා මහත්තයෝ. ඒ කියන්නේ ඒ සා දුක් කන්දරාවක් විඳගෙන අපි ආපු ගමනක් තමයි මේ. මේ ආවා වූ දීර්ඝ භව ගමනේ දී ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා ලක්‍ෂ ගාණක් පහළ වුනා වගේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අනාගත ලෝකයේත් නර්මදා නදී තීරයේ තියෙන වැලිකැට සංඛ්‍යාවට වඩා බුදුරජාණන් වහන්සේලා පහළ වෙනවාය කියලා.

එහෙමනම් ඒ සා දීර්ඝ කාලයක් පසුකරගෙන ආවා වගේම අර සා දීර්ඝ කාලයක් මේ ලෝකය පවතිනවා. මේ ලෝකෙ නැවතීමක් නැහැ. අනාගතයේ දී ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා ලක්‍ෂ ගාණක් මේ ලෝකයේ පහළ වෙනවා පින්වතුනි, එහෙමනම් මේක නැවතීමක් නිමාවක් දකින්න පුළුවන් ලෝකයක් නෙමෙයි. එතකොට මේක දකින කෙනා තමයි ශ්‍රද්ධාව සකස් කර ගන්නේ. ශ්‍රද්ධාව සකස් කරගත්ත කෙනා තමයි මාර්ගය තුළ ශක්තිමත්ව වීර්යයෙන් යන කෙනා. එයා තමයි සතර අපායට වැටෙන්න බිය ඇතිකර ගත්ත කෙනා. එතනින් තමයි පටන්ගන්න ඕනෑ.

<u>ප්‍රශ්නය</u>

***26. ගරු ස්වාමීන් වහන්ස, සම්මා දිට්ඨිය ගැන පැහැදිළි කර එය තමා විසින් වර්ධනය කරගත යුතු ආකාරය කරුණාවෙන් පැහැදිලි කර දෙන්න.***

<u>පිළිතුර</u>

බුදුරජාණන් වහන්සේ කෙනෙක් ලෝකයට පහළ වෙන්නේ මේ චතුරාර්ය සත්‍යය පිළිබඳව ලෝකයට දේශනා කරන්නයි. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් පාරමී ධර්මයන් පුරාගෙන ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් බුද්ධත්වයට පත් වෙන්නේ මේ චතුරාර්ය සත්‍යය කියන ධර්මතාවය දේශනා කරන්නයි.

එතකොට චතුරාර්ය සත්‍යයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන මුල්ම ආර්ය සත්‍යය තමයි දුක කියන කාරණය. දුක කියන්නෙ මොකක්ද? ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම පංච උපාදානස්ඛන්ධය නිත්‍ය භාවයෙන් ගැනීම නිසා සකස් වෙන්නා වූ දුක. දැන් ඔය කියන දුක මහත්තයල තුළ තියෙනවද? නැද්ද? තියෙනව. දුක මහත්තයා තුළ තියෙනව නම් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දුකට හේතුව තෘෂ්ණාව කියලා. එහෙනම් දුක මහත්තයා ළඟ තියෙනවා නම් තෘෂ්ණාව මහත්තයා තුළ තියෙනවද? නැද්ද? තියෙනවා. එහෙම නම් දුක කියන කාරණය තමා තුළ තියෙනවා. දුකට හේතුව වූ තෘෂ්ණාවත් තමා තුළ තියෙනවා. තුන්වෙනි ආර්ය සත්‍යයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දුක නැති කරන්න නම් තෘෂ්ණාව නැති කරන්න ඕන කියලා. දුක තියෙන්නෙත් තමා තුළ නම් තෘෂ්ණාව තියෙන්නෙත් තමා තුළ නම් දුක නැතිකරන්න තෘෂ්ණාව නැතිකරන්න ඕන කවුද? තමා.

හතරවෙනි ආර්ය සත්‍යයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දුක නැතිකර ගැනීමේ මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා. එහෙමනම් බලන්න මේ චතුරාර්ය සත්‍යය කියන කාරණය තමා තුළින් ම තමා දකින්න තියෙන්නෙ. මේක ආයිමත් බාහිරින් අපට ගන්න දෙයක් නෑ. බුදුරජාණන් වහන්සේ කල්‍යාණ මිත්‍රයා බවට පත්කරගෙන ධර්මරත්නය සංඝරත්නය කල්‍යාණ මිත්‍රයා බවට පත් කරගෙන තමා තුළින්ම තමා අවබෝධ කරගත යුතු දෙයක් තමයි චතුරාර්ය සත්‍යය යන්න. එතකොට මේ දුක නැති කිරීමේ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය බුදුරජාණන් වහන්සේ ශීල, සමාධි, ප්‍රඥා කියල කාරණා තුනකට බෙදල තියෙනවා. එතනදී මේ ප්‍රඥාවට අදාළ අංග දෙක හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කර පනවන්නේ සම්මා දිට්ඨියත් සම්මා සංකප්පයත්. සම්මා දිට්ඨියත් සම්මා සංකප්පයත් ප්‍රඥාවට අදාළ අංගයන් හැටියට පනවනව. ශීලයට අදාළ අංගයන් හැටියට සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව පනවනව.

සමාධියට අදාළ අංගයන් හැටියට සම්මා වායාමෝ, සම්මා සති, සම්මා සමාධි පනවනව. එහෙනම් මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් ප්‍රඥාවට අදාළ වූ ඉතාමත් වටිනා අංග දෙක තමයි සම්මා දිට්ඨියත්, සම්මා සංකප්පයත්. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා දිට්ඨියෙන් තොරව කවදාවත් සම්මා සංකප්පයක් සකස් වෙන්නෙ නැහැ. හේතුඵල ධර්මයක්. සම්මා සංකප්පයකින් තොරව කවදාවත් සම්මා වාචාවක් සකස් වෙන්නෙ නැහැ. සම්මා

වාචාවකින් තොරව සම්මා කම්මන්තයක් සකස් වෙන්නෙ නැහැ. ඒවගේ මේ එකිනෙක වැඩීමෙන් පමණයි ඊළඟ අංගය අප තුළ සකස් වෙන්නෙ. එහෙනම් සම්මා දිට්ඨිය තමයි අපි මුලින්ම ඇතිකර ගත යුත්තේ. සම්මා දිට්ඨියේ දී ලෞකික සම්මා දිට්ඨිය, ලෝකෝත්තර සම්මා දිට්ඨිය කියල කොටස් දෙකකට බෙදනව. එතකොට ලෞකික සම්මා දිට්ඨිය කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ,

01. තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව.
02. කර්මය කර්මඵල පිළිබඳ විශ්වාසය.
03. මැරිලා නැවත හේතුඵල ධර්මයන් අනුව උපතක් තියෙනවාය කියලා ඇතිකර ගන්නා වූ විශ්වාසය.
04. සිල් සමාදන් වුනොත් දන් දුන්නොත් එහි ආනිසංස ධර්මයන් තියෙනවාය කියලා ඇතිකර ගන්නා වු විශ්වාසය.
05. අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳව ඇතිකර ගන්නා වූ විශ්වාසය.
06. මේ ශාසනය සන්දිට්ඨිකව තියෙන තාක්කල් මේ උතුම් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් ඵලයන්ට පත්වෙන්න පුළුවන්ය කියලා ඇතිකර ගන්නා වූ විශ්වාසය.

දැන් මේ විශ්වාසයන් මහත්තයල තුළ තියෙනවද? මේ විශ්වාසයන් තියෙනව නම් සම්මා දිට්ඨිය තුළ ඉන්නවා. නමුත් ඒ සම්මා දිට්ඨිය ලෞකික සම්මා දිට්ඨියයි. ලෞකික සම්මා දිට්ඨිය තුළ සිටින තාක් කල් ලෞකික සම්මා දිට්ඨියේ ඵලය හැටියට අපට මොකක්ද ලැබෙන්නේ? සුගතියේ උපතක්. මහත්තයල කොච්චර ලෞකික සම්මා දිට්ඨිය තුළ ජීවත් වුනත් ඒ ලෞකික සම්මා දිට්ඨිය අපිට ලබල දෙන්නෙ මොකක්ද? නැවත සුගතියේ උපතක්. ඒක තමයි ලෞකික සම්මා දිට්ඨිය. එතකොට ලෝකෝත්තර සම්මා දිට්ඨිය කියන්නෙ මොකක්ද? මේ ලෞකික සම්මා දිට්ඨිය අපි විදර්ශනා නුවණින් දැක්ක තැනයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙන්නෙ. ලෞකික සම්මා දිට්ඨියේ මුල්ම කාරණය මොකක්ද? තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අතීතයේ ලොච්තුරා බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගාණක් පහල වුණාය කියලා. අපි දන්නෙ අටවිසි බුදුරජාණන් වහන්සේලා ගැන විතරයි.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නර්මදා නදී තීරයේ වැලිකැට සංඛ්‍යාව ගණනකින් කියන්න බැහැ වගේ අතීතයේ පහළ වුණා වූ බුදුරජාණන් වහන්සේලා

මෙපමණයි කියලා ගණනකින් කියන්න බෑ කියලා. ඒ ලක්ෂ ගාණක් සම්මා සම්බුද්ධ ශාසන වල දී ඔබලා සෑම කෙනෙක්ම මේ මොහොතේ මගෙන් බණ අහනව වගේ බුදුරජාණන් වහන්සේලා දස දහස් ගණනකින් බණ අහලා තියෙනවා. රහතන් වහන්සේලා ලක්ෂ ගාණකින් සද්ධර්මය ශ්‍රවණය කරල තියෙනව. ඉතින් ඒ සා සංස්කාරයන් රැස්කරගෙන ආපු ගමනෙදි ඔබලා දස දහස් වතාවල් වල දී තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කරගෙන තියෙනව. නමුත් ඒ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින් මහත්තයාලට මොකක්ද ලැබුණෙ?. සුගතියේ උපතක්. එච්චරයි.

දැන් මහත්තයා මේ ජීවිතයේ දී තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස්කරගෙන තියෙන තාක්කල් මහත්තයාට ලැබෙන්නේ සුගතියේ උපතක්. දැන් මහත්තයා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස් කරගෙන මේ ජීවිතේ චිරාත් කාලයක් ජීවත්වෙලා මැරෙන වෙලාවට එක පාරටම අවසාන චුති සිතට බුදුරජාණන් වහන්සේගේ රූපකාය උපාදානය කර ගත්තොත් එහෙම නැත්නම් බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ගුණයක් සම්මා සම්බුද්ධ ඤාණයක් උපාදානය කර ගත්තොත් සිහිපත් කරගත්තොත් මහත්තයා සුගතියේ උත්පත්තියකට පත් වෙනව. එච්චරයි.

ඊට වඩා දෙයක් නෑ. නමුත් ලැබුවා වූ සුගතියේ උපත අනිත්‍ය වූ දෙයක්. අපි ආයිමත් සතර අපායටම වැටෙනවා. එහෙම නම් ලෞකික සම්මා දිට්ඨිය තුළ ජීවත් වෙද්දී. ඔබලාට ලැබෙන්නෙ එහි ඵලය හැටියට සුගතියේ උපතක් කියන කාරණය විතරයි. විදර්ශනා නුවණක් සකස් වෙන්න නෑ. මාර්ගඵල පැත්තට සෝවාන් ඵලය පැත්තට ඉස්සරහට ඔහු යන්නෙ නෑ. එහෙනම් ඔබ ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දැක්ක තැනයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙන්නෙ.

එතකොට ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දකිනව කියන්නෙ අන්න එයා නුවණින් හිතන්න පටන් ගන්නවා ඇයි එයා නුවණින් හිතන්න පටන් ගන්නෙ? එයාට කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබෙනව. ඒනිසා සද්ධර්ම ශ්‍රවණය ඇහෙනව. දැන් ඒ ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරන කොට අන්න එයා දකිනවා කොයි සා ශ්‍රද්ධාව සකස් කරගෙන හිටියත් ශ්‍රද්ධාව කියන සංස්කාරය විපාක දීල අනිත්‍ය වෙන දෙයක් කියලා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ කුමන සම්මා සම්බුද්ධ ගුණයත් ඥානයත් අනිත්‍ය වූ දෙයක් කියලා එයා දකිනවා. මේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා පහළ වූ ඒ සෑම

ශාසනයක්ම අනිත්‍යභාවයට පත්වුණාය කියන කාරණය එයා දකිනව. අතීතයේ සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගාණක වැඩ සිටියා වූ ඒ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිවුවණක් පිරිස කෝටි ප්‍රකෝටි ගාණක් වෙනවා. ඒ සැම කෙනෙක්ම අනිත්‍ය භාවයට පත්වුනාය කියන කාරණය එයා දකිනව. එතකොට එයා ශ්‍රද්ධාවට බැඳිලා යන්නෙ නැහැ. එයා ශ්‍රද්ධාව කියන කාරණයත් අනිත්‍යයි කියල දකිනවා. මේ ශ්‍රද්ධාව නිසා සකස් වෙන්නා වූ සංස්කාරයනුත් විපාක දීල අනිත්‍ය වෙන දෙයක් කියලා එයා දකිනව. එහෙම දකිද්දි මොකක්ද සකස් වෙන්නෙ? විදර්ශනා නුවණයි එයා තුළ සකස් වෙන්නෙ.

එයා ශ්‍රද්ධාවට බැඳෙන්නෙ නෑ. එයා දන්නව ශ්‍රද්ධාව කියන්නෙත් විපාක දීල අනිත්‍ය භාවයට පත්වෙන සංස්කාරයක්ය කියලා. ඒ නිසා විපාක දීල අනිත්‍ය භාවයට පත් වෙන්නා වූ සංස්කාරයක් කියලා දකින මොහොතේම, ඒ සංස්කාරයන් කෙරෙහි තියෙන ඡන්දරාගය හීන වෙන මොහොතේම තමා තුළ විදර්ශනා නුවණක් සකස් වෙනව. ඒ නිසා ඒ ආකාරයෙන් අපි ලෞකික සම්මා දිට්ඨිය නිරතුරුවම විදර්ශනා නුවණින් දක්ක තැනයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙන්නෙ. දැන් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ලෞකික සම්මා දිට්ඨියේ  එක අංගයක් තමයි අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳව ඇතිකර ගන්නා වූ විශ්වාසය. එහෙනම් බලන්න සංසාරේ දී අපි අම්මා, තාත්තා කෙරෙහි ආදරයෙන් බැඳිල, අපි සංසාරේ කොච්චර නම් අම්මලා, තාත්තලා පෝෂණය කරන්න ඇද්ද? අම්මලා තාත්තලාව අපි කරේ තියාගෙන කොච්චර නම් ඇවිදින්න ඇත්ද? නමුත් ඒ රැස්වුණා වූ සංස්කාර නිත්‍යද? අනිත්‍යද? අනිත්‍යයි.

අම්මාට තාත්තාට සැලකීම නිසා අපි සක්‍රයා වෙලා ඉපදෙන්නත් ඇති. නමුත් ආයිමත් අපි සතර අපායන්ට වැටුන. අපි සංස්කාරයන් කෙරෙහි විශ්වාසය තබල කොච්චර සිල් සමාදන් වෙන්න ඇත්ද? කොච්චර දන් දෙන්න ඇත්ද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ආවා වූ දීර්ඝ භව ගමනේ දී ඔබලා බුදුරජාණන් වහන්සේලා උදෙසා පූජා කරල තියෙන බුද්ධ පූජාවන් එක ගොඩක් ගැහුවොත් එය ගිජ්ජකූට පර්වතයට වඩා විශාලයි කියලා, පින්වතුනි, එහෙනම් කර්මය කර්මඵල විශ්වාසයන් පිළිබඳව සිතා අපි කොයි සා දන් දෙන්න ඇත්ද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මේ ගෙවාගෙන පැමිණි සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනකදි ඔබත් මමත් සිල් සමාදන් වෙන්න ඇත්ද සුදු සිල් රෙදි එක ගොඩක් ගැහුවොත් එය ගිජ්ජකූට පර්වතයට වඩා විශාලයි කියලා පිංවතුනි, ඒ සා සංසාරයේ අපි සිල් සමාදන් වෙලා තියෙනව.

මොකද සමහර සාසන අවුරුදු 60,000 ක් දීර්සයි. අවුරුදු 50,000, 40,000 ක් දීර්සයි. බලන්න කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනය අවුරුදු 20,000 ක් දීර්සයි. එවැනි දීර්ස සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගාණක් පසුකරගෙන ආපු ගමනේ දී අපි සිල් සමාදන් වෙන්න ඇත්ද සුදු සිල් රෙදි එක ගොඩක් ගැහුවොත් ඒක ගිජ්ජකූට පර්වතයට වඩා විශාලයි පින්වතුනි, එහෙනම් බලන්න මේ දානය තුළින් ශීලය තුළින් කොයිසා කුසල් සංස්කාරයන් අපි රැස් කරන්න ඇත්ද? ඒ කුසල් සංස්කාරයන් නිසා ශක්‍රයා වෙලා අපි කොච්චර නම් ඉන්න ඇත්ද? සක්විති රජ්ජුරුවො වෙලා අපි කොච්චර නම් ඉන්න ඇත්ද? සුජම්පතී දේවිය වෙලා, ස්ත්‍රී රත්නය වෙලා කොච්චර ඉන්න ඇත්ද?

නමුත් ඒ සෑම සංස්කාරයක්ම විපාක දීලා අනිත්‍ය වුනා පින්වතුනි, මෙන්න මේ ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දැක්ක තැනයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙන්නෙ. ලෝකෝත්තර සම්මා දිට්ඨිය තමයි අර මාර්ගඵල පැත්තට ඉස්සරහට අරගෙන යන්නෙ. මොකද යමෙක් සෝවාන් ඵලයට පත් වෙන්න නම් එයා තුළ මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ සම වෙන්න ඕන. මොනවද ඉන්ද්‍රිය ධර්මයන්. **ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා** මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ සම වෙන වෙලාවේ එයා සෝවාන් ඵලයට පත් වෙනවා. එහෙනම් මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ සම වෙන්නෙ නැත්නම් මේක අසමානව තියෙන තාක් කල් අපි ඉන්නෙ ශ්‍රද්ධානුසාරී, ධම්මානුසාරී කියන තැන් දෙකේ. මේ දෙතැනින් ඔබ්බට ගිහිල්ල සෝවාන් ඵලයට පත් වෙන්න නම් අපි නිරතුරුවම මේ ශ්‍රද්ධාව කියන දේ විදර්ශනා නුවණින් දකින්න ඕනෑ. ශ්‍රද්ධාව විදර්ශනා නුවණින් දැක්ක තැනයි ප්‍රඥාව මේ පැත්තෙන් මෝදු වෙන්නෙ. ශීලය විදර්ශනා නුවණින් දැක්ක තැනයි මේ පැත්තෙන් ප්‍රඥාව මෝදු වෙන්නෙ. සමාධිය විදර්ශනා නුවණින් දකින්න අපි දක්ෂ වෙන්න ඕන. සමාධිය විදර්ශනා නුවණින් දැක්කොත් පමණයි මේ පැත්තෙන් ප්‍රඥාව මෝදු වෙන්නෙ. ශීලය විදර්ශනා නුවණින් දකින්න අපි දක්ෂ වෙන්න ඕන. ඉන් මෙහා අපි ලෞකික සම්මා දිට්ඨිය තුළ ජීවත්වෙන තාක් කල් ප්‍රඥාව කියන ඉන්ද්‍රිය අපි තුළ වැඩෙන්න නැහැ. අපි සෑම මොහොතකම මේ ශ්‍රද්ධානුසාරී සහ ධම්මානුසාරී කියන දෙන්නා අතර ඉන්නවා. අපි අචල වූ ශ්‍රද්ධාව ආර්ය සීලය කියන කාරණාව අපි ජීවිතයට එකතු කර ගන්නේ නැහැ.

**<u>ප්‍රශ්නය</u>**

***27. ඡන්ද රාගය දුරුකොට සක්කාය දිට්ඨිය නැති කර ගැනිමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.***

**පිළිතුර**

දැන් මේ ප්‍රශ්නය යොමු කරන්නෙ පංචුපාදානස්කන්ධය කෙරෙහි පවත්නා ඡන්දරාගය දුරු කරන්නේ කොහොමද කියන කාරණයයි, පංචුපාදානස්කන්ධය කෙරෙහි පවත්නා ඡන්දරාගය තමයි භවයේ නැවත නැවත උපතක් කරා අපව ඉස්සරහට අරගෙන යන්නෙ. ඒ නිසා මේ පංචුපාදානස්කන්ධය අනිත්‍ය භාවය දකින්න නම් පටිච්ච සමුප්පන්නව මේ ජීවිතය දකින්න ඕන. හේතුඵල ධර්මයක් තුළින් මේ ජීවිතය දකින්න ඕන. පටිච්ච සමුප්පන්නව ජීවිතය නොදකින තාක් කල් අපි මේ රූපය මගේ කරගෙන අල්ලා ගන්නව. මේ වේදනාව මගේ කොට ගන්නව. මේ සංඥාව මගේ කොට ගන්නව. මේ සංස්කාරයන් මගේ කොට ගන්නව. මේ විඤ්ඤාණයන් මගේ කොට ගන්නව. එතන සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවාය කියන කාරණය දකිනව. මෙතන මේ වේදනාව තුළ සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවාය කියන කාරණය දකිනව.

ඒ නිසා මේ පංචුපාදානස්කන්ධය කෙරෙහි ඇති ඡන්ද රාගය අපි දුරු කර ගන්න ඕනි නම් පටිච්ච සමුප්පන්නව ජීවිතය දකින්න ඕන. පටිච්ච සමුප්පන්නව ජීවිතය දකිනවා කියන්නේ පින්වතුනි, හේතුඵල ධර්මයන් තුළ ඉඳිමින් ජීවිතය දැකීම. දැන් මේ මහත්තයාව උදාහරණයකට ගත්තොත් මේ මහත්මයා ගිය ජීවිතයේ අපි හිතමු මනුස්ස ජීවිතයක් ගතකළ කෙනෙක් කියලා. මේ මහත්මයා අවුරුදු 90 ක් විතර ජීවත් වෙලා මැරෙන වෙලාව එනව ගිය ජීවිතේ.

ඒ මැරෙන වෙලාවෙ ඒ රූපය ඇසුරෙන් සකස් වන අවසාන පංචුපාදානස්කන්ධයට කියනවා චුති සිත කියලා. ඒක තමයි මේ රූපය ඇසුරු කරගෙන සකස් වන්නා වූ අවසාන පංචුපාදානස්කන්ධය. ඒ අවසාන චුති සිතට කුසල් චිත්තයක් තමයි මේ මහත්මයාට උපාදානය වුනේ. එතකොට මේ අවසාන චුති සිතට කියනවා විඤ්ඤාණය කියලා. එතකොට විඤ්ඤාණය සකස් වුනේ කුමක් නිසාද? සංඛාර පච්චයා විඤ්ඤාණං. මේ මහත්මයා ගිය ජීවිතේ සංස්කාරයන් රැස් කරපු නිසා. ඒ කියන්නේ සංස්කාරයන් කියන කුසල් සහ අකුසල් සංස්කාරයන් රැස් කරපු නිසා ඊට අදාළව විඤ්ඤාණය සකස් වුනා. එතකොට සංස්කාර සකස් වුනේ කුමක් නිසාද? අවිද්‍යාව නිසා. ''අවිජ්ජා පච්චයා සංඛාරා'' අවිද්‍යාව කියල කියන්නෙ මොකක්ද? චතුරාර්ය සත්‍යය නොදැනීම. චතුරාර්ය සත්‍යය එයා දන්නෙ නෑ. දුක්ඛ කියන කාරණය දන්නෙ නෑ. දුකට හේතුව තෘෂ්ණාව කියන කාරණය එයා හඳුනන්නෙ නෑ.

තෘෂ්ණාව නැති කළොත් දුක නැති කරනවාය කියන කාරණය එයා අඳුරන්නේ නෑ. දුක නැති කිරීමේ මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියල එයා හඳුනන්නේ නෑ. මේ අවිද්‍යාව නිසාම අපි නිරතුරුවම සංස්කාරයන් රැස් කරනවා. එහෙනම් අවිද්‍යා නිරෝධා සංස්කාර මොකද වෙන්නෙ? අවිද්‍යා නිරොධා සංස්කාර නිරෝධෝ, දැන් අවිද්‍යාවත් සංස්කාරයත් අතර සත්වයෙක් පුද්ගලයෙක් හිටියද? නැහැ. හේතුඵල ධර්මයක් අවිද්‍යාව නිරුද්ධ කර ගනිමින් සංස්කාරයන් නිරුද්ධ වෙනවා. අවිද්‍යාවත් සංස්කාරයත් අතර අපට සත්වයෙක් පුද්ගලයෙක් දකින්න බෑ. හේතුඵල ධර්මයක් පමණයි. සංස්කාර රැස් කරපු නිසා ඊට අදාළව අවසාන චුති සිත හෙවත් විඤ්ඤාණය සකස් වුනා. අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාරා පච්චයා විඤ්ඤාණං, සංස්කාරයට අදාළව චුති සිත නැත්නම් විඤ්ඤාණය සකස් වෙනව. සංස්කාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ. දැන් සංස්කාරයත් විඤ්ඤාණයත් අතර සත්වයෙක් පුද්ගලයෙක් හිටියද? කොතැනකවත් හිටියද සත්වයෙක් පුද්ගලයෙක්? නැහැ හේතුඵල ධර්මයක්. ඊට පස්සේ විඤ්ඤාණ පච්චයා නාමරූපං.

මේ විඤ්ඤාණය නිසා නාමරූප සකස් වෙනවා. එතකොට විඤ්ඤාණය නිසා නාම රූප සකස් වෙනවාය කියන්නේ, දැන් මහත්තයාගේ අවසාන චුති විඤ්ඤාණය සකස් වුනාය කියන එකයි. ඒ වෙලාවෙ මහත්තයෝ මහත්තයාගේ මේ ජීවිතයෙ අම්මාගේ මව්කුසේ කලල රූපයක් හට ගන්නවා. ඒක ජීව විද්‍යාත්මක දෙයක් පමණයි. ඒ කලල රූපය පැලෝපීය නාලය හෝ ගර්භාෂයේ පාවී පාවී තියෙනවා. මේක මේ රූපයක් පමණයි. ඊට වඩා එහා දෙයක් නෑ. මෙන්න මේ අම්මාගේ මව්කුසේ පාවී පාවී තියෙන කලල රූපයට තමයි මේ විඤ්ඤාණය ඇවිල්ල බැස ගන්නෙ. විඤ්ඤාණය ඇවිල්ල බැස ගත්තට පස්සෙ මෙතෙක් වේලා අර රූපයක් හැටියට පාවී පාවී තිබුන කලල රූපය දැන් ගැහෙන්න පටන් ගන්නවා. අපේ පපුව ගැහෙනව වගේ ගැහෙනවා. දැන් කාය සංස්කාර සකස් වෙනවා. විඤ්ඤාණ පච්චයා නාමරූපං. විඤ්ඤාණය බැස ගත්ත නිසා නාමරූප සකස් වෙනවා. විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරොධෝ. එහෙමනම් මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර සත්ත්වයෙක් පුද්ගලයෙක් හිටියද මෙතන? හේතුඵල ධර්මයක්. විඤ්ඤාණ නිරෝධා නාම රූප නිරෝධෝ. ඊට පස්සෙ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නාමරූප පච්චයා සළායතනං නාමරූප නිසා සළායතන සකස් වෙනව.

නාමරූප නිසා සළායතන සකස් වෙනවා කියන්නේ දැන් අර කලල රූපය, ගැහි ගැහී තියෙන කලල රූපය සති හතක් අටක් යනකොට තම්බපු බිත්තරයක ප්‍රමාණයට ලොකු

වෙනව. ලොකු වෙලා මේ අතපය වෙන්වෙලා බෙදිලා මේ ආයතන හය පිහිටනව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. දැන් ආයතන හය පිහිටවුවේ කුමක් නිසාද? නාමරූප පච්චයා සළායතනං. නාමරූප සකස් වූ නිසා සලායතන සකස් වුනා. නාමරූප නිරෝධා සලායතන නිරෝධෝ. මේ නාමරූපයත් සලායතනන් අතර සත්වයෙක් පුද්ගලයෙක් හිටියද? නැහැ.

හේතුඵල ධර්මයක් විතරයි. ඊට පස්සෙ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සලායතන පච්චයා ඵස්සො. සලායතන නිසා ඵස්සය සිද්ධ වෙනවා. සලායතන නිසා ඵස්සය සිද්ධ වෙනවාය කියන්නේ දැන් මහත්තයා මේ ලෝකෙට බිහි වෙනවා. බිහිවුනාට පස්සෙ මහත්තයා ඇසෙන් රූප දකිනවා. ඇසෙන් රූප දැක්කාය කියන්නෙ චක්ඛු විඤ්ඤාණය පහළ වෙනවා. දැන් මහත්තයා ඊළඟට මොකද කරන්නේ. දැක්කා වූ රූපය ගැන හිතනවා. චක්ඛු විඤ්ඤාණය මැරිලා මනෝ විඤ්ඤාණය පහල වෙනවා.

දැන් මහත්තයාට සද්දයක් ඇහෙනවා. දැන් චක්ඛු විඤ්ඤාණය මැරිලා සෝත විඤ්ඤාණය උපදිනවා. ඒ සද්දය ගැන මහත්තයා හිතනවා. එතකොට සෝත විඤ්ඤාණය මැරිලා මනෝ විඤ්ඤාණය උපදිනවා. දැන් මහත්තයට මදුරුවෙක් කනව. කාය විඤ්ඤාණය සකස් වෙනවා. මනෝ විඤ්ඤාණය මැරෙනව. මේක අපි කිව්ව වගේ ලේසි පහසුවෙන් සිද්ධ වෙන දෙයක් නොවෙයි. මේක ඒ සා වේගයෙන් සිද්ධ වන්නා වූ දෙයක්. දැන් චක්ඛු විඤ්ඤාණය ම ද සෝත විඤ්ඤාණය කියන්නෙ? නැහැ. සෝත විඤ්ඤාණයම ද මනෝ විඤ්ඤාණය කියන්නෙ? නැහැ. මනෝ විඤ්ඤාණය ද කාය විඤ්ඤාණය කියන්නෙ? නැහැ. ඇස මැරිලයි මන ඉපදෙන්නෙ. මන මැරිලයි කය ඉපදෙන්නෙ. කය මැරිලයි කණ ඉපදෙන්නෙ. තේරුණාද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ සෑම සත්වයෙක්ම සෑම නිමේෂයකදී ම මැරෙමින් ඉපදෙනවා. මැරෙමින් ඉපදෙනවාය කියලා. නමුත් අපි දන්නේ නෑ අපි සෑම නිමේෂයකදී ම මැරෙමින් ඉපදෙනවාය කියන කාරණය. අපි අපේ මරණය හැටියට දන්නේ කවදා හරි වයසට ගිහිල්ල ලෙඩ වෙලා සිද්ධ වෙන මරණය ගැන විතරයි.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මේ සෑම සත්වයෙකුම සෑම නිමේෂයකදී ම මැරෙමින් උපදිනව, මැරෙමින් උපදිනවා කියලා. එතකොට මැරෙමින් උපදිනවාය කියල මේ මොකක්ද බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ? ඇසෙන් රූපයක්

දකිද්දී ඇස ඉපදෙනවා. චක්ඛු විඤ්ඤාණය සකස් වුණා. ඊට පස්සෙ දැක්කා වූ රූපය ගැන හිතන කොට ඇස මැරිලා මනෝ විඤ්ඤාණය ඉපදෙනවා.

ඊට පස්සෙ සද්දයක් ඇහෙනකොට මනෝ විඤ්ඤාණය මැරිලා සෝත විඤ්ඤාණය උපදිනවා. එහෙම නම් ඕනෑම කෙනෙකුගේ ඕනෑම අවස්ථාවක එකම එක ආයතනයයි ඉපදිලා තියෙන්නෙ. ඒක හරි වේගවත්. කවදාහරි අපිට ප්‍රඥාවෙන් විතරයි ඒක දකින්න පුළුවන් වෙන්නෙ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ සෑම නිමේෂයකදී ම එක ආයතනයයි ඉපදිලා තියෙන්නෙ. ඒ ඉපදිලා තියෙන ආයතනය තුළ විඤ්ඤාණය බැසගෙන තියෙනවා.

ඇස උපදින කොට චක්ඛු විඤ්ඤාණය ඇස තුළ බැසගෙන තියෙනවා. මන ඉපදෙන කොට විඤ්ඤාණය මනස තුළ බැසගෙන තියෙනව. කණ ඉපදෙනකොට විඤ්ඤාණය කණ තුළ බැසගෙන තියෙනව. එහෙම නම් එකම විඤ්ඤාණයක්ද? නැහැ. ඇතිවෙමින් නැතිවෙමින් මැරෙමින් ඉපදෙමින් මේ ආයතනයන් ආයතනයන් හරහා මෙසේ ඇතිවෙමින් නැතිවෙමින් ගලාගෙන ගිහිල්ල මහත්තයා මේ ජීවිතයේ චිරාත් කාලයක් ජීවත් වෙලා මියයන වෙලාවෙ මනෝ විඤ්ඤාණය හැටියට අවසාන චුති සිත සකස් වෙලා ඊළඟ ප්‍රතිසංධියට යනවා. එහෙමනම් දැන් මෙතන සත්ත්වයෙක් පුද්ගලයෙක් කොතන හරි දැක්කද? නෑ. හේතුඵල ධර්මයක් තිබුණෙ. එහෙමනම් මේ අවිද්‍යාව කියන කාරණය අපි නිරෝධය කළා නම් මේ මුලු වැඩ සටහනම නිරෝධයට යනව. එහෙනම් අපි හේතුඵල ධර්මයන් අනුව ජීවිතය දකිද්දී අපි මෙතන සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවාය කියන මුලාවට බැඳෙන්නෙ නැහැ. මේ රූපය තුළ,  මේ වේදනාව තුළ, මේ සංඥාව තුළ සංස්කාර තුළ සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් තියෙනවාය කියන කාරණය අපි දකින්නෙ නැහැ. එහෙම නොදකින්න නම් අනිවාර්යෙන්ම අර කිව්ව විදිහට පටිච්ච සමුප්පන්නව ජීවිතය දකින්න ඕන.

මේ හේතුඵල ධර්මය අනුව ජීවිතය දකින කෙනා අවබෝධ කර ගන්නවා මමය කියල සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැහැ කියන කාරණය. ඒ එක පැත්තකින් අපි පටිච්ච සමුප්පාදය තුළ පංචුපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨාන සූත්‍රයෙන් දේශනා කරනවා මේ රූපයම විදර්ශනා නුවණින් දකින්න කියලා. දැන් මෙතන රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන පංචුපාදනස්ඛන්ධයේ

මුල්ම උපාදානස්ඛන්ධය මොකක්ද? රූප උපාදානස්ඛන්ධය. රූපය කෙරෙහි ඇතිකර ගන්නා වූ තෘෂ්ණාව නිසයි වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයන් අපි සකස් කර ගන්නෙ. යම් දවසක අපි රූපය කෙරෙහි තියෙන තෘෂ්ණාව සිඳල දැම්ම නම් අපට වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ පිළිබඳ ප්‍රශ්නයක් මතුවෙන්නෙ නැහැ.

අපි හිතමු ලෝකයේ කොහේ හරි රහතන් වහන්සේ නමක් වැඩ සිටිනවා නම් ඒ රහතන් වහන්සේටත් ඇසක් තියෙනවා. ඇසෙන් රූප දකිනවා. ඒ රහතන් වහන්සේටත් කණක් තියෙනවා. කණෙන් ශබ්ද අහනවා. එතකොට දැක්කා, ඇසුනා, කියන්නෙ මොකක්ද? ඵස්සය. ඵස්සය කියන්නෙ මොකක්ද? කාරණා තුනක එකතුව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මොනවද මේ කාරණා තුන? අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත් කියන කාරණා තුනෙහි එකතුව. මේ තුන එකට එකතු වෙද්දිම ඵස්සය සිද්ධ වෙනව. මේ තුන එකට එකතු වුනහම ඵස්සය සිද්ධ වෙනව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. එහෙම නම් රහතන් වහන්සේ තුළත් ඵස්සය සිද්ධ වෙනව. එයා දැක්කා කියන තැන ඉන්නවා. ඇසුනා කියන තැන ඉන්නවා. දැනුනා කියන තැන ඉන්නවා. ඒ කියන්නෙ රහතන් වහන්සේ තුළත් ඵස්සය සිද්ධ වෙනවා. නමුත් ඵස්සය ළඟදීම රහතන් වහන්සේ ඕනෑම රූපයක් අනිත්‍යයි කියලා දකින්න දක්ෂයි. තේරුණාද? මහා බ්‍රහ්මයා කියන රූපය අරමුණු වුනත් ශක්‍රයා කියන රූපය අරමුණු වුනත් සකවිති රජකම කියන රූපය අරමුණු වුනත් ඒ ඕනෑම නිමේෂයක දී ම ඵස්සය ළඟදීම රූපය අනිත්‍යයි කියල දකින්න රහතන් වහන්සේ දක්ෂයි. ඇයි දක්ෂ? එයා චතුරාර්ය සත්‍යය අවබෝධ කරන වෙලාවෙ එයා ඤාණ දර්ශන තුළින් රූපයේ අනිත්‍යභාවය දැක්ක කෙනෙක්. ඒ නිසා එයා ඵස්සය ළඟදීම ඕනෑම රූපයක් අනිත්‍යයි කියල දකිනවා.

ඵස්සය අනිත්‍යයි කියල දැක්ක නම් වේදනාවක් සකස් වෙනවද? ඵස්සය හේතුවෙනුයි වේදනාව සකස් වෙන්නෙ. එහෙමනම් ඵස්සය අනිත්‍යයි කියලා දැක්ක නම් වේදනාවත් සකස් වෙන්නේ නැහැ. වේදනාව සකස් වෙන්නෙ නැති තැනකදී සංඥා, සංඛාර, විඤ්ඤාණ පිළිබඳව කතා කිරීම අවශ්‍ය වෙන්නෙ නැහැ. එහෙනම් අපි මේ පංච උපාදානස්ඛන්ධය කෙරෙහි තෘෂ්ණාව ඇතිකර ගන්නේ, රූපය කෙරෙහි ඇතිකර ගත්තා වූ තෘෂ්ණාව නිසාමයි.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ මේ නිවන් මාර්ගයට අදාළව දේශනා කරන මූලිකම සූත්‍රය වන සතර සතිපට්ඨාන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ

රූපයේම අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙන්න කියලා. මේක ආයතන හැටියට මේ රූපයේ අනිත්‍යභාවය දකින්න කියනව. සතර මහා ධාතූන් හැටියට මේ රූපයේ අනිත්‍ය භාවය දකින්න කියනව. දෙතිස් කුණපය හැටියට මේ රූපයේ අනිත්‍යභාවය දකින්න කියනව. එතකොට ආයතන හැටියට මේ රූපයේ අනිත්‍යභාවය දකිනවා කියන්නේ මේ ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස හැටියට මේ රූපයේ අනිත්‍යභාවය දැකීමයි. දැන් බලන්න මේ ඇස කියන රූපය නුවණින් ගන්න.

ඇස කියන රූපයේ අනිත්‍ය භාවය දකිද්දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනව ඔබ අම්මාගේ මව් කුසට යන්න කියලා. අම්මාගේ මව්කුසේ ගර්භාෂ කුටියේ වකුටු වෙලා කලල රූපයක් හැටියට ජීවත් වෙද්දී ඒ ලේ, සැරව තැවරිලා තිබුන රතුපාට වැහිලා තිබුන ඇස් දෙකේ ස්වභාවය නුවණින් දකින්න කියනව. ඒ කලල රූපයට මාස 3ක් මාස 6ක් මාස 9 ක් ගත වෙද්දී ඒ කලල රූපයේ අර ලේ, සැරව තැවරිලා තියෙන රතුපාට වැහිලා තියෙන ඇස්දෙක දිහා නුවණින් දකින්න කියනවා. ඔබ මේ ලෝකෙට බිහිවන වෙලාවෙ ගල්‍යාගාර හෙදිය ඔබේ කකුල් දෙකෙන් ඔසවල ගනිද්දි ඒ ලේ, සැරව තැවරිලා තිබුණ, රතුපාට වැහිල තිබුන ඇස් දෙකේ ස්වභාවය නුවණින් දකින්න කියනව. ඔබ ළමා කාලය ගත කරද්දී තරුණ කාලය ගත කරද්දී ඔබට තිබුණා වූ ඒ දීප්තිමත් ප්‍රභාෂ්වර ඇස්දෙක නුවණින් දකිමින් ජීවත් වෙන්න කියනව. ඔබ ජීවිතයේ මැදි වයසට පත් වෙද්දී වයෝවෘද්ධ භාවයට පත් වෙද්දී ඔබේ ඇසේ සුද ඇවිල්ලා අන්ධ වෙලා තියෙනව නුවණින් දකින්න කියනව. ඔබේම ඇස අන්ධ වෙලා තියෙනවා. ඔබේම ඇස සුද ඇවිල්ලා තියෙනවා. නුවණින් දකින්න කියනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මනසින් මැරෙන්න කියලා. ඒ මළ කඳේ තියෙන මළ ඇස නුවණින් දකින්න කියනවා. ඒ මළ කඳට දවසක් දෙකක්, තුනක්, හතරක්, පහක් යනකොට ඒ මළ ඇස කුණුවෙලා, නරක් වෙලා, ඕජාව ගලනවා. නිලමැස්සො වසාගෙන මේ ඇස කනවා නුවණින් දකින්න කියනවා. අවසානයේ මේ දේහය ගිහිල්ල සුසාන භූමියට දානවා නුවණින් දකින්න කියනවා. මේ දේහය ගිනි තබන වෙලාවේ මේ ඇස ගිනි ගොඩක් බවට පත්වෙනවා නුවණින් දකින්න කියනවා. අවසානේ මේ ඇස මහ පොළවට පස් වෙනවා නුවණින් දකින්න කියනවා.

මම ඔබෙන් ඇහුවොත් ඔබට ආච්චි කෙනෙක්, සීයා කෙනෙක් හිටිය ද කියලා, ඔබ උත්තර දේවි ඔව් හාමුදුරුවනේ මට ආච්චි කෙනෙක් හිටිය කියලා. මම ඇහුවොත් ඒ ආච්චිට

ඇස් දෙකක් තිබුණ ද කියලා ඔබ මොකද කියන්නේ. ඔව් අපේ ආච්චිට ඇස් දෙකක් තිබුනා කියලයි කියන්නේ. මං ඇහුවොත් ඒ ආච්චිගෙ ඇස් දෙක මේ වෙලාවේ කොතනද තියෙන්නෙ කියලා ඔබ කියන්නෙ ඒ ආච්චිගෙ ඇස් දෙක මහ පොළවට පස් වෙලයි තියෙන්නෙ කියලා. ඒ ආච්චිටත් මේවගේ රූපයක් තිබුන. ඒ රූපය මේ වෙලාවේ තියෙන්නෙ කොතනද කියල ඇහුවොත් ඔබ කියන්නෙ ඒ රූපය මහ පොළවට පස් වෙලයි කියලයි. එහෙමනම් බලන්න ආච්චිගෙ රූපය අයිති වුනේ මහ පොළවෙ පසටයි. ආච්චිගෙ ඇස් අයිති වුනේ මහ පොළවෙ පසටමයි. එහෙමනම් බලන්න මහ පොළවේ පසට අයිති වෙන ඇසක් උදෙසා රූපයක් උදෙසා ඒ ආච්චි කොච්චර නම් අකුසල් කර ගන්න ඇද්ද?. ඒ ඇස මගේ කරගෙන ඒ ඇස තුළ ආත්මයක් තියෙනවා කියල දකිමින් ඒ ආත්මය තුළ මම ඉන්නවාය කියල දකිමින් ඒ ඇස නිසා ඒ ආච්චි කොච්චර නම් අකුසල් කරගන්න ඇත්ද? ඒ රූපය තුළ මම ඉන්නවාය කියලා දකිමින් ඒ රූපය තුළ ආත්මයක් තියෙනවාය කියලා දකිමින් ඒ රූපය නිසා ඒ ආච්චි කොච්චර නම් අකුසල් කර ගන්න ඇද්ද? නමුත් අවසානයේ ඇස අයිති වුනේ, අවසානයේ රූපය අයිති වුනේ මහ පොළවේ පසටමයි.

ඒ නිසා තමන් දක්ෂ වෙන්න ඕනෑ මේ මහපොළවේ පසට අයිතිවෙන ඇසක් උදෙසා, රූපයක් උදෙසා අකුසල් කරගන්නේ නෑ කියන තැනට මුලින්ම එන්න. මොකද මේ ඇස ඔබට අයිති ඇසක් නෙවෙයි. මේ රූපයේ හේතුව නිසා සකස් වුනා වූ දෙයක්. ඒ නිසා මෙය අවසානයේ මහපොළවෙ පසට නම් අයිති වෙන්නෙ මේවා උදෙසා අපි අකුසල් සිද්ධ කරගන්න එකේ තේරුමක් නැහැ.

ඊළඟට නිරතුරුවම මේ ආයතනයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින්න. මේ ආයතනයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින මොහොතක් පාසා අපි මේ රූපය කෙරෙහි ඇතිකර ගන්නා වූ ඡන්ද රාගය සියුම් කර ගන්නව. ඉතින් රූපය කෙරෙහි ඇති කරගන්නා වූ ඡන්ද රාගය සියුම් වෙන ප්‍රමාණයට වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණයන් කෙරෙහි ඇති කරගන්නා වූ ඡන්ද රාගයත් සියුම් කර ගන්නව. ඒ නිසා අනිවාර්යෙන්ම පටිච්ච සමුප්පන්නව ජීවිතය දකින්න හුරුවෙන්න හේතුඵල ධර්මයන් අනුව. හැමදාම රාත්‍රී අපි බුද්ධ වන්දනාව කරද්දී නිරතුරුවම මේ පටිච්ච සමුප්පාදය සජ්ඣායනය කරන්න දක්ෂ වෙන්න.

නිරතුරුවම මේ අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්යා විඤ්ඤාණං ........ මේ ආදී වශයෙන් පටිච්ච සමුප්පන්නව අපි දවසට දෙතුන් වතාවක් පටිච්ච සමුප්පාදය සජ්ඣායනය

කරන්න, හිතන්න, මෙනෙහි කරන්න දක්ෂ නම් ඉබේම මේ පටිච්ච සමුප්පන්න ක්‍රියාවලිය අපේ ජීවිතයට අර්ථවත් කරගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඉන් එහා අපි නිරතුරුවම මේ රූපයේ අනිත්‍ය භාවය දකිමින් ජීවත් වෙන්න උත්සාහ ගන්න. මේ වේදනාවේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න.

දූන් මේ බලන්න අපි ඉස්සෙල්ලාම මේ ඇසින් දූක්කා වූ රූපය මොකක්ද? අම්මා කියන රූපය. අපි කවුරුත් මේ ඇස් දෙකෙන් ඉස්සෙල්ලාම දූක්කේ අම්මා කියන රූපයයි. එහෙමනම් බලන්න ඒ අපේ ඇස් දෙකෙන් දූක්කා වූ අම්මා කියන රූපය මේ වෙනකොට කොයිසා නම් වෙනස් වීමකට ලක් වෙලාද? ඒ අම්මා අද සමහර විට වයෝවෘද්ධ භාවයට පත්වෙලා ඉන්න පුළුවන්. ගිලන් වෙලා රෝද පුටුවක යනවා වෙන්න පුළුවන්. මිය පරලොව ගිහිල්ලා වෙන්න පුළුවන්. දිව්‍ය තලයක දිව්‍යාංගනාවක් වෙලා ඉන්න පුළුවන්. නැවත මනුස්සයෙක් වෙලා ඉපදිලා ඉන්න පුළුවන්. සතර අපායකට වැටිලා ඉන්න පුලුවන්. එහෙමනම් බලන්න මේ ඇස් දෙකෙන් දූක්කා වූ මුල්ම රූපය කොයිසා නම් අනිත්‍ය භාවයකට පත් වුනාද කියලා. ඒ අම්මා කියන රූපය වගේම තාත්තා කියන රූපය, ආච්චී කියන රූපය, සීයා කියන රූපය. මේ කොයි රූපයත් අපි නුවණින් මතු කරල ගත්තත් ඒ සෑම රූපයක්ම කොයි සා වේගයකින් අනිත්‍යභාවයට පත්වුනාද කියල අපි දකින්න ඕන.

ඒවගේම ඒ අම්මා කියන රූපය අනිත්‍ය වුනා වගේම ඒ අම්මා දූක්කා වූ ඇස කියන රූපය මේ වෙලාවට කොච්චර නම් අනිත්‍ය භාවයට පත්වෙලාද? ඇස වයෝවෘද්ධ භාවයට පත්වෙලා. ජාති, ජරා, ව්‍යාධි, මරණාදියට ලක්වෙමින් තමයි මේ මොහොතෙත් ඔය ඇස තියෙන්නෙ. එහෙමනම් බලන්න මේ අම්මා කියන රූපයත් ඇස කියන රූපයත් කොයි සා අනිත්‍ය භාවයට පත් වෙලාද? ඒවගේම අම්මා නිසා අපි කොච්චර නම් විඳීම් ඇතිකර ගන්න ඇද්ද?

විඳීම කියන්නෙ ඇලීම් ගැටීම් උපේක්ෂාවන්. අම්මාගේ ආදරයට, අම්මාගේ කිරි සුවඳට, අම්මාගේ හුරතලයට, අම්මා ගහනකොට, බණින කොට, කවනකොට, පොවන කොට, අකුරු කියල දෙනකොට, අම්මා නිසා කොයිසා විඳීම් අපි ඇතිකර ගන්න ඇද්ද? ඒ විඳීම් නිත්‍යද? අනිත්‍යද? අනිත්‍යයි. ඒ සෑම විඳීමක්ම අපිට තේරෙනව කොයි සා නම් අනිත්‍ය භාවයකට පත්වුනාද කියලා. අම්මා නිසා අපි කොච්චර හඳුනාගැනීම් ඇතිකර ගන්න ඇද්ද? ඇසෙන් අම්මා කොච්චර හඳුනාගන්න ඇද්ද? කණෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්,

මනසින් අම්මා කියන රූපය අපි කොයිසා ආකාරයෙන් හඳුනාගැනීම් සිද්ධ කරන්න ඇද්ද? නමුත් ඒ සෑම හඳුනාගැනීමක්ම අනිත්‍ය බවටයි පත්වෙලා තියෙන්නෙ. ඒ වගේම අම්මා නිසා අපි කොච්චර කුසල් අකුසල් සංස්කාරයන් සකස් කර ගන්න ඇද්ද? අම්මා නිසා කේන්ති අරගෙන අම්මා නිසා සතුටු වෙලා කොයිසා කුසල් අකුසල් සංස්කාරයන් අපි රැස්කර ගන්න ඇද්ද? ඒ සෑම සංස්කාරයක්ම විපාක දීලා අනිත්‍ය වන දෙයක්මයි. ඒ නිසා අම්මා නිසා කොයිසා විඤ්ඤාණයන්, විඤ්ඤාණයන් කියන විශේෂ වූ දැනීමක්, අම්මා මේ විදිහේ කෙනෙක්. මේ විදිහේ කෙනෙක් ආදී වශයෙන් විශේෂ වූ දැනීම් අම්මා කෙරෙහි කොච්චර සකස් කර ගන්න ඇද්ද? ඒ සෑම දෙයක්ම අනිත්‍ය භාවයට පත්වන දෙයක්මයි.

ඒ නිසා නිරතුරුවම එක පැත්තකින් පටිච්ච සමුප්පන්නව ජීවිතය දකින්න. අනික් පැත්තෙන් රූපයේ අනිත්‍ය භාවය දකිමින් ජීවත් වෙන්න. ඒ ප්‍රමාණය මත ඔබ පංච උපාදානස්කන්ධය කෙරෙහි තියෙන ඡන්දරාගය සියුම් කරගන්න.

**<u>ප්‍රශ්නය</u>**

***28. ස්වාමීන් වහන්ස ගායනා කරන අයුරින් බොහෝ ස්වාමීන් වහන්සේලා ගාථා කීම, පන්සිල් දීම, සුදුසු කාරණයක්ද? කවිබණ කීමත් ස්වාමීන් වහන්සේලා විසින් කිරීම සුදුසුද?***

**<u>පිළිතුර</u>**

බුදුරජාණන් වහන්සේ අපේ විනය කාරණා වල දී දේශනා කරනවා, කවි බණ, විරිදු බණ කීම භික්ෂුවකට අකැපයි කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළා කිසිම අවස්ථාවක දී ඔබලා භික්ෂූන් වහන්සේලාගේ වැරදි හොයන්න යන්න එපා කියලා. ඒක තමයි ඇත්ත. මගෙන් කවුරුහරි ඇහුවොත් ඔබ ආරණ්‍යයකට ද කැමති පන්සලකට ද කියලා මම කියන්නේ මම කැමති පන්සලට කියලා. මොකද මම එහෙම කියන්නෙ, මම මේ ධර්මයේ අයන්න ආයන්න ඉගෙන ගත්තේ පන්සලෙන් නිසා. නමුත් මම අයන්න ආයන්න ඉගෙන ගන්න කොට මම දැක්කා අපේ පන්සලේ ස්වාමීන් වහන්සේලාගේ සිල්පද දුර්වලයි කියලා.

නමුත් මම මට ඒක අදාළ කර ගත්තේ නැහැ. අපේ ගමන යන්න අපි ඒවා ප්‍රයෝජනයට ගත යුතුයි. කොයි වෙලාවකවත් ස්වාමීන් වහන්සේලාගේ වැරදි හොයන්න

යන්න එපා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සූත්‍රයකින්, අනාගතයේ දී කාසායකණ්ඨක කියලා කෙනෙක් බිහි වෙනවා කියලා. ඒ කාසායකන්ඨක කියන කෙනාගෙන් මේ සිවුරත් අයින් වෙලා, අඳනයත් අයින් වෙලා, එයා කහපාට නූලක් විතරයි දාගෙන ඉන්නෙ. කලිසමත් ඇඳලා, කමිසයක් ඇඳලා කහපාට නූලක් දාලා එයා විවාහයක් වෙලා දරුවො හදාගෙන, සත්තු මරාගෙන කාලා බීලා විනෝද වෙලා ගෙදර ජීවත් වෙනවා. එදාට එයා තමයි සංඝයා. එදාට මනුෂ්‍යයෝ ගිහිල්ලා ඒ කාසායකණ්ඨකට දන් දෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කාසායකණ්ඨකට දෙන දානයත්, මහත්ඵලයි, මහානිසංසයි කියලා. කාසායකණ්ඨකටත් දානය සාංඝික කරන්න පුළුවන් කියලා. සංඝික කරල දන් දෙන්න පුළුවන් කියලා.

ඇයි බුදුරජාජාණන් වහන්සේ කාසායකණ්ඨකටත් සාංඝික කරලා දන් දෙන්න පුළුවන් කියලා කියන්නේ? එදා සමාජය තුළ කාසායකණ්ඨක තමයි ලොකුම සිල්වතා. ධර්මයේ හරයත් නැහැ, ඵලයත් නැහැ, ධර්මය අතුරුදහන් වෙලා. නමුත් එදා සමාජයේ කාසායකණ්ඨක තමයි ලොකුම සිල්වතා. එහෙමනම් ඔබ හිතන්න එදා ඔබ ඉපදිලා හිටියොත් මොන සා දුස්සීල වූ සමාජයක ද ඔබ ඉන්නෙ කියලා. එහෙමනම් බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනව නම්, කාසායකණ්ඨක කියන කෙනාටත් සංඝික කරල දන් දෙන්න කියලා. අපේ පන්සලේ හාමුදුරුවන්ගේ වැරදි හොයන්න ඔබලා යන්න එපා. උන්වහන්සේලා විරිදුවෙන් බණ කියනවානම් විරිදුවෙන් බණ කියපුදෙන්, කවියෙන් බණ කියනවා නම් කවියෙන් බණ කියපු දෙන්, අපි ඒ ධර්මය අපේ ජීවිතයට පුළුවන් විදිහට යොදා ගනිමු.

මොකද සංඝයා කියන්නේ ගින්දරක් කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නෙ. සංඝයා කියන්නෙ ගින්දරක්. ගින්දර එක්ක සෙල්ලම් කරන්න යන්න එපා. සංඝයාගේ ගුණයන් ඥාණයන් වැඩි වෙන්න වැඩි වෙන්න ඒ ගිනි රස්නය වැඩි වෙනවා. ඒ නිසා පන්සලේ ස්වාමීන් වහන්සේ කෙනෙක් ඉන්න පුළුවන් යම් ගුණයක් ශක්තියක් දරාගෙන. අපිට ඒ ගැන හිතන්න බැහැ. අපි කවදාවත් අපේ ජීවිතයේ ගුණයන් ලෝකයට පෙන්නුවේ නැහැ. ලෝකයට පෙන්වන්න ගියේ නැහැ. මට මේ වගේ බණ කියන්න පුළුවන් කියලා අපේ නායක ස්වාමීන් වහන්සේ දැනගත්තේ මීට මාස 3 කට ඉස්සෙල්ල. අපට ඒ තියෙන පුළුවන්කම ලෝකයාට පෙන්නන්න ගියේ නැහැ. මහ පාරෙදි, බස් එකේ දි කවුරු හරි දැක්කත්, මම එක පාරක් ආරණ්‍යයක ඉන්න කොට ... අපි ධර්මය කතා කරනව, සාකච්ජා කරනව, ඔක්කොම කරනව. මම ඒ ආරණ්‍යයේ හිටියේ කිසිම දෙයක් නොදන්න කෙනක්

විදිහට. ඒ ආරණ්‍යයේ නායක හාමුදුරුවො කියනව මේ හාමුදුරුවො නම් සිවුරු ඇරල යන්න තමයි මේ දඟලන්නේ කියලා. ඒ නිසා කෙනෙක්ගෙ ගුණයක් හොයන්න බැහැ. ඒ නායක හාමුදුරුවො මෙයා නම් සිවුරු ඇරල යාවි කියල කියද්දිත් මේ මොහොතේ මා ළඟ තිබෙන ගුණයන් එදත් තිබුණා. එහෙමනම් නොදන්නාකමින් කොච්චර අකුසලයක් එයා කරගන්න ඇද්ද? ඒ නිසයි කියන්නෙ සංඝයා ගින්දරක් කියලා. ඒ ගින්දරත් එක්ක සෙල්ලම් කරන්න යන්න එපා. පන්සලේ හෝ ආරණ්‍යයේ කැමති නම් දන්දෙන්න. අකමැති නම් නොදී ඉන්න.

බුදුරජාණන් වහන්සේ කියනවා නම් කාසායකණ්ඨකටත් සාංඝික කරලා දන් දෙන්න කියලා අපි බුදුරජාණන් වහන්සේ ඉක්මවලා යන්න හොඳ නැහැ, සුප්‍රබුද්ධ කියලා කුෂ්ඨ රෝගියෙක් හිටියා. ඉපදෙනකොටම කුෂ්ඨයක්, උප්පත්තියෙන්ම කුෂ්ඨයක්. යාචක පවුලක ඉපදුනේ. බුදුරජාණන් වහන්සේ බණ කියනවා ජේතවනාරාමයේ. මේ වගේ සෙනඟ පිරිලා. මේ කුෂ්ඨ රෝගියා හිතනවා මෙතන මොකක් හරි දන්සැලක් කියලා. ගිහින් ඈත ඉඳන් බණ අහනවා. බුදුරජාණන් වහන්සේට අරමුණු වෙනවා ඈත ඉඳන් බණ අහන සුප්‍රබුද්ධව. බුදුරජාණන් වහන්සේ සුප්‍රබුද්ධ අරමුණු කරගෙන බණ කියනවා. සුප්‍රබුද්ධ සෝවාන් ඵලයට පත් වෙනවා. තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇති කරගන්නවා. සාධුකාර දෙනවා. ඊට පස්සේ සෝවාන් ඵලයට පත් වෙච්ච සුප්‍රබුද්ධට මේ ආත්මයේ මේ සා දරුණු කුෂ්ඨ රෝගයක් හට ගත්තේ ඇයි කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. බුදුරජාණන් වහන්සේ කියනවා අතීතයේ අබුද්ධෝත්පාදක කාලයක, අබුද්ධෝත්පාදක කාලයක් කියන්නේ බුද්ධ, ධම්ම, සංඝ කියලා වචනයක් ඇහෙන්නේ නැහැ. මේ අබුද්ධෝත්පාදක කාලයක පසේ බුදු කෙනෙක් කැළේ ඉඳන් එනවා පිණ්ඩපාතයට.

දැන් ස්වාමීන් වහන්සේ පසේ බුදු කියලා කවුරුත් අඳුරන්නේ නැහැ. එදා සුප්‍රබුද්ධ රජ කුමාරයෙක්. අශ්වයාගේ පිට නැඟලා මේ රාජකුමාරයා පාරේ එනකොට අර පසේ බුදුවරයා කැළේ ඉඳන් එනවා පිණ්ඩපාතයට ගමට. දැන් මේ රාජකුමාරයා පසේ බුදුවරයා දැක්ක ගමන් කියනවා ''මේ කාලකණ්නියා උදේ පාන්දර රෙද්දක් පොරවාගෙන ඇගේ කුෂ්ඨයක් ද කොහෙද?'' කියලා. ඔච්චරයි කිව්වෙ. මේ කාලකණ්නි මනුස්සයාගේ ඇගේ කුෂ්ඨයක් ද කොහෙද? ඇගේ රෙද්දක් පොරවාගෙන ඉන්නෙ. දැන් සුප්‍රබුද්ධ දැනගෙන හිටියද, ඒ රාජකුමාරයා දැනගෙන හිටියද? මේ පසේ බුදුරජාණන් වහන්සේ නමක් කියලා. නැහැ. මේ සංඝයා කියලා දැන ගත්තද? නැහැ. නිකම්ම අර වචනෙ කිව්වා විතරයි. නමුත් ඒ වචනෙට කල්ප ගාණක් නිරයේ ඉඳලා එදා තමයි මනුෂ්‍ය ලෝකෙට මතු වුණේ.

ඒකයි කියන්නේ සංඝයා ගින්දරක්. ඒ සංඝයාගේ ගුණයන්, ඥානයන් වැඩිවෙන්න, වැඩිවෙන්න, ඒ ගින්දර රශ්මිය වැඩියි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා, පසේ බුදුරජාණන් වහන්සේලා, රහතුන් වහන්සේලා, මේ ලෝක ධර්මයන්ට යටත් නැහැ. මේ ලෝකයේ කර්ම ශක්තියට යටත් නැහැ.

අපි බුදුරජාණන් වහන්සේ නමකට පසේ බුදුරජාණන් වහන්සේ නමකට, රහතන් වහන්සේ නමකට චේතනාවක් නැතිව හෝ අකුසලයක් කළොත් විපාකය ලැබෙනවා. චේතනාවක් ඕනෙ නැහැ. මොකද ඒ ගොල්ලො ලෝකෙන් මිදිලා තියෙන්නෙ. ලෝක ධර්මයට ඒ ගොල්ලො යටත් නැහැ. ඒ නිසා දරුවො කවරදාකවත් කිසිම දවසක ස්වාමීන් වහන්සේ කෙනෙක්ගෙ හරි වැරැද්ද හොයන්න එපා. ඔබ පන්සලට අකමැති නම් වෙන පන්සලකට යන්න. මොකද සංඝයා කියන්නේ ගින්දරක්!

<u>ප්‍රශ්නය</u>

***29.*** ***අද සමාජයේ ගිහි බෞද්ධයින් අපේ රටේ ජීවත් වන්නා වූ උතුම් ස්වාමීන් වහන්සේලා දේශනා කරන ධර්මය තවත් ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ඉදිරියට ගොස් ප්‍රසිද්ධ ස්ථානවල දී ඒ අර අති උතුම් ගෞරවනීය ස්වාමීන් වහන්සේ දේශනා කරන ලද ධර්මය ඉතා කෙටි ලෙසින් අරගෙන, ඒ කියන්නෙ එක වාක්‍යයක් පමණක් අරගෙන ඒ වාක්‍යයේ තියෙන සත්‍ය සහ අසත්‍යතාවය අර ගෞරවනීය ස්වාමීන් වහන්සේගෙන් අහනවා. එතකොට ඒ ගෞරවනීය ස්වාමීන් වහන්සේ දන්නෙත් නැහැ. අර උතුම් ස්වාමීන් වහන්සේ මේ ගැන සම්පූර්ණයෙන් දේශනා කරන ලද සියල්ල. ඉතිං ඒ වෙලාවේ දී අපේ අර උතුම් ස්වාමීන් වහන්සේ ඒ වෙලාවේ දී අගෞරවයට ලක්වෙන විදිහට අර ප්‍රශ්නය ගිහියා විසින් ඉදිරිපත් කරනවා. ස්වාමීන් වහන්ස, ඉතිං මේ වගේ ගිහියන්ට ස්වාමීන් වහන්සේට දෙන්න පුළුවන් අවවාද සහ ලැබෙන ඵල විපාක පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරය ගැන පැහැදිලි කර දෙන්න ස්වාමීන් වහන්ස.***

<u>පිළිතුර</u>

මහත්තයෝ, ඕක තමයි ලෝකය කියන්නෙ. ලෝකය ඔහොම හින්දයි අපිට මේකෙන් ගැලවිලා යන්න ඕන වෙලා තියෙන්නෙ. මේ ලෝකයේ ස්වභාවය තමයි ඔය. ඕක අමුතුවෙන් සිද්ධ වෙච්ච දෙයක් නෙවෙයි. බුදුරජාණන් වහන්සේගේ කාලයෙත් ඔහොමමයි. මිහිඳු

මහරහතන් වහන්සේගේ කාලයෙත් ඔහොමමයි. මේ කාලයෙත් ඔහොමයි. අනාගතයෙත් ඔහොමයි. ඕක අපිට නිවැරදි කරන්න බැහැ. එතකොට නිවැරදි කරන්න බැහැ කියන්නෙ මොකද? මේ ලෝකයේ බුදුරජාණන් වහන්සේ පනවන්නේ සංස්කාරයන් මත. භික්ෂුවක් හැටියට මට කවුරුන් හෝ චෝදනා කරනවා නම් ඒ මගේ සංස්කාරයක්මයි. මං ජීවිතේ කවදා හරි කාට හරි චෝදනා කරලා තියෙනවා. වෙන දෙයක් නැහැ. ඔච්චරයි වෙන්නෙ. ඒ නිසා අප්‍රමාණ අපි සංසාරේ කළා වූ අකුසල් තියෙනවා. මේ ජීවිතයේ ගිහියෙක් හැටියට අපි අතින් සිදු වූනා වූ අප්‍රමාණ අකුසල් තියෙනවා. ඒ නිසා අනිවාර්යෙන්ම ඒවා විපාකයට එන්න ඕනෙ. ඒවා විපාකයට එන්නේ නැත්නම් කවදාවත් ධර්මය ඇත්තක් වෙන්නේ නැහැ. ඒ නිසා අදින් පස්සේ අදට වඩා හෙට මට චෝදනා ඒවි. ඒ මගේ අතීත අකුසල් තියෙන නිසා. මගේ අකුසලයක් ක්‍රියාත්මක වෙනකොට මම තව කෙනෙකුට දොස් කියලා වැඩක් නැහැ. එතකොට ඒ මගේ අකුසලයක් ක්‍රියාත්මක වෙද්දී තව කෙනෙක් අනාගත විපාකය උදෙසා අකුසලයක් රැස් කර ගන්නවා. මොකද ලෝකය පවතින්න ඕනෙ.

ලෝකය පවතින්න නම් මේ ක්‍රමය ඉස්සරහට යන්න ඕනෙ. මේ ක්‍රමය නවතින්නෙ නැහැ. ඒක තමයි හිත කියන්නෙ මාරයා. මාරයා මේ ලෝකෙ පැවැත්ම සඳහා සිතුවිලි සකස් කරලා ඉවරයි. ඒක තමයි ධර්මය කියලා දකින්නෙ. ඕක දැක්ක නිසයි අපි සමාජයෙන් පැනලා මෙතෙන්ට ආවෙ. ඔහොම නොවෙනවනම් අපි සමාජයේම කොටස්කරුවන් වෙලා සමාජය තුළ ඉන්නවා. ඉතිං ඕක දැකලයි මෙතනින් නිදහස් වෙන්න ඕනෙ කියන තැනට ආවේ. මම සංස්කාරයක් අත් විඳිනකොට තවත් කෙනෙක් අනාගත විපාකයන් සඳහා සංස්කාරයක් සකස් කර ගන්නවා. ඇයි ලෝකය පවතින්න ඕනනෙ. ලෝකය අයිති දුකට. ලෝකයා අයිති මාරයාට. මාරයා කියන්නේ හිත. හිත නැමැති මාරයා කෙනෙක් විපාකයන් විඳින කොට තව කෙනෙක් විපාකයක් කරා ළං වෙනවා. ඉතිං ඔතන කිසිම පුදුමයක් වෙන්න දෙයක් නැහැ. කවුරු හරි චෝදනා කරනකොට හිනාවෙන්නයි තියෙන්නෙ. වෙන මොනවා කරන්නද? මම කරපු දෙයක් මට විපාක දෙනවා කියලා මම හඳුනා ගත්තා. හඳුනාගත්තට පසු හිනා වෙන්නයි තියෙන්නෙ. ගැටෙන්න යනවා කියන්නේ එයා ඒක හඳුනාගෙන නැහැ.

<u>අතුරු ප්‍රශ්නයක්</u>

***29 (i). ස්වාමීන් වහන්ස, එවැනි පුද්ගලයින් නිසා, ඒ උතුම් ස්වාමීන් වහන්සේ දේශනා කරන ලද ධර්මය පිළිබඳව බුද්ධිමත් පිරිස් අධ්‍යයනයක් කරගෙන යන අවස්ථාවල දී ඒ අහිංසක පින්වතුන් නොමඟ යාමක් වෙන්නේ නැද්ද?***

**පිළිතුර**

ඉතින් ඒක තමයි ලෝකයේ හැටි. ලෝකය කවදාකවත් යහපත් ආකාරයට ගොඩනැගෙන්නේ නැහැ. දැන් බුදුරජාණන් වහන්සේ පහළ වෙන කොට දෘෂ්ටීන් 62 ක් දඹදිව තිබුණා. බුදුරජාණන් වහන්සේ කොයි සා අමාරුවෙන් ද මේ ධර්මය මේ ආකාරයෙන් ස්ථාපිත කළේ, ඉන්දියාවෙ. ඉතින් ඒ වෙන්න තියෙන දේ වෙන්නෙ මහත්තයො. මොකද අදට වඩා යහපත් ලෝකයක් අනාගතයේ දී බිහිවෙන්නෙ නැහැ. අදට වඩා සිල්වත් සමාජයක් හෙට කවදාකවත් නැහැ. අදට වඩා දුර්වල ලෝකයක් තමයි හෙට පවතින්නෙ. ඒ නිසා ඒ දුර්වලභාවයට අදාළ සංස්කාරයන් වැඩිවීමක් ලෝකය තුළ සිද්ධ වෙනවා. මහත්මයා හෙට දවසේ සෝවාන් ඵලයට පත් වුණොත් මහත්තයෝ, මහත්මයා විවේචනය කරන්න මාරයා මේ ලෝකෙ දහසක් දෙනා ඇති කරනවා. ඇති කරන්නේ කොහොමද හිත කියන්නේ මාරයා කියන ධර්මතාවය යටතේ. ඒ මාරයාගේ සිරිත. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. අපි ඒ ස්වභාවයන් අවබෝධ කර ගන්න ඕන.

මේ මොහොත මහත්තයෝ ශ්‍රේෂ්ඨම මොහොතක්. සම්මා සම්බුදු ශාසනයේ අවසාන දීප්තිමත්ම කාලයයි අපි මේ ගත කරන්නේ. මීට වඩා දීප්තිමත් කාලයක් එයි කියලා මට නම් හිතෙන්නෙ නැහැ. මේක තමයි මේ සම්මා සම්බුද්ධ ශාසනයේ අවසාන මාර්ග ඵල ලාභීන් ලෝකයට බිහිවන කාලය. ඒ නිසා මේ කාලය තුළ ඔබටත් මටත් මේ ධර්මය තුළ ඉඳලා, සද්ධර්මයේ අර්ථයන් ජීවිතයට ගන්න තියන කාලයයි මේ උදාවෙලා තියෙන්නෙ. ඒ නිසා මේ වෙලාවේ මහත්තයෝ මාරයා දැඩි ආකාරයෙන් කිපිලයි ඉන්නෙ. ඒ නිසා මාරයා කොයි ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවද කියල අපට හිතාගන්නවත් බැහැ. මොකද එයා උත්සාහ කරන්නේ මේ දීප්තිමත් මොහොතේ එක් කෙනෙක් හෝ මේ ධර්මාවබෝධයෙන් මගහැරෙන තැනට පත් කරන්න. ඒ නිසා අප්‍රමාණ විවේචන, අප්‍රමාණ චෝදනාවන් , අප්‍රමාණ විකෘති ධර්මයන් මේ ලෝකය තුළ, මේ මොහොතේ බිහි වෙනවා. අනාගතයේ දීත් බිහි වෙනවා. මොකද මේ දීප්තිමත් අවස්ථාවේ දී ලෝකයාට ඒ තත්ත්වය අහිමි කරන්න.

ඒනිසා ලෝකය කියන කාරණය ලෝකයේ ස්වභාවයන් අමතක කරල මේ ස්වභාවයන් කමටහන් කරගෙන මහත්තයෝ මේ මොහොතේ ගන්න තියෙන ඵලය ගන්නයි අපි දක්ෂ වෙන්න ඕනෑ. ඒ තැනට තමයි අපි යන්න ඕනෑ. එහෙම නැත්නම් මේක කරන්න බැහැ. ඒක තමයි මහත්තයා සෝවාන් වුනොත් මහත්තයාව විවේචනය කරන්න මාරයා

දාහක් දෙනා නිර්මාණය කරාවි . හිත කියන්නේ මාරයා කියලා බුදුරජාණන් වහන්සේ ඒකයි දේශනා කළේ.

<u>ප්‍රශ්නය</u>

*30.* ***ගෞරවනීය ස්වාමීන් වහන්ස දැන් අපි කැළය ඇතුළෙ තියෙන කුටියකත් ඉන්නවා. ඊළඟට මේ වගේ ග්‍රාමවාසී ආරණ්‍යවල, නගර ආශ්‍රිත කුටිවල නිතර නිතර ඉන්නවා. ඒ අතරෙ පයින් ගමන් කරනවා. වාහනවල ගමන් කරනවා. විවිධ පුද්ගලයන් ඇසුරු කරනවා. මේ සෑම අවස්ථාවකම ඇසින් දකින රූප, කනට ඇසෙන ශබ්ද, නාසයට දැනෙන ගඳ සුවඳ ආදී මේ ඉන්ද්‍රියන් පහට ගෝචර වෙන දේ එකිනෙකට එකක් පරස්පරයි. එතකොට අපි ධර්මය දියුණු කරන්න යන මාර්ගයට උපකාරයක් වෙන විදිහට අපිට එදිනෙදා ඇස ගැටෙන දේ කමටහනක් විදිහට අපි පත්කර ගන්නේ කොහොමද? ස්වාමීන් වහන්සේගේ අත්දැකීමක් මඟින් අපිට පහදන්න.*** (ස්වාමීන් වහන්සේ නමකගේ ප්‍රශ්නයක්)

<u>පිළිතුර</u>

ස්වාමීන් වහන්ස, මම කවදාකවත් ලෝකයේ දේවල් මගේ කරගන්න ගියේ නැහැ. ලෝකයට ලෝකයේ ස්වභාවයෙන් තියෙන්න ඇරියා. මොකද මමත් ලෝකයෙන් මිදෙන්න නේ ගියේ. ඒ නිසා ලෝකය මගේ කර ගන්න අවශ්‍ය නැහැ. අපි මෙතනට ආවත් මෙතන තියෙන දේ මගේ කරගත යුතු නැහැ. මගේ කාර්යය කරගෙන මම හිමිහිට යනවා. මට රැඳෙන්න බැරිනම් මම මෙතනින් යනවා. ඉතින් මෙතන ඉන්නවා නම් මගේ කාර්යය කරගෙන මෙතන ස්වභාවය මෙතනට පවතින්න දීල ඉන්නවා. මගේ ස්වභාවයත් මට අයිති නැති කොට මට මෙතන තියෙන ස්වභාවයන් වෙනස් කරන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා ලෝකය ලෝකයේ ස්වභාවයෙන් තියෙද්දෙන්. මනුෂ්‍යයා මනුෂ්‍යයාගේ ස්වභාවයෙන් සිටියදෙන්. පරිසරය පරිසරයේ ස්වභාවයෙන් තියෙද්දෙන්. තමන් මේ දෙය අවබෝධ කරගන්නා ස්වභාවයෙන් ඉන්න ඕනෙ.

ස්වාමීන් වහන්ස, අවබෝධ කරගන්නවා නම් මොකක්ද තියෙන්නෙ. මේ හැම ස්වභාවයක්ම අනිත්‍යයි කියන කාරණයයි අපි අවබෝධ කරගන්න ඕනෙ. මේ හැමදේම අනිත්‍යයි කියන කාරණය නම් වෙනස්වීම කියන කාරණයට අපි පුරුදු වෙන්න වෙනව. ස්වාමීන් වහන්ස, වෙනස්වීම කියන කාරණය අපි දකින්න දක්ෂ වෙන්න වෙනවා. මොකද

අපි හිතන දේ නෙමෙයි අපිට ඊළඟ මොහොතේ සිදුවන්නේ. මොකද මේ දේවල් අනිත්‍යයි කියන කාරණය තුළ ඉඳගෙන. ඒ නිසා ස්වාමීන් වහන්ස එතන ස්වභාවය එතන ස්වභාවයෙන් තියෙද්දෙන්. අපි අපේ ස්වභාවයෙන් හිටියම ප්‍රශ්නය ඉවර වෙනවා. මේ වගේ දේවල් අපට ඕනෑ තරම් වෙලා තියෙනවා.

මම දවසක් එක්තරා ආරණ්‍යයක ඉන්න කොට එතන පුංචි සාමණේර හාමුදුරුවරු දහ නමක් විතර ඉන්නවා. හවස වන්දනාවට ගියා. හවස 6.30 ට තමයි වන්දනාව තියෙන්නෙ. දැන් ඒ සාමණේර හාමුදුරුවරු ටිකක් දඟකාරයි. මම වැඩිවියට පත්වෙලානෙ මහණ වෙලා ඉන්නෙ. ඒ ගොල්ලො ආසයි වැඩිවියට පත් වූ අයට, මොකක් හරි කියලා සතුටු වෙන්න. ඉතිං අපි දැන් වන්දනාව කරලා ඉවර වෙලා පැය භාගයක භාවනාවක් තියෙනවා. මම පැය භාගය භාවනා කරන කොට මට තේරෙනවා එතන ඒ ශාලාවේ මදුරුවො ඉන්නවා. ඒ නිසා මදුරු කොයිල් දෙක තුනක් පත්තු කරනවා භාවනාව කරන්න බැරි නිසා. නමුත් මම භාවනා කර කර ඉන්න කොට මට තේරෙනවා මේ මදුරු කොයිල් දුමක් මගෙ මේ නහය කඩාගෙන යනවා. ඒ කියන්නේ කෙනෙක් මගේ මේ නහයට මදුරු කොයිල් දුම අල්ලනවා. මේ මගේ නහය කඩාගෙන යනවා දැන්. මේ මට ඉන්න බැහැ. හචින් යන්න එනවා. ඒත් මගේ ඒ භාවනා ඉරියව්ව වෙනස් වුණේ නැහැ. නමුත් ඒක කරපු හාමුදුරුවො තවමත් දන්නෙ නැහැ මම ඒක දන්නවා කියලා. ආයෙමත් එක දවසක් තව තැනක සාමණේර ස්වාමීන් වහන්සේ කෙනෙක් භාවනා කරන කොට ඒ කට්ටිය හිනස්සන්න පිටිපස්සෙන් ඇඟිලි තියලා අර අපි අං එනවා කියලා කියන්නෙ. මට තේරෙනවා ඒ වගේ පිටිපස්සෙන් කෙනෙක් ඉඳගෙන මොනවහරි කරනවා. නමුත් ඒ ගොල්ලො තාම දන්නෙ නැහැ මම ඒක දන්නවා කියලා.

මොකද අනුන්ගේ දේවල් මම මගේ කරගන්න ගියෙ නැහැ. මගේ කරගන්න ගියා නම් මට එදායින් පස්සෙ ඒ ආරාමෙ ඉන්නත් බෑ. ඒ නිසා ආරණ්‍යය ආරණ්‍යයේ ස්වභාවයෙන් තියෙද්දෙන්. දවසක් මම ඒ ආරණ්‍යයේ ඉන්න කොට වැඩිහිටි ස්වාමීන් වහන්සේ කෙනෙක් මාව පරීක්ෂා කරන්න, ඒ ආරණ්‍යයේ 11.30 වෙන කොට තමයි දානෙ බෙදන්නේ. නමුත් එදා 11.00 වෙනකොට ඔක්කෝම දානය පාත්තර වලට බෙදල ඉවරයි. මම යනකොට අතන භාජනවල තියෙනවා වම්බටු ටිකකුයි, බත් දංකුඩ ටිකකුයි. මම ගිහිල්ල එතන තිබුණ බත් දංකුඩ ටිකයි වම්බටු ටිකයි බෙදාගෙන දාන ශාලාවේ දොරෙන් එළියට එනකොට ඒ වැඩේ කරපු ස්වාමීන් වහන්සේ එතන ඉන්නවා. එයා කිව්වා අනේ ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට

අද දානෙ නැහැ නේද කියලා. මම කිව්වා මම වළඳලා තියෙන දානත් එක්ක බලනකොට මේක රාජ බෝජනයක් කියලා. මම එතනදිවත් එයාට සතුටු වෙන්න දුන්නේ නැහැ.

බුද්ධිමත් ස්වාමීන් වහන්ස, අපි ලෝකයේ දේවල් අපේ කරගන්න ඕනෙ නැහැ. මොකද සංසාරෙ අපිත් කවදාහරි එහෙම කරපු නිසයි මට එදා දානය වැරදුනේ. මමත් සංසාරේ කවදා හරි ස්වාමීන් වහන්සේ කෙනෙකුගේ දානය වරද්දන්න ඇති. මමත් කවදා හරි සංසාරේ භාවනා කරපු හාමුදුරු කෙනෙකුට මදුරු කොයිල් දුමක් අල්ලන්න ඇති. එහෙමනම් මම කරපු දේ තමයි මට ලැබුනේ. මම කරපු දේ මට ලැබෙන කොට ඒවට ගැටිල වැඩක් නෑ. එහෙම වුනොත් අකුසලය උදෙසා මම තව අකුසල් රැස්කර ගන්නවා. කොයිම වෙලාවකවත් ලෝකයේ දේ අපිට ගන්න බෑ. මොකද මේ ලෝකය අත් හරින්නයි අපි යන්නෙ. ලෝකය අත්හරින්න යන ගමනෙදි අපි ලෝකයේ දේවල් ගන්න ගියොත් ස්වාමීන් වහන්ස අපි ලෝකය අල්ලා ගැනීමක් තුළයි ඉන්නෙ. එහෙම නම් මෙතනදී අපි දක්ෂ වෙන්න ඕන.

ලෝකය ලෝකයේ ස්වභාවයෙන් තියෙද්දෙන්. අපට ලෝකය නිවැරදි කරන්න බෑ. බුදුරජාණන් වහන්සේට ලෝකය නිවැරදි කරන්න බැරි වුනානම් අපට කවදාවත් ඒක කරන්න බැහැ. වැරදි කරන ලෝකය තුළ අපි නිවැරදි වෙලා මෙතැනින් යන්නයි අපට තියෙන්නෙ. ස්වාමීන් වහන්ස, මගේ ජීවිතයේ මම වැඩියෙන්ම පින් දෙන්නෙ මට වැරදි කරපු අයටමයි. මට ආදරය කරපු නැති අයටමයි. මොකද මට ලෝකය ආදරය කළා නම් මම අද මෙතන නෑ. ස්වාමීන් වහන්ස, ලෝකයා ආදරය නොකරපු නිසාමයි මම මෙතැන ඉන්නෙ. එහෙමනම් ලෝකයා මට ආදරය නොකළේ ස්වාමීන් වහන්ස, මගේ වැරැද්දක් නිසා නෙමෙයි. ඒ හේතුඵල ධර්මයක් මයි. මට මෙතනට එන්න අවස්ථාව ලබල දෙන්නයි මට ලෝකයා ආදරය කරලා නැත්තේ. ලෝකයා මට වෛර කළා නම් වෛර කළේ. එහෙනම් වෙච්ච දේ හොඳටයි වෙලා තියෙන්නේ. ස්වාමීන් වහන්ස, අපේ ජීවිතයේ කොයි දේ වුනත් හෙට අපි පාරකට යනකොට වැරැද්දක් වෙන්න පුළුවන් කෙනෙක්ගෙන්. නමුත් ඒ වැරැද්ද හොඳටමයි වෙන්නෙ කියලා අපි දකින්න ඕනැ. ඒක තුලිනුත් අපිට යහපත් දේ මතුකර ගන්න ශක්තිය තියෙන්නෙ ඕන ස්වාමීන් වහන්ස.

## ප්‍රශ්නය

*31. ගෞරවනීය ස්වාමීන් වහන්ස අනිත්‍ය සංඥා වඩන හැටි පිළිබඳව විස්තර ටිකක් කියලා දෙන්න ස්වාමීන් වහන්ස. සාමාන්‍යයෙන් අපි අනිත්‍යභාවය කිව්වහම දූන් අපි ඉර නැගල එනව බැහැල යනව දකිනවා. නමුත් කිසිම කලකිරීමක් ඇතිවෙන්නෙ නැහැනේ. මලක් ගත්තොත් පරවෙනවා දකිනවා. නමුත් ජීවිතාවබෝධයක් ඇති වෙනවද? මේ ගැඹුරට වඩා ගැඹුරු අනිත්‍යතාවයක් දූකිය යුතු නිසානෙ. ඒ කියන අනිත්‍යතාවය කොහොමද උපදවා ගන්නේ? දියුණු කරන්නේ?* (ස්වාමීන් වහන්සේ නමකගේ ප්‍රශ්නයක්)

## පිළිතුර

ස්වාමීන් වහන්ස, මම මතුකර ගත්තේ රූපයේ අනිත්‍යභාවය දකිමින් මයි. මොකද මට ගිහි ජීවිතයක් තිබුණා. මම ගිහි ජීවිතයේ බලාපොරොත්තු වෙච්ච ගොඩක් දේවල් තිබ්බා. මං ප්‍රාර්ථනා කරපු දේවල්. මම මෙහෙම වෙන්න ඕනෑ කියලා හිතපු අවස්ථාවල් ඕන තරම් තිබ්බ, ස්වාමීන් වහන්ස. එතකොට මං පැවිදි භාවයට පත්වෙලා, ස්වාමීන් වහන්ස මං හැම වෙලාවෙම ඒ රූපයන් මතු කරල ගත්තා. මම දේශපාලඥයෙක් වෙන්න කැමති වුනා නම් ස්වාමීන් වහන්ස, මම එක්තරා රාත්‍රියක දී සියලු දේවල් මතුකර කර මතුකර කර විදර්ශනා නුවණින් ගත්තා. දේශපාලඥයා කියන චරිතය ගත්තා. ඒ දේශපාලඥයො දේශපාලනය කරල බලයෙන් පිරිහිලා අවසානයේ ලෙඩ ඇඳේ වැටිල අංශභාගය හැදිල රෝද පුටුවෙන් යනව නුවණින්, මනසින් මෙනෙහි කරකර බැලුව, ස්වාමීන් වහන්ස. දේශපාලඥයො අවසානයේ බෝම්බ වලට අහුවෙලා කුඩුවෙලා විසිරිලා, සවල් වලින් මේ කෑලි එකතු කරනවා මනසින් දූක්කා ස්වාමීන් වහන්ස. දේශපාලනය කරල අවසානෙදි පරාදවෙලා අඬනවා, කඳුළු සලනවා, ලෙඩ වෙනවා, මැරෙනවා, අපි මනසින් බැලුව ස්වාමීන් වහන්ස. එහෙම බලමින් බලමින් දේශපාලඥයා කියන රූපය කෙරෙහි තියෙන තෘෂ්ණාව නැතිකර ගත්තා.

එතනින් නැවතුනේ නෑ. ලෝකයටත් ගියා ස්වාමීන් වහන්ස. එක්තරා රාත්‍රියක දී ඇමරිකාවෙ හිටපු ජනාධිපති කෙනෙක් අවසානයේ මානසික රෝගියෙක් හැටියට මිය පරලොව යනව මනසින් දූක්ක ස්වාමීන් වහන්ස. රජීව් ගාන්ධි කියන මහත්මයා බෝම්බයක් පිපිරිලා කෑලි කෑලි වලට විසිරිලා යන හැටි මනසින් දූක්ක. ඉන්දිරා ගාන්ධි කියන කෙනා වෙඩි කාල ලේ විලක් මැද වැටිල ඉන්නව මනසින් දූක්ක. ඊට පස්සේ ව්‍යාපාර ක්ෂේත්‍රය කියන දේ නුවණින් ගත්තා. ඒ ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ කෝටිපති ප්‍රකෝටිපති ව්‍යාපාරිකයන්

විඳින සම්පත් විඳින සැපයන් මනසින් දැක්කා. ඒ ව්‍යාපාර බංකොලොත් වෙලා ඒ ගොල්ලො දුකට පත්වෙලා අඬනවා මනසින් දැක්ක. ඒ ව්‍යාපාර උපාදානය කරගෙන මැරිල සතර අපායේ දුක් විඳිනව මනසින් දැක්ක ස්වාමීන් වහන්ස. මේ විදිහට මේ හැම රූපයක්ම මතුකර ගනිමින් මතුකර ගනිමින් විදර්ශනා නුවණ සකස් කර ගත්ත ස්වාමීන් වහන්ස.

පන්සල් වල නායක ස්වාමීන් වහන්සේලා මහානායක ස්වාමීන් වහන්සේලා ඒ ඒ දේවල් උපාදානය කරගෙන ඉන්නවා මනසින් දැක්ක. ඒ උපාදානයන් නිසා ඒ ගොල්ලන් පත් වෙන්නා වූ අපහසුතාවයන් පත්වෙන්නා වූ ප්‍රශ්න පිළිබඳව නුවණින් මෙනෙහි කර ගත්ත. මෙනෙහි කරමින් මනුස්ස ලෝකය තුළ තියෙන්නා වූ සියලුම උපාදානයන් කෙරෙහි තියෙන කැමැත්ත පිළිබඳව තියෙන උපාදානය අඩුකර ගත්ත ස්වාමීන් වහන්ස. නැවත නැවත නැවත නැවත නුවණින් මෙනෙහි කර කර බැලුව, තවත් මේ මනුෂ්‍ය ලෝකය කෙරෙහි තෘෂ්ණාවක් තියෙනවද කියලා. මොකද ඉඳිකටු තුඩක තරම් තෘෂ්ණාවක් යම් තැනක තිබ්බ නම් ඒ ඉඳිකටු තුඩක ප්‍රමාණය ප්‍රමාණවත් විඤ්ඤාණය එතන බැස ගන්න. ඒ නිසා ඉඳිකටු තුඩක වත් තෘෂ්ණාවක් තියෙනවද කියල නුවණින් මෙනෙහි කළා ස්වාමීන් වහන්ස. මේ ලෝකයේ රජකම ගත්තත් ඒ රජ්ජුරුවොත් ජාති, ජරා, ව්‍යාධි මරණවලට ලක්වෙලා බියෙන් ජීවත් වන හැටි මනසින් දැක්ක. ජාත්‍යන්තරයටත් ගිහිල්ල මේ අවසාන මනුස්ස ලෝකය තුළ ඉඳිකටු තුඩක තරම් වත් තෘෂ්ණාවක් නෑ කියන තැනට එනකම් ම නුවණින් මෙනෙහි කර කර නුවණින් මෙනෙහි කර කර ගත්ත ස්වාමීන් වහන්ස.

තමායි දන්නේ තමා තුළ මොන ආකාරයේ කෙලෙස් තිබ්බද කියලා. තමායි දන්නේ තමා තුළ මොන ආකාරයේ බලාපොරොත්තු තිබ්බද කියලා. මේ හැම දෙයක්ම නුවණින් මෙනෙහි කර කර මෙනෙහි කර කර මනුස්ස ලෝකය තුළ ඉඳිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් නැහැයි කියලා එයා සැක හැරලා දැනගත්තකම් ස්වාමීන් වහන්ස මේ විදර්ශනාවන් වැඩුව. වැඩුනට පස්සේ එයා නිශ්චිතව දැනගත්ත දැන් මනුෂ්‍ය ලෝකය කෙරෙහි තෘෂ්ණාවක් නැහැයි කියන කාරණය, ස්වාමීන් වහන්ස. මේ මුලු රැයක් පුරාවට මේක වඩන්නේ. ඒ මනුස්ස ලෝකය කෙරෙහි තෘෂ්ණාවක් නැති වෙනකොට එයාට මනුස්ස ලෝකය කෙරෙහි තියෙන තෘෂ්ණාව අත හැරෙනවා.

ඊට පස්සේ එයා දිව්‍ය තල පීර පීරා මනසින් බලනවා ස්වාමීන් වහන්ස. දිව්‍ය තලවල කොතැනකවත් හෝ නිත්‍ය වූ ස්ථිර වූ සැපයක් තියෙනවද කියලා. එයා දකිනවා, ශක්‍රයා

කියන රූපය, සතර වරම් දෙවියන් කියන රූපය, සුජම්පතී කියන රූපය මේ හැම දෙයක්ම නුවණින් මෙනෙහි කර කර දකිනවා. එයා දකිනවා, බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා, දෙවියනුත් දිව්‍ය ලෝක වලින් චුත වෙන කොට මල් පරවෙනවා, දහඩිය දමනවා, අඬා වැටෙනවා, අප්‍රමාණ දුකට පත් වෙනවා කියලා. එයා දෙවියනුත් අප්‍රමාණ දුකට පත් වෙලා අඬා වැටිලා, සතර අපායන්ට පත් වෙනවා දකිනවා. දකිමින් දිව්‍ය ලෝකයේ කල්ප ගානක් දිව්‍ය සැප වින්දත්, කවදාහරි ඒ අය සතර අපායට වැටෙනවා කියන කාරණය නුවණින් දකිනවා. දකිමින් නැවත නැවත නුවණින් මෙනෙහි කරමින්, මෙනෙහි කරමින්, දිව්‍ය තල කෙරෙහි එයාට ඉදිකටු තුඩක තරම්වත් උපාදානයක්, කැමැත්තක්, තෘෂ්ණාවක් තියෙනවද කියලා බලනවා. එයා දකිනවා. ශක්‍රයා කියන තැන හිත පිහිටුවන්න පුළුවන් කියලා. එයා ශක්‍රයා කියන රූපය නුවණින් අරගෙන නුවණින් විදර්ශනාවට ලක් කරමින්, ශක්‍රයාත් සතර අපායෙන් මිදිලා නැත්නම්, ශක්‍රයාත් නැවත සතර අපායට වැටෙන්න පුළුවන් කියන කාරණය නුවණින් දකිනවා.

ස්වාමීන් වහන්ස, මගේ අත්දැකීමයි මම මේ කියන්නෙ. මෙහෙම දකිමින් දකිමින් එයා අවසානයේ දී බලනවා දිව්‍ය තලය කෙරෙහි එයාගෙ තෘෂ්ණාවක් තියෙනවද නැද්ද, ඉදිකටුවක තුඩක තරම්වත් තෘෂ්ණාවක් තියෙනවද කියන එක. එයා සැක හැර දැන ගන්නවා දැන් දිව්‍ය තල කෙරෙහි තෘෂ්ණාවක් අතහැරුණා කියන එක.

ඊළඟට එයා බලනවා රූපාවචර, අරූපාවචර බ්‍රහ්ම තල පීර පීරා මනසින් බලනවා, මේවා තුළ නිත්‍ය වූ ස්ථිර වූ සැපයක් තියෙනවද කියලා. බ්‍රහ්ම තලවල කවදාවත් බ්‍රහ්මයො දෙන්නෙක් එකට ඉන්නෙ නැහැ. දිව්‍ය තල වල වගේ කණ්ඩායම් වශයෙන් බ්‍රහ්මයො කවදාවත් එකට ඉන්නෙ නෑ. බ්‍රහ්මයා හැමතැනම ඉන්නෙ එකලාව තනියම නැත්නම් එරමිණියා ගොතාගෙන නැත්නම් සක්මන් කරමින්. මොකද ඒ ගොල්ලො තුළ පංච නීවරණ නැහැ. පංච නීවරණ යටපත් වෙලා නිසා දෙන්නෙක් කථා කර කර ඉන්න තැනක් බ්‍රහ්ම ලෝක වල කොතැනකවත් නැහැ. එයා බ්‍රහ්ම තල පීර පීර මනසින් රූපාවචර අරූපාවචර බ්‍රහ්මතල දකිනවා. දකිමින් එයා අවසානයේ දකිනවා මේ රූපාවචර අරූපාවචර දිව්‍ය බ්‍රහ්ම තලවල ඉන්න බ්‍රහ්මයෝත්. මේ බ්‍රහ්ම තල වලින් චුත වෙලා නැවත සතර අපායන්ට වැටෙනවා කියලා එයා සතර අපායන් වලට වැටෙන බ්‍රහ්මයන් නුවණින්, මනසින් දකිනවා. දකිමින් බ්‍රහ්ම තල වලට තියෙන තෘෂ්ණාව එයා අඩුකර ගන්නවා. එයා බලනවා ඉදිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් බ්‍රහ්ම තල කෙරෙහි තියෙනවද කියලා. එයා දකිනවා මහා

බ්‍රහ්මයා කියලා කෙනෙක් ඉන්නවා කියලා. එයා නුවණින් මෙනෙහි කර කර මහා බ්‍රහ්මයා කියන රූපය විදර්ශනාවට ලක් කරනවා. එයා දකිනවා මහා බ්‍රහ්මයාත් සතර අපායෙන් මිදිලා නැත්නම් මහාබ්‍රහ්මයත් ආයෙමත් සතර අපායට වැටෙනවා කියන කාරණය දකිමින් බ්‍රහ්ම තලය කෙරෙහි තියෙන අවසාන කැමැත්තත් විදර්ශනාවට එයා ලක් කරනවා.

එහෙමනම් අවසානෙදි මොකක් ද වෙන්නෙ. මනුෂ්‍ය ලෝකය කෙරෙහි තියෙන තෘෂ්ණාවත්, දිව්‍ය තල, බ්‍රහ්ම තල කෙරෙහි තියෙන තෘෂ්ණාවත්, හිඳුන තැන හිත පිහිටන්නේ නිවනෙයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ස්වාමීන් වහන්ස. අනිත්‍යයි කියන සංඥාව මා තුළින් මා බැලුවෙ ඔය ආකාරයටයි ස්වාමීන් වහන්ස. මගේ ජීවිතයේ තෘෂ්ණාව කියන කාරණය හීන කර ගත්තෙ රූපය ඔය ආකාරයට අරගෙනයි. මොකද මම කැමති දේ, දන්න දේ, මගේ ස්වභාවය එකක්. තව කෙනෙක්ගේ, තව ස්වාමීන් වහන්සේ කෙනෙක්ගේ කැමැත්ත තව එකක් වෙන්න පුළුවන්. එතකොට ඒ තමා තුළ තියෙන දේ, තමා ඒ මතුකර කර, මතුකර කර විදර්ශනා නුවණින් දකිමින් ඒවා සමාජයත් එක්ක, ලෝකයත් එක්ක බද්ධ කර ගනිමින් ඒවා කෙරෙහි තියෙන තෘෂ්ණාවෙන් අපි මිදෙන්න ඕනෙ.

**<u>හරස් ප්‍රශ්නයක්</u>**

***ස්වාමීන් වහන්සේ කියන්නෙ හිතට එන එන අරමුණක්ම අතහැරියා කියන අර්ථයෙන්ද?***

**<u>පිළිතුර</u>**

නැහැ. මෙතනින් මතුකර කර ගන්නවා ස්වාමීන් වහන්ස. මේකෙදි මතුකර කර, මතු කර කර ඒ රූප ගන්න ඕනෙ. මතුකරමින්, මතුකරමින්, මතුකරමින් සමහර විට මුළු රැයක් පුරා වෙන්න පුළුවන්. නින්දක් නැහැ. නින්දක් කියන කාරණය එදාට ජීවිතයට අදාළ නැහැ. අත්‍යවශ්‍ය නැහැ. මොකද එයා සංසාර බය පිළිබඳව හඳුනාගෙන සංසාරය පිළිබඳව දැඩි කලකිරීමකින් ඉන්නෙ. එයාට ඕනෙ මේකෙන් ගැලවෙන්න ඕන කියන කාරණය. ඒ කාරණය තුළ අරවගේ වඩමින්, වඩමින්, වඩමින් ස්වාමීන් වහන්ස, මනුෂ්‍ය තල, දිව්‍ය තල සහ බ්‍රහ්ම තල කියන තෘෂ්ණාවන් වලින් අපි සිඳුනා නම් සිත නැවත පිහිටන්න තැනක් නැහැ ස්වාමීන් වහන්ස.

**ප්‍රශ්නය**

*32. ස්වාමීන් වහන්ස බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී මාර්ගඵල ලබනකොට දෙවියන්ගේ උපකාර ලැබුණනෙ ,තවත් ඉදිරියට යන්න. වර්තමානයෙත් මේ විදිහට දෙවියන්ගෙ උපකාර ලැබෙනවද?* (ස්වාමීන් වහන්සේලා සමග පැවැත් වූ ධර්ම සාකච්ඡාවක දී මතු වූ ප්‍රශ්නයකි)

**පිළිතුර**

මේ ධර්ම මාර්ගය තුළ ගමන් කරද්දී දෙවියන්ගෙ උපකාර ලැබෙනවා. දෙවියන්ගෙ උපකාරය කියන්නෙ මම අදත් බුදුන් වඳිද්දී දෙවියන්ට පිං දෙනවා. මම හැමදාම කොයි කුටියක හිටියත් පැය කාලයක් හරි බුද්ධ වන්දනාවක් කරනවා. කවදාවත් බුද්ධ වන්දනාවක් නොකරපු දවසක් මගේ ජීවිතයේ නැහැ. කොහි හිටියත් අවම වශයෙන් පැය කාලක් හරි බුද්ධ වන්දනාව කරනවා. දෙවියන්ට පින් දෙනවා. ඒක මම අත ඇරලා නැහැ. මම කාටවත් ඒක අතහරින්නෙ කියන්නෙත් නැහැ. අපි අපේ ආරක්‍ෂාව සඳහා තිබිය යුතු දේවල් අපි අපේ ආරක්ෂාව සඳහා තියා ගන්න ඕනෙ.

නමුත් ආරක්ෂාව උදෙසා නෙමෙයි මම එතනදි පින් දෙන්නෙ. දෙවියන් අපේ මේ පින්දීම නිසා ඒ අය සතුටු වෙනවා කියන කාරණය තුළ ඉඳගෙන පින් දෙන්න ඕනෙ. නමුත් අපි තාම යම් අවබෝධයකට පත් වෙලා තැන්තම් අපි පැමිණිලා නැති තැන ඉඳලා අපේ ආරක්ෂාවට තියෙන දේවල් අපි නැතිකර ගන්න ඕනෙ නැහැ. ඒක තේරුම් ගන්න ඕනෙ. දැන් එතකොට මේ වෙලාවෙ මම දෙවියන්ට පින් දෙන්නෙ මගේ ආරක්ෂාවක් උදෙසා නෙමෙයි. අනේ ඒ පිරිස මේ පිනෙන් සතුටු වෙනවා කියන කාරණය තුළ ඉඳගෙන පමණයි. නමුත් අපි අවබෝධයක් ලබලා නැත්නම් අපි කවදාවත් අපේ ආරක්ෂාවට තියෙන දේ හැමදෙයක්ම අත්හරින්න අප කැමති වෙන්න ඕනෙ නැහැ. මොකද ඒවා අපේ ආරක්ෂාව උදෙසා තියෙන්න ඕනෙ.

මම එක්තරා කුටියක ඉන්න කොට, දැන් අවුරුදු 4 කට ඉස්සෙල්ලා ඒ මේ හසලක පැත්තෙ තිබුණු කුටියක් නමුත් ඒකෙ ස්වාමීන් වහන්සේ කෙනෙක් හිටියෙත් නැහැ. ඒ ගමත් බොහොම දුප්පත් ගමක්. ඒ ගොල්ලන්ට එච්චර පිණ්ඩපාතයක් ගැන වැඩසටහනක් තිබ්බෙ නැහැ. නමුත් එළවළු දෙකක් තුනක් එක්ක බත් තමයි හැමදාම ලැබුණේ. සීනි පැණි රස ලැබුණේ නැහැ. නමුත් මගේ සාමාන්‍ය ස්වභාවයක් තිබුණා මට සීනි අඩුවෙනවා. සීනි

අඩුවීමේ ස්වභාවයක්. අර පැණි රසත් නැති නිසා මොකවත් ගිලන්පසත් නැති නිසා මගේ සීනි ප්‍රමාණය අඩුවුණා. අඩුවෙලා දැන් කොහොම හරි එදා රෑ හය හමාරට වගේ රෑක දැන් මට දැඩි කලන්තයක් ආවා. දැන් කලන්තෙ එනකොට මම දන්නවා ශරීරයේ සීනි අඩුවෙලා කියලා. මම දන්නවනෙ මම සීනි ගත්තෙ නැහැ කියලා මේ ටිකේම. මට තේරෙනවා මේ සීනි ප්‍රමාණය අඩු වෙලා තමයි කියලා. එතකොට අර පරණ සීනි බෝතලය තිබ්බා. ඒකෙ තිබුණා ඇලිච්ච සීනි වගයක්. දැන් මට හොඳටම අපහසුයි. ඉන්න බැහැ. මම අර ඇලිච්ච සීනි බෝතලයට වතුර ටිකක් දාලා කලවම් කරලා ඒක පානය කළා. පානය කළා කියලා ඒක දැනුනෙවත් නැහැ. දැන් මට අටට විතර වෙනකොට ඉන්න බැහැ අමාරුයි. මට ඔයිට ඉස්සෙල්ලත් ඕක හැදිලා තියෙනවා. මට ඉන්න බැහැ, ඒ වෙලාවට මට කලන්තය වගේ එනවා. ඊට පස්සේ මම දෙවෙනි වතාවටත් සීනි බෝතලේ හෝදලා වැළඳුවා. ඒත් දැනුනෙ නැහැ. චුට්ටක් පැණි රහ තිබ්බා. මට ඊට පස්සෙ කරන්න දෙයක් නැහැ. ස්වාමීන් වහන්ස, මට එස්.ආර් දත් බෙහෙත් ටියුබ් එක තිබුණා. මේක පැණි රසයි කියන කාරණය තුළ මේක චුට්ටක් කෑවා. බඩ දැවිල්ල ගන්න ගත්තා. ඊට පස්සෙ රෑ 10 විතර මට දැන් හොඳටම තේරෙනවා මම හෙට උදේ වෙනාකොට මැරිල ඉඳියි කියලා.

මම අවංකවම දොරේ (දොර තියෙන කුටියක් ඒක) තියෙන ලොක් එක පැන්නුවා. ඒ කියන්නෙ උදේට මම මැරිලා හිටියොත් දායක වැසියො හොයන්න ආවොත් දොර කඩයි කියලා හිතලා. මම අවංකවම හිතුවේ උදේට මැරෙයි කියලා. මොකද ඒ සා අසාධ්‍ය තත්ත්වයෙන් මම හිටියේ. නමුත් ඒ වෙලාවෙ භික්ෂුවකට කරන්න දෙයක් නැහැ. භික්ෂුවකට කරන්න තියෙන්නෙ එකම දෙයයි. මම ඇඳේ හාන්සි වෙලා මේ වේදනාව මගේ නෙවෙයි. මේ රූපයත් මගේ නෙවෙයි කියලා මම එක පාරට අත හැරියා. ඒ කියන්නෙ නාම ධර්මයන් මගේ නෙවෙයි කියලා මම අතහැරියා. අතහැරිච්ච තැන මගේ තිබිච්ච මේ වේදනාවන් සියලු දේ මට නොදැනී ගියා. අතහැරීම තුළයි නොදැනී ගියේ. එහෙම්මම මට නින්ද ගියා. ඒක සමාධිමත් නින්දක්. ඒ සමාධිමත් නින්දෙදි එකපාරටම මම සමාධියෙන් අත මෙහෙම දික් කෙරුවා. මම ඕනෑකමින් අත දික් කළා නෙවෙයි. මෙහම දික් කරනකොට මගේ අතට රත්තරන් පාට සීනි අහුරක් ලැබුණා. රත්තරං පාටයි ඒ සීනි. රත්තරන් වලටත් වඩා දිලිසෙනවා. මේ රත්තරං පාට සීනි අහුර අරගෙන මම මෙහෙම තොල ගෑවා. මේ තොල ගාලා ඒක ඉවර වුණා. එච්චරයි ඊට පස්සෙ ඒක ඉවරයි.

නමුත් උදේ පාන්දර 4 ට ඇහැරුණා. මට අර තිබුණ කිසිම අමාරුවක් නැහැ. පාන්දර 6 ට විතර කිලෝමීටර් තුනක් ගමට පිණ්ඩපාතය ගිහිල්ලා පිණ්ඩපාතයත් කරගෙන කුටියට ආවා. නමුත් කිසිම අමාරුවක් තිබ්බේ නැහැ. එතකොට රෑ මට මොකක්ද ලැබුණේ. දිව්‍ය ඕජාවයි ලැබුණේ. දෙවියන්ගේ ඕජාව. ඒකයි මාර්ගය තුළ ලබන කෙනාට දෙවියො කවදාවත් අසරණ වෙන්න දෙන්නෙ නැහැ. දෙවියන්ගේ ඕජාවයි ඒ ලැබුණේ. සීනි අහුරක් තමයි මට එතනදි ලැබුණෙ. නමුත් මම එදා ගමට ගිහිල්ලා කවුරුත් සීනි පූජා කළෙත් නැහැ. මම සීනි කටෙන් ඉල්ලුවෙත් නැහැ. මගේ ඒ තරම් සීලයක් ඒ කාලෙත් තිබ්බා. ඒ සාමණේර කාලෙත්. සීනි කටෙන් ඉල්ලුවෙ නැහැ. කවුරුත් දුන්නෙත් නැහැ. මම ඊට පස්සේ එදත් සීනි නැතිව එළවළුයි, බතුයි විතරක් අරගෙන ආවා.

නමුත් මට දවල් 12.30 වෙනකොට ආයෙමත් අමාරුව ආවා. දැන් 12.30 යි. මම හසලක ඉස්පිරිතාලෙට ගියහම මට ග්ලූකෝස් 4 ක් දුන්නා. මේක ගිහිල්ලා දෙකක් බොන්න කියලා. නමුත් මම ගමේ අයට කිව්වේ නැහැ. ගමේ අය ඇහුවෙත් නැහැ. මම තුන්වෙනි දවසේ ගමට පිණ්ඩපාතේ එනකොට ඒ ගමේ හිටිය කැපකරු ඇහුවා ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මීට දවස් තුනකට ඉස්සෙල්ලා හසලක ඉස්පිරිතාලෙ ඉඳලා තියෙනවා. ඔබ වහන්සේ ඇයි ඉස්පිරිතාලෙට ගියේ කියලා. මම කිව්වා මහත්තයො (එතකොට දැන් මගෙන් ඇහුවනේ ඒ නිසා මම කිවුව) මට සීනි ප්‍රශ්නයක් මතු වුණා. ඇඟේ සීනි අඩුයි, ඒ නිසයි මම ඉස්පිරිතාලෙට ගියෙ කියලා. ඒත් සීනි ඉල්ලුවෙ නැහැ. එයා සීනි දුන්නෙත් නැහැ.

මම එදත් කුටියට ගිහිල්ලා පහුවදා පිණ්ඩපාතෙ යන්න ඉස්සෙල්ලා ම යන්නෙ කැපකරුගෙ ගෙදෙට්ට. කැපකරු භාජන දෙකකුත් තියාගෙන පාර අයිනෙ ඉන්නවා නෝනත් එක්ක. දැන් ඇත්තටම මොනවද කැපකරු පූජා කළේ කියලා මේ ස්වාමීන් වහන්සේලා දන්නවද? මොනවද පූජා කරන්න ඇත්තේ? පූජා කළේ කරවිලයි බතුයි. ඇයි ඒ ගොල්ලන්ට සීනි ගැන දැනීමක් නැහැ. ඒ ගොල්ලන්ට දියවැඩියාව ගැන දන්නෙ නැහැ. ඒ මනුෂ්‍යයා ඒ මනුෂ්‍යයාගේ අසරණකමට කරවිලයි, බතුයි පූජා කළේ. මම ඒක පිළිඅරගෙන දැන් බැලුවා. දැන්නම් හරියන්නෙ නැහැ. මම අල්ලපු ගෙදරට ගියා. පිණ්ඩපාතෙ බෙදනකොට මම අත වැහුවා. එතකොට ඇහුවා ඇයි කියලා. මම කිව්ව පුතේ මට දානේ අවශ්‍ය නැහැ. සීනි ටිකක් අවශ්‍යයි කියලා. දවස් හතරක් යනකම් සීනි ටිකක් ගත්තෙ නැහැ. ඒක තමයි සීලය කියන්නෙ. බලන්න කොයි තරම් අත්හැරීමක් කරලා ද අපි ඉස්සරහට ආවේ කියලා. ඒ

අත්හැරීම තුළ ඇතිවෙන්නා වූ සතිය ගැන අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. විතර්ක ඔක්කොම අයින් කරලා දානවා.

මේක ස්වාමීන් වහන්ස මගේ සාමණේර කාලේ වෙච්ච දෙයක්. ඒ අත හැරීමට තමයි දෙවියො කියන කාරණයත් කම්පා වෙන්නෙ. අපි වේදනාවක් දැනෙන වෙලාවට නාම රූප දෙක අත හැරලා ඇස් දෙක පියා ගන්නවා කියන්නෙ දිව්‍ය ලෝකය කම්පා වෙනවා. ඒවා දෙවියන්ට දැනෙනවා. ඔය හිමාලයේ සමහර සෘෂිවරු ඉන්නවා එයාලා ආහාරයක් ගන්නෙ නැහැ. ඒ දිව්‍ය ඕජාවෙන් ඒ ගොල්ලො ජීවත් වෙන්නෙ. අර රත්තරං සීනි අහුර දිව්‍ය ඕජාව. එච්චර පයින් ගිහිල්ලා නැවත කුටියටත් ආවා. ඇගේ කිසිම අමාරුවක් නැහැ. ඒ කියන්නේ ඒක තමයි බුදුරජාණන් වහන්සේගේ මාර්ගය. ඒ තරම් දෙවියන් බ්‍රහ්මයින් බලාගෙන ඉන්නවා අපි ගමන් කරන ඒ මාර්ගය දිහා.

බුදුරජාණන් වහන්සේ කියනවා නේ භික්ෂුවක් පැවිදි වෙන්න යනකොට මාරයා එක්ක සටන් කරන්න යනවා කියලා, පැවිදි වුණාට පස්සෙ මාරයාත් එක්ක සටන් කරනවා කියලා දෙවියන් හිතනවා කියලා. ධර්මය අවබෝධ කර ගත්තහම මාරයා පරාජය කළාය කියා දෙවියන් හිතනවා කිවුවා. දෙවියෝ හැමවෙලාවෙම අපි ඉස්සරහා ඉන්නවා. ඒ විශ්වාසය අපිට තියෙන්න ඕනැ.

<u>ප්‍රශ්නය</u>

***33. පින්වත් ස්වාමීන් වහන්ස, මම තෙරුවන් කෙරෙහි බලවත් ශ්‍රද්ධාවක් ඇත්තෙක්මි. නමුත් සමහර ආමිස පූජා සඳහා සහභාගි වීමට මට කැමැත්තක් ඇති නොවේ. ඒ අය සිල්වත් නැති බව වැටහේ. මෙය මට අකුසලයක් වේද? මෙය මගේ ශ්‍රද්ධාවේ අඩුවක්ද? පහදා දෙන්න.***

<u>පිළිතුර</u>

මෙහෙමයි. මම හිතනවා මම ශ්‍රද්ධාවෙන් පරිපූර්ණයි. මම බුදුරජාණන් වහන්සේ උදෙසා මල් පූජා කරන්න ඕන නෑ. හඳුන්කූරු පූජා කරන්න ඕන නෑ. ගිලන්පස පූජා කරන්න ඕන නෑ කියලා හිතනවා. එක මහත්තයෙක් ඇවිල්ල කිව්ව ඒ මහත්තයාගේ යාලුවෙක් භාවනා කරන්න යනව කියලා. භාවනා කරන්න ගිහිල්ල කාලයක් භාවනා කරමින් ඉන්න කොට භාවනා ගුරුවරයා කියනවලු දැන් එයා රහත් වෙලා කියලා. එයාට උපදෙස් මාලාවකුත්

දීල තියෙනවා. ඒ උපදෙස් මාලාව තමයි ගෙදරින් බුදුරජාණන් වහන්සේගේ රූපය අයින් කරන්න ඕනැ බුදුරජාණන් වහන්සේට මල්, පහන්, ගිලන්පස ආදී මුකුත් පූජා කරන්න බැහැ. මෙයා ගෙදර ඇවිල්ල සම්පූර්ණ බුදු මැදුරම අස් කරල දරුවකුට වත් පහනක් තියන්න, පන්සලට යන්න දුන් එයා දෙන්නෙ නැහැ. නමුත් අපි හිතන්න ඕනෙ රහතන් වහන්සේ නමක් ලෝකෙ ඉන්නව නම් ඒ රහතන් වහන්සේත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උදෙසා මල් පූජා කරනවා. තෙල් පහන් ගිලන්පස පූජාවන් කරනවා. ඇයි එයා අර්හත් භාවයට පත්වුනේ මේ සම්මා සම්බුද්ධ ඥානයේ අසිරිය නිසා. උන්වහන්සේ බුදුරජාණන් වහන්සේගේ රූපකායට නෙවෙයි මේ පූජා කරන්නෙ. උතුම් වූ සම්මා සම්බුද්ධ ඥාණයට. මේ සා ඝෝර කටුක භයානක සංසාරයකින් මේ සැනසීම ලබල දුන්නේ ඔබ වහන්සේමයි කියන තැන ඉඳලා ඒ සම්මා සම්බුද්ධ ඥාණයට රහතන් වහන්සේත් ආමිස පූජාවන් කරනවා. මම නම් දකින්නෙ නෑ රහතන් වහන්සේ නමකට මලක් දුන්නොත් ''මම මල් පූජා කරන්නේ නෑ. එපා'' කියයි කියලා.

අපි අතීතයේ දකිනවා ස්වර්ණමාලී සෑ සමිඳුන් වහන්සේට පූජා පවත්වන අවස්ථාවේ දී දස දහස් ගණන් රහතන් වහන්සේලා ආව කියලා. ඒ නිසා බුදුරජාණන් වහන්සේගේ මාර්ගය තුළ ගමන් කරල එයා ඒ මාර්ගය තුළ ලබන්න තියෙන අවසාන ඵලය වන රහතන් වහන්සේ වුනත් එයාට මල් දෝතක් අරන් බුදුරජාණන් වහන්සේට වඳින්න බැහැ කියන්නෙ නැහැ. නමුත් එයා අපි වඳින ආකාරයට නෙමෙයි බුදුරජාණන් වහන්සේට වඳින්නෙ. අපි බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් දැකල සුගතිය, සංස්කාර ප්‍රාර්ථනා කරල වඳිනව වගේ නෙමෙයි. අනිත්‍යය ආදී ලෝක ධර්මයන් මට කියාදීපු මේ සම්මා සම්බුද්ධ ඥාණය උදෙසාමයි කියන කාරණය තුළ රහතන් වහන්සේගේ වන්දනාව බුදුරජාණන් වහන්සේට සිද්ධ වෙනව.

ඒ නිසා දරුවෝ ඒ කොයිම අවස්ථාවකවත් බුදුරජාණන් වහන්සේ උදෙසා මලක් පූජා කරන්න හිත දෙන්නෙ නැත්නම් ඒ හිත අයින් කර ගන්න. බුදුරජාණන් වහන්සේමයි අපි කොතැන සැපය කියන තැනට ගියත් අපට පාර කිවුවෙ. නමුත් මම එකක් කියනවා. රහතන් වහන්සේ කෙනෙකු විසින් බුදුරජාණන් වහන්සේට මල් පූජා කළ කියලා, තෙල්, පහන්, ගිලන්පස පූජා කළා කියලා වැඩක් නෑ. මොකද සංස්කාරයන් රැස්කිරීමක් නෑ. හුදු ක්‍රියාකාරකමක්ම විතරයි. නමුත් එක දෙයක් තේරුම් ගන්න ඕනෙ. රහතන් වහන්සේ කියන්නෙ පරමාදර්ශී චරිතයක්. රහතන් වහන්සේ පරමාදර්ශී චරිතයක් හැටියටයි සමාජය

තුළ ජීවත් වෙන්නෙ. රහතන් වහන්සේ මලක් පූජා කිරීම ප්‍රතික්ෂේප කළොත් ඒ ආදර්ශය ලෝකයාත් ගන්න පුළුවන්. ඒ නිසා රහතන් වහන්සේ නමක් තමන්ට මල්පූජා කිරීමෙන් ඵලයක් නෑ, තමන්ට සංස්කාරයන් රැස්වෙන්නේ නෑ, අවශ්‍ය නෑ භව නිරෝධය සාක්ෂාත් කරල තියෙන්නෙ කියලා නොසිතා රහතන් වහන්සේත් බුදුරජාණන් වහන්සේට මල් පූජා කරනවා, ලෝකයට පරමාදර්ශයක් හැටියට. ලෝකයට ප්‍රතික්ෂේප වුනොත් එයා ලෝකයට පරමාදර්ශී වෙන්නෙ නෑ. මොකද රහතන් වහන්සේත් දන්නවා එයා රහත් භාවයට පත්වුණේ මූලිකවම බුදුරජාණන් වහන්සේට ආමිස පූජා පවත්වලයි කියලා. එහෙම හිතල එහෙම ගලපල අපි මේ කාරණය ගලපල ගන්න ඕන.

<u>ප්‍රශ්නය</u>

***34. ස්වාමීන් වහන්ස, මේ භව ගමනේ දී අප ගමන් කරන විට අප සමග ගමන් කරන්නේ එකම විඥ්ඤාණයක්ද? ඒ වගේම කරන්නා වූ කුසලාකුසල කර්ම යම් තරමකින් මේ විඥ්ඤාණයේ ශක්තිය හීන කිරීමට හෝ බලවත් කිරීමට බලපානවද? (දසසිල් මාතාවක් යොමුකළ ප්‍රශ්නයක්)***

<u>පිළිතුර</u>

මෙහෙමයි, මේ විඥ්ඤාණය කියන කාරණය මං බොහොම තේරෙන භාෂාවෙන් පැහැදිලි කරල දෙන්නම්. ඔබතුමිය ඉන්නවා. ඔබතුමියට අපි කියමු පෙර ජීවිතයේ ඔබතුමිය මනුස්සයෙක්. මනුස්ස කාන්තාවක්. ඔබ පෙර ජීවිතයේ අවුරුදු 80 ක් 90 ක් ජීවත් වෙලා ඔබ මැරෙන වෙලාව එනවා. මැරෙන වෙලාවෙදි මේ රූපය ඇසුරෙන් සකස්වන අවසාන පංචුපාදානස්කන්ධය සකස් වෙනව. ඒක මනෝ විඥ්ඤාණයක් හැටියටයි සකස් වෙන්නෙ. ඒකට අපි කියනව චුති සිත කියලා, ඔය චුති සිත කියන්නෙ විඥ්ඤාණය. එතකොට දැන් විඥ්ඤාණය සකස් වුනේ කුමක් නිසාද? සංස්කාර නිසා. ''සංඛාර පච්චයා විඥ්ඤාණං'' එතකොට සංස්කාර සකස් වෙන්නෙ කුමක් නිසාද? අවිද්‍යාව නිසා. 'අවිජ්ජා පච්චයා සංඛාරා'' අවිද්‍යාව ඔබ ක්ෂය කලේ නෑ. ඔබ රහත් වෙලා හිටියෙ නෑ. මේ නිසා ඔබ සංස්කාර රැස්කළා.

එතකොට අවිද්‍යාව නිසා නේද සංස්කාර සකස් වුනේ. අවිද්‍යාවත් සංස්කාරත් අතර සත්වයෙක් පුද්ගලයෙක් හිටියද? අවිද්‍යාව නිසානෙ සංස්කාර සකස් වුනේ? එතකොට අවිද්‍යා නිරෝධා සංස්කාර නිරෝධා තේරුණාද? දැන් මෙතන හේතු ඵලයක් නෙ තියෙන්නෙ. දැන්

මෙතන සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවද? නැහැ හරිද? අවිජ්ජා පච්චයා සංඛාරා. හේතු ඵලයක්. මෙතන මේ අතර සත්ත්වයෙක් පුද්ගලයෙක් හිටියෙ නැහැ. සංඛාරා පච්චයා විඤ්ඤාණං සංස්කාරය නිසා චුති සිත සකස් වුනා. මෙතන මමය කියලා සත්ත්වයෙක් පුද්ගලයෙක් හිටියෙ නැහැ. ''සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ'' තේරුණාද? හේතුඵල ධර්මතාවයක්. විඤ්ඤාණ පච්චයා නාමරූපං බුදුරජාණන් වහන්සේ කියනවා විඤ්ඤාණය නිසා නාමරූප සකස් වෙනව කියලා.

දැන් මෙතනදි විඤ්ඤාණය කිව්වෙ ඔබේ ගිය ජීවිතයේ අවසාන චුති චිත්තය නේද? දැන් මේ විඤ්ඤාණය ඒ කියන්නෙ ඔබේ අවසාන චුති සිත ඔබේ මේ ජීවිතයේ අම්මාගේ මවුකුසට බැස ගන්නව. තේරුණාද? ඒ බැස ගන්න කොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනව, ඔබේ අම්මාගේ මව් කුසේ, මේ ජීවිතයේ ඔබේ අම්මාගේ මව් කුසේ, මේ පැලෝපීය නාලයේ පුංචි කලලරූපයක් තියෙනව. තේරුණාද? ඒක ජීව විද්‍යාත්මක දෙයක්. තාත්තාගේ ශුක්‍රාණුවක් සහ අම්මාගේ ඩිම්බයක් එකතු වීම නිසා සකස් වුණ ජීව විද්‍යාත්මක දෙයක්. පුංචි මස් කැල්ලක්. උකුණු හිසක් තරම්.

දැන් මේ චුති චිත්තය ඒ කියන්නෙ විඤ්ඤාණය ඇවිල්ල මේ මස් කැල්ලට තමයි බැස ගන්නෙ තේරුණාද? මස් කැල්ලට බැස ගත්ත ගමන් දැන් මේ මස් කැල්ල ගැහෙන්න පටන් ගන්නව. කාය සංස්කාර .... අපේ පපුව ගැහෙන්නෙ, ඒ වගේ මේ කාය සංස්කාර සකස් වෙනව කියන්නෙ නාමරූප සකස් වෙනව. විඤ්ඤාණ පච්චයා නාමරූපං. විඤ්ඤාණය නිසා නාමරූප සකස් වෙනව. තේරුණාද? විඤ්ඤාණය නිරෝධා නාමරූප නිරෝධෝ. හේතුඵල ධර්මයක්. විඤ්ඤාණය කලල රූපයට බැස ගත් නිසා නාමරූප ධර්මයන් සකස් වෙනව. නාමරූපයත් විඤ්ඤාණයත් අතර සත්ත්වයෙක් පුද්ගලයෙක් දෙයක් හිටියද? නෑ. හේතුඵල ධර්මයක් විතරයි. විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ.

දැන් රහතන් වහන්සේ විඤ්ඤාණය නිරුද්ධ කරපු කෙනා. රහතන් වහන්සේට නාමරූප නිසා විඤ්ඤාණයක් සකස් වෙනවද? නෑ විඤ්ඤාණය තමා තුලින්ම නිවිල යනව. ගිනි ගොඩක් දර ඉවර වෙලා, ගිනි ගොඩේම නිවී යන්නේ යම් සේද විඤ්ඤාණයත් තමා තුළින්ම නිවිල යනව. නමුත් ගිය ජීවිතේ අර විඤ්ඤාණය සකස් වුනා වූ චුති චිත්තය විඤ්ඤාණ පච්චයා නාමරූපං නිසා නාමරූප සකස් වුණා. තේරුණාද? ඊළඟට බුදුරජාණන්

වහන්සේ දේශනා කරනවා නාමරූප පච්චයා සලායතන කියලා. නාමරූප නිසයි සලායතන සකස් වෙන්නෙ.

ඒක කොහොමද වෙන්නේ? බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මේ කලල රූපය සති හත අටක් යනකොට තම්බපු බිත්තරයක් ප්‍රමාණයට ලොකු වෙනව කියලා. ලොකු වෙලා ආයතන පිහිටනවා. දැන් නාමරූප නිසා සලායතන සකස් වෙලා, නාමරූප පච්චයා සලායතනං. එතකොට නාමරූපයත් සලායතනයත් අතර සත්ත්වයෙක් පුද්ගලයෙක් හිටියද? හේතුඵල ධර්මයක් තේරුණාද? හේතුව නිසා සකස් වුන ඵලයක්. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ කියනවා නාමරූප පච්චයා සලායතනං, සලායතන පච්චයා ඵස්සෝ. සලායතනය නිසා ඵස්සය සිද්ධ වෙනවා.

එතකොට සලායතනය නිසා ඵස්සය සිද්ධ වෙන්නෙ කොහොමද? දරුවා මේ ජීවිතයේ අම්මාගේ මව් කුසෙන් බිහි වෙනවා. මව්කුසෙන් බිහිවුණාට පස්සේ මේ දරුවා ඇහෙන් රූප දකිනවා. ඇහෙන් රූප දැක්කා කියන්නේ චක්ඛු විඤ්ඤාණය සකස් වෙනව. චක්ඛු විඤ්ඤාණය සකස් වුන මොහොතේම, ඇහැ ඉපදුනු මොහොතේම, දැක්කා වූ රූපය ගැන හිතනවා. මනෝ විඤ්ඤාණය සකස් වෙනවා. චක්ඛු විඤ්ඤාණය මැරෙනවා. චක්ඛු විඤ්ඤාණය මැරිලයි මනෝ විඤ්ඤාණය සකස් වුණේ. ඇස මැරිලයි මන ඉපදුනේ තේරුණාද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ඉන්න හැම සත්ත්වයෙක්ම හැම නිමේෂයක දී ම මැරෙමින් ඉපදෙනවා, මැරෙමින් ඉපදෙනවා කියලා. නමුත් අපි ඒක දන්නේ නෑ. අපි දන්නේ මේ ආයුෂත්, එතිනින් ගියහම උණුසුමත්, විඤ්ඤාණයත් තුනම පහව ගියා වූ මරණයක් ගැන විතරයි. නමුත් බුදුරජාණන් වහන්සේ එහෙම කියන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ කියනව මේ හැම සත්ත්වයෙක්ම හැම නිමේෂයක දී ම මැරෙමින් උපදිනව, මැරෙමින් උපදිනව කියලා. එතකොට මේ මොකක් ද කියන්නෙ. ඇසෙන් රූපයත් දකිද්දී ඇහැ උපදිනව. දැක්කා වූ රූපය ගැන හිතනවා. ඇහැ මැරිලා මන උපදිනව. එතකොට මේ මොකක්ද කියන්නෙ. ඇසෙන් රූපයක් දකිද්දී ඇහැ උපදිනව. දැක්කා වූ රූපය ගැන හිතනවා. ඇහැ මැරිලා මන උපදිනවා. එතකොට සද්දයක් ඇහෙනවා. මන මැරිලා කණ, ශ්‍රෝත විඤ්ඤාණය උපදිනවා. කණට ශබ්දයක් ඇහුනම කණ මැරිලා මනෝ

විඤ්ඤාණය උපදිනව. එතකොට මදුරුවෙක් කනවා. කාය විඤ්ඤාණය ඉපදෙනව. මනෝ විඤ්ඤාණය මැරෙනව. චක්ඛු විඤ්ඤාණය ද, ශ්‍රෝත විඤ්ඤාණය කියන්නෙ නැහැ. ඇහැ මැරිලයි කණ ඉපදුනේ. ශ්‍රෝත විඤ්ඤාණය ද මනෝ විඤ්ඤාණය කියන්නෙ? කණ මැරිලයි මන ඉපදුනෙ. මනෝ විඤ්ඤාණය ද කාය විඤ්ඤාණය කියන්නෙ? මන මැරිලයි කය ඉපදුනේ. මේ ප්‍රඥාවෙන් විතරයි අපි ඒක දකින්නෙ. මොකක්ද ප්‍රඥාවෙන් දකින්නේ.

මේ ආයතන හයෙන් එක ආයතනයකයි හැම වෙලාවෙම ඉපදිලා තියෙන්නෙ තේරුණාද? අනිත් ආයතන පහ මැරිල තියෙනවා. ඒ ඉපදිලා තියෙන ආයතනය තුළ විඤ්ඤාණය බැසගෙන තියෙනව. චක්ඛු විඤ්ඤාණය සකස් වෙන කොට විඤ්ඤාණය ඇස තුළ තියෙනව තේරුණාද? එහෙම නම් දැන් මෙතන එකම විඤ්ඤාණයක් ද තිබ්බේ. නෑ. ඇස මැරිලයි කණ ඉපදුනේ නේද? චක්ඛු විඤ්ඤාණය අනිත්‍ය වෙලයි සෝත විඤ්ඤාණය සකස් වුණේ. ශ්‍රෝත විඤ්ඤාණය අනිත්‍ය වෙලයි මනෝ විඤ්ඤාණය සකස් වුනේ. මනෝ විඤ්ඤාණය අනිත්‍ය වෙලයි ඝාන විඤ්ඤාණය සකස් වුනේ. එකම විඤ්ඤාණයක් නෙවෙයි.

මැරෙමින් ඉපදෙමින් මැරෙමින් ඉපදෙමින් ගලා යන්නා වූ විඤ්ඤාණය. එහෙම ගිහිල්ලා ඔබ මේ ජීවිතයේ තව චිරාත් කාලයක් ජීවත් වෙලා මැරෙන දවසක් එනවා. මැරෙන වෙලාවට මනෝ විඤ්ඤාණය කියල අවසාන චුති සිත සකස් වෙනවා. දැන් එකම විඤ්ඤාණයක් ද? තේරුණාද? එකම විඤ්ඤාණයක් කියල දෙයක් නැහැ. ඇස මැරිලයි කණ ඉපදෙන්නෙ. කණ මැරිලයි මන ඉපදෙන්නෙ. මන මැරිලයි කය ඉපදෙන්නෙ. කය මැරිලයි දිව ඉපදෙන්නෙ. දිව මැරිල තමයි නාසය ඉපදෙන්නෙ. හැම වෙලාවකම මේ ආයතන හයෙන් එකයි ඉපදිලා තියෙන්නෙ. ඒ ඉපදිලා තියෙන ආයතන තුළ විඤ්ඤාණය බැසගෙන තියෙනව. ඇතිවෙමින් නැතිවෙමින් මැරෙමින් ඉපදෙමින් යන්නා වූ දෙයක්.

**ප්‍රශ්නය**

***35. මගේ මව මියගොස් වසර 12 ක් පමණ වේ. ඇය මිය ගියේ පිළිකා රෝගයෙන්. ඇය මා හට නිතර නිතර සිහිනයෙන් පෙනේ. ඇය සිහිනයෙන් පෙනුනේ දුඃඛිත බවින් සිටින අයුරුය. අප විවිධ පින්කම් සිදු කර මවට පින් අනුමෝදන් කර ඇත්තෙමු. දැන් ඈ පෙනෙන්නේ සාමාන්‍ය ස්වරූපයෙනි. ඉන් අදහස් වන්නේ කුමක්ද ස්වාමීන් වහන්ස?***

**පිළිතුර**

ඒක අපිට කියන්න බෑ මහත්තයො. සමහරවිට දැන් පිළිකාවකින් වගේ කෙනෙක් නැති වුණහම ඇත්ත වශයෙන්ම අපට තේරෙනව මෙයා නැතිවුනේ අකුසලයක් නිසා කියලා. තේරුණාද? අකුසලයකට අදාළ රෝගයක් තමයි පිළිකාව කියන්නේ. ඉතින් ඒ පිළිකාව නිසා සමහර වෙලාවට එයා ඒ දුකට පත්වෙලා මැරෙන්නත් පුළුවන්. එතකොට එහෙම මැරෙන කොට ඒ මැරුණ කෙනා දුගතියට වැටෙයි කියලා විශ්වාසයක් අපේ හිත් තුළ තියෙනවා. මොකද එයා මැරුණෙත් දුක් විඳලා. මැරුණෙත් පිළිකාවක් හැදිලා. අනේ මෙයා දුකට වැටුනාය කියන චිත්තය අපි තුළ තියෙනවා. ඒ නිසා මනෝ භාවය තුළ ක්‍රියාත්මක වෙලා රෑට හීනෙන් අපේ අම්මා දුඃඛිත තැනක ඉන්නවා, කියලා පේන්න පුළුවන්. ඒක අපි තුළ වැඩෙනවා. එහෙම චිත්තයක් වැඩුනට පස්සේ අපි එයාට පින්දෙනවා. පින් දුන්නාට පස්සේ අපි තුළම නැවත චිත්තයක් සකස් වෙනවා අපේ අම්මා දැන් පින් ගන්න ඇතියි කියලා.

ඊට පස්සේ ඔන්න අම්මා සුදු සාරියක් සුදු හැට්ටයක් ඇඳල ඉන්නව අපට හීනෙන් පේන්න පටන් ගන්නව. දැන් මේ සියල්ලම තමාගේ මනස තුළින් මතුකරල ගත්තෙ. එහෙම වෙන්නත් පුළුවන්. නමුත් ඉන් එහාට ගිහිල්ල යම් යම් ඥාණ ශක්තීන් සකස් කරගෙන දැන් අම්මා මේ තැන්වල ඉන්නවා කියල දකින්නත් පුලුවන්. මේ දෙකෙන් කෝක දැක්ක ද කියල කියන්න මම දන්නේ නෑ. නමුත් කෝක දැක්කත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මැරුණාට පස්සේ මැරිච්ච කෙනාව අත් හරින්න කියලා. මැරිච්ච කෙනත් එක්ක ජීවත් වෙන්න එපා කියලා. යුතුකමක් හැටියට ජීවත් වෙන අය පින් කරල ඒ පින් අනුමෝදන් කරනවා මිසක් මැරිච්ච අයත් එක්ක ජීවත් වෙන්න එපා කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මැරිච්ච අය ගැන හිතන්න මැරිච්ච අය ගැන කල්පනා කරන්න, ඒ අය ගැන සැලසුම් කරන්න එපා කියලා බුදුරාජණන් වහන්සේ දේශනා කරනව. නමුත් පින් දෙන්න ඕන. කරන පින්කමක දී හැම වෙලාවක දීම නම කියලා පින් දෙන්න. ඉන් එහාට හිතන්න යන්න එපා. මොකද ඕක හිතල කවදාවත් ඉවරයක් කරන්න බෑ.

දැන් මේ ජීවිතයේ අම්මයි මැරිල ඉන්නෙ. මේ ජීවිතයේ අම්මා ගැන ඔච්චර දුක් විඳිනව නම් ඔබගේ පෙර ජීවිතයේ අම්මා ගැන ඊටත් පෙර ජීවිතවල අම්මලා ගැන මොකද හිතන්නේ? අසාධාරණයි නේද, පෙර ජීවිතයේ අම්මා ගැන නොහිතන එක? මීට අවුරුදු 50 කට ඉස්සර අම්ම කෙනෙක් හිටියනෙ. ඊට ඉස්සර ජීවිතයේ අම්මට මොකද වුණේ? ඊට ඉස්සෙල්ල ජීවිතේ අම්මට මොකද වුණේ? ඊට ඉස්සෙල්ල අම්මට මොකද වුණේ?

බුදුරජාණන් වහන්සේ කියනව මහත්තයෝ, මුලු දඹදිවම තියෙන කෝටුකැලි එක ගොඩකට ගහල මේ කෝටු කැලි හැම එකක්ම ඇඟිල්ලේ ප්‍රමාණයට කඩල එක කෝටු කෑල්ල කෑල්ල අයින් කරන්න කියනව. මේ මගේ මේ ජීවිතේ අම්ම, මේ මගේ ගිය ජීවිතේ අම්ම, මේ මගේ ඊට පෙර ජීවිතයේ අම්ම කියලා. කෝටු කැලි ටික ඉවර වෙනවා. අම්මල ඉවර වෙන්නෙ නෑ කියලා කියනවා. එහෙමනම් මේක කවදාවත් ඉවර කරන්න බැහැ. ඒකයි කිවුවෙ දූන් අම්මා ජීවතුන් අතර ඉන්න වෙලාවෙ රෝගී වුණා. පිළිකාවක් හැදුනා නම් ඒ අම්මාට කරන්න තියෙන උපස්ථානයක් අපි කළා. කරල මැරුණට පස්සේ කරන්න තියෙන්නේ පින්පෙත් දීල, අනාගතයෙත් එහෙම කරල එතනින් නතර කරල අත හෝදල දාන්න.

දූන් එයා අපට අයිති නෑ. ඒ අම්මා ගිහිල්ලා මව් කුසක ඉපදිලා ඉන්නවා නම් දූන් තවත් කොහේ හරි අම්මා කෙනෙක් ඒ දරුවා හුරතල් කරනවා ඇති. සශ්‍රීක දිව්‍ය තලයක ඉපදුනා නම් දිව්‍යාංගනාවො වටකරගෙන එයා අප්‍රමාණ කාමච්ඡන්දයන් විඳිනවා ඇති. නමුත් අපි මෙතන ඉඳන් අඬනවා. තේරුමක් නැහැ. මැරුණට පස්සේ මැරිච්ච කෙනා කොහෙද ගියේ කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා මැරුණට පස්සෙ පින්පෙත් දෙන්න. මැරිච්ච කෙනාව අමතක කරන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ.

නමුත් එයා දුර්වල තැනක ඉන්නවා නම් මේ දරුවො එයා ගැන හිතන හිතන වාරයක් පාසා එයාට පේනව දරුවො තමන් ගැන හිතන බව. මොකද ප්‍රේතයින්ට අනුන්ගෙ හිත් දූන ගැනීමේ ශක්තිය තියෙනව. ඒ ගොල්ලන්ට පේනව දරුවො මා ගැන හිතනව කියලා. ඒ නිසා එයා තව තව දරුවාට ළංවෙනවා. එහෙම දරුවාට ලංවෙලා එයා උත්සාහ කරන්නෙ දරුවා ඉන්න තැනට යන්න නෙවෙයි. දරුවා එයාගෙ තැනට ගන්නයි එයා උත්සාහ කරන්නෙ. මොකද ප්‍රේත ලෝකයේ ඉන්න කෙනා එයා දුකක් විඳින්නෙ කියලා, දුකක ඉන්නව කියලා දන්නෙ නෑ. එයා සැපයක් කොටයි එයා ඉන්න තැන අල්ලාගෙන ඉන්නෙ. ඒ නිසා එයා හදන්නෙ දරුවාවත් තමන් ළඟට ගන්න. බැරි වෙලා හරි දරුවා මැරෙන වෙලාවට අසරණ භාවයෙන් මැරුණොත් අර අම්මා ඇවිල්ල දරුවාට පෙනී හිටිනව. මොකද මැරෙන වෙලාවෙ දරුවා මානසිකව දුර්වල වෙනකොට අම්ම ඇවිල්ල පෙනී හිටිනව. එතකොට ම උපාදානය සකස් වෙලා ''අම්මේ'' කියල අල්ල ගන්න ගමන් දරුවාත් අම්මා ළඟට යනව. එයා බලාගෙන ඉන්නෙ එතනට ගන්න.

ඒ නිසා මැරිච්ච අයත් එක්ක සම්බන්ධකම් තියාගෙන ඉන්න එපා. සතර අපායට නොවැටීම සඳහා චුති චිත්තය සකස් කර ගැනීමටයි ඔබ දක්ෂ වෙන්න ඕනෙ.

**<u>ප්‍රශ්නය</u>**

***36. ස්වාමීන් වහන්ස, දානයක්, පිංකමක් කුමක් හෝ කුසලයක් කිරීමෙන් පසුව ඒවායේ ආනිසංස මෙනෙහි කරමින් ඒවා අනිත්‍ය බව දැක එවලේම සිතින් අත් හැරීම ද කළ යුත්තේ එහෙම නැත්නම් නැවත නැවත එස්සය මෙනෙහි කරමින් සතුටුවෙමින් එහි ආනිසංස දකිමින් අනිත්‍යය දැකීම ද කළ යුත්තේ?***

**<u>පිළිතුර</u>**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හේතූන් කීපයක් නිසා කෙනෙක් දන් දෙනවා කියා.

i. එක්කෙනක් ඉන්නවා එයා මෙලොව දී ලබමී කියන බලාපොරොත්තුවෙන් දන් දෙනවා. මෙලොවදි ලබමි කියන්නේ මට විවාහයක් සිදු වේවා, මගේ දියුණුව සැලසේවා, මම පොහොසත් වේවා, මගේ රෝගය දුරුවේවා කියල ප්‍රාර්ථනා කරමින් දන් දීමයි. එයාගේ බලාපොරොත්තුව මෙලොව දී යම් සැපයක් ලැබීම.

ii. ආයිමත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා තව කෙනෙක් ඉන්නවා එයා දන්දෙන්නේ පරලොව දී ලබමී කියන බලාපොරොත්තුවෙන්. ඒ කියන්නේ මරණින් පසු මම දෙවියෙක් වේවා, සශ්‍රීක මනුෂ්‍යයෙක් වේවා කියා ප්‍රාර්ථනා කරගෙන එයා දන්දෙනවා.

iii. තව කෙනෙක් ඉන්නවා එයා පරම්පරාවෙන් එන නිසා දන් දෙනවා. ඒ කියන්නේ මගේ සීයා, මගේ ආච්චී, මගේ අම්මා, මගේ තාත්තා අහවල් ආරණ්‍යයට අහවල් දවසේ දන් දෙනවා. ඒ නිසා මම ඒක නොකඩවා පවත්වාගෙන යනවා කියලා දන් දෙනවා.

iv. තව කෙනෙක් දන් දෙනවා හිතේ සතුට නිසා. එයා වෙන මුකුත් දන්නේ නැහැ. එයා දෙන්නෙ අනුන් සතුටු කිරීම සඳහා. එයා කෙනෙකුට බත් පිඟානක් දීලා එයා ඒ බත් පිඟාන කනවා දැකලා සතුටු වෙනවා. කෙනෙකුට ඇඳුමක් දීලා එයා ඒ ඇඳුම අඳිනවා දැකලා සතුටු වෙනවා. ඉන් එහා දෙයක් එයා දන්නෙ නැහැ.

v. තව කෙනෙක් ඉන්නවා කියලා බුදුරජාණන් වහන්සේ කියනවා එයා දන් දෙන්නේ මහණ බමුණන්ට ජීවත් වීමට වෙනත් ක්‍රමයක් නැහැ. ඒ අය විවාහක නැහැ. ඒ අය

මුදල් උපයන්නේ නැහැ. ඒ නිසා ඒ ගොල්ලන්ට දන් දෙනවා කියන කාරණය තුළ සිට දන් දෙනවා කියා.

නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා මේ කිසිම දානයක් මහත්ඵල මහානිසංශ නැහැ කියලා. ආනිසංස තියෙනවා. මහත්ඵල මහානිසංස නැහැයි කියලයි කියන්නෙ. ආනිසංස නැහැ කියලා කියන්නේ නැහැ. සැපය, සුගතියේ උපතක් තියෙනවා. නමුත් මහත්ඵල මහානිසංස නැහැ කියලා **බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මේ කිසිම දානයකින්. බුදුරජාණන් වහන්සේ මහත්ඵල මහානිසංස දානය කියන්නේ සිතට අලංකාරයක් උදෙසා දෙන දානයටයි. සිතට පරිෂ්කාරයක් උදෙසා දෙන දානයටයි. සිතට අලංකාරයක්, සිතට පරිෂ්කාරයක් කියන්නේ මොන සිතට ද? මේ සමථ විදර්ශනා සිතටයි. සමථ විදර්ශනා සිත කියන්නේ කුමකට ද? මේ රූපය දුකයි කියලා, දැක්කා වූ සිතට.** මේ වේදනාව, මේ සංඥාව, මේ චේතනාව, මේ විඤ්ඤාණය අනිත්‍යයි, දුකයි කියා දැක්කා වූ සිතට. ඒ නිසා ඒ සිත දුකයි කියා දැක්කා වූ සිත තව තවත් ශක්තිමත් කරගන්න. ඒ අනිත්‍යයි කියලා දැක්කා වූ සිතට අලංකාරයක් උදෙසා, පරිෂ්කාරයක් උදෙසා දන් දෙන්න කියලයි බුදුරජාණන් වහන්සේ කියන්නේ. ඒ දානය තමයි මහත්ඵල මහානිසංස දානය. එහෙමනම් අපි දන්දීම තුළින් බලාපොරොත්තු වෙන්නෙ මොනවද? නිරතුරුවම අප තුළ වැඩෙන්නා වූ සමථ විදර්ශනා සිත ශක්තිමත් කර ගැනීම. සමථ විදර්ශනා සිත ශක්තිමත් කර ගන්නවා කියන්නේ මොකක්ද? දන් දෙමින් දානයේ අනිසංස ජීවිතයට ලබමින් ඒ ආනිසංසයන්ගේ අනිත්‍ය භාවය දැකීමයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය අනුව කොහොමටත් පිංවතුන්ලාට දානයෙන් තොරව නිවන් මගට යන්න බැහැ. සමහර ගිහි පිංවතුන් කියනවා ස්වාමීන් වහන්ස අපි භාවනා කරන අය. අපි දන් දෙන්නේ නැහැ කියලා. එහෙම ධර්මයක් බුදු දහමේ නැහැ. උග්ග ගෘහපතියා අනාගාමී ඵලයට පත් වී දන් දුන්නා. වේළුකණ්ඨකී නන්ද මාතාව අනාගාමී ඵලයට පත් වී දන් දුන්නා. සෝවාන් ඵලයට පත් වූ අනේපිඬු සිටුතුමා දන් දුන්නා. එහෙමනම් කවුරු හරි කියනවා නම් මම භාවනා කරන කෙනෙක්, මම දන් දෙන්නේ නැහැ කියලා ඒක ධර්මයට එකඟ නැහැ. මොකද දානය තමයි අපිට අත්හැරීමේ අයන්න, ආයන්න කියලා දෙන්නේ. සාක්කුවේ තියෙන රු. 100 දානයට අත්හැරීමට අපි කැමති නැත්නම් අපි මේ රූපය මගේ නෙවෙයි කියලා අත් හරින්න අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අතනින් තමයි අත්හැරීමට පුරුද්ද සකස් කරලා දෙන්නේ. ඒ නිසා දානයේ සැබෑම අර්ථය

තමයි දන් දෙමින් ආයුෂ, වර්ණය, සැපය, බලය, ලබමින් ඒ ආයුෂ, වර්ණ, සැපය, බලයේ අනිත්‍ය භාවය දැකීම. දන් දීමෙන් අපිට ආයුෂ, වර්ණ, සැපය, බලය ලබෙනව. මොකද ආයුෂ, වර්ණ, සැපය, බලය අත්‍යවශයි. ආයුෂ, වර්ණ, සැපය, බලයෙන් තොරව අපිට ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් වඩන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා දන් දෙමින්, ආයුෂ, වර්ණ, සැපය, බලය ජීවිතයට ලබමින් ඊට පස්සේ ඒවායෙහි අනිත්‍යභාවය දකිනවා. ඒ නිසා දන් දීලයි දානය නිසා තමන් සතුටු වෙන්න ඕනැ.

දානයේ දිට්ඨ ධම්ම වේදනීය කුසල විපාකයක් තියෙනවා. ඔබ හිතුවත් නොහිතුවත් ඔබට ලැබෙන දිට්ඨ ධම්මවේදනීය කුසල විපාකයක් තියෙනව. ඒක කාටවත් වළක්වන්න බැහැ. දානයේ දිට්ඨ ධම්ම වේදනීය කුසල විපාකය තමයි දන්දෙන මොහොතේ ඇතිවන කායික මානසික සැනසිල්ල. ඒ කායික, මානසික සැනසිල්ල නිසා ලේ ධාතුව පිරිසිදු වෙනව. ශරීරය ප්‍රසන්න වෙනව. ඒ කියන්නේ නිරෝගී භාවය ආයුෂ, වර්ණ, සැපය, බලය ජීවිතයට එකතු වෙනවා. ඉතින් ඒක තමයි ආයුෂ, වර්ණ, සැපය, බලය කියන්නේ. දන්දීල ආයුෂ, වර්ණ, සැපය, බලය ලබමින් එහි අනිත්‍යභාවය දකිනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම ආයුෂ, වර්ණ, සැපය, බලය ජීවිතයට ලබන්න ඕන. ඒ නිසා නිරතුරුව දන් දෙමින් අපි මේ ඇස අනිත්‍යයි කියලා දකින්න ඕන. මොකද මේ ඇසෙන් පෙනෙන්නේ ඇස පෝෂණය වී පවතින්නේ දානය නිසාමයි. දන් දෙමින් මේ රූපය අනිත්‍යයි කියලා දකිද්දී දානයේ ආනිසංස වල අනිත්‍ය භාවය දකිනවා. ඒ නිසා අනිවාර්යෙන්ම ආනිසංස ජීවිතයට ලබන්න ඕන. ආනිසංස ලබන්නෙ නැතුව අනිත්‍යය දකින්න බැහැ. ආනිසංස අනිවාර්යෙන්ම අපට ලැබෙනව. ඒ හේතුඵල ධර්මයක්. ලැබිල ලැබුණ දේ අනිත්‍ය භාවය දකිනව. බුදුරජාණන් වහන්සේ කියනව නිරතුරුවම දුන්නා වූ දානයන් සිහිපත් කරන්න කියලා.

මේ මහත්තයාට ඔතන වාඩිවෙලා ඉඳලා මීට අවුරුදු දහයකට ඉස්සෙල්ලා දුන්නු දානයක් සිහිපත් වුනොත් මොකක්ද ලැබෙන්නේ. තව තව සතුට, ප්‍රීතිය ලැබෙන්නේ. ඒක හේතුඵල ධර්මයක්. එතකොට සතුට, ප්‍රීතිය කියන්නේ ආයුෂ, වර්ණ, සැපය, බලය. ඒව ලබල ඕනෙ, ඒවායෙහි අනිත්‍ය භාවය දකින්න. ඉතින් ඒ නිසා බුදුරජාණන් වහන්සේ කියනව නිරතුරුවම දුන්නා වූ දානයන් ආවර්ජනය කරන්න, සිහිපත් කරන්න, මෙනෙහි කරන්න. මෙනෙහි කරමින් දානය නිසා ලැබුණා වූ අනිසංසයන්ගේ අනිත්‍යභාවය දකින්න. දන් දීම නිසා මට ආයුෂ, වර්ණ, සැපය, බලය ලැබුණා. නමුත් මට තේරෙනව සෑම ගතවන නිමේෂයකම ඒ ආයුෂ, වර්ණ, සැපය, බලය අනිත්‍ය භාවයට පත් වෙනවා කියලා. එතකොට

අනිත්‍යභාවය දකින මොහොතේ දානයේ අනිසංසයන්ගේ අනිත්‍ය භාවය දකිනවා. ඉතින් එතන තමයි දානයට දෙන්න තියෙන සැබෑම අර්ථය. නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සංඝයා අරමුණු කරගෙන දෙන දානයයි ශ්‍රේෂ්ඨතම දානය කියලා. සංඝයා අරමුණු කරගෙන දෙන දානය.

මහා ප්‍රජාපතී ගෝතමිය බුදුරජාණන් වහන්සේට ගෙනල්ල චීවරයක් පූජා කරනව. බුදුරජාණන් වහන්සේ කියනව ''ගෝතමිය මට පූජා කරන්න උත්සාහ කරන්න එපා. සංඝයාට පූජා කරන්න'' කියලා. ඒවගේ තුන් වතාවක් විතර ඇවිටිලි කරනව බුදුරජාණන් වහන්සේට පූජා කරන්න. ඒත් බුදුරජාණන් වහන්සේ එය අනුමත කරන්නේ නෑ. සංඝයාට පූජා කරන්න කියනවා.

සංඝයාට පූජා කරන දේ ආනිසංස වැඩියි. නමුත් සංඝයාට පූජා කරද්දී, ඒ පූජාවන් සංඝයාට පූජා කරන තැන බුදුරජාණන් වහන්සේත් වැඩ ඉන්නවා නම්, රහතන් වහන්සේලාත් වැඩ ඉන්නවා නම්, ඒ කණ්ඩායමට සංඝයා අරමුණු කරගෙන දෙන්නා වූ දානයමයි ආනිසංස පක්ෂය වැඩි. ගුණාත්මක භාවයෙන්, සීලයෙන් වැඩිවෙන්න වැඩි වෙන්න ඒ ගොල්ලන්ට දෙන්නා වූ ආනිසංස ප්‍රමාණය වැඩියි. ඒ නිසා සංඝයා අරමුණු කරගෙනයි දන් දෙන්න ඕන. බුදුරජාණන් වහන්සේට දානයක් දුන්නත් සංඝයා අරමුණු කරගෙන නම් දානය පූජා කරන්නෙ ඒ දානයේ ආනිසංස වැඩියි. සංඝයා අරමුණු කරගෙන දානය පූජා කරද්දී ඒ දානය පිළිගන්නේ රහතන් වහන්සේලා නම් ඒ දානයේ ආනිසංස වැඩියි. දානය පිරිනමද්දී පිළිගනිද්දී එතන ඉන්නෙ අනාගාමී ස්වාමීන් වහන්සේලා නම් ඒ දානයේ ආනිසංස වැඩියි. ඒ වගේ ගුණාත්මක භාවයෙන් අවබෝධාත්මක භාවයෙන් වැඩි පිරිසකට සංඝයා අරමුණු කරගෙන දන් දෙන්න.

ඒවායේ තියෙන්නා වූ ආනිසංස පක්ෂය වැඩියි. එහෙම නැතුව හැම සංඝික දානයකටම එකම අනිසංසය ලැබෙන්නේ නැහැ. ඒ ස්වාමීන් වහන්සේලාගේ අවබෝධාත්මක භාවය වැඩි වෙන්න වැඩි වෙන්න, ගුණාත්මක භාවය වැඩි වෙන්න වැඩිවෙන්න ඒවායින් ලැබෙන්නා වූ ආනිසංස පක්ෂය වෙනස් වෙනව.

**<u>ප්‍රශ්නය</u>**

***37. ස්වාමීන් වහන්ස, බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට දෙන දානයේ ආනිසංස පක්ෂය වැඩි වුනාට අද එවැනි දානයක ආනිසංස අපට ලබන්න පුළුවන්ද, මොකද බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා සමග අද බුදුරජාණන් වහන්සේ නොමැති නිසා?***

**<u>පිළිතුර</u>**

මෙහෙමයි, දැන් බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින්නේ නැහැ. දැන් එදා වගේ අර උභතෝභාග විමුක්ත රහතන් වහන්සේලා අපට දකින්න නැහැ. අනිවාර්යෙන්ම රහතන් වහන්සේලා කියල බාහිරින් එහෙම දැකල අවබෝධ කරගැනීමේ හැකියාවක් තියෙන එවැනි රහතන් වහන්සේලා අද නැහැ. ඒ නිසා මහත්තයො අපට මේ වෙලාවෙ කරන්න තියෙන්නෙ සංඝයා අරමුණු කරගෙන දන් දෙන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කරනව මෙහෙම ගිහිල්ල, මෙහෙම ගිහිල්ල අනාගතයේ දී කාසායකණ්ඨක කියලා කහපාට නූලක් විතරක් බැඳගත්තු පිරිසක් බිහි වෙනවා කියලා. එදාට සංඝයා හැටියට නියෝජනය කරන්නේ ඒ අය. ඒ ගොල්ලො ජීවත්වෙන්නෙ ගෙවල්වල. පන්සල්වල නෙවෙයි. ගෙයක් හදාගෙන, විවාහ වෙලා, දරුවෝ හදාගෙන, සත්තු මරාගෙන කාලා, අරක්කු බීගෙන තමයි ඒගොල්ලො ජීවත් වෙන්නෙ. එදාට අපි ගිහිල්ල ඒ අයට තමයි දන් දෙන්නෙ. ඇයි ඒ අයට දන් දෙන්නේ? එදා සමාජයේ ඉන්න සිල්වත්ම පිරිස ඒ ගොල්ලෝ තමයි. ඒගොල්ලොයි සිල්වත්ම පිරිස. එතකොට අපි දකින්න ඕන ඒ ගොල්ලො නම් සිල්වත් පිරිස, එදා සමාජය කොච්චර නම් දුස්සීල භාවයට පත්වෙලා ඇද්ද කියලා.

බුදුරජාණන් වහන්සේ කියනව කාසායකණ්ඨකටත් දෙන දානය සංඝයා අරමුණු කරගෙන දෙන්න කියලා. ඒ කාසායකණ්ඨකටත් දානයක් සංඝික කරන්න පුළුවන් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අපි හිතමු කාසායකණ්ඨක ලා පහළ වෙලා ඒ ගොල්ලන්ට දානය සංඝික කරනවා. ඒක සංඝික දානයක්. නමුත් ඒ සාංඝික දානයෙයි වර්තමාන දෙන සාංඝික දානයෙ ආනිසංස පක්ෂය අහසයි පොළොවයි වගේ. අපි අද සාංඝික දානයක් දෙනව කියන්නකො. අද දෙන දානයෙයි මීට අවුරුදු 2600 කට ඉස්සෙල්ලා ඒ සාරිපුත්ත මහ රහතන් වහන්සේලා ගෙදරට වඩම්මල දෙන සාංඝික දානයෙයි ආනිසංස පක්ෂය අහසයි පොළවයි වගේ. ඒ නිසා එදා ඒ අය සංඝික දාන දුන්නෙ ඒ සාරිපුත්ත මහ රහතන් වහන්සේලාගේ මුගලන් මහ රහතන් වහන්සේලාගෙ ඒ ශ්‍රේෂ්ඨ උතුමන්ගේ ගුණයන්,

ඥාණයන්, හැකියාවන් දකිමිනුයි. ඒ අයගේ චේතනාවල් වල ශක්තිය වැඩියි. ඒ නිසා එදා සාංඝික දානයේ ආනිසංස පක්ෂය වැඩියි. මේ වෙලාවෙ අපි සංඝික දානයක් දෙන්නෙ චිත්‍රයක් මවාගෙන. එහෙම නැත්නම් පොතකින් හරි සූත්‍රයකින් හරි සාරිපුත්ත මහරහතන් වහන්සේ මේ වගේ උතුමෙක්, මුගලන් මහ රහතන් වහන්සේ මේ වගේ උතුමෙක් කියල අපි මනසින් ඇඳගත්තා වූ චිත්‍රයක් දැකලය, දන් දෙන්නෙ. නමුත් එදා ඒ අය දන් දුන්නේ මනසින් ඇඳගත්තු චිත්‍රයක් දැකල නෙවෙයි. සැබවින්ම කණෙන්, ඇසෙන්, අහල දැකල.

ඒ නිසා මේ මොහොතේ අපි සංඝයා කියලා අරමුණු කරගෙන දෙන්නා වූ දානයෙන් එදා ආනිසංස පක්ෂය අපට ලැබෙන්නේ නෑ. ඊට අඩුයි. කාසායකණ්ඨකලා බිහිවුණාට පස්සේ ධර්ම විනය කියලා දෙයක් ලෝකෙ නැහැ. එදාට මේ සූත්‍ර ඔක්කොම ගිනිතියලා දාලා තියෙන්නෙ. සූත්‍රයක්, ධර්මයක්, විනයක් කියලා දෙයක් නැහැ. එදා මිනිස්සු දන්නේ නෑ සාරිපුත්ත මහ රහතන් වහන්සේ කියන්නේ කවුද කියලා. මොකද එදා සංඝයා කියන්නේ කහපාට නූලක් විතරක් බැඳගත්තු කෙනෙක්. එතකොට එතන කොහෙත්ම හිත පිහිටන්නේ නැහැ. නමුත් ඒ කාසායකණ්ඨකට දෙන දානෙත් මහත්ඵලයි මහානිසංසයි. මොකද ඊට වඩා දෙයක්, දානයක් එදාට ලෝකෙ නැහැ. නමුත් එහෙමනම් මීට අවුරුදු 2600 ක් තරම් වන කාලයෙ දි දුන්නා වූ දානයක් වර්තමානයේ දෙන්නා වූ දානයත්, කාසායකණ්ඨකලාට දෙන්නා වූ දානයත් තුනටම සංඝයා අරමුණු කරගෙන තමයි දෙන්නෙ. නමුත් මේ දාන තුනේ ආනිසංස පක්ෂය එකිනෙකට එකක්, එකිනෙකට එකක් වෙනස්.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාපු වෙලාවේ මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ 500 ක් ස්වාමීන් වහන්සේලා එක්ක වඩිනවා. නමුත් කාශ්‍යප මහරහතන් වහන්ස දන්නෙ නෑ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑව කියලා. ඉතින් කාශ්‍යප මහරහතන් වහන්සේ 500 ක් ස්වාමීන් වහන්සේලා එක්ක එක්තරා ගමකට ඇවිල්ල සෝදිසි කරල බලනව මේ හරියේ බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නවද කියලා. ඒ වෙලාවේ බමුණෙක් එනව මදාරා මලක් අරගෙන. ඒ බමුණගෙන් අහනව කාශ්‍යප මහ රහතන් වහන්සේ ''බමුණ මේ ප්‍රදේශයේ බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නවද කියලා'' එතකොට බමුණා කියනවා ''ස්වාමීන් වහන්ස බුදුරජාණන් වහන්සේ ඊයේ පිරිනිවන් පෑවා කුසිනාරාවේ. මම මේ එතනට ගිහිල්ලා ගෞරව දක්වල එතනින් මේ මදාරා මලත් අරගෙන එන ගමන්'' කියලා. ඒ වෙලාවෙ තමයි කාශ්‍යප මහ රහතන් වහන්සේ දැන ගත්තේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑව කියලා.

ඒ වෙලාවෙම ඒ ප්‍රවෘත්තිය අර භික්ෂූන් දැනගත්තට පස්සෙ එතැන හිටිය භික්ෂූන් හඬා වැටෙන කොට,  සුභද්‍ර කියන භික්ෂුව කියනව '' අඬන්න එපා. අඬන්න හේතුවක් නෑ. අපි හිනාවෙන්න, සතුටුවෙන්න ඕනැ. දැන් අපට විනය පනවන්න කෙනෙක් නෑ. අපිට මේක වැරදියි, මේක හරියි කියල කියන්න කෙනෙක් නෑ. අපට ඕන දෙයක් සුවසේ අපට කැමති ආකාරයෙන් කරන්න පුළුවන්. ඒ නිසා අඬන්න එපා. දැන් සතුටුවෙන්නයි ඕන. හිනාවෙන්න.'' කියලා.

එහෙම කිව්වහම දැන් අපි හිතමු. දැන් මෙතැනට කවුරුහරි මහත්වරු දෙන්නෙක් එනව. එක්කෙනෙක් හිතනව ''මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තමයි මෙතන හරි. ඒ නිසා මම මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ගෙදරට වඩම්මගෙන ගිහිල්ල සංඝයා අරමුණු කරගෙන දන් දෙනවා'' කියලා. එතකොට අනික් මහත්තයා කල්පනා කරනවා ''සුභද්‍ර තමයි හරි බලන්නකො සුභද්‍ර බුදුරජාණන් වහන්සේටත් මෙහෙම කියනව. එයා මොනව හරි ගුණයක් තියෙන කෙනෙක්. ඒ නිසා මම සුභද්‍රව මගේ ගෙදරට එක්කගෙන ගිහිල්ල සංඝයා අරමුණු කරගෙන දන් දෙනවා කියල.'' දැන් දෙතැනකම, අතන කාශ්‍යප මහ රහතන් වහන්සේ එක්කගෙන ගියේ. එයා දැක්ක මේ තමයි සැබෑම ශ්‍රාවකයා කියලා හිතලා දන් දුන්න. අනිත් එක්කෙනා දැක්ක සුභද්‍ර පුදුම කෙනෙක්නෙ. මෙච්චර ලස්සනට බයක් නැතුව ඉන්න මෙයා තමයි සැබෑම භික්ෂුව කියලා සුභද්‍රව එක්කන් ගිහිල්ල සාංඝික කරලා දන් දෙනව. දැන් දෙකම සාංඝික දාන. නමුත් මේ සාංඝික දාන දෙකේ ලැබෙන්නා වූ ආනිසංස අහසට පොළොව වගේ. මොකද අර මහත්තයා මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ගුණයන්, ඥානයන් සංඝයා කියා චේතනාව සකස් කරගෙන සංඝයා වහන්සේගේ සැබෑ ප්‍රතිරූපය දැකලයි දන් දෙන්නේ. ඒ දානයේ මහත්ඵල මහානිසංස වැඩියි. එතකොට අර සුභද්‍ර කියන භික්ෂුව එක්කන් ගිය මහත්තය, සංඝයා හැටියට දකින්නේ සුභද්‍ර වැනි හීන ආචාර ධර්මයන් තියෙන කෙනෙක්. එතකොට එයාගෙ හිත සංඝයා කියන ගුණය සංඝයා කියන ශක්තිය කෙරෙහි පිහිටන්නෙ නෑ. ඒ නිසා ඒ දාන දෙකේ ආනිසංස පක්ෂය වෙනස්. ඒ නිසා අපි සංඝයා කියන තැන දුර්වල චිත්‍රයක් මවාගෙන සංඝයා අරමුණු කරගෙන දන් දුන්නා කියලා ඒකෙන් ලැබෙන ආනිසංස පක්ෂය අඩුයි. නමුත් ආනිසංස තියෙනවා. ආනිසංස නැත්තේ නෑ. නමුත් අර මහානිසංයන් එක්ක ගත්තහම විශාල පරතරයක් තියෙනව.

<u>ප්‍රශ්නය</u>

***38. ස්වාමීන් වහන්ස, වඩා සුදුසු වන්නේ අප කළා වූ කුසල් කළ විගස අත හැරීම ද? එසේත් නැත්නම් ඒ සියල්ල තමන්ට අනුමෝදන් කරගැනීම ද? ඉහත පැවසූ ක්‍රම දෙකෙන් කරන්නා වූ කුසල් අනුමෝදන් කර ගැනීමට වඩාත් සුදුසු ක්‍රමය ඔබ වහන්සේ විසින් කාරුණිකව පහදා දෙන්න.***

<u>පිළිතුර</u>

කුසල් ගැන කතා කරන්න පෙර මතක් කරන්න ඕනේ මේ පින සහ කුසලය යන කාරණා දෙකක් ගැන අපි කතා කරනවා. පින කියා කියන්නේ සැපයට කියන්නා වූ තවත් නමක්. ඒ කියන්නේ සැපයට කියන තවත් නමක් තමයි පින කියා කියන්නේ. ඔබ සැපයෙන් ජීවත් වෙනවා නම් ඒ ඔබ සැපයෙන් ජීවත් වෙන්නේ පින නිසයි. කුසලය කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ කුමක්ද? සිතින් කයින් වචනයෙන් සිද්ධ වෙන්නා වූ යහපත් දේ අපි සතුන් මැරීමෙන් වළකිනවා, සොරකම් කිරීමෙන් වළකිනවා, කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකිනවා. වචනයෙන් සිදුවෙන්නා වූ යහපත් දේ තමයි මුසාවාදා, පිසුණාවාචා, පරුෂා වාචා, සම්ප්‍රප්ලාපා යන කාරණාවලින් වැළකීම. ඒ වගේම මනසින් සිදුවෙන්නා වූ යහපත් දේ තමයි ලෝභ, ද්වේශ, මෝහ කියන වැරදිවලින් වැළකීම. ඒ කියන්නේ යමෙක් මේ සිතින්, කයින්, වචනයෙන් සිදුවෙන්නා වූ වැරදි වලින් වැළකී ජීවත් වෙනවා නම් එතැන දී කියනවා අපි කුසලය තුළ ජීවත් වුනා කියන කාරණය. එහෙමනම් පින කියන්නේ කුමක්ද? සැපයට කියන තවත් නමක්. කුසලය කියා කියන්නේ මොකක්ද? මේ සිතින්, කයින් වචනයෙන් සිද්ධ කර ගන්නා වූ යහපත් දේ. අයහපත් දේ අකුසලය කියා කියනවා. නමුත් මේ වචන දෙකේ තේරුම් දෙක වෙනස් වුනාට මේ වචන දෙකේ අර්ථයෙන් එකට බැඳිලයි තියෙන්නේ. එකට බැඳී තිබෙන්නේ කෙසේද? යමෙක් සැපයෙන් ජීවත් වන්නේ කුමක් නිසාද? කුසල දහම් වඩන නිසයි. යමෙක් අසතුටෙන් ජීවත් වන්නේ කුමක් නිසාද? එයා අකුසල් දහම් වඩන නිසයි අසතුටෙන් ජීවත් වන්නේ. එසේ නම් මේ පින කියා කියන්නේ සැපයට කියන තවත් නමක්. ඒ වගේම කුසලය කියා කියන්නේ සිතින්, කයින්, වචනයෙන් සිදුකරන්නා වූ යහපත් දේ. එසේ නම් ඒ මහත්මයා ඇසූ ප්‍රශ්නය තමයි අපි මේ කරන්නා වූ පින වේවා, කුසලය වේවා අපි ඒ මොහොත්ම ඒ පින්කම් සිදු කරලා ඒ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් අත්හැර දානවද? එසේ නැත්නම් එය භවයේ අනාගත සැපය උදෙසා ප්‍රාර්ථනා කරනවාද යන කාරණය.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පින්වතුනි, අපි මේ ආවා වූ ගමනේ දී අතීතයේ සම්මා සම්බුදු ශාසන ලක්‍ෂ ගණනක් පසු කරලයි ඇවිත් ඉන්නේ කියල. බුදුරජාණන් වහන්සේගෙන් එක්තරා බමුණෙක් ඇවිත් අහනවා භාග්‍යවතුන් වහන්ස, අතීතයේ මේ ලෝකයේ බුදුරජාණන් වහන්සේලා කී නමක් පහළ වුනාද කියා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ නර්මදා නදියේ ඇති වැලි කැට සංඛ්‍යාව උපමාවට අරගෙන කියනවා මේ නර්මදා නදියේ තියෙන වැලිකැට සංඛ්‍යාව ගණනින් කියන්න බැහැ වගේ අතීතයේ පහළ වූ බුදුරජාණන් වහන්සේලා මෙපමණයි කියා ගණනින් කියන්න බැහැ කියා.

එහෙමනම් බලන්න අතීතයේ ලක්‍ෂ ගණනක් බුදුරජාණන් වහන්සේලා මේ ලෝකයේ පහළ වෙලා තියෙනවා පින්වතුනි. ඒ පහළ වුනා වූ සම්මා සම්බුද්ධ ශාසනවල අපි මනුෂ්‍යයෝ හැටියට ඉපදිලා අපි බුදුරජාණන් වහන්සේලා අරමුණු කරගෙන පූජා කර තිබෙන පහන් ආලෝකයන් එක පිඩක් කළොත් එය මේ හිරුගේ ආලෝකයට වඩා ප්‍රභාෂ්වරයි කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එතකොට මේ ආවා වූ දීර්ඝ භව ගමනේ දී අපි බුදුරජාණන් වහන්සේලා, සංඝයා අරමුණු කරගෙන පූජා කළා වූ දානයන් පූජා කළා වූ සුවඳ මල් එක ගොඩකට ගැසුවොත් එය ගිජ්ජකූඨ පර්වතයට වඩා විශාලයි කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ වගේම ඒ සම්මා සම්බුද්ධ ශාසනවල ඉපදිලා කඨින පූජාවන් සිද්ධ කරන වෙලාවේ පූජා කළා වූ කඨින වස්ත්‍ර එක ගොඩක් ගැසුවොත් එය ගිජ්ජකූඨ පර්වතයට වඩා විශාලයි කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එසේ නම් පින්වතුනි, සංසාරයක් පුරාවට අපි මෙපමණ පින්කම්, මෙපමණ කුසල් දහම් වඩලා තියෙනවා. නමුත් මේ කුසල් දහම් නිසාම, පින්කම් නිසාම මේ ලෝකයේ මනුෂ්‍යයෙක් හැටියට විඳින්න තියෙන සෑම සැපයක්ම අපි ලබලා තියෙනවා කියා බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ලෝකයේ මනුෂ්‍යයෙක් ලබන්න තිබෙන ශ්‍රේෂ්ඨ සැපය තමයි මේ සක්විති රජ කියන සැපය කියා. මේ මනුස්ස ලෝකයේ අවුරුදු 84,000 ක් ආයුෂ තිබෙන කාලයේ තමයි සක්විති රජ කෙනෙක් පහළ වෙන්නේ. එයාට බිසවක් පහළ වෙනවා දිව්‍ය තලයකින්, එයා බහින්නේ. පංච කල්‍යාණයන්ගෙන් බබළන ස්ත්‍රී රත්නයක් එයාට ලැබෙන්නේ. ඍද්ධියෙන් යන්න පුළුවන් අශ්වයෙක්, ඍද්ධියෙන් යන්න පුළුවන් ඇතෙක් ලැබෙනවා. ඒ වගේම මහ පොළොව යට ඇති ඕනෑම සම්පතක් දිවැසින් දකින්න පුළුවන් ඇමතියෙක් එයාට ලැබෙනවා කියනවා. ඒ වගේම පුත්තු දහසක් ලබනවා

කියනවා, මුළු ලෝකෙම දිග්විජය කරන්න. එහෙනම් බලන්න ඒ සා සම්පත් අප ලැබුවේ කුමක් නිසාද ? අප කළා වූ පින්කම්, කුසල් දහම් නිසාමයි.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ලෝකයේ යම් සැපයක් කියා දෙයක් තියෙනවා නම් ඒ සියලුම සැප සම්පත් සමග ශක්‍රයා කියන සැපයක් අපි අත්විඳලා තියෙන්නේ කියලා. ශක්‍රයාගේ සුජම්පති දේවිය කියන සැපයක් අපි සංසාරය පුරාවට අත් විඳලයි තියෙන්නේ. එහෙමනම් පින්වතුනි මේ ලෝක ධාතුව තුළ යම් සැපයක් ලබන්න තියෙනවා නම් ඒ සෑම සැපයක්ම අපි අත්විඳලයි තියෙන්නේ. එහෙමනම් නුවණින් දකින්න තමන් අතීතයේ සක්විති රජ වෙලා සිටියා නම්, තමන් අතීතයේ ශක්‍රයා වෙලා සිටියා නම්, තමන් අතීතයේ ස්ත්‍රී රත්නය වෙලා, සුජම්පතී වෙලා සිටියානම්, මේ ජීවිතයේ අප මේ ලබා තිබෙන දෙය කොයි සා කුඩා දෙයක් ද කියා. මේ සා ඉහළ සශ්‍රීක තැන් අප ලැබුවේ කුමක් නිසාද? අපි කළා වූ කුසල් දහම්, පින්කම් නිසාමයි.

බුදුරජාණන් වහන්සේ මේ මහපාර හරහා යන කඩිරැළක් පෙන්නලා ආනන්ද ස්වාමීන් වහන්සේට කියනවා ''ආනන්ද මේ කඩි රැළේ ඉන්න සෑම කඩියෙක්ම සංසාරයේ සක්විති රජ වෙලා තියෙනවා'' කියලා ... එහෙනම් බලන්න කඩියෙක් සක්විති රජවෙලා තියෙනවා නම් ඔබත්, මමත් සංසාරයේ කොපමණ නම් සක්විති රජවෙලා ඇති ද පින්වතුනි.

එහෙමනම් මේ සෑම සශ්‍රීක භාවයක්ම අපිට ලැබුණේ අපි කළා වූ කුසල් දහම් නිසාමයි. එහෙමනම් මේ කාරණා තුළින් අපි කුමක්ද දකින්නේ පින්වතුනි, කොයි සා කුසල් දහම් කරලත් අපි ප්‍රාර්ථනා කරන්නේ භවය නම්, අපි ඒ සංස්කාරයන්ට ඇලෙනවා නම්, අපිට අනිවාර්යෙන්ම භවයයි ලැබෙන්නේ පින්වතුනි, භවය ලැබුන නම්, උපතක් ලැබුණා නම් අනිවාර්යෙන්ම අපි ජාති, ජරා, ව්‍යාධි, මරණ වලට ලක්වෙන තැනකටයි අපි පත්වෙන්නේ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හැකිතාක් කුසල් දහම් වඩන්න. හැකිතාක් පින්කම් සිද්ධ කරන්න. පින්කම් සිද්ධ කරලා මේ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින්න.

දන් දානයක් පූජා කළොත් අපට මොකක්ද ලැබෙන්නේ. ආයුෂ, වර්ණය, සැපය, බලය. මේ හතර තමයි දානයක් තුළින් ලැබෙන්නේ. ඔබ මේ ජීවිතය තුළ ආයුෂ, වර්ණ, සැපය, බලය යන කාරණාවල් ලබලා තියෙනවානම් ඒ පෙර ජීවිතයේ පූජා කළා වූ

දානයන්ගේ ආනිසංසමයි පින්වතුනි, එහෙමනම් බලන්න මේ ආයුෂ. වර්ණය, සැපය, බලය නිත්‍ය වූ දෙයක්ද? නෑ දවසින් දවස, දවසින් දවස මේ ආයුෂ, වර්ණය, සැපය, බලය ගෙවී යනවා පින්වතුනි. ගෙවිලා යනවා කියන්නේ දානයේ සංස්කාරයන්ගේ අනිත්‍ය බව අපිට මතක් කරනවා.

ඒ වගේම මේ ශීලය තුළින් අපට මොකක්ද ලබලා දෙන්නේ. ඔබ මේ ලස්සන මනුෂ්‍ය ජීවිතය ලැබුනේ කුමක් නිසාද? පෙර ජීවිතයේ ඔබ සිල්පද පහ ආරක්ෂා කරගෙන ජීවත් වූ නිසයි. සිල්පද පහ ආරක්ෂා කරගෙන ජීවත් වීමේ ඵලය තමයි, ඔබ මේ ලැබුවා වූ මනුෂ්‍ය ජීවිතය. නමුත් දැන් බලන්න මේ මනුෂ්‍ය ජීවිතයක ආයුෂ ගෙවී ගෙවී යනවා කියන්නේ මොකක්ද? ගිය ජීවිතයේ රැස් කළා වූ ශීලයේ සංස්කාරයන් ගෙවී යනවා. මේ සංස්කාරයන් ගෙවිලා ගිහිල්ලා ගෙවිලා ගිහිල්ලා, මේ ජීවිතයේ අපි සෝවාන් ඵලයට පත්වුනේ නැත්නම් **''උපාදාන පච්චයා භවෝ''** කියන ධර්මතාවය යටතේ මැරෙන වෙලාවේ ද්වේශයක් සකස් වුනොත් අපි ආයිමත් සතර අපායන්ට වැටෙනවා පින්වතුනි. එහෙමනම් බලන්න මේ සංස්කාරයන්ට බැඳීම තුළ බරපතල භව අනතුරක් අපේ ජීවිතයේ ඉදිරියට තියෙනවා. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ ලොකයේ අපි විඳින්න තියෙන සෑම සැපයක්ම විඳලයි තියෙන්නේ. ඒ නිසා තවත් මේ භවයේ සැපයන් කෙරෙහි ලොල් වෙන්න එපා. මේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකිමින් විදර්ශනා නුවණ සකස් කර ගන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. පින්කමක් කරමින් ඒ පින්කමේ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින්න.

දැන් සිල් සමාදන් වුනොත් මොනවද අපට ලැබෙන ආනිසංස. සුගතියේ උපදිනවා, සිහි මුලා නොවී මැරෙනවා, අපේ කීර්ති රාවය පැතිරෙනවා, ඕනෑම සභාවක් ඉදිරියට නොබියව යනවා. අප්‍රමාදී භාවය ඇතිවෙනවා මේ කියන ආනිසංස නිත්‍යද, අනිත්‍යද? අනිත්‍යයි? මේ සෑම සංස්කාරයක්ම විපාක දීලා අනිත්‍ය වෙනවා. කොච්චර සුගතියේ ඉපදුනත් අපි ආයිමත් දුගතියට වැටෙන්න පුළුවන්. කොච්චර සිහිමුලා නොවී මැරුණත් අපි ආයිමත් සිහිමුලාවට වැටෙන්න පුළුවන්. කොච්චර මේ කීර්ති රාවය පැතිරුණත් එක මොහොතකින් මේ කීර්තිරාවය අහිමි වෙන්න පුළුවන්. කොච්චර අපි සභාවක් ඉදිරියට නොබියව ගියත් අපි දුශ්සීල භාවයට පත් වුනොත් සභාවක් ඉදිරියට යන්න බිය ඇති වෙන්න පුළුවන්. එහෙමනම් බලන්න මේ ශීලයේ සංස්කාරයන් අනිත්‍යයි. විපාක දීලා අනිත්‍ය වෙනවා. ඒ නිසා මේ සංස්කාරයන්ට බැඳෙන්න එපාය කියලයි බුදුරජාණන් වහන්සේ

දේශනා කරන්නේ. හැම වෙලාවකම දන් දෙමින්, සිල් ආරක්‍ෂා කරමින්, මෛත්‍රිය වඩමින්, සමාධිය වඩමින් මේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකින්න කියලා බුදුරාජාණන් වහන්සේ දේශනා කරනවා.

මේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකින මොහොතේම අන්න පින්වතුනි විදර්ශනා නුවණ සකස් වෙනවා. එතැන තමයි වටිනාකම. එහෙම නැතිව පින්කමක් සිද්ධ කරලා අපි ප්‍රාර්ථනා කරන්නේ නැවත මනුෂ්‍යයෙක් වෙන්න කියලා නම් ඒ අපි ප්‍රාර්ථනා කරන්නේ අනාගත පංචඋපාදානස්කන්ධයක්මයි. අපි දන්දීලා, ප්‍රාර්ථනා කරන්නේ නැවත දෙවියෙක් වෙන්න කියලා නම් ඒ අපි ප්‍රාර්ථනා කරන්නේ අනාගත පංච උපාදානස්කන්ධයක්මයි. ප්‍රාර්ථනා කරන්නේ පංචුපාදානස්කන්ධයක් නම් එතැන තියෙන්නේ දුකක්ය කියලයි බුදුරාජාණනන් වහන්සේ දේශනා කරන්නේ. ඒ නිසා හැකිතාත් කුසල් සංස්කාරයන් ජීවිතය තුළින් වඩන්න. ජීවිතය තුළින් වඩා ඒ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න.

ඔබ ඒ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින මොහොතක් පාසා ඔබ තුළ විදර්ශනා නුවණයි සකස් වෙන්නේ කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එතකොට ඔබ භවයට බැඳිලා යන්නේ නැහැ. ඕනෑම සංස්කාරයක අනිත්‍යය දකිමින් විදර්ශනා නුවණ සකස් කර ගන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ විදර්ශනා නුවණ සකස් කර ගෙන යන ගමනේ දී පින්වතුනි, අපිට නැවත භවයේ උපතක් සකස් වුනොත් අපිට මේ කළා වූ කුසල් වලට අදාළ සැපයක් ලැබෙනවා. අපි දූන් පිටකොටුවට ගොස් කතරගමට යන්න බස් එකකට නැග්ගොත් අපි ඒ කතරගම බස් එකේ ඉන්න කොන්දොස්තර මහත්මයාට මට ගාල්ල, මාතර, තිස්සමහාරාම, කතරගම කියා ටිකට් එකක් ඉල්ලන්නෙ නැහැ. අපි කතරගමට ටිකට් එකක් දෙන්න කියලයි ගන්නේ. කතරගම ටිකට් එක ගත්තහම මේ සියලු නගරයන් පසුකරගෙනයි යන්නේ. පින්වතුනි, ඒ නිසා ඕනෑම පින්කමක් නිවන අරමුණු කරගෙන සිද්ධ කරද්දී, නිවන් ලබන තාක්කල් භවයේ ලබන්න තිබෙන සැපයන් අපිට ලැබෙනවා. පින්වතුනි, නමුත් මේ භවයේ සැපයන් කෙරෙහි කෙලෙස් තෘෂ්ණාව සකස් කර ගන්න එපා. මොකද මේ ආවා වූ දීර්ඝ භව ගමන පින්වතුනි, බුදුරජාණන් වහන්සේලාගේ ශාසන ලක්‍ෂ ගණනක් පසුකරලා ආව ගමනක් කියා මම මතක් කළා. ඒ නිසා තවත් භවයේ සැපත කියන එක ප්‍රාර්ථනා කරන්න එපා!

මේ භවයේ තිබෙන්නා වූ කටුක භාවයම දකින්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ආවා වූ ගමනේ දී අපි අපේ අම්මලා, තාත්තලා වෙනුවෙන් හෙළු කඳුළු මහ සාගරයේ ජලයට වැඩියි කියලා. මේ බිරින්දෑවරු උදෙසා, ස්වාමි පුරුෂයන් උදෙසා අපි හෙළු කඳුළු මහ සාගරයේ ජලයට වැඩියි. කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අප්‍රිය දේවල් හා එක් වීම නිසා ප්‍රිය දේවල් අහිමිවීම නිසා අපි සංසාරයේ හෙළු කඳුළු මහා සාගරයේ ජලයට වඩා වැඩියි කියනවා.

එක් අවස්ථාවක දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ දඹදිව තිබෙන කෝටු කැලි ඔක්කොම එක ගොඩකට ගහන්න කියලා. මුළු දඹදිවම තිබෙන කෝටුකැලි. ඒ සෑම කෝටු කැල්ලක්ම මේ ඇඟිල්ලේ ප්‍රමාණයට කඩන්න කියනවා. එක කෝටු කැල්ල, එක කෝටු කැල්ල අයින් කරන්න කියනවා. මේ මගේ මේ ජීවිතයේ අම්මා, මේ මගේ ගිය ජීවිතයේ අම්මා, මේ මගේ ගිය ජීවිතයේ අම්මා කියලා. කෝටු කැලි ප්‍රමාණය ඉවර වෙනවා කියනවා. අම්මලාගේ ප්‍රමාණය ඉවර වෙන්නේ නැහැ කියනවා. එහෙමනම් මේ සංසාර බය, මේ සංසාර ගැඹුර දකින්න පින්වතුනි, මේ සංසාර බය, මේ සංසාර ගැඹුර දැකලා මේ නැවත වතාවක් භවය කෙරෙහි තිබෙන තෘෂ්ණාවෙන් අත් මිදෙන්න. ඒ තෘෂ්ණාවෙන් අත්මිදෙන්න නම් ඔබ අනිවාර්යයෙන්ම මේ සෑම පින්කමක්ම සිද්ධ කරමින් මේ සෑම කුසල් දහමක්ම වඩමින් ඒ කුසල් දහම් වලින් රැස්වෙන්නා වූ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් විදර්ශනා නුවණ සකස් කර ගන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

<u>ප්‍රශ්නය</u>

***39. ගෞරවනීය ස්වාමීන් වහන්ස, භාවනා කිරීමේ දී සිත එක අරමුණක පිහිටුවන්නට කොපමණ උත්සාහ කළත් එම උත්සාහය අසාර්ථක වන්නේ උත්සාහය මදිකම නිසාද, නැත්නම් පින් මදිකම නිසාද?***

<u>පිළිතුර</u>

සමහරු භාවනා කරන්නට යද්දී අපිට මතක් කරනවා, ස්වාමීන් වහන්ස මේ සිත නිරතුරුවම විසිරෙනවා කියලා. සිත විසිරෙනවාය කියන කාරණය, සිත විසිරෙන්න හේතුව සිත විසිරෙනවා කියන්නේ, සිත දුවනවාය කියන්නේ සිත දුවන්නේ රූපයක් පසුපසමයි. කාගෙ සිත දිව්වත් ඒ හිත දුවන්නේ රූපයක් පසුපසමයි. එහෙමනම් රූපයන් කෙරෙහි

ඇතිකර ගන්නා වූ තෘෂ්ණාව නිසාමයි, පින්වතුනි, මේ භාවනාව කරන්න ගිය පසු තමන්ගේ සිත එහාට මෙහාට දුවන්නේ. ඒ නිසා භාවනා කරන්න යන්න ඉස්සර වෙලා මේ භාවනා මාර්ගය බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් හැටියටයි හඳුන්වන්නේ. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල්ම මාර්ග අංගය තමයි සම්මා දිට්ඨිය. සම්මා දිට්ඨියෙන් පටන් ගත්ත ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා සතිය කියන කාරණය සකස් වෙන්නේ හත්වෙනි මාර්ග අංගය හැටියටයි පින්වතුනි. එහෙමනම් මේ සම්මා සතිය සකස් කර ගන්න නම් අනිවාර්යෙන්ම මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල් මාර්ග අංග හය තමා තුළ වැඩෙන්න ඕනේ.

ඒ නිසා යමෙක් භාවනා කරද්දී හිත දුවන ස්වභාවයක් තිබෙනවා නම් ඊට හේතුව තමයි මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල් මාර්ග අංග හයේ වැඩීමේ දුර්වලතාවයන්. ඒ නිසා තමන් නිරතුරුවම ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩෙන දිශාවට ගමන් කරන්න. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල් මාර්ග හයේ ඵලය තමයි සම්මා සතිය කියා කියන්නේ. එහෙමනම් යහපත් සිහියක් ඇති කරගන්න නම් ඒක ඉබේම වෙන්නේ නැහැ. අප තුළ සම්මා දිට්ඨිය සකස් වී නැත්නම් අප තුළ කවදාවත් සම්මා සංකප්පයන් සකස් වෙන්නේ නැහැ. අප තුළ සම්මා සංකප්පයන් සකස් වෙන්නේ නැත්නම් කවදාවත් සම්මා වාචාවක් සකස් වෙන්නේ නැහැ. සම්මා වාචාවක් සකස් වෙන්නේ නැත්නම් සම්මා කම්මන්තයක් සකස් වෙන්නේ නැහැ. සම්මා කම්මන්තයක් සකස් වෙන්නේ නැත්නම් සම්මා ආජීවො, සම්මා වායාමෝ, සම්මා සතියක් සකස් වෙන්නේ නැහැ. පින්වතුනි, මේ සියල්ලම හේතුඵල ධර්මයන්. ඒ නිසා මේ හේතුඵල ධර්මයන් දකිමින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩෙන දිශාවට ගමන් කරමිනුයි, අපි භාවනාවක් කරා යන්න ඕනේ.

ඒ වගේම යමෙක් භාවනා කරනවා නම් මුලින්ම දකින්න ඕනේ පින්වතුනි, තමන් මේ පුරුදු වෙන්නෙ නෙවෙයි භවනා කරන්නේ කියා. මේ සංසාරයේ පළමුවෙනි වතාවට නෙවෙයි ඔබලා භාවනා කරන්නේ කියා. මොකද අපි සම්මා සම්බුද්ධ ලක්ෂ ගණනක් පසුකරගෙන ආවා පින්වතුනි, මේ සම්මා සම්බුද්ධ ලක්ෂ ගණනක දි ඔබලා මෛත්‍රී ධ්‍යාන ලබලා මෙතැන ඉන්න හැම කෙනෙක්ම ඍද්ධියෙන් ගිහින් තියෙනවා පින්වතුනි. ඔබලා රූපාවචර, අරූපාවචර පළවෙනි, දෙවෙනි. තුන්වෙනි, හතරවෙනි ධ්‍යාන වල උපත ලබලා, ඔබලා රූපාවචර බ්‍රහ්ම තලවල කල්ප ගණන් උපත ලබලා තිබෙනවා. ඔබලා අරූපාවචර ධ්‍යාන ලබලා අරූපාවචර බ්‍රහ්ම තලවල කල්ප ගණන් ජීවත් වෙලා තිබෙනවා. පින්වතුනි.

එහෙමනම් බලන්න අපි මේ පුරුදු වෙන්න භාවනා කරනවා නොවේ. අතීතයේ මේ භාවනාවන් නිසා සෘද්ධියෙන් ගිය පිරිසක් අපි. එහෙමනම් ඒ සා සංසාරයේ අපි භාවනා කරලා තිබෙනවා පින්වතුනි. ඒ සා භාවනා කළත් අපි ඒ භාවනාව භව නිරෝධය කරා සම්මා සතියක්, සම්මා සමාධියක් බවට පත්කර ගත්තේ නැහැ පින්වතුනි. ඒක හොඳට තේරුම් ගන්න ඕනේ. මෙතැන වැදගත් වන්නේ සතිය කියන කාරණය නොවේ. සම්මා සතියයි. සතියයි, සම්මා සතිය අතර අහසයි, පොළොවයි වගේ වෙනසක් තිබෙනවා පින්වතුනි.

සතිය කියන දේ මුස්ලිම් පල්ලියක සිටින මහත්මයෙකු තුළත් තිබෙන්න පුළුවන්. සතිය කියන දේ ක්‍රිස්තියානි පල්ලියක මහත්මයෙක් තුළත් තිබෙන්න පුළුවන්. නමුත් සම්මා සතිය කියන්නේ බෞද්ධයෙකුට ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ එලයයි පින්වතුනි, එහෙමනම් සතිය පසුපස නොවේ අප යා යුත්තේ, සම්මා සතිය පස්සෙයි. සම්මා සතියත්, සතියත් කියන්නේ අහසත්, පොළොවත් වගේ පරතරයක් ඇති දෙයක් කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

ඔබ හිතන්න හරකෙක් ඉන්නවා. ඒ හරකව අපි ලෙහෙලා දානවා. ලෙහෙලා දැම්මොත් මොකද කරන්නේ. එයා වටේම තිබෙන ගොයම් පැල ටික, කෙසෙල් පැල ටික කනවා පින්වතුනි. අපි එයාව මීටර් 10 ක කඹයකින් බඳිනවා. බැන්දොත් මොකද වෙන්නේ එයා මීටර් 10 ප්‍රමාණයට තමයි දුන් කන්නේ. මීටර් 10 කඹයත් අයින් කරලා අපි එයාව මීටර් 5 කඹයකින් බඳිනවා. දැන් මොකද වෙන්නේ, එයා මීටර් 5 ප්‍රමාණයටයි කන්නේ. පින්වතුනි, ඒ මීටර් 5 කඹෙත් අයින් කරලා අපි එයා කණුවටම බෙල්ල තියලා බඳිනවා. එයා කණුවට බෙල්ල තියලා බැන්දත් මෙයා වටේ පිටේ තියෙන කෙසෙල් පැළ, ගොයම් පැළ, දිහා බලමින් කෙල ගිලිමින් තමයි ඉන්නේ. ලණුව කඩාගන්නේ කොහොමද කියලා දකිමින් තමයි ඉන්නේ. මොකද සම්මා සතිය සකස් වුනේ නැහැ. තෘෂ්ණාව ක්‍ෂය වුනේ නැහැ. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල් මාර්ග අංග හය වැඩුනේ නැහැ. එහෙමනම් එතැන තමයි සතිය කියලා කියන්නේ. ඒ සතිය තුළ තෘෂ්ණාව සැඟවිලා තිබෙනවා පින්වතුනි. සම්මා සතිය කියන්නේ කුමක්ද? සම්මා සතියේ දීත් එයා මේ කණුවට බෙල්ල තියලා බැඳිලා තමයි ඉන්නේ. නමුත් එයා වටපිටාවේ තිබෙන කෙසෙල් පැළ, ගොයම් පැළ දිහා බල බලා කෙළ ගිලින්නේ නැහැ පින්වතුනි. මොකද එයා තෘෂ්ණාව ක්‍ෂය කරගන්නා වූ ගමනක යන්නේ. එයා රූපයේ අනිත්‍ය භාවය දකිනවා. එයා වේදනාවේ අනිත්‍යභාවය දකිනවා. ඒ නිසා එයා කවදාවත් කණුවට බෙල්ල තියලා බැඳලා තිබ්බත් ලණුව කඩා ගන්න හදන්නේ නැහැ. වටපිටාවේ දේවල් වලට

කෙළ ගිලින්න යන්නේ නැහැ පින්වතුනි. එහෙමනම් සතියත්, සම්මා සතියත් අතර තිබෙන වෙනස තමයි මේ.

මේ නිසා යමෙක් භාවනා කරන්න යද්දී ඔබේ හිත දුවනවා නම් ඔබ නිරතුරුවම සංසාර බය දකින්න. සංසාරය මේ කොපමණ ගැඹුරු, කොපමණ විෂම, සංසාර ගමනක් ද අපි මේ යන්නෙ කියන කාරණය දකින්න. මේ සාසාර බය අපට සකස් කරලා දෙන්නේ සම්මා දිට්ඨිය විසින්මයි පින්වතුනි. සම්මා දිට්ඨියෙන් අපි පරිපූර්ණ නැත්නම් කවදාවත් සංසාර බිය කියන දේ සකස් වෙන්නේ නැහැ. අපි හිතන්නේ අපිට ගිය ජීවිතයත් තිබුණා. ඊට පස්සේ මරණින් පසු තව ජීවිතයක් ඇතියි කියන කාරණයයි.

අර සා සම්මා සම්බුද්ධ ශාසන ලක්‍ෂ ගණනක් පසුකර ගෙන අර සා අප්‍රමාණ දුක් කන්දරාවක් විඳගෙන ආවා කියන කාරණය අපි දකින්න ඕනේ. ඒ නිසා මේ සංසාර බය දකින්න. සංසාර බය දකිමින් මේ ජීවිතයේ අපිට ධර්මයෙන් ප්‍රයෝජනයක් ගන්න බැරි වුනොත් පින්වතුනි, ආයිමත් සම්මා සම්බුද්ධ ශාසනයක් ලැබෙන්නේ තව අවුරුදු ලක්‍ෂ විසි පහක් පමණ ගිය පසුවයි. මොකද මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහල වෙන්න අවම වශයෙන් තව අවුරුදු ලක්‍ෂ විසිපහක් වත් යනවා පින්වතුනි. මොකද මනුෂ්‍යාගේ පරම ආයුෂ අවුරුදු 80,000 ක් කියන තැනදීයි මෛත්‍රී බෝධිසත්ත්වයන් පහළ වෙන්නේ. දැන් බලන්න අපේ බුදුරජාණන් වහන්සේගේ කාලයේ පරම ආයුෂ අවුරුදු 120 යි. අද වෙන කොට පරම ආයුෂ අවුරුදු 70ක වගේ තැනට අඩුවෙලා තිබෙනවා. එහෙමනම් අවුරුදු 2600 ක් තුළ අවුරුදු 50 ක් ආයුෂ අඩු වුණා. අවුරුදු 2600 ක් තුළ අවුරුදු 50 ක් ආයුෂ අඩුවීමේ වේගය අනුව ගණනය කරන කොට අඩු 80,000 ක් වයස තියෙන මනුෂ්‍යයෝ බිහිවෙන්න නම්, තව අවුරුදු ලක්‍ෂ 25 ක් වත් යනවා පින්වතුනි, ඒ කියන්නේ තව අවුරුදු ලක්‍ෂ 25 ක් අබුද්ධෝත්පාද කාලයක්. ධර්මයක් නැහැ. සංඝයා කියන වචනය නැහැ. බුද්ධ කියන වචනය නැහැ. කොතැන ඉපදුනත් එතන දුකමයි පින්වතුනි,

අබුද්ධෝත්පාද කාලය කියන්නේ මාරයාගේ ග්‍රහණය තුළ, මාරයාගේ පාලනය තුළ තියෙන කාලය. බුදුරජාණන් වහන්සේ කියනවා ඒ කාලයට දිව්‍යතල හිස් වෙනවා කියා. දිව්‍යතල හිස්වෙලා දෙවියන් තුළත් ලෝභ, ද්වේශ, මෝහ අකුසල් මූලයන් සකස් වෙලා දෙවියනුත් දුශ්සීල මනුෂ්‍යයින් බවට, ප්‍රේතයින් බවට, යක්‍ෂයින්, නිරි සතුන්, තිරිසන් සතුන්

බවට පත්වෙනවා කියනවා පින්වතුනි, එහෙමනම් කොතනකදීවත් පින්වතුනි, සංසාරයේ අබුද්ධෝත්පාද කාලයකින් ගැලවීමක් ලැබෙන්නේ නැහැ.

ඒ සංසාර බය දකින්න. මේ සංසාර බය දැකලා මේ සංසාර බයෙන් එතෙර වෙනවාය කියා සිතන තැන දී භාවනාවට වාඩිවෙන්න. වෙන දේවල් හිතන්න යන්න එපා. මේ සා ගැඹුරු ගමනක්, මේ සා දුක්ඛිත ගමනක් බව මම පසුකර ඇවිත් තිබෙනවා. ඒ ආවා වූ දුක්ඛිත ගමනේදි මම එළුවෙක් වෙලා, ඌරෙක් වෙලා, කුකුළෙක් වෙලා, හරකෙක් වෙලා මගේ බෙල්ල කපල මරපු වෙලාවේ ගලාගිය රුධිරය මහ සාගරයේ ජලයට වඩා වැඩියි කියා බුදුරජාණන් වහන්සේ කියනවා. ඒ සා තිරිසන් කුලවල ඉපදිලා අපේ බෙල්ල කපන වෙලාවේ මහා සාගරය තරම් රුධිරය ගලලා තියෙනවා පින්වතුනි, මේ සංසාර බය දකින්න. මේ සංසාර බය දකිමින් මේ මොහොතේ ධර්මයේ ඵලයන් ලබාගන්න බැරි වුනොත් අනාගතයේ දී වැටෙන්නා වූ සංසාරයේ බියකරු බව දකින්න. මේ සංසාර බය දකිමින් ඔබ භාවනාවට වාඩිවෙන්න. එතකොට ඔබේ හිත විසිරෙන්නේ නැහැ පින්වතුනි.

ඒ සංසාර බය නොදකින තාක් කල් ඔබ භාවනා කරන්න යන්නේ තාවකාලිකව, මානසිකව සුවයක් උදෙසා නම්, තාවකාලිකව තිබෙන ප්‍රශ්නයක් මගහරවා ගැනීම උදෙසා නම් මම මේ කියන ධර්මය අදාළ වෙන්නේ නැහැ පින්වතුනි. ඒවා උදෙසා භාවනා කරන ධර්මයක් බුදුරජාණන් වහන්සේ අපට දේශනා කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ මේ උතුම් මාර්ගය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය දේශනා කරන්නේ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් උතුම් ඵලයන් උදෙසාමයි පින්වතුනි, ඒ නිසා ඔබ මොන භාවනාවක් කළත් මුලින්ම බුද්ධානුස්සතියෙන් ජීවිතය පටන් ගන්න. මොකද බුදුරජාණන් වහන්සේයි මුල් වන්නේ, ධර්මරත්නයයි, සංඝරත්නයයි මුල් වන්නේ, ඒ නිසා බුද්ධානුස්සතියෙන් නිරතුරුවම ජීවිතය පටන් ගන්න. බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ගුණයන් සිහිපත් කරන්න. **ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ ලෝක විදූ** මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ගුණයන් සිහිපත් කර ගන්න. මෙහෙම සිහිපත් කරගෙන ආයිමත් බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ඥාණයන් සිහියට නගා ගන්න. **''දුක්ඛෙ ඤාණං, බුද්ධ ඤාණං ... දුක්ඛ සමුදයෙ ඥාණං, බුද්ධ ඥාණං, දුක්ඛ නිරෝධ ඥාණං, බුද්ධ ඥාණං, දුක්ඛ නිරෝධගාමිණී පටිපදාය ඥාණං, බුද්ධ ඥාණං''....**

ඒ අනන්ත වූ බුදුරජාණන් වහන්සේලාගේ ඥාණයන්ගෙන් සිත පුරවා ගන්න. දැන් ඔබ බුද්ධානුස්සතියෙන් ජීවිතය පුරවා ගෙනයි තිබෙන්නේ. දැන් ඔබ හිතන්න ඔබ චිරාත් කාලයක් ජීවත් වෙලා මැරෙන වෙලාව එනවා. මැරෙන වෙලාවේ එකපාරටම ඔබේ සිත බුදුගුණයකට යනවා පින්වතුනි. මොකද ඔබ බුද්ධානුස්සතිය පුහුණු කරපු කෙනෙක්. මැරෙන වෙලාවේ එක පාරට බුදුගුණයක් තමයි සිහිපත් වන්නේ. මොකද ඔබට වෙන්නේ. ඔබ සුගතියේ උපතක් සකස් කර ගන්නවා. සුගතියේ උපතක් සකස් කරගත්තා. භව නිරෝධයකට ඔබ ගියේ නැහැ පින්වතුනි. මෙච්චර කාලයක් සංසාරයේ බුදුගුණ වඩලා අපි මැරෙන වෙලාවේ බුදුගුණයක් සිහිපත් කරගෙන නැවත දෙව්යෙක් වුනා, නැවත මනුෂ්‍යයෙක් වුනා පින්වතුනි. ඒ නිසා ඒ කළ දේ ආයිමත් කරන්න ලෑස්ති වෙන්න එපා. ආයිමත් කරන්න ලෑස්ති වුනොත් ආයිමත් සුගතියේ දිව්‍ය නැත්නම් මනුෂ්‍ය උපතක් කරායි අපි යන්නේ. ඒ නිසා ඔබ මුලින්ම පුහුණුවෙන කොට බුද්ධානුස්සතිය පුහුණු වෙන්න. බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, ඥාණයන් සිහිපත් කරමින් බුද්ධානුස්සතියෙන් ජීවිතය පුරවා ගන්න. බුද්ධානුස්සතියෙන් ජීවිතය පුරවාගෙන ඊට පසුව බුද්ධානුස්සතියත් විදර්ශනා නුවණින් දකින්න පින්වතුනි, එතැන තමයි දක්‍ෂභාවය. බුද්ධානුස්සතිය විදර්ශනා නුවණින් දකින්නෙ කොහොමද?

දැන් බුද්ධානුස්සතියෙන් ජීවිතය පුරවාගෙනයි ඉන්නේ. දැන් එහෙම ඇස් දෙක පියාගෙන ඔබ නුවණින් මෙනෙහි කරන්න අතීතයේ බුදුරජාණන් වහන්සේලා ලක්‍ෂ ගණනක් පහළ වුනා. ඒ සෑම බුදුරජාණන් වහන්සේ කෙනෙක්ම පිරිනිවී ගියාය කියන කාරණය නුවණින් දකින්න. අතීතයේ සම්මා සම්බුද්ධ ශාසන ලක්‍ෂ ගණනක් පැවතුනා. ඒ සෑම ශාසනයක්ම අතුරුදහන් වෙලා ගියාය කියන කාරණය නුවණින් දකින්න. අතීතයේ සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනෙදි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිවුවණක් පිරිස කෝටි ගණනක් ජීවත් වුනා. ඒ සෑම කෙනෙක්ම පිරිනිවී ගියා, අනිත්‍ය භාවයට පත් වුනා කියන කාරණය නුවණින් දකින්න. අපේ බුදුරජාණන් වහන්සේ උතුම් වූ සම්මා සම්බුද්ධ ඥාණය අවබෝධ කරගත්තා කියන කාරණය නුවණින් දකින්න. අපේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන වෙලාවේ ඒ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයන්ගෙන් බබළන සම්මා සම්බුද්ධ රූපකායන් අනිත්‍ය භාවයට පත් වුනා. අළු ගොඩක්, ධාතූන් වහන්සේලා ගොඩක් වුනාය කියල නුවණින් දකින්න. ඒ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂ ගණනක් පාරමී දම් පුරලා අවබෝධ කොට ගත්තා වූ සම්මා සම්බුද්ධ ඥාණයන් පිරිනිවන් පාන මොහොතේ අනිත්‍ය භාවයට පත් වුනාය කියන කාරණය නුවණින් දකින්න. ඒ වාගේම මේ ශාසනය අතුරුදහන් වෙලා

කාසායකණ්ඨකලාගේ ලෝකය, කහපාට නූලක් අතේ බැඳගත්ත කාසායකණ්ඨකලාගේ අනාගත ලෝකය නුවණින් දකින්න.

අන්න බුද්ධානුස්සතිය විදර්ශනා නුවණින් දැක්කා වෙනවා. එතැන තමයි විදර්ශනා නුවණ, ප්‍රඥාව කියන කාරණය සකස් වෙන්නේ. මොකද යමෙක් මේ භව ගමනේ ලබන්න තිබෙන මුල්ම ජයග්‍රහණය තමයි සෝවාන් ඵලයට පත්වෙනවාය කියන කාරණය. ඔබ සෝවාන් ඵලයට පත්වෙන්න නම් මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ සම වෙන්න ඕනේ පින්වතුනි. මොනවද මේ ඉන්ද්‍රිය ධර්මයන්. ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා. මේ ඉන්ද්‍රිය ධර්මයන් පහ සමවෙන තැනයි, ඔබව සෝවාන් ඵලයට පත් වෙන්නේ. ඒ නිසා ශ්‍රද්ධාව වැඩෙන්න ඕනේ ප්‍රඥාව මෝදු කරගෙනයි. ශීලය වැඩෙන්න ඕනේ ප්‍රඥාව මෝදු කරගෙනයි. මෛත්‍රිය වැඩෙන්න ඕනේ ප්‍රඥාව මෝදු කරගෙනයි. සමාධිය වැඩෙන්න ඕනේ ප්‍රඥාව මෝදු කරගෙනයි. ප්‍රඥාව මෝදු වන්නේ කුමක් තුළින්ද? මේ උතුම් ධර්මතාවයන් විදර්ශනා නුවණින් දැක්කොත් විතරයි පින්වතුනි. එහෙමනම් මුලින්ම බුද්ධානුස්සතිය තුළ ශක්තිමත් වෙන්න. ශක්තිමත් වෙලා බුද්ධානුස්සතියන් විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වෙන්න.

ඊළඟට බුදුරජාණන් වහන්සේ මෛත්‍රී භාවනාව ගැන කියනවා. ඒ කියන්නේ මෛත්‍රිය වඩමින් අපි මුලින්ම මම සුවපත් වේම්වා! නිදුක් වේම්වා! නිරෝගී වේම්වා! කියා තමාට මෛත්‍රී වඩනවා. මගේ කයේ දුක් දුරු වී සිතේ දුක් දුරු වී නිදුක් වෙම්වා! නිරෝගී වෙම්වා! සුවපත් වෙම්වා! කියා තමා තමාටම මෛත්‍රී කර ගන්නවා.

ඊට පසුව සියලු සත්ත්වයෝ කයේ දුක් දුරු වී, සිතේ දුක් දුරු වී නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! කියා මුළු ලෝකයාට මෛත්‍රී පතුරුවනවා. එයිනුත් ඉස්සරහට ගොස් දස දිශාවන්හිම සත්ත්වයන් නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! කියා ප්‍රාර්ථනා කරනවා. උතුරු දිශාවේ, දකුණු දිශාවේ, නැගෙනහිර, බටහිර, අනුදිශා හතරේ, උඩු දිශාව, යට දිශාව කියන දස දිශාවේම සත්ත්වයන් කයේ දුක් දුරු වී, සිතේ දුක් දුරු වී, නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! කියා මෛත්‍රී වඩනවා. දැන් මෙහෙම මෛත්‍රී වඩමින් ඔබ හිතන්න ඔබ හොඳින් මෛත්‍රී පුරුදු කරපු කෙනෙක්. ඔබ කවදාහරි චිරාත් කාලයක් ජීවත් වෙලා මැරෙන වෙලාවට එක පාරටම මෛත්‍රී චිත්තයකට හිත යනවා. මෛත්‍රී චිත්තයකට හිත ගිය ගමන් මොකද වෙන්නේ ඔබ ගිහිල්ලා දිව්‍ය, මනුෂ්‍ය

උත්පත්තියක් සකස් කර ගන්නවා. සුගතියේ උපතක් පින්වතුනි. භව නිරෝධයකට ගියේ නැහැ. ඒ නිසා මෛත්‍රිය වඩමින්, මෛත්‍රියත් විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වෙන්න ඕනේ. මෛත්‍රිය විදර්ශනා නුවණින් දැක්ක තැනයි ප්‍රඥාව කියන කාරණය තමා තුළින් මෝදු වෙන්නෙ.

පින්වතුනි, මෛත්‍රිය විදර්ශනා නුවණින් දකින්නෙ කොහොමද? මෛත්‍රිය වැඩීම නිසා අපිට ලැබෙන්නේ මොනවාද? බුදුරජාණන් වහන්සේ කියනවා මෛත්‍රියෙන් ලැබෙන්නා වූ ආනිසංස එකොළහක් තියෙනවා කියලා. ඒවා අංගුත්තර නිකායේ මෛත්‍රිය සූත්‍රයේ මෙන්න මේ විදිහට දක්වලා තියෙනවා.

1. සුවසේ නින්ද යාම.
2. නපුරු සිහින නොපෙනීම.
3. සුවසේ නින්දෙන් පිබිදීම.
4. සෑම මනුෂ්‍යයෙකුටම ප්‍රිය වීම.
5. දෙවියන්ට ප්‍රිය වීම.
6. දෙවියන් විසින් ආරක්ෂා කරනු ලැබීම.
7. ගින්නෙන්, විෂෙන්, ආයුධ වලින් අනතුරු නොලැබීම.
8. ඉක්මනින් සිත සමාධියට පත් වීම.
9. මුහුණේ පැහැය බැබළීම.
10. සිහි මුලා නොවී මරණයට පත් වීම.
11. ඒ ජාතියේ දී ම රහත් වීමට නොහැකි නම් මරණින් මතු බඹ ලොවට යා හැකි වීම.

පින්වතුනි, මේ තමයි මෛත්‍රියේ ආනිසංස. ඔබ කොච්චර මෛත්‍රිය වැඩුවත් ඔබට ලැබෙන්නේ ඔය ආනිසංසයි. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ සෑම ආනිසංසයක්ම විපාක දීලා අනිත්‍ය භාවයට පත්වෙනවා කියලා. එහෙමනම් ඔබ හැකිතාත් මෛත්‍රිය වඩන්න. හැකිතාත් මෛත්‍රිය වඩමින් ඒ මෛත්‍රී සිතින්ම මේ මෛත්‍රියේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකින්න. සංස්කාරයන්ට බැඳෙන්න එපා. සුගතියට බැඳෙන්න එපා. මේ මෛත්‍රියේ සංස්කාරයන්ට බැඳෙන මොහොතෙම ඔබ නැවත භවයේ උපතක් කරා ජීවිතය අරගෙන යනවා පින්වතුනි. ඒ වගේම බුද්ධානුස්සතිය වඩලා බුද්ධානුස්සතිය විදර්ශනා නුවණින් දකින්න. මෛත්‍රිය වඩලා මෛත්‍රිය විදර්ශනා නුවණින් දකින්න.

ඒ වාගේම ආනාපාන සතිය තුළින් සමාධිමත් සිතක් සකස් කර ගන්න. සමාධිමත් සිතක් ඇති කරගෙන බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ආශ්වාසයේ දිග භාවය, කෙටි භාවය දකිමින් ජීවත් වෙන්න කියලා. දැන් ඔබ එරමිණියා ගොතාගෙන කය ඍජුව තබාගෙන වාඩිවෙලා ඔබ මේ ආශ්වාසයට හිත යොමු කරන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මුලින්ම මේ ආශ්වාසයේ දිග භාවයයි සකස් වෙන්නේ. මේ ආශ්වාසයේ දිග භාවය දකිමින් ජීවත් වෙන්න කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. ක්‍රමානුකූලව මේ ආශ්වාසයේ දිග භාවය කෙටිවෙනවා. ඒ කෙටි ස්වභාවය දකිමින් ජීවත් වෙන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මේ කෙටි ස්වභාවයත් ක්‍රමානුකූලව හීනවෙලා ඔබට දැන් නාසයෙන් ආශ්වාස ප්‍රාශ්වාසයත් නොදැනෙන තැනට එනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ සංහිඳීම කියන තැනට. දැන් තමාට නාසයෙන් ආශ්වාස, ප්‍රාශ්වාසයත් දැනෙන්නෙ නැහැ. නමුත් මේ සියුම් ආශ්වාස ප්‍රාශ්වාස කයත් මේ උදරය හරහා ක්‍රියාත්මක වෙනවා කියලා තමන්ට දැනෙනවා කියනවා. එතැන සංහිඳීම කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. මේ සංහිඳීම දකිමින් ජීවත් වෙන්න කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. මේ සංහිඳීමත් දකිමින් ජීවත් වෙනකොට උපේක්ෂාව කියන තැනට සිත එනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මෙන්න මේ උපේක්ෂාව ඇලීම්, ගැටීම් වලින් තොර තැනේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ආනාපානසති සමාධිය විදර්ශනාවට යොමුකරගන්න කියලා. එහෙම නැතිනම් ඔබ මේ සමාධියේ ආශ්වාදයට බැඳුනොත්, මේ ධ්‍යානයන්ගේ ආශ්වාදයට බැඳුනොත්, ඔබ පළවෙනි, දෙවෙනි, තෙවෙනි, සතරවෙනි ධ්‍යාන තල ස්පර්ශ කරන්න දක්ෂ කෙනෙක් නම්, ඔබ ධ්‍යාන කෙරෙහි තෘෂ්ණාව සකස් කර ගත්ත කෙනෙක් නම් ඔබ මැරෙන වෙලාවේ සිත එකපාරටම ධ්‍යානයකට යන්න පුළුවන් පින්වතුනි. මැරෙන වෙලාවෙම ඔබ එක පාරටම 1 වෙනි ධ්‍යානයට හිත ගන්නවා. මොකද ධ්‍යාන වඩලා පුරුදුයි. 1 වෙනි ධ්‍යානයට හිත ගත්ත ගමන් ඔබ ගිහිල්ලා රූපාවචර බ්‍රහ්ම තලයක උත්පත්තියක් ලබනවා. භව නිරෝධයක් පැත්තට ගියේ නැහැ. සෝවාන් ඵලයට පත් වුනේ නැහැ.

රූපාවචර බ්‍රහ්ම තලයේ ඉපදිලා කල්ප ගණනක් හෝ ගිහිල්ලා ඔබ ආයිමත් සතර අපායට වැටෙනවා පින්වතුනි. සංසාරයේ මේ වැරැද්ද අපි මෙපමණ කාලයක් කරලා තියෙනවා. මොකද අපි බුද්ධානුස්සතිය වඩමින් බුද්ධානුස්සතියට බැඳිලා ගියා. මෛත්‍රිය

වඩමින් මෛත්‍රියේ ආනිසංසවලට බැඳිලා ගියා. සමාධිය වඩමින් සමාධියේ ධ්‍යාන තලවලට බැඳිලා ගියා. ඒ නිසා අපි දක්‍ෂ වෙන්න ඕනේ, සමාධිය තුළින් ධ්‍යාන තල සකස් කරගෙන ඒ ධ්‍යාන තලයන්ගේ අනිත්‍යභාවය දකලා විදර්ශනා නුවණ කියන කාරණය සකස් කරගන්න. පින්වතුනි, මෙන්න මේ මාර්ගය තුළ ඔබ ගමන් කළොත් මුලින්ම සංසාර බය දකින්න. අතීතයේ ගෙවාගෙන ආවා වූ සංසාරයේ බියකරු බව දකින්න. අනාගතයේ අපිට වැටෙන්න තිබෙන්නා වූ සංසාරයේ බියකරු බව දකින්න. අතීතයේ මම භාවනා කරලා මේ සා උසස් තැන්වල සිටියා කියන කාරණය නුවණින් දකින්න. දකලා මේ භවය කෙරෙහි තිබෙන්නා වූ තෘෂ්ණාව සිඳෙන දිශාවට සංසාර භය සකස් කර ගනිමින් ඔබ භාවනාවට වාඩිවෙන්න. එතකොට සිත දුවන ස්වභාවය නැතිවේවි.

එහෙමත් වාඩිවෙලා ඔබේ සිත දුවනවානම් ඒ සිත දුවන්නේ රූපයක් පසුපසමයි පින්වතුනි. එක්කො බිරිඳ කියන රූපයට වෙන්න පුළුවන්. එක්කෝ ස්වාමිපුරුෂයා කියන රූපයට වෙන්න පුළුවන්. එක්කෝ නිවස ගැන, පිටරට සිටින දරුවා කියන රූපය ගැන, මොකක් හෝ රූපයකටයි සිත දුවන්නේ පින්වතුනි.

මෙන්න මේ දුවන රූපය මොකක්ද කියලා වෙන්ව හඳුනාගෙන ඒ රූපය වෙන්ව අරගෙන විදර්ශනාවට ලක් කරන්න. දැන් ඔබේ සිත දුවන්නේ දරුවා කියන රූපයට නම් ඔබ ඒ දරුවා කියන රූපය වෙන්ව අරගෙන නිරතුරුවම දරුවා කියන රූපය විදර්ශනාවට ලක් කරන්න. ඔබ විදර්ශනා නුවණින් දකින්න සංසාරයේ මෙවැනි දරුවන් උදෙසා මම මහා සාගරයේ ජලයට වඩා කඳුළු හෙලලා තියෙනවා කියලා. මේ මනුෂ්‍ය ලෝකයේ ඉන්න සෑම මනුෂ්‍යයෙක්ම සංසාරයේ මගේ දරුවෙක් වෙලා ඉපදිලා සිටියා කියන කාරණය දකින්න. මේ තිරිසන් ලෝකවල, ප්‍රේත ලෝකවල, නිරයන්හි ඉන්න දුක් විඳින සෑම සත්ත්වයෙක්ම මගේ දරුවෙක් වෙලා ඉපදිලා තියෙනවාය කියන කාරණය දකින්න. ඒ නිසා දරුවාය කියන්නේ මේ ලෝකයේ තියෙන ඉහළම කාම වස්තුවයි, දරුවා නිසා මම නැවත දුකට වැටෙන්නේ නැහැ කියන කාරණය සිතේ ඇති කරගන්න. එහෙම කරලා පින්වතුනි, විසිරෙන සිත කුමන රූපයක් කරා ද විසිරෙන්නේ කියන කාරණය දැනගෙන ඒ රූපය වෙන්ව අරගෙන ඒ රූපය විදර්ශනාවට ලක් කරන්න. එතකොට පින්වතුනි, විසිරෙන සිත එක තැනකට ගන්න ඔබට ශක්තිය ලැබේවි.

<u>ප්‍රශ්නය</u>

**40. *ස්වාමීන් වහන්ස, සාමාන්‍ය බෞද්ධයෙකුට තම එදිනෙදා කටයුතුවල යෙදෙන අතරම නිවනම අරමුණු කරගත් මාර්ගයක ගමන් කළ හැකිද?***

***ii. ගිහි ජීවිතයේ හිඳිමින් ශීලය ආර්ය ශීලයක් කරගන්නේ කෙසේද?***

***iii. සමාධිය ආර්ය සමාධියක් කරගන්නේ කෙසේද?***

<u>පිළිතුර</u>

i. දැන් මෙතැනදී ඕනෑම ගිහි පින්වතෙකුට කාන්තා වේවා, පිරිමි වේවා, මේ ජීවිතය තුළ දී සෝවාන්, සකෘදාගාමී, අනාගාමී යන ඵලයන්ට පත්වෙන්න පුළුවන්. කිසිම ගැටළුවක් නැහැ. ඕනෑම පුරුෂයෙකුට, කාන්තාවකට මේ ධර්ම මාර්ගය තුළ ගමන් කර, ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ ගමන් කර සෝවාන්, සකෘදාගාමී, අනාගාමී යන ඵලයන්ට පත්වෙන්න පුළුවනි. නමුත් බුදුරජාණන් වහන්සේ නිරතුරුවම ගිහි පින්වතුන්ලාට ඉලක්කය හැටියට පෙන්වන්නේ මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වෙන්න කියන කාරණයයි. දුවා දරුවන් පෝෂණය කරමින්, ඉඩකඩම්, දේපල පරිහරණය කරමින්, යානවාහන, ගෙවල් දොරවල් පරිහරණය කරමින්, ඒවා කෙරෙහි තෘෂ්ණාව හීන කර ගනිමින් මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වෙන්න කියන ඉලක්කය තමයි බුදුරාජණන් වහන්සේ දෙන්නෙ. ඒ නිසා නිරතුරුවම විචිකිච්චාව කියන කාරණයෙන් බැහැර වෙන්න. මොකද අපි තුළ විචිකිච්ජාව, සැකය තියෙනවා පින්වතුනි.

මේ විචිකිච්ඡාව කියන්නේ මොකක්ද, අපි තුළ සැකයක් තියෙනවා මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙන්න බැහැ, මේ ජීවිතයේ කෙනෙකුට සෝවාන් ඵලයට පත්වෙන්න බැහැ, නැවත වතාවක් මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනය ඇතිවෙන තුරු සෝවාන් ඵලයට කෙනෙකුට පත්වෙන්න බැහැ කියන සැකය. මේ සැකයෙන් මුලින්ම මිදෙන්න පින්වතුනි. මේ සැකය තිබෙන තාක්කල් ඔබට මේ මාර්ගය තුළ ගමන් කරන්න බැහැ. බුදුරජාණන් වහන්සේ සහතිකයක් දෙනවා, ධර්මය සන්දිට්ඨිකව තිබෙන තාක්කල් ඒ උතුම් ආර්ය මාර්ගයේ ඵලයන් ලබන්න ලෝකයාට පුළුවන් කියලා. ධර්මය සන්දිට්ඨිකව තියෙනවා පින්වතුනි. ධර්මය සන්දිට්ඨිකව තියෙනවා කියන්නේ මේ උතුම් ප්‍රාතිමෝක්ෂයන් ආරක්ෂා කරගෙන ජීවත්වෙන දස

දහස් ගණනක් උපසම්පදා භික්ෂූන් වහන්සේලා මේ ලෝකයේ ජීවත් වෙනවා. මේ උතුම් ශීලයන් ආරක්ෂා කරගෙන, උපසම්පදා භික්ෂූන් වහන්සේලා චතුරාර්ය සත්‍යය දේශනා කරනවා, ආර්ය අෂ්ඨාංගික මාර්ගය දේශනා කරනවා. ඒ කියන්නේ ධර්මය අපේ ඇස් පනාපිටම අපි ඉදිරියේ තිබෙනවා පින්වතුනි. එහෙමනම් විචිකිච්ඡාවෙන් බැහැර වෙන්න. බැහැයි කියන විචිකිච්ඡාවෙන් බැහැර වෙන්න. බැහැර වෙලා අර පරමාදර්ශී චරිත මේ ගිහි ජීවිතය තුළ සිට, මේ ගිහි ජීවිතය තරණය කරලා සෝවාන් ඵලයට පත් වුනා වූ පරමාදර්ශී චරිත ඔබේ ජීවිතයේ පරමාදර්ශය බවට පත්කර ගන්න.

කවුද මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත් වූ පරමාදර්ශී චරිත, අර විශාඛාව බලන්න, අනේපිඬු සිටුතුමා, නකුල මාතා, නකුල පිතා, වේළුකණ්ඨකී නන්ද මාතාව, උග්ග ගෘහපතිවරයා මේ ගිහි ජීවිත ගත කරමින් මේ ගිහි ජීවිතයේ උතුම් අධිගමයන් කරා ගිය අය පින්වතුනි. බලන්න විශාඛාවට දරුවන් විසිදෙනෙක් සිටියා. මුණුපුරු, මිණිපිරියන් සිය ගණනක් සිටියා. එහෙමනම් බලන්න දරුවෝ ඉන්නවා කියන කාරණය මේ ගමන යන්න අපට බාධාවක් වෙන්නේ නැහැ. අනේ පිඬු සිටුතුමා කියන්නේ කෝටිපති ව්‍යාපාරිකයෙක්. ජේතවනය රන්කාසි වලින් අතුරනවා. ඒ සා ධනයක් තිබුණා පින්වතුනි. එහෙමනම් මම ධනවතෙක් කියන කාරණය මේ ගමන යන්න අපට බාධාවක් නැහැ. එතකොට බලන්න වේළුකණ්ඨකී නන්ද මාතාව ගෙදරක හිටිය මැදිවියේ අම්මා කෙනෙක්. නන්ද කියන එකම දරුවාගේ අම්මා. මේ අම්මා අනාගාමී උපාසිකාවක් පිංවතුනි. කාම, රාග, පටිඝයන් නැහැ. එයා කාමය ගැන හඳුනන්නේ නැහැ. ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ දේශනා කරනවා මේ වේළුකණ්ඨකී නන්ද මාතාව සතරවරම් දෙවියන් එක්ක දිවැසින් කතා කරනවා කියා පින්වතුනි. එයාට දෙවියන් එක්ක දිවැසින් කතා කරන්න පුළුවන්.

එතකොට බලන්න උග්ග ගෘහපතිවරයා බිරින්දෑවරු පස් දෙනෙක් සමග එක ගෙදරක සිටියා. මේ බිරින්දෑවරු පස්දෙනා ළඟට කතා කර කියනවා මම බුදුරජාණන් වහන්සේ ළඟට බණ අහන්න යනවා කියලා. ගොස් සද්ධර්මය ශ්‍රවණය කරනවා. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරලා, මෙනෙහි කරලා, කාම, රාග, පටිඝයන් නැති කරලා, තුනී කරලා අනාගාමී ඵලයට පත්වෙනවා, පින්වතුනි. අනාගාමී ඵලයට පත් වුනාට පස්සේ මේ උග්ග ගෘහපතිවරයා ගෙදරට එනවා.

ගෙදරට ඇවිත් බිරින්දෑවරු පස්දෙනා ළඟට අඬ ගසා කියනවා, අදින් පස්සේ මම ඔබලා සමග කාමයෙහි ඇසුරක් නැහැ. මට දැන් එවැනි සිතුවිලි සකස් වෙන්නේ නැහැ. ඔබලා කැමති කෙනෙක් විවාහ කරගෙන යන්න. කැමති කෙනෙක් සහෝදරියෝ හැටියට මේ ගෙදර ජීවත් වෙන්න කියලා. එක බිරිඳක් කියනවා මට අහවලා විවාහ කරගෙන යන්න ඕනෑ කියලා. එයා ගෙනැල්ලා අතපැන් වත්කර විවාහ කර දීලා දායාද දීලා පිටත් කරනවා. අනිත් බිරින්දෑවරු හතරදෙනා කියනවා අපි සහෝදරියෝ වගේ මේ ගෙදර ඉන්නවා කියලා. එහෙමනම් බලන්න උග්ග ගෘහපතිවරයා කියන අනාගාමී උපාසකතුමා බිරින්දෑවරු හතර දෙනෙක් සහෝදරියන් හැටියට එක ගෙදර ජීවත් වුණ කෙනෙක්. එහෙමනම් පින්වතුනි, කොතැනකවත් බාධාවක් ඇතිවෙන්නේ නැහැ. කොතැනකවත් විචිකිච්ඡාවක්, සැකයක් ඇති වෙන්නේ නැහැ, මේ ගිහි ජීවිතය ගත කරමින් මේ උතුම් අධිගමයන් කරා යන්න පුළුවන් කියන සහතිකය බුදුරජාණන් වහන්සේ අපට ලබලා දෙනවා.

එහෙමනම් මුලින්ම විචිකිච්ඡාවෙන් බැහැර වෙන්න. විචිකිච්ඡාවෙන් බැහැර වෙලා ධර්මය කෙරෙහි, මාර්ගය කෙරෙහි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කර ගන්න. ඒ විශ්වාසය ඇතිකරගෙන අර පරමාදර්ශී ජීවිත ගත කළා වූ පරමාදර්ශය ඔබේ ජීවිතවලට එකතු කර ගන්න. විශාඛාව ජීවත් වුනේ යම් සේද මම විශාඛාවක් වෙනවා කියලා දකින්න. විශාඛාවට ජීවිතයේ මැදිවයසේ දී බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිත් කියනවා භාග්‍යවතුන් වහන්ස මට වරයන් අටක් ඕනේ කියලා. මොනවද මේ වරයන් අට.

1. දිවි හිමියෙන් සියලු භික්ෂූන් වහන්සේලාට වැසි සළු පිදීමට.
2. දිවි හිමියෙන් සියලු භික්ෂූන් වහන්සේලාට ආගන්තුක බත පිදීමට.
3. දිවි හිමියෙන් සියලු භික්ෂූන් වහන්සේලාට ගමික බත පිදීමට.
4. දිවි හිමියෙන් සියලුම ගිලන් භික්ෂූන් වහන්සේලාට සත්ප්‍රාය ආහාර සකස් කොට පිදීමට.
5. දිවි හිමියෙන් ගිලන් භික්ෂූන්ට උවැටන් කරන භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ආහාර පිදීමට.
6. දිවි හිමියෙන් ගිලන් භික්ෂූන්ට අවශ්‍ය ඖෂධ වර්ග පිදීමට.

7. ඔබ වහන්සේ අන්ධකවින්ද නුවර වැඩ සිටියදී දේශනා කළ පරිදි දස වැදෑරුම් වූ ආනිසංස ලැබෙන කැඳ මාගේ දිවි හිමියෙන් භික්ෂූන් වහන්සේලාට පිදීමට
8. දිවි හිමියෙන් භික්ෂුණීන් වහන්සේලාට දිය සළු (උදක සාටිකා) පිදීමට.

කවුද මේ, සෝවාන් ඵලයට පත් වූ විශාඛා උපාසිකාවයි. බුදුරජාණන් වහන්සේ මේ වර අට අනුදැන වදාළා. එතකොට බලන්න වේළුකණ්ඨකී නන්ද මාතාව, උග්ග ගෘහපතිවරයා, අනේපිඬු සිටුතුමා එක වතාවට පන්සියයක් ස්වාමීන් වහන්සේ ගෙදරට වඩම්මවනවා. පන්සියයක් ස්වාමීන් වහන්සේලා ගෙදරට වැඩමකරවලයි දානය පූජා කරන්නේ පින්වතුනි. එහෙමනම් බලන්න මේ මාර්ගඵල ලාභී උපාසක, උපාසිකාවන් කොයි තරම් ශාසනය උදෙසා, ස්වාමීන් වහන්සේලා උදෙසා, මේ ශාසනික සේවාවන් සිදු කළා ද කියා.

නමුත් බලන්න අපේ සමාජයේ කෙනෙක් සෝවාන් ඵලයට පත් වුනා කිව්වොත් කුමක්ද සිද්ධ වෙන්නේ. එදායින් පසුව එයා පන්සලට යන්නේ නැහැ පින්වතුනි. එයා ස්වාමීන් වහන්සේලාට වන්දනා කරන්නේ නැහැ. බුදු පිළිම වහන්සේලාට වන්දනා කරන්නේ නැහැ. පන්සලට සිල් ගන්න යන්නේ නැහැ. ඇයි? මම සෝවාන් ඵලයට පත්වෙලා කියලා, පින්වතුනි. බලන්න සමාජය කොයිතරම් විකෘතීන් කරා ගමන් කරනවාද කියා. ඇයි මේ සමාජය විකෘතීන් කරා ගමන් කරන්නේ පින්වතුනි. එයට හේතුව තමයි, අර පරමාදර්ශී චරිත අනුව අපේ ජීවිත ගොඩනගා ගන්න අපි දක්ෂ නැහැ.

ඒ නිසා ඔබ චිත්තයක් ඇතිකර ගන්න. මම මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙනවාය කියන චිත්තය. ඡන්දය, කැමැත්ත ඇතිකර ගන්න. එහෙම කැමැත්ත ඇතිකරගෙන ඔබ තුළින්ම ඔබ තීන්දුවක් ගන්න විශාඛාව ජීවත් වුයේ යම් සේද මම එවැනි කෙනෙක් වෙනවා කියා චිත්තයක් ඇති කර ගන්න. අනේ පිඬු සිටුතුමා ජීවත් වුනේ යම් සේද මම එවැනි කෙනෙක් වෙනවා කියා චිත්තයක් ඇති කර ගන්න. වේළුකණ්ඨකී නන්ද මාතාව, උග්ග ගෘහපතිවරයා ජීවත් වුනේ යම් සේද මම එවැනි කෙනෙක් වෙනවා කියා චිත්තයක් ඇතිකර ගන්න. ලෝකය යන දිශාවට යන්න එපා පින්වතුනි. මොකද ලෝකය යන්නේ දුක දිශාවටමයි. මොකද ලෝකය අයිති

මාරයාටයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ලෝකය යන දිශාවට යන්න එපා.

මේ ධර්ම මාර්ගය තුළ ගමන් කරන කෙනා උඩුගං බලා යන කෙනෙක් පින්වතුනි. එයා දුක පැත්තට, මුහුද පැත්තට ගලාගෙන යන කෙනෙක් නොවේ. එයා උඩුගං බලා යන විට ලෝකයා ඉදිරියේ ඔබ අමුත්තෙක් වෙන්න පුළුවන්. ලෝකයා ඉදරියේ ඔබ පිස්සෙක්, පිස්සියක් කියා ලෝකයා කියන්න පුළුවන්. නමුත් මේ කොතැනකදීවත් ඔබේ ගමන ඔබ බාධා කරගන්න එපා පින්වතුනි. මොකද මුළු ලෝකයම ඔබට අහිමි වුනත් බුදුරජාණන් වහන්සේ ඔබ ළඟ ඉන්නවාය කියන විශ්වාසය ඔබ ඇතිකර ගන්න. මේ ධර්ම මාර්ගය තුළ ඔබ ගමන් ගනිද්දී මුළු ලෝකයම ඔබට නැති වුනත් බුදුරජාණන් වහන්සේ ඔබ ළඟ ඉන්නවාය කියන විශ්වාසය හිතේ ඇති කර ගන්න. මුළු ලෝකයම අත්වැල් බැඳගෙන කරට අත දාගෙන හිටියත් වැඩක් නැහැ. බුදුරජාණන් වහන්සේ අපි ළඟ නැත්නම් පින්වතුනි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ තමා තුළ ඉන්නවාය කියන විශ්වාසය තුළ ධර්මයේ සන්දිට්ඨික භාවය ජීවමානව පවතින මේ මොහොතේ මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වෙන්න පුළුවන් කියන විශ්වාසය ඇතිකර ගන්න.

ii. **ශීලය ආර්ය ශීලයක් බවට පත් කරන්නේ කෙසේද?** ශීලය ආර්ය ශීලයක් බවට පත්කරනවාය කියන්නේ ශීලය විදර්ශනා නුවණින් දකිනවා කියන එකයි. අපි කොච්චර සිල් සමාදන් වුනත් අපිට ලැබෙන්නේ භවයයි පින්වතුනි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ආවා වූ භව ගමනේ දී මුණ ගැසුණා වූ සම්මා සම්බුද්ධ ශාසනවල ඔබලා සිල් සමාදන් වෙන්න ඇන්ද සුදු සිල් රෙදි එක ගොඩක් ගැසුවොත් එය ගිජ්ජකූඨ පර්වතයට වඩා විශාලයි කියලා පින්වතුනි. එහෙමනම් බලන්න ඔබලා ඒ සා සංසාරයේ සිල් සමාදන් වෙලා තියෙනවා. නමුත් ඒ සා සිල් සමාදන් වෙලා අපි ප්‍රාර්ථනා කළේ, අපි ලැබුවේ කුමක්ද? භවයමයි පින්වතුනි. අපි ශීලය විදර්ශනා නුවණින් දැක්කේ නැහැ. ශීලය ආර්ය ශීලයක් බවට පත් කළේ නැහැ.

දැන් ඔබ හිතන්නකෝ පංචශීලය සමාදන් වෙනවා. පංච ශීලය සමාදන් වෙලා සිල් පද පහ ඇස් දෙක වගේ ආරක්ෂා කර ගන්නවා. ආරක්ෂා කළා වූ සිල්පද ආවර්ජනය කරනවා. ආවර්ජනය කරමින් ශීලයේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකිනවා.

සංස්කාරයන්ට බැඳෙන්නෙ නැහැ. මම මුලින් මතක් කළා, ශීලයේ සංස්කාරයන් මොනවාද කියලා. ශීලයේ සංස්කාරයන් තමයි,

1. මහත් වූ භෝග සම්පත් ලබනවා.
2. තමාගේ කීර්ති රාවය පැතිරෙනවා.
3. ඕනෑම සභාවකට නොබියව යනවා.
4. සිහි මුලා නොවී මැරෙනවා.
5. මරණින් මතු සුගතියේ උපදිනවා.

එහෙමනම් මේ සෑම සංස්කාරයක්ම අනිත්‍යයි පින්වතුනි. සිල් සමාදන් වෙමින් සමාදන් වුනා වූ ශීලය රැක ගනිමින්, ඒ රැකගන්නා වූ ශීලයේ ආනිසංසයන්ගේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න. සිල් සමාදන් වෙලා අනාගතයේ දෙවියෙක් වේවා කියා චිත්තයක් ඇති වුනොත් ඔබ ශක්‍රයා වෙලා ඉඳලා සතර අපායට වැටුන හැටි සිහිපත් කරන්න.

සිල් සමාදන් වෙලා ඔබට බ්‍රහ්මයෙක් වෙන්න කියා චිත්තයක් ඇති වුනොත් ඔබ රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතල වල කල්ප ගණන් ඉඳලා ආයිමත් සතර අපායට වැටුණ සැටි සිහිපත් කරන්න. සිල් සමාදන් වෙලා ඔබට නැවත මනුෂ්‍යයෙක් වේවා කියා චිත්තයක් ඇති වුනොත් ඔබ සක්විති රජවෙලා ආයිමත් සතර අපායට වැටුන හැටි සිහිපත් කරන්න. ශීලයේ සංස්කාරයන්ට බැඳෙන්න එපා. ශීලය තුළින් සුගතියේ උපතක් කියන සිත සකස් වෙන විටම ඒ සුගතියේ තිබෙන්නා වූ අනිත්‍ය භාවය නුවණින් දකින්න. එහෙම නැත්නම් ඒ සිතේ අනිත්‍ය භාවය දකින්න දක්ෂ වෙන්න. මෙන්න මේ විදිහටයි ශීලය ආර්ය ශීලයක් බවට පත්වෙන්නේ. මොකද බුදුරජාණන් වහන්සේ පහළ වෙන්නත් පෙර ශීලය දඹදිව තිබුණා පින්වතුනි, මහාමායා දේවියගේ මව්කුසට අපේ සිදුහත් කුමාරයා එන දවසේ එතුමිය උපෝසථ ශීලයක් සමාදන් වෙලයි තිබුණේ. එහෙමනම් ශීලය කියන්නේ බුදුරජාණන් වහන්සේ පනවපු දෙයක් නොවේ. බුදුරජාණන් වහන්සේ කුමක්ද කළේ, සමාජයේ තිබුණා වූ ශීලය ආර්ය ශීලයක් බවට පත් කළා. ආර්ය ශීලය කියන්නේ විදර්ශනා නුවණ, ප්‍රඥාව සකස් වෙන්නා වූ ශීලයයි. ඒක තමයි ආර්ය ශීලය.

iii. **සමාධිය ආර්ය සමාධියක් බවට පත්කර ගන්නේ කෙසේද?** ඔබ කොච්චර නම් සමාධිය වැඩුවත්, සමාධිය වඩා ඔබ කොච්චර ධ්‍යාන තල පුහුණු කරගෙන සිටියත්, විදර්ශනා නුවණක් ඔබට සකස් කරන්නේ නැහැ. ධ්‍යාන උපාදාන කරගත්තොත්, සමාධියට හිත ගියොත් ඔබ රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතල වලයි උත්පත්තිය ලබන්නේ. මේවා ලෞකික බ්‍රහ්ම තල පින්වතුනි. මාර්ගඵල පැත්තට ඔබේ සිත යන්නේ නැහැ. එතකොට සමාධිය ආර්ය සමාධියක් කරන්න නම් ඔබ මුලින්ම ධ්‍යානයක් සකස් කරගෙන ඒ ධ්‍යානයන් විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වෙන්න ඕනේ. ඒ ධ්‍යානයන්ගේ අනිත්‍ය භාවය දකින්න දක්ෂ වෙන්න ඕනේ. මේ ධ්‍යානයන්ගේ අනිත්‍ය භාවය දකින මොහොතේ සමාධිය ආර්ය සමාධියක් බවට පත්වෙනවා පින්වතුනි.

**<u>ප්‍රශ්නය</u>**

***41. සාමාන්‍ය ජීවිතයේ දී හෝ මරණ මොහොතේ දී ඇලීම් ගැටීම් සහ උපේක්ෂාවෙන් තොරව ජීවිතය ගත කරන්නේ කෙසේදැයි පහදා දෙනු මැනව, ස්වාමීන් වහන්ස.***

**<u>පිළිතුර</u>**

මෙහෙමයි, ඇලීම් ගැටීම් උපේක්ෂාව කියන්නේ වේදනාව කියන කාරණයයි. වේදනාව සකස් වන්නේ කුමන ඵලයක් නිසාද? ඵස්සයේ ඵලය නිසායි. ඵස්සය නිත්‍ය වශයෙන් ගන්න තැන දී ඇලීම ගැටීම උපේක්ෂාව අප තුළ සකස් වෙනවා. නමුත් අවසාන වෙලාවෙ ඒ කියන්නේ මරණය වෙලාවෙ ඇලීම් ගැටීම් උපේක්ෂාවෙන් තොරව හුස්ම ටික යන්නෙ රහතන් වහන්සේ කෙනෙක්ගේ විතරයි. ඉන් මෙහා කිසිම කෙනෙක්ගේ ඇලීම් ගැටීම් උපේක්ෂාවන්ගෙන් තොරව හුස්ම පිට වීමක් සිද්ධ වෙන්නේ නැහැ. ඔය රහතන් වහන්සේගේ ස්වභාවයන් ගැනයි කියන්නේ. ඇලීම් ගැටීම් උපේක්ෂාවන්ගෙන් තොරව හුස්ම පිටවුනා කියන්නේ එයා රහතන් වහන්සේ කෙනෙක්මයි. ඉන් මෙහා සෝවාන් ඵලයට පත්වුනත් උපේක්ෂාව තුළ අපේ හිත තියෙනවා. ඒ නිසා නිරතුරුවම අපි මේ ජීවන ගමනෙ දි උත්සාහ ගන්න ඕනෑ ඇලීම් ගැටීම් අවම කරගන්න. මොකද ඇලීම් ගැටීම් තුළ අකුසල් සිද්ධ වෙන්න තියෙන අවස්ථා ගොඩක් වැඩියි.

ඒ නිසා ඇලීම් ගැටීම් පුළුවන් තරම් සීමාවට පත් කරගෙන උපේක්ෂාව තුළ ජීවිතය ගත කරන්න. බුදුරජාණන් වහන්සේ කියනවා ඇලීම තුළත් තෘෂ්ණාවයි තියෙන්නෙ. ගැටීම

තුළත් තෘෂ්ණාවයි තියෙන්නෙ කියලා. උපේක්ෂාව තුළ තෘෂ්ණාව මඳ භාවයෙන් තියෙනව කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙමනම් සෝවාන් ඵලයට පත්වුන කෙනාත් උපේක්ෂාව තුලයි ජීවත් වෙන්නේ. ඇලීම් ගැටීම් වලින් එයා අඩුයි. ඒ නිසා මහත්තයො අපි උත්සාහ ගන්න ඕනෙ ඇලීම් ගැටීම් වලින් තොර උපේක්ෂාව කියන තැන හිත සකස් කර ගන්න. එහෙම කළොත් අපි අතින් සිද්ධ වෙන අකුසල් ප්‍රමාණය අඩුයි.

**<u>ප්‍රශ්නය</u>**

***42. ගෞරවනීය ස්වාමීන් වහන්ස, බුදුරජාණන් වහන්සේ ගේ සහ මහරහතුන් වහන්සේලාගේ ශක්තිය තවමත් ලොවෙහි පවතිනවාද? පවතී නම් ධර්ම මාර්ගයෙහි ගමන් කරන විට අපට උන්වහන්සේලාගෙන් උපකාර ලබාගත හැකිවන්නේ කෙසේද?***

**<u>පිළිතුර</u>**

මෙහෙමයි බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑව. රහතන් වහන්සේලා පිරිනිවී ගියා. බුදුරජාණන් වහන්සේ සහ රහතන් වහන්සේලා පිරිනිවන් පෑවට පස්සේ ආයිමත් උන්වහන්සේලාගේ ශක්තියක් ලෝකය තුළ නැහැ. දැන් මෙතන ගිණි ගොඩක් තියෙනවා. මේ ගිණිගොඩ දර තියෙන තාක් කල් ඇවිලෙනවා. දර දාන්න දර දාන්න තව තව ඇවිලෙනව. නමුත් යම් වෙලාවක මේ දර ටික සම්පූර්ණයෙන්ම ඉවර වුනාට පස්සේ මොකද වෙන්නේ. මේ ගිනිගොඩ තුළින්ම ගින්දර නිවිල යනව. ගිනිගොඩ තුළින්ම ගින්දර නිවී ගියාට පස්සේ මේ ගින්දරවල බලපෑමක් ලෝකයට තියෙනව කියලා අපට කියන්න පුළුවන්ද? එහෙම පුළුවන්කමක් නැහැ. ඒ නිසා උන්වහන්සේලා පිරිනිවී ගියා. පිරිවනිවන් පෑවට පස්සේ උන්වහන්සේලාගේ ශක්තිය ලෝකය තුළ නැහැ.

නමුත් උන්වහන්සේලාගේ ධාතුන් වහන්සේලා ලෝකය තුළ වැඩ සිටිනව. එතකොට උන්වහන්සේලාගේ කාලයේ උන්වහන්සේලාගේ ශිෂ්‍යයො වෙලා, සෝවාන්, සකෘදාගාමී, අනාගාමී වෙච්ච දෙවිවරු ලක්‍ෂ ගණනක් දිව්‍ය තලවල ඉන්නවා. ඒ බුදුරජාණන් වහන්සේගේ කාලයේ, සාරිපුත්ත මහරහතන් වහන්සේගේ, කාශ්‍යප මහරහතන් වහන්සේගේ ආනන්ද මහරහතන් වහන්සේගේ ශිෂ්‍යයො හැටියට ඉඳලා එදා රහත් වෙන්න බැරිවෙච්ච සෝවාන්, සකෘදාගාමී, අනගාමී වෙච්ච ඒ පැවිදි භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා සිවුවණක් ලක්‍ෂ ගණන් පිරිසක් දිව්‍ය තලවල තවම ජීවත් වෙනවා. ඉතින් ඒ දිව්‍ය තලවල ඒ අය ජීවත්වෙන නිසා ඒගොල්ලන්ගේ ආරක්‍ෂාව ධර්ම මාර්ගයේ ගමන් කරන අයට තියෙනවා.

ආටානාටිය සූත්‍රයේ දී බොහොම පැහැදිලිව සඳහන් කරලා තියෙනවා භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සිවුවණක් පිරිසට මේ ඉන්නා වූ ශක්තිමත් බලවේගවල ආශිර්වාදය, ආරක්ෂාව තියෙනව කියලා. ඒ ආරක්ෂාව තියෙනව කියල මහත්තයො. එහෙම නැතිව බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑව. මහ රහතන්වහන්සේලා පිරිනිවන් පෑව. බුදුරජාණන් වහන්සේ හරි අතීතයේ වැඩසිටි මහ රහතන්වහන්සේලාගේ හරි ශක්තියක් ලෝකය තුළ වර්තමානයේ නැහැ.

බුදුරජාණන් වහන්සේ පැහැදිලිව දේශනා කරනව මේ පිරිනිවන් මංචකයේ මා පිරිනිවන් පෑවට පස්සේ මේ බුද්ධ ශරීරය කිසිම බ්‍රහ්මයෙකුට, දෙවියෙකුට, මනුෂ්‍යයෙකුට නැවත දකින්න ලැබෙන්නේ නෑ කියලා. එහෙම නම් ආයිමත් උන්වහන්සේලා කොහෙවත් පහළ වෙන්නේ නැහැ. ඒක බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. නමුත් ඒ කාලයේ උන්වහන්සේලාගේ ගෝලයෝ වෙලා හිටපු ලක්ෂ ගණනක් දෙවිවරු දිව්‍ය තලවල ජීවත් වෙනව. ඒ ගොල්ලන්ගේ ආශිර්වාදය ධර්ම මාර්ගයේ ගමන් කරන අයට තියෙනව.

<u>ප්‍රශ්නය</u>

***43. ගෞරවනීය ස්වාමීන් වහන්ස, මේ ප්‍රශ්නය යොමුවන්නේ ආධුනිකයෙකුගේ භාවනානුයෝගී භාවය සම්බන්ධයෙන්. කොටස් 3 ක් වූ මෙම ප්‍රශ්නයේ පළමු කොටස***

***i. ආධුනිකයෙකු භාවනාවට යොමුවීමට සුදුසු වන්නේ කුමන භාවනා ක්‍රමයක්ද?***

<u>පිළිතුර</u>

ආධුනිකයෙකු ප්‍රගුණ කළ යුත්තේ බුද්ධානුස්සතියයි. මොකද මේක ආර්ය අෂ්ඨාංගික මාර්ගයක්නෙ. මේ මාර්ගයෙන් තොරව අපට නිවන සාක්ෂාත් කරගන්න බැහැ. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මුල්ම මාර්ගාංගය තමයි සම්මා දිට්ඨිය. ඒ කියන්නේ තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාවයි. ඒ නිසා නවක කෙනෙක් ධර්ම මාර්ගයට අවතීර්ණ වෙද්දී අනිවාර්යෙන්ම එයා බුද්ධානුස්සතියය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය තුළ ශක්තිමත් වෙන්න ඕන. එතනින් තමයි එයා පටන් ගන්න ඕන. ඊට පස්සේ මෛත්‍රී භාවනාව තියෙනව. ආනාපාන සතිය අසුභය, මරණානුස්සතිය වගේ. තමන්ට ගැළපෙන භාවනාවක් තෝරා ගන්න පුළුවන්. නමුත් මුල් වෙන්නෙ බුද්ධානුස්සතිය. එතනින් තමයි ධර්මයේ මුල පටන් ගන්න ඕනෑ.

***<u>ප්‍රශ්නයේ දෙවන කොටස</u>***

***ii. භාවනා කරන ගිහියෙකුට තමාට වඩාත්ම සුදුසු භාවනා ක්‍රමය කුමක්දැයි හඳුනාගන්නේ කෙසේද?***

***<u>පිළිතුර</u>***

මෙහෙමයි. ඒක තමන් ගුරුවරු ළඟට ගහිල්ල එක පැත්තකින් හඳුනාගන්න පුළුවන්. එහෙම නැත්නම් බුදුරජාණන් වහන්සේ දේශනා කරනව තමා තුළ නිරතුරුවම ද්වේශ සිතුවිලි උපදිනව නම් ව්‍යාපාදය තියෙනව නම් එයාට මෛත්‍රී භාවනාවයි සුදුසු කියලා. එතකොට යමෙකුට රාග සිත් සකස් වෙනවා වැඩි නම් එයාට සුදුසු අසුභය නැත්නම් පිළිකුල් භාවනාව වගේ භාවනා ක්‍රමයක් කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එතකොට එයාට මෝහ සිතුවිලි සකස් වෙනවා වැඩි නම්, ධර්මය කෙරෙහි විශ්වාසයක් නැත්නම් එයාට තෙරුවන් කෙරෙහි බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය වඩන්න කියල බුදුරජාණන් වහන්සේ කියනව. ඒවගේම කෙනෙකුට නිතරම විසිරුණු හිතක් තියෙනව නම් සිත විසිරෙන ස්වභාවයෙන් තියෙනව නම් හිත එක අරමුණකට ගන්න ආනාපාන සතිය වඩන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒවගේ තමන්ගේ ස්වභාවය තමන් දකිමින් තමන් දක්ෂ වෙන්න ඕන ඊට අදාළ භාවනාවක් වඩමින් තමන්ගේ තියෙන කෙලෙස් යටපත් කරගන්න. ඒක තමා තුළින් තමා තීරණයක් ගන්න ඕන. එහෙම නැත්නම් සුදුසු ගුරුවරයෙක් ළඟට ගිහිල්ල අදාළ උපදේශයක් ගන්න ඕනැ. නැත්නම් බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ සූත්‍ර තියෙනව සතර සතිපට්ඨාන සූත්‍රය, ආනාපාන සති සූත්‍රය, සබ්බාසව සූත්‍රය මෙවැනි සූත්‍ර පරිහරණය කරල අපි කොතනින් හරි මුලක් මතුකර ගන්න ඕන.

***<u>ප්‍රශ්නයේ තෙවන කොටස</u>***

***iii. තවද නිවැරදි කමටහනක් ලබා ගැනීම සඳහා සුදුසුම ආචාර්යවරයා සොයා ගන්නේ කෙසේද?***

***<u>පිළිතුර</u>***

මෙහෙමයි මහත්තයො, ඕක හරි භයානක තැනක්. කමටහන් නිසා වැරදි මාර්ගවල ගිය අය සමාජයේ ඉන්නව. සමහර අය අපට ඇවිල්ල කතා කරලත් තියෙනව. ඒ නිසා මට නම් කියන්න බැහැ කවුද ගුරුවරයා කියන කාරණය. ගුරුවරයා කියන කාරණය බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ කල්‍යාණ මිත්‍රයා කියලයි. මේ ලෝකේ සැබෑම කල්‍යාණ මිත්‍රයෙක්

වෙන්න පුලුවන් අවම වශයෙන් සෝවාන් ඵලයට පත්වුන කෙනාටයි. මොකද සෝවාන් ඵලයට පත්වුන කෙනා තමයි ධර්මය දැක්ක කෙනා. තුනුරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට ආපු කෙනා. ශීලය ආර්ය ශීලයක් හැටියට පරිපූර්ණ කරපු කෙනා. ඒ නිසා සෝවාන් වෙච්ච කෙනාටයි මුලින්ම අවංකවම කල්‍යාණ මිත්‍රයෙක් වෙන්න පුලුවන්. නමුත් මහත්තයො වර්තමානයේ සෝවාන් වෙච්ච ගුරුවරයා කවුද කියල අපට හොයාගෙන යන්න පුලුවන් කමක් නැහැ. මොකද අපට කෙනෙක්ගේ අධිගමයන් දකින්න බැහැ. කෙනෙක්ගේ අධිගමයන් දකින්න පුළුවන්කම තියෙන නුවණ තියෙන්නෙ බුදුරජාණන් වහන්සේට විතරයි. තව කෙනෙකුගේ අධිගමයන් ලෝකයේ වෙන කිසිම කෙනෙකුට දකින්න බැහැ. යමෙක් තව කෙනෙකුගේ අධිගමයක් ප්‍රකාශ කරනව නම් මහත්තයො ඒක බුදුරජාණන් වහන්සේ අනුමත කරන්නේ නැහැ. ඒ අධිගම සහිත පුද්ගලයා හඳුනා ගැනීමේ නුවණ තියෙන්නෙ බුදුරජාණන් වහන්සේට විතරයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යමෙක් හේතූන් 4 ක් නිසා අධිගමයන් ප්‍රකාශයට පත් කරනවා කියලා.

1. අධිමාන්නය නිසා එයා ප්‍රකාශ කරනව මම සෝවාන් ඵලයට පත් වෙලා කියලා.
2. මෝහය නිසා / මෝඩකම නිසා එයා ප්‍රකාශ කරනවා මම සෝවාන් ඵලයට පත්වෙලා කියලා.
3. එයා මානසික රෝගී භාවය නිසා ප්‍රකාශයට පත් කරනව සෝවාන් ඵලයට පත්වෙලා කියලා.
4. එයා අවබෝධයෙන්ම ප්‍රකාශ කරනවා මම සෝවාන් ඵලයට පත්වෙලා කියලා.

එහෙමනම් මහත්තයෝ යමෙක් අධිගමයන් ප්‍රකාශ කරද්දී මේ කාරණා හතරටම දාල අපි බලන්න ඕනෑ. මේ කාරණා හතර නිසාම අධිගමයන් ප්‍රකාශ කරනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනව. ඒ නිසා කෙනෙකුගේ අධිගමයන් අපි හිතන්න හරි යනව නම් අපිට චිත්‍රයක් හරි මවාගන්න ඕන නම් බුදුරජාණන් වහන්සේ කියනවා එයාගේ ශීලය පිළිබඳව, එයාගේ සමාධිය පිළිබඳව, එයාගේ ප්‍රඥාව පිළිබඳව නැවත, නැවත, නැවත සොයන්න, සෝදිසි කරන්න, සොයලා අවුස්සල හාරල බලන්න කියලා. එයා දේශනා කරන ධර්මය නැවත නැවත මෙනෙහි කරල ප්‍රඥාවට අදාළ ධර්මයක් ද කියලා බලන්න කියනව. එහෙම බලමින්, බලමින්, බලමින් අපිට චිත්‍රයක් ඇති කරගන්න පුලුවන් මහත්තයො. මෙයා මෙහෙම කෙනෙක් කියල. නමුත් පරිපූර්ණ වශයෙන් දෙන්න සහතිකයක් බුදුරජාණන් වහන්සේ අපිට කියන්නේ නෑ. මොකද ඒ ඥාණය අපිට නෑ මහත්තයො.

ඒ නිසා අපට වර්තමාන සමාජයේ සෝවාන් වෙච්ච ගුරුවරයා කවුද කියලා හොයාගන්න බැහැ, ඒ නිසා හැම වෙලාවෙම අපි දක්ෂ වෙන්න ඕන අපට වඩා දැනුමෙන් බුද්ධියෙන් ඉහළ කෙනෙක් කල්‍යාණ මිත්‍රයා හැටියට ඇසුරු කරන්න. බුදුරජාණන් වහන්සේ කියනව නිරතුරුවම තමාට වඩා දැනුමෙන්, බුද්ධියෙන් වැඩි ධර්ම මාර්ගයට බර කෙනෙක් කල්‍යාණ මිත්‍රයා හැටියට ඇසුරු කරන්න කියලා. ඒ කියන්නේ මහා සංඝරත්නය, උපාසක උපාසිකා නැත්නම් භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා කියන සිවුවණක් පිරිස කල්‍යාණ මිත්‍රයන් හැටියට අපට ගන්න පුළුවන්. එවැනි කෙනෙක් ඇසුරු කරන්න. එවැනි කෙනෙක් නැත්නම් තමන්ට සමාන කෙනෙක් ඇසුරු කරන්න කියලා බුදුරජාණන් වහන්සේ කියනව. තමාට සමාන කෙනෙකුත් නැත්නම් හුදෙකලාව ජීවත් වෙන්න කියලයි බුදුරජාණන් වහන්සේ කියන්නෙ.

ඒ නිසා මහත්තයො සෝවාන් වුන කෙනා කවුද කියල හොයාගෙන යන්න අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා හැම වෙලාවෙම අපි දක්ෂ වෙන්න ඕන බුදුරජාණන් වහන්සේ අපේ කල්‍යාණ මිත්‍රයා කරගන්න. එතකොට කොහොමද බුදුරජාණන් වහන්සේ කල්‍යාණ මිත්‍රයා කරගන්නේ? බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාල ඉවරයි. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්න ඉස්සෙල්ල දේශනා කරනව ''ආනන්ද මගේ ඇවෑමෙන් ධර්ම විනය දෙකෙ ශාස්තෘ බවට පත්වෙනවා'' කියලා. එහෙමනම් ධර්ම විනය දෙක ජීවමානව තියෙනවද? නැද්ද? තියෙනව. ජීවමානව තියෙනව ධර්ම විනය දෙක. එහෙම නම් ජීවමානව තියෙන ධර්ම විනය දෙකයි අපි අපේ කල්‍යාණ මිත්‍රයා බවට පත්කරගන්න ඕනෑ. ජීවමානව තියෙන ධර්ම විනය දෙක අපි අපේ කල්‍යාණ මිත්‍රයා බවට පත් කරගන්න ඕනෑ.

මේ ධර්ම විනය කියන්නේ මොකක්ද පින්වතුනි, බුදුරජාණන් වහන්සේ දේශනා කළා වූ සමස්ත ධර්මස්කන්ධය, මේ සූත්‍ර විනය, අභිධර්මය කියන සමස්ත ධර්මස්කන්ධය. මේ සෑම ධර්ම කාරණයක්ම බුදුරජාණන් වහන්සේ අවසානයේ ඉලක්ක කරන්නෙ කොතනටද? චතුරාර්ය සත්‍ය අවබෝධයට. චතුරාර්ය සත්‍යයේ මුල්ම ආර්ය සත්‍යය මොකක්ද? දුක කියන කාරණය. එතකොට බුදුරජාණන් වහන්සේ දුක කියල කියන්නෙ මොකක්ද? ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම, පංච උපාදානස්ඛන්ධය නිත්‍ය භාවයෙන් ගන්නා වූ දුක. එහෙමනම් මේ දුක කියන කාරණය අපි තුළ තියෙනව නේද? එහෙමනම් බුදුරජාණන් වහන්සේ සමස්ත ධර්ම විනය

තුළින් අපව අවසානයේ ඉලක්ක කරන්නේ කොතනටද? මේ පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියල දකින්න.

ඔබ සෝවාන් ඵලයට පත්වෙනවාය කියන්නෙ මොකක්ද? පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියල දක්ක. ඔබ රහත් භාවයට පත් වෙනවාය කියන්නෙ මොකක්ද? පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියල අවබෝධ කරගත්ත. එහෙමනම් මේ ධර්ම මාර්ගයේ ගමන් කරල අවසානනෙදි අපි අවබෝධ කරගන්නෙ මොකක්ද? පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියල අවබෝධ කරගත්තා කියන කාරණයයි. එතනටයි අපි මේ යන්න හදන්නෙ. මේ ධර්ම විනයේ අවසාන ඉලක්කය අපිව යොමු කරන්නේ පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියන තැනට යන්නයි. එහෙමනම් මොකක්ද මේ පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියන්නේ? මේ ඇස අනිත්‍යයි, මේ ඇස නිසා සකස් වන්නා වූ ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ අනිත්‍යයි. මේ කණ, නාසය, මේ දිව, මේ ශරීරය, මේ මනස අනිත්‍යයි. මේවා නිසා සකස් වෙන්නා වූ ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ අනිත්‍යයි. එහෙමනම් මෙතන තමයි පංචුපාදානස්කන්ධයේ අනිත්‍යභාවය තියෙන්නෙ.

එහෙමනම් ඔබ ඇස් දෙක පියාගෙන මේ ඇස අනිත්‍යයි කියල දකින මොහොතේ මේ ඇස නිසා සකස් වෙන්නා වූ ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ අනිත්‍යයි කියල ඔබ දකින මොහොතෙම තමා තුළින් තමා කල්‍යාණ මිත්‍රයා මතුකර ගන්නවා පින්වතුනි. තමා තුළින් තමා කල්‍යාණ මිත්‍රයා මතුකර ගන්නවා. මොකද මේ සමස්ත ධර්ම විනයේ හරය ඵලය තමයි තමා තුළින් තමා මේ මතු කරල ගත්තෙ. එහෙමනම් ඔබ ඇස් දෙක පියාගෙන මේ ඇසේ අනිත්‍යභාවය දකින මොහොතක් පාසා මේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයන් ගේ අනිත්‍යභාවය දකින මොහොතක් පාසා ඔබ නිරතුරුවම තමා තුළින් තමා කල්‍යාණ මිත්‍රයා මතුකර ගත්තා වෙනව.

එහෙමනම් ලෝකෙ හොයන්න යන්න අවශ්‍යතාවයක් නෑ. කල්‍යාණ මිත්‍රයෙක් නොලැබුණා කියලා ඔබට දුක් වෙන්න අවශ්‍යතාවයක් නැහැ. ඔබ ශ්‍රද්ධාවෙන් පරිපූර්ණ වෙන්න. ශීලයෙන් පරිපූර්ණ වෙන්න. පරිපූර්ණ වෙලා මේ ආකාරයෙන් රූප, වේදනා, සංඥා, සංඛාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න කියනවා. මේ ඇසේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන් කියනව.

ඔබ මතක් කරන්න මේ ඇසෙන් දැක්කා වූ මුල්ම රූපය කවුද? අම්මා කියන රූපයයි. අපි මුලින්ම දැක්කෙ ඒ අම්මා කියන රූපේ. මේ ඇසෙන් මුලින්ම දකිද්දි ඒ අම්මා කොච්චර නම් තරුණ අම්ම කෙනෙක් වෙලා ඉන්න ඇද්ද? බලන්න ඒ තරුණ අම්මා මේ වෙලාව වෙනකොට කොච්චර නම් වයෝවෘද්ධ භාවයට පත් වෙලාද? ලෙඩ වෙලා අංශභාගෙ හැදිල රෝගී වෙලා ඉන්න පුළුවන්. මැරිල දිව්‍ය තලයක, මනුස්ස ලෝකෙක, සතර අපායක ඉන්න පුළුවන්. ඒ අම්මා කියන රූපය කොයි සා අනිත්‍ය භාවයට පත් වෙලාද කියලා නුවණින් දකින්න. ඒ නිසා බලන්න ඒ අම්මා නිසා අපි කොච්චර නම් විඳීම් ඇතිකර ගන්න ඇද්ද? අම්මාගේ කිරි සුවඳට, අම්මාගේ ආදරයට, අම්මාගේ හුරතලයට, අම්මා කවන කොට පොවන කොට, ගහනකොට, බණින කොට, අකුරු කියලා දෙනකොට කොයි සා විඳීම් අපි ඇති කරගන්න ඇද්ද? ඒ විඳීම් නිත්‍යද? අනිත්‍යද? අනිත්‍යයි. එහෙමනම් බලන්න තාත්තා කියන රූපය, බාප්පා, මහප්පා කියන රූපය, මහ ගෙදර කියන රූපය. මේවා නිසා කොයි සා විඳීම් අපි ඇතිකර ගන්න ඇත්ද? නමුත් මේ සෑම විඳීමක්ම අනිත්‍යයි පින්වතුනි. මේවා නිසා අපි කොච්චර නම් කුසල් අකුසල් සංස්කාරයන් රැස්කර ගන්න ඇත්ද? මේ සෑම කුසල් සංස්කාරයක්ම අකුසල් සංස්කාරයක්ම විපාක දීලා අනිත්‍ය භාවයට පත් වෙනවා.

ඒ නිසා තමා තුළින් මේ දැක්ම දකින මොහොතක් පාසා ඔබ තමා තුළින් කල්‍යාණ මිත්‍රයා මතුකර ගත්තා වෙනව. සමස්ත ධර්ම විනයේ හරය සමස්ත ධර්ම විනයේ එලය මතුකර ගත්තා වෙනව. ඉන් පස්සේ තමන්ට කල්‍යාණ මිත්‍රයෙක් නැතැයි කියන ප්‍රශ්නය මතුවෙන්නෙ නැහැ පින්වතුනි! ඒ නිසා කල්‍යාණ මිත්‍රයා සොයා ගැනීම දුර්ලභම දෙයක් නම් බැරිම කෙනෙක් නම් කරුණාකරලා බුදුරජාණන් වහන්සේ කල්‍යාණ මිත්‍රයා කරගන්න. ධර්ම විනය දෙක කල්‍යාණ මිත්‍රයා කරගන්න. මේ පංචුපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න. තමා තුලින්ම තමාට කල්‍යාණ මිත්‍රයා මතුකර ගන්න පුළුවන්.

**ප්‍රශ්නය**

***44. ගෞරවනීය ස්වාමීන් වහන්ස, බොහෝ දෙනාට විමතියක් තියෙන බව මතක් කරනවා ස්වාමීන් වහන්සේලා මේ මල් මතින් වැඩම කරන එක යෝග්‍යද? කියන කාරණය.***

**පිළිතුර**

මෙහෙමයි දැන් ඉතින් ඕක මටම කියල තියෙන ප්‍රශ්නයක් වගේ මට හිතෙන්නෙ. මේ අපේ මහත්තයා මම ලග්ගල නාරංගමුවෙ කුටියෙ ඉන්න කොට මට ඇවිල්ලා ආරාධනයක් කලා ''ස්වාමීන් වහන්ස පේරාදෙණිය වෛද්‍ය පීඨයට ඇවිල්ල ධර්ම දේශනයක් කරන්න'' කියලා. මං ඒ වෙලාවෙ කිව්ව ''මහත්තයෝ බණ කියන්න තවම තීරණය කළේ නෑ, තීරණය කළොත් කියන්නම්'' කියලා, ඊට පස්සේ මාස දෙකකට විතර පස්සෙ තමයි ආයිමත් බුන්දල කුටියට ඇවිල්ල මට මේ ධර්ම දේශනාවට ආරාධනා කළේ. ඒ ආරාධනය කරද්දී මම අද දවසත් වෙලාවත් විතරයි කිව්වෙ. වෙන කිසිම දෙයක් කිවුවෙ නැහැ. මට ධර්ම දේශනාවට ඉස්සෙල්ලා පැයක් විතර විවේක ගන්න තැනක් ලෑස්ති කරල දෙන්න කිවුව. එහෙමනම් මහත්තයො මං කාටවත් කිව්වේ නෑ මල් දාන්න, සුවඳ ඉහින්න, ලස්සන කරන්න කියලා. මං මුකුත් කිව්වේ නෑ.

නමුත් මහත්තයෝ මම මේ මල් ගොඩින් වඩිනකොට මම අර වාහනයෙන් බැහැලා මල් පාවඩයට කකුල තියද්දිම මං මගේ ඉස්සරහින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩම කළා මහත්තයො. ශාරිපුත්ත මහ රහතන් වහන්සේ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මගේ ඉස්සරහින් වැඩම කළා. මම ගියෙ හතර වෙනියට නැත්නම් පස්වෙනියටයි. මම හිතෙන් එගොල්ලො වඩිනවා දැක්ක මහත්තයො. එහෙමනම් මහත්තයො ඔබලා මේ එක මලක් හරි පූජා කළා නම් මම දක්ෂ වුණා ඒ මලට ලබාදෙන සැබෑම කුසලය ඔබලාට ලබාදෙන්න. තේරුණාද? සැබෑම කුසලය ලබල දෙන්න මම දක්ෂ වුණා.

ඒ නිසා මම නෙවෙයි දරුවො මේකෙ වැඩියෙ. බුදුරජාණන් වහන්සේමයි වැඩැම්මුවෙ. සාරිපුත්ත මහරහතන් වහන්සේ මයි වැඩැම්මුවෙ. ඒ නිසා දරුවෝ මේ මල් උඩ වඩිද්දී මං කාටවත් මල් නෙලන්න කියල කිව්වෙ නෑ. නමුත් මේ මල් උඩ වඩිද්දී මට එක දශමයක් වත් බියක් සකස් වෙන්නෙ නෑ මහත්තයො. ඒ දශමයක්වත් බියක් සකස් වෙන්නෙ නැත්තෙ මගේ ශීලය පිළිබඳව, මගේ සමාධිය පිළිබඳ, මගේ ප්‍රඥාව පිළිබඳ මට සීයට සීයක් විශ්වාස නිසයි මහත්තයො.

ඒ නිසා කොතනකවත් මලක් උඩින් වඩිද්දී මට බියක් සකස් වෙන්නෙ නෑ. තේරුණාද? දිව්‍ය තලයේ තියෙනව නන්දන උයන. නන්දන උයනෙ මලින් බර වෙච්ච මල් ගස් තියෙනව. නන්දන උයනෙ තියෙන මල් ගස්වල මහත්තයො මේ අපේ රටේ තියෙන මල් ගස් වගේ කොළ නෑ. ඒවායෙ මල් විතරයි තියෙන්නෙ. ගස් තියෙනව මල් විතරයි. කොළ නෑ. ඒකයි ස්වභාවය. නමුත් ඔය නන්දන උයනෙන් මල් ගෙනල්ල මේ පාවඩය මත තිබ්බත් මහත්තයො මම ඒ මත වඩින්න බය නෑ. මොකද මගේ සීලය, මගේ සමාධිය, මගේ ශ්‍රද්ධාව මට විශ්වාසයි!

***ප්‍රශ්නකරු : සාදු ! සාදු ! සාදු !!!***

***මම හිතන්නෙ බොහෝදෙනාට තිබුණ ගැටළුවකට වටිනා කියන සීහනාදයක් කරන්නට අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේ මේ වෙලාවේ දක්ෂ වුණා.***

---

***මේ ධර්ම සාකච්ඡා කියවූ ඔබ සැම මේ ජීවිතයේ දීම සතර අපායෙන් මිදීමට දක්ෂ වේවා!***

*- සම්පාදක -*

*2014 ඔක්තෝබර් මස 31 වන දින*